2025 ඔක්තෝම්බර් 03
2025 ஒக்டோபர் 03
03 October 2025

NAOSL

වාර්තාවේ අංකය : එස්පීආර්/2025/03
அறிக்கை இல. : எஸ்.ஆர்/2025/03
Report No : SPR/2025/03

# ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ මාර්ගගත වීසා නිකුත් කිරීමේ ක්‍රමවේදය පිළිබඳ විශේෂ විගණන වාර්තාව

# குடிவரவு மற்றும் குடியகல்வு திணைக்களத்தின் இணையவழி ஊடாக வீசா வழங்கும் முறைமை தொடர்பான விசேட கணக்காய்வு அறிக்கை.

# Special Audit Report on the Online Visa Issuance Methodology of the Department of Immigration and Emigration

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE



# ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ මාර්ගගත වීසා නිකුත්කිරීමේ ක්‍රමවේදය පිළිබඳ විශේෂ විගණන වාර්තාව

**විධායක සාරාංශය**

1948 අංක 20 දරන ආගාමික හා විගාමික පනතේ ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරීම සඳහා ස්ථාපනය කරන ලද ආගමන හා විගමන දෙපාර්තමේන්තුව 1949 නොවැම්බර් 1 සිට ක්‍රියාත්මකකර ඇත. පනතේ පූර්විකාවේ සඳහන් පරිදි, ශ්‍රී ලාංකික පුරවැසියන් නොවන වෙනත් පුද්ගලයන් ශ්‍රී ලංකාවට ඇතුල්වීම පාලනය කිරීම, ශ්‍රී ලාංකික පුරවැසියන් සහ ශ්‍රී ලාංකික නොවන පුද්ගලයන් ශ්‍රී ලංකාවෙන් පිටවීම විධිමත් කිරීම, ශ්‍රී ලාංකීය පුරවැසියන් නොවන අනවශ්‍ය පුද්ගලයන් ශ්‍රී ලංකාවෙන් බැහැර කිරීම හෝ ඉහත සඳහන් කරුණුවලට අනුෂාංගික හෝ සම්බන්ධ වෙනත් කරුණු සඳහා විධිවිධාන සකස්කිරීම සඳහා පනත බලාත්මකකර ඇත. 1955 අංක 16, 1961 අංක 68, 1993 අංක 1, 1988 අංක 42, 2006 අංක 31,2015 අංක 07 හා 2021 අංක 27 දරන සංශෝධන පනත් මගින් මුල් ආගාමික හා විගාමික පනත සංශෝධනයකර ඇති අතර, 1956 ආගාමික හා විගාමික පනත යටතේ වන රෙගුලාසි පනවා ඇත. වීසා නිකුත්කිරීම, පනත යටතේ වන එක් ප්‍රධාන කාර්යයක් වේ. පැමිණීමේ වීසා (Visit Visa), වාස වීසා (Resident Visa) හා සංක්‍රමණ වීසා (Transit Visa) ලෙස වීසා වර්ග 03ක් වේ. 1949 වසරේ සිට 2012 වසර දක්වා රටවල් කිහිපයක් හැර විදේශ සංචාරකයන්ගෙන් වීසා ගාස්තු අයකිරීමක් සිදුකර නොතිබුණි. 2012 දී ප්‍රථමවරට වීසා ඉල්ලුම්පත් මාර්ගගත ක්‍රමය මගින් ඉදිරිපත් කිරීම ආරම්භකර ඇත.

ඒවන විටත් ඇමෙරිකා එක්සත් ජනපදය, කැනඩාව, ජපානය, ඕස්ට්‍රේලියාව වැනි රටවල් මෙම ක්‍රමය ක්‍රියාත්මක කරමින් පැවති අතර, විශේෂයෙන් ඕස්ට්‍රේලියාව අනුගමනය කරන ලද ක්‍රමවේදය ආදර්ශයට ගෙන 2012 වර්ෂයේ දී විදුයුත් සංචරණ අනුමැති ක්‍රමය හඳුන්වාදීමත් සමග දකුණු ආසියාවේ එම ක්‍රමය හඳුන්වාදුන් පළමු රට බවට ශ්‍රී ලංකාව පත්ව තිබුණි. මෙම ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමේදී සී/ස මොබිටෙල් (පුද්ගලික) සමාගම කිසිදු සේවා ගාස්තුවක් අයකර නොතිබුණි. අඛණ්ඩව පවත්වාගෙන ආ මෙම ක්‍රමවේදය තවදුරටත් සංවර්ධනය කිරීමේ අවශ්‍යතාවය 2018 වර්ෂයේ පමණ සිට හඳුනාගෙන තිබූ අතර ජාතික ආරක්ෂාව තීව්‍ර කිරීම සඳහා ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ප්‍රත්‍යන්ත පාලනයේ විදුයුත් සංචරණ අනුමැතිය (ETA) ලබාගැනීමේ පද්ධතිය වැඩිදියුණු කිරීමේ යෝජනාව (Revamp) සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් 2021 වර්ෂයේ දී අනුමැතිය ලබා දී තිබුණු අතර, එහි වැඩිදියුණු කිරීම් කළ බව සඳහන්කළ ද 2024 වර්ෂය දක්වාම එය ක්‍රියාත්මකකර නොතිබුණි.

මේ අතර ශ්‍රී ලංකාවට පැමිණෙන හා ශ්‍රී ලංකාවේ සංචාරය කරන විදේශිකයන්ගේ වීසා අයදුම්පත් විදුයුත් ගමන් අවසර පද්ධතිය හරහා ඉදිරිපත් කිරීම සඳහා බලයලත් නියෝජිතයන් පත්කිරීම යන මැයෙන් වූ 2020 ජනවාරි 07 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා ලැබී ඇති අනුමැතිය මත ETA පද්ධතිය හරහා චීන ජාතිකයන්ගේ අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා සී/ස ට්‍රැවර්ල්සන් ඉන්ටර්නැෂනල් ට්‍රැවල් සර්විස් (ෂැංහයි) සමාගමට බලය ලබා දී තිබූ අතර එම ක්‍රමය 2023 සැප්තැම්බර් 06 දින සිට ක්‍රියාත්මකකර තිබුණි.

මේ අතර 2023 සැප්තැම්බර් 08 දින IVS - GBS Global Service Powered with VFS Global as a Technical Partner ආයතනය විසින් මහජන ආරක්ෂක අමාත්‍යාංශය හා විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන බව දක්වා තිබූ මාර්ගගත වීසා කන්සියුලර් සේවා, වීසා සේවා, ජීවදත්ත සේවා හා සංචාරක ප්‍රවර්ධනය සඳහා වූ සවිස්තරාත්මක යෝජනාව 2023 සැප්තැම්බර් 08 දින අමාත්‍ය මණ්ඩලය වෙත

ඉදිරිපත්කර තිබුණි. 2023 සැප්තැම්බර් 11 දින එම යෝජනාව සහ අදාළ ගිවිසුම ඇගයීම පිළිබඳ කමිටුවක් පත්කිරීම හා අත්සන් කිරීමට යෝජිත ගිවිසුමට නීතිපති නිෂ්කාශන ලබාගෙන අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීම අමාත්‍ය මණ්ඩලය විසින් අනුමතකර තිබුණි. අදාළ වාර්තා හා ගිවිසුම 2023 දෙසැම්බර් 04 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සඳහා 2023 දෙසැම්බර් 11 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබූ අතර 2023 දෙසැම්බර් 21 දින සමාගම් සමග ගිවිසුමට එළැඹ තිබුණි.

2024 අප්‍රේල් 17 දින සිට 2024 අගෝස්තු 02 දින දක්වා GBS Technology Service & IVS Globle-FZCO, VF Worldwide Holding Ltd සමාගම හරහා වීසා නිකුත්කිරීම සිදුකර තිබුණු අතර 2024 මැයි 01 දින කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේ මගීන්ගේ වීසා ලබාදීමේ ප්‍රමාදය හේතුවෙන් සිදු වූ නොසන්සුන්තාවය නිසා එම සමාගම මගින් වීසා නිකුත්කිරීමේ ගැටළුව සමාජගතවීමෙන් පසුව එදින සිට විද්‍යුත් සංචරණ වීසා නිකුත්කිරීම අත්හිටුවා දෙපාර්තමේන්තුව මගින් On Arrival Visa පමණක් නිකුත්කර තිබූ බවට නිරීක්ෂණය විය. අංක SC FR 203/2024,SC FR 204/2024 හා SC FR 205/2024 යන නඩුකර තුන සඳහා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබාදෙන ලද අතුරු තහනම් නියෝගයක් මත 2024 අගෝස්තු 02 දින සිට GBS Technology Service & IVS Globle-FZCO, VF Worldwide Holding Ltd ආයතනය හරහා වීසා නිකුත්කිරීමේ ක්‍රමය නතර කරන ලෙසත්, පෙර පැවති ක්‍රමයට වීසා නිකුත්කරන ලෙසත් නියමකර තිබුණි. මෙම වාර්තාවේ දිනය දක්වා එම ක්‍රමය ක්‍රියාත්මක කරමින් පවතින බව නිරීක්ෂණය විය.

2012 වර්ෂයේ සිට මොබිටෙල් (පුද්) සමාගම හරහා ක්‍රියාත්මක වූ මාර්ගගත ක්‍රමය ඔස්සේ වීසා නිකුත් කිරීමේ ක්‍රියාවලිය 2024 අප්‍රේල් 17 දක්වා ක්‍රියාත්මක වූ අතර එම කාලය තුළ මොබිටෙල් (පුද්) සමාගම ඒ සඳහා තෝරාගැනීම හා එම ආයතනය මගින් සපයනු ලැබූ සේවාව මෙන් ම ඒ සඳහා දෙපාර්තමේන්තුවට දැරීමට සිදු වූ පිරිවැය හා ඒ මගින් මොබිටෙල් සමාගම ලබාගත් ප්‍රතිලාභ මෙන් ම එම ක්‍රියාවලිය වර්තමානයට ගැළපෙන පරිදි වැඩිදියුණු කිරීමට ගෙන ඇති උත්සාහයන් මෙම විගණනයේ දී සැලකිල්ලට ගන්නා ලදී. එසේ ම ඒ අතරතුර GBS Technology Service & IVS Globle-FZCO, VF Worldwide Holding Ltd ආයතනය විසින් ඒකපාර්ශවිකව ඉදිරිපත් කළ යෝජනාව හා එය ඇගයීමට ලක්කිරීමේ ක්‍රියාවලිය හා ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීම මෙන් ම මෙම නව වීසා නිකුත්කිරීමේ ක්‍රියාවලිය තුළ මහජනයාට ලැබුණු සේවාවේ ගුණාත්මක බව හා දෙපාර්තමේන්තුවට ලැබිය යුතු වීසා ගාස්තුව නිවැරදිව විනිවිදභාවයකින් යුතුව ලබාගැනීමේ ක්‍රමවේදයන් පිළිබඳව පරීක්ෂා කිරීම ඇතුලු කරුණු මෙම වාර්තාව මගින් සාකච්ඡා කෙරේ.

පටුන


| අනු අංකය | විස්තරය | පිටු අංකය |
|---|---|---|
| **1** | හැදින්වීම | 01 |
| **1.1** | ආයතනික පසුබිම හා ස්වභාවය | 01 |
| **1.2** | අනුගමනය කරන ලද ක්‍රමවේදයන් | 01 |
| **1.3** | විෂය පථය හා විෂය පථය සීමාවීම | 02 |
| **1.4** | විගණන අධිකාරය | 03 |
| **2** | ක්‍රියාවලිය | 03 |
| **2.1** | ආයතනික පසුබිම | 03 |
| **2.2** | වීසා නිකුත් කිරීමට අදාළ වන නෛතික පසුබිම | 08 |
| **2.3** | විදෘුත් සංචරණ අනුමැතිය ක්‍රමවේදය මගින් වීසා නිකුත් කිරීමේ ආරම්භය | 10 |
| **2.4** | ශ්‍රී ලංකාවට පැමිණෙන සහ ශ්‍රී ලංකාවේ සංචාරය කරන විදේශිකයන්ගේ වීසා අයදුම්පත් විදෘුත් ගමන් අවසර පද්ධතිය හරහා ඉදිරිපත් කිරීම සඳහා බලයලත් නියෝජිතයින් පත්කිරීම | 15 |
| **2.5** | මාර්ගගත ක්‍රමය මගින් වීසා නිකුත්කිරීමේ ක්‍රමවේදය වැඩිදියුණු කිරීම | 17 |
| **2.6** | IVS – GBS Global Services ( Powered with UFS Global as a Technical Partner) ආයතනය විසින් 2023 ජූනි මාසයේදී (e –Visa, Consular Services, Visa Services, Bio Metric Services and Tourism Promotion) ඊ වීසා, කොන්සියුලර් සේවා, වීසා සේවා , ජීව දත්ත, සේවා හා සංචාරක ප්‍රවර්ධනය සඳහා ඒක පාර්ශවික යෝජනාවක් (Unsolicited Proposal) ඉදිරිපත් කිරීම | 29 |
| **3** | විගණන නිරීක්ෂණ | 60 |
| **4** | විගණන නිර්දේශ | 83 |
| | ඇමුණුම් | 85 |

## 1. හැඳින්වීම

### 1.1 ආයතනික පසුබිම හා ස්වභාවය

ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, 1948 අංක 20 දරන ආගාමික හා විගාමික පනත හා එහි සංශෝධනයන්ගේ ද, 1956 ආගාමික හා විගාමික පනතට අදාළව සැකසූ රෙගුලාසි හා එහි සංශෝධනයන්ගේ ද, පුරවැසිභාවය ප්‍රදානය කිරීමට අදාළ පනත්වල විධිවිධානයන් යටතේ ද ලද නෛතික අධිකාරිය මත ක්‍රියාත්මක වේ.

ජාතික ආරක්ෂාව තහවුරුවන සේ ශ්‍රී ලාංකීය පුරවැසියන් නොවන තැනැත්තන් මෙරටට ඇතුලුවීම හා පිටවීම විධිමත් කිරීම, මෙරට රැඳී සිටින ශ්‍රී ලාංකීය පුරවැසියන් නොවන තැනැත්තන්ගේ කටයුතු අධීක්ෂණය, ශ්‍රී ලාංකීය අනන්‍යතාවය විදේශයන්හිදී තහවුරුකිරීම සඳහා ශ්‍රී ලාංකිකයන්ගේ අවශ්‍යතාවය මත විදේශ ගමන් බලපත් නිකුත්කිරීම, විදේශිකයන් සඳහා වීසා බලපත්‍ර නිකුත්කිරීම හා විදේශයන්හි උපත ලබන ශ්‍රී ලාංකීය පුරවැසියන්ගේ දරුවන් සඳහා සහ මෙරට පුරවැසිභාවය ඉල්ලුම්කරන තැනැත්තන් සඳහා පුරවැසිභාවය ප්‍රදානය කිරීම මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරය වේ.

ආගමන හා විගමන දෙපාර්තමේන්තුව ජාතික ආදායම් උත්පාදනය කිරීමෙහිලා සැලකිය යුතු දායකත්වයක් ලබාදෙන දෙපාර්තමේන්තුවකි. ඒ අනුව 2024 වර්ෂය තුළදී රුපියල් බිලියන 38.01ක ආදායමක් ජාතික ආදායමට රැස්කරදීමට හැකියාව ලැබී තිබුණි.

### 1.2 අනුගමනය කරන ලද ක්‍රමවේදයන්

මෙම වාර්තාව සඳහා සාක්ෂි රැස්කිරීමේදී පහත සඳහන් ක්‍රමවේද අනුගමනය කරන ලදී.

#### 1.2.1 අණපනත් හා රෙගුලාසි

- ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
- 1948 අංක 20 දරන ආගාමික හා විගාමික පනත
- 1955 අංක 16 දරන ආගාමික හා විගාමික සංශෝධන පනත
- 1961 අංක 68 දරන ආගාමික හා විගාමික සංශෝධන පනත
- 1993 අංක 16 දරන ආගාමික හා විගාමික සංශෝධන පනත
- 1998 අංක 42 දරන ආගාමික හා විගාමික සංශෝධන පනත
- 2006 අංක 31 දරන ආගාමික හා විගාමික සංශෝධන පනත
- 2015 අංක 07 දරන ආගාමික හා විගාමික සංශෝධන පනත
- 2021 අංක 27 දරන ආගාමික හා විගාමික සංශෝධන පනත
- 1956 ආගාමික හා විගාමික නියෝග සහ ඊට අදාළ සංශෝධන
- ඉහත පනත්වලට අදාළ සියලුම රෙගුලාසි හා නියෝග
- ආගමන විගමන පාලක ජනරාල් විසින් නිකුත්කරනු ලබන චක්‍රලේඛ හා උපදෙස්

#### 1.2.2 ලිපිගොනු වාර්තා ආදිය පරීක්ෂා කිරීම

- ක්‍රියාවලියට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශ, සංදේශ සඳහා වූ නිරීක්ෂණ හා අමාත්‍ය මණ්ඩල තීරණ
- දෙපාර්තමේන්තුවෙන් ලබාගත් අදාළ ලිපිගොනු වාර්තා හා නෛතික ප්‍රතිපාදන ඇතුළත් ලිපිලේඛන පරිශීලනය

- මොබිටෙල් ආයතනයෙන් ලබාගත් ලිපිලේඛන පරීක්ෂාව
- තොරතුරු කැඳවීම මගින් ලබාගත් විස්තර පරීක්ෂාව

### 1.2.3 වගකිව යුතු පාර්ශවයන් සමග සාකච්ඡා පැවැත්වීම

## 1.3 විෂය පථය හා විෂය පථය සීමාවීම

### 1.3.1 විෂය පථය

2012 වර්ෂයේ සිට මොබිටෙල් (පුද්) සමාගම හරහා ක්‍රියාත්මක වූ මාර්ගගත ක්‍රමය ඔස්සේ වීසා නිකුත්කිරීමේ ක්‍රියාවලිය 2024 අප්‍රේල් 16 දක්වා ක්‍රියාත්මක වූ අතර එම කාලය තුළ මොබිටෙල් ආයතනය ඒ සඳහා තෝරාගැනීම හා එම ආයතනය මගින් සපයනු ලැබූ සේවාව මෙන් ම ඒ සඳහා දෙපාර්තමේන්තුවට දැරීමට සිදු වූ පිරිවැය හා ඒ මගින් මොබිටෙල් සමාගම ලබාගත් ප්‍රතිලාභ මෙන්ම එම ක්‍රියාවලිය වර්තමානයට ගැළපෙන පරිදි වැඩිදියුණු කිරීමට ගෙන ඇති උත්සාහයන් මෙම විගණනයේ දී සැලකිල්ලට ගන්නා ලදී. එසේ ම ඒ අතරතුර GBS Technology Service & IVS Globle -FZCO, VF Worldwide Holding Ltd ආයතනය විසින් ඒකපාර්ශවිකව ඉදිරිපත් කළ යෝජනාව හා එය ඇගයීමට ලක්කිරීමේ ක්‍රියාවලිය හා ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීම මෙන් ම මෙම නවවීසා නිකුත්කිරීමේ ක්‍රියාවලිය තුළ මහජනයාට ලැබුණු සේවාවේ ගුණාත්මක බව හා දෙපාර්තමේන්තුවට ලැබිය යුතු වීසා ගාස්තුව නිවැරදිව විනිවිදභාවයකින් යුතුව ලබාගැනීමේ ක්‍රමවේදයන් පිළිබඳව පරීක්ෂා කිරීම මෙම වාර්තාවේ විෂය පථය වේ. ඊට අමතරව මෙම ක්‍රමවේදය තුළ ආගාමික හා විගාමික පනත ඇතුළු ඒ සඳහා බල පැවැත්වෙන අනෙකුත් නීති රෙගුලාසි සහ රාජ්‍ය ප්‍රතිපත්තීන් කෙරෙහි ඇති කරන බලපෑම එම නීති රෙගුලාසි අනුව ඉහත සමස්ත ක්‍රියාවලිය සිදුකර තිබේ ද යන්න මෙහිදී ඇගයීමට ලක්කරන ලදී.

### 1.3.2 විෂය පථය සීමාවීම

2012 ජනවාරි 01 සිට වීසා නිකුත්කිරීමේ ක්‍රියාවලියට අදාළ මූලික තොරතුරු අදාළ ලිපිගොනු වාර්තා හා නෛතික ප්‍රතිපාදන ඇතුළත් ලිපිලේඛන පරිශීලනය කිරීමෙන් හා ඇතැම් වගකිව යුතු පාර්ශවයන්ගෙන් කරන ලද පැහැදිළි කිරීම් මගින් ලබාගන්නා ලදී. එහෙත් මෙම විගණනය සිදුකිරීමේදී පහත සඳහන් සීමාවන් යටතේ කිරීමට සිදුවිය.

- මෙම විදේශ ආයතනවල ලියාපදිංචිය පිළිබඳ විස්තර ලබාගැනීමට නොහැකිවීම.
- 2024 අප්‍රේල් 17 සිට 2024 අගෝස්තු 02 දක්වා කාලය තුළ විදේශ ආයතන යටතේ ලබාගත් වීසා ආදායම් විදේශ බැංකු ගිණුම් වෙත සෘජුව ප්‍රේෂණයකර තිබුණි. එම වීසා ආදායම් පිළිබඳ නිවැරදි වාර්තා දෙපාර්තමේන්තුව තුළ නොමැතිවීම හේතුවෙන් එම කාලය තුළ රැස්කර තිබූ වීසා ආදායමෙහි නිවැරදිභාවය පිළිබඳ තහවුරුකර ගත නොහැකි වීම.
- අදාළ පද්ධතිය විගණන කාලය තුළ ක්‍රියාත්මක තත්ත්වයේ නොපැවතීම නිසා එහි ක්‍රියාකාරිත්වය සහ නිමැවුම් දත්ත වැනි විස්තර ලබාගැනීමට නොහැකිවීම.

- ආගමන විගමන පාලක ජනරාල් හා මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ එවකට ලේකම් යන නිලධාරීන්ගෙන් මේ සඳහා අවශ්‍ය පැහැදිලිකිරීම් හා ප්‍රකාශ ලබාගැනීමට පැවති සීමාකාරී තත්ත්වයන්

- මෙම විෂය සම්බන්ධව එවකට කටයුතුකළ ඇතැම් නිලධාරීන් විශ්‍රාම ගෙන තිබීම හෝ ස්ථාන මාරුවීම් ලැබ තිබීම හා ආයතනයේ නිලධාරීන් විවිධ අංශ අතර මාරුකර තිබීම නිසා ඇතැම් තොරතුරු ලබාගැනීමේදී ගැටලු මතුවීම.

- මෙම විෂය ක්ෂේත්‍රය තොරතුරු තාක්ෂණය මූලික කරගත් ක්ෂේත්‍රයක් වූ බැවින් හා තාක්ෂණික ක්ෂේත්‍ර පිළිබඳ විශේෂඥ දැනුම ජාතික විගණන කාර්යාලය සතුව නොමැති බැවින් තාක්ෂණික කරුණු පිළිබඳ ගැඹුරින් අධ්‍යනයකළ නොහැකිවීම හා ඒ පිළිබඳ නිරීක්ෂණයන් හා නිර්දේශ ඉදිරිපත්කළ නොහැකිවීම.

**1.4 විගණන අධිකාරය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය සිදුකරන ලදී.

## 2. ක්‍රියාවලිය

### 2.1 ආයතනික පසුබිම

#### 2.1.1 ආගමන හා විගමන දෙපාර්තමේන්තුව පිහිටුවීම හා කාර්යභාරය

ආගමන හා විගමන දෙපාර්තමේන්තුව 1948 අංක 20 දරන ආගාමික හා විගාමික පනත හා එහි සංශෝධනයන්ගේ ද, 1956 ආගාමික හා විගාමික පනතට අදාළව සැකසූ රෙගුලාසි හා එහි සංශෝධනයන්ගේ පුරවැසිභාවය ප්‍රදානය කිරීමට අදාළ අණපනත්වල විධිවිධානයන් යටතේ ද ලද නෛතික අධිකාරිය මත ක්‍රියාත්මක වේ.

උක්ත පනතේ III කොටසෙහි **(ඇමුණුම 01)** ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන තැනැත්තන් ශ්‍රී ලංකාවට ඇතුළ්වීම පාලනය කිරීමට අදාළව අඩංගු විධිවිධාන අනුව ද පනතට අදාළව සම්පාදනය වූ 1956 ආගමන හා විගමන රෙගුලාසි අංක 02 සිට අංක 35 ප්‍රකාරව **(ඇමුණුම 02)** ජාතික ආරක්ෂාව තහවුරු වන පරිදි ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශිකයන් සඳහා මෙරට තුළ නීත්‍යානුකූලව රැඳී සිටීමට වලංගු වීසා බලපත්‍ර නිකුත්කිරීම හා වීසා දීර්ඝ කිරීම ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් ඉටුකරනු ලැබේ.

විවිධ අරමුණු යටතේ ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයන් සඳහා වීසා නිකුත්කිරීම සංචාරක වීසා, ව්‍යාපාරික වීසා, අධ්‍යයන වීසා හා වාස වීසා ආදී වශයෙන් වර්ග කිහිපයක් යටතේ සිදු කරනු ලබන අතර වීසා ගාස්තු හා වීසා නිදහස්කිරීම් ප්‍රතිපත්තිමය තීරණ මත වරින් වර වෙනස් කරනු ලබයි. වීසා අයදුම් කිරීම සඳහා ආගමන විගමන දෙපාර්තමේන්තුව විසින් ක්‍රමවේදයන් දෙකක් අනුගමනය කරන ලදී. 2012 වර්ෂයේ සිට මොබිටෙල් සමාගම සම්බන්ධවීමෙන් වීසා අයදුම්කිරීම සඳහා ETA (Electronic Travel Authorization) ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම

මගින් කෙටිකාලීන වීසා මාර්ගගත ක්‍රමය (Online Visa) ඔස්සේ වීසා නිකුත්කිරීම ආරම්භකර තිබුණි. කෙටිකාලීනව නිකුත්කරන වීසා, සංචාරක වීසා හා ව්‍යාපාරික වීසා වන අතර අනෙක් ක්‍රමය වනුයේ ගුවන්තොටුපළ පැමිණීමේ පර්යන්තයේ දී දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් On Arrival Visa නිකුත්කිරීම වේ. අධ්‍යයන වීසා හා වාස වීසා වැනි දිගුකාලීන වීසා හා විදේශ දූතමණ්ඩල වීසා නිකුත්කිරීම දෙපාර්තමේන්තුව විසින් පමණක් ඉටුකරමින් පැවතුණි.

### 2.1.2 දැක්ම, මෙහෙවර

**දැක්ම**

කලාපයේ ප්‍රමුඛතම ආගමන හා විගමන සේවාව බවට පත්වීම

**මෙහෙවර**

ජාතික ආරක්ෂාව හා සමාජ හර පද්ධතිය සුරක්ෂිත කිරීම සහ ආර්ථික සංවර්ධනයට ඉඩ ප්‍රස්ථා සලසමින්, රටින් බැහැරවන්නන් හා රටට ඇතුලුවන්නන් නියාමනය කිරීම හා පුරවැසි සේවා සැපයීම.

**අරමුණු**

- ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් ප්‍රධාන පාර්ශවකරුවෙක් ලෙස කටයුතුකිරීම.
- ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව නම් කරන ලද තොටුපළ හරහා නීත්‍යානුකූලව ඇතුලු වීම හා පිටවීම ඵලදායී ලෙස කළමනාකරණය කිරීම.
- ශ්‍රී ලාංකික අනන්‍යතාවය විදේශයන්හිදී තහවුරු කිරීම.
- සේවාලාභීන් සඳහා ගුණාත්මක හා කාර්යක්ෂම සේවාවක් සැපයීම තුළින් රාජ්‍ය සේවයේ විශිෂ්ඨතම රාජ්‍ය ආයතනය බවට පත්වීම.

**ප්‍රධාන කාර්යයන්**

- ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන තැනැත්තන් ශ්‍රී ලංකාවට ඇතුළ්වීම පාලනය කිරීම, පිටවීම විධිමත් කිරීම, මෙරට රැඳී සිටින ශ්‍රී ලාංකික පුරවැසියන් නොවන තැනැත්තන්ගේ කටයුතු අධීක්ෂණය සහ ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන නොමනා තැනැත්තන් රටින් ඉවත්කිරීම.
- ශ්‍රී ලාංකික පුරවැසියන් සඳහා විදේශ ගමන් බලපත් නිකුත්කිරීම
- විදේශිකයන් සඳහා වීසා බලපත් නිකුත්කිරීම හා දීර්ඝකිරීම.
- ශ්‍රී ලාංකික පුරවැසිභාවය ප්‍රදානය කිරීම හා ඊට ආනුශාංගික කාර්යයන්.
- ද්විත්ව පුරවැසිභාවය ප්‍රදානය කිරීම හා ඊට ආනුශාංගික කාර්යයන්.

### 2.1.3 කාර්ය මණ්ඩල තොරතුරු

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩල විස්තර පහත පරිදි වේ.

වගු අංක 1 - කාර්ය මණ්ඩල විස්තර

| සේවා මට්ටම | අනුමත තනතුරු සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 68 | 55 | 13 |
| තෘතීයික | 531 | 438 | 93 |
| ද්විතීක | 564 | 444 | 120 |
| ප්‍රාථමික | 159 | 140 | 19 |
| **මුළු එකතුව** | **1322** | **1077** | **245** |

**2.1.4 අමාත්‍යාංශ වෙනස්වීම් හා ප්‍රතිපාදන වෙන්කිරීම්**

**2.1.4.1** 2015 සැප්තැම්බර් 21 දිනැති අංක 1933/13 දරන ගැසට් නිවේදනය **(ඇමුණුම 03)** අනුව අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශ විෂය පථය යටතට ද, 2020 අගෝස්තු 09 දිනැති අංක 2187/27 දරන ගැසට් නිවේදනය **(ඇමුණුම 04)** අනුව ආරක්ෂක අමාත්‍යාංශ විෂය පථය යටතට ද, 2022 ජූලි 22 දිනැති අංක 2289/43 **(ඇමුණුම 05)** දරන ගැසට් නිවේදනය මගින් ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශ විෂය පථය යටතට සහ 2022 ඔක්තෝම්බර් 05 දිනැති අංක 2300/24 දරන ගැසට් නිවේදනය **(ඇමුණුම 06)** මගින් මහජන ආරක්ෂක අමාත්‍යාංශ විෂය පථය යටතට ද ලෙස වරින් වර ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විවිධ අමාත්‍යාංශ විෂය පථය යටතට පත්කර තිබුණි.

**2.1.4.2** ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ අරමුණු හා කාර්යයන් ඉටුකිරීම වෙනුවෙන් පසුගිය වර්ෂ 05ක ජාතික අයවැය මගින් වෙන්කළ ප්‍රතිපාදන හා එම ප්‍රතිපාදන වියදම් වී ඇති ආකාරය පිළිබඳ විස්තර පහත පරිදි වේ.

**වගු අංක 2 -** ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සඳහා ජාතික අයවැය මගින් පසුගිය වර්ෂ **5** තුළදී වෙන්කළ ප්‍රතිපාදන හා එම ප්‍රතිපාදන උපයෝජනය කළ ආකාරය

| වර්ෂය | වියදම් වර්ගය | මුල් ප්‍රතිපාදනය රු. | ශුද්ධ ප්‍රතිපාදනය රු. | ප්‍රතිපාදන වෙනස රු. | වියදම රු. | ඉතිරිය රු. | ඉතිරිය, ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස (%) |
|---|---|---|---|---|---|---|---|
| **2020** | පුනරාවර්තන | 1,594,760,000 | 1,594,760,000 | - | 1,542,029,090 | 52,730,910 | 3 |
| | ප්‍රාග්ධන | 780,900,000 | 780,900,000 | - | 735,306,965 | 45,593,035 | 6 |
| **2021** | පුනරාවර්තන | 1,927,302,000 | 1,927,302,000 | - | 1,712,254,824 | 215,047,176 | 11 |
| | ප්‍රාග්ධන | 1,210,500,000 | 1,210,500,000 | - | 963,079,643 | 247,420,357 | 20 |
| **2022** | පුනරාවර්තන | 2,017,310,000 | 2,017,310,000 | - | 2,006,816,401 | 10,493,599 | 1 |
| | ප්‍රාග්ධන | 1,805,500,000 | 1,805,500,000 | - | 1,518,675,446 | 286,824,554 | 16 |
| **2023** | පුනරාවර්තන | 2,894,000,000 | 2,819,900,000 | (74,100,000) | 2,232,895,536 | 496,004,464 | 18 |
| | ප්‍රාග්ධන | 2,332,000,000 | 2,906,100,000 | 574,100,000 | 2,695,939,722 | 210,160,278 | 7 |
| **2024** | පුනරාවර්තන | 2,571,500,000 | 2,650,865,000 | 79,365,000 | 2,382,594,313 | 268,270,687 | 10 |
| | ප්‍රාග්ධන | 2,436,000,000 | 2,596,440,000 | 160,440,000 | 2,285,162,159 | 311,277,841 | 12 |

### 2.1.5 ආගමන විගමන දෙපාර්තමේන්තුව විසින් වීසා නිකුත්කිරීමේ ක්‍රමවේදය

1949 වසරේ ආගමන විගමන දෙපාර්තමේන්තුව ස්ථාපිත කිරීමෙන් පසුව මෙරටට පැමිණෙන සංචාරකයන්ට වීසා පහසුකම් සාමාන්‍ය පරිදි ලිපිලේඛන පරීක්ෂා කිරීමෙන් අනතුරුව ලබා දී තිබූ අතර 1949 වසරේ සිට 2012 වසර දක්වා රටවල් කිහිපයක් හැර විදේශ සංචාරකයන්ගෙන් වීසා ගාස්තු අයකිරීමක් සිදුකර නොතිබුණි.

#### 2.1.5.1 වීසා ගාස්තු සංශෝධනය කිරීම

(අ) 2012 ජනවාරි 01 දින සිට 2024 අගෝස්තු 17 දක්වා කාල පරිච්ඡේදය තුළ 2012 ජනවාරි 25 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය **(ඇමුණුම 07)** හා 2021 අගෝස්තු 18, 2023 නොවැම්බර් 27 හා 2024 මැයි 17 දිනැති ගැසට්පත්‍ර මගින් අවස්ථා 04ක දී වීසා ගාස්තු සංශෝධනයකර තිබුණි.

(ආ) මොබිටෙල් සමාගම හරහා මාර්ගගත ක්‍රමයට වීසා නිකුත්කිරීම ආරම්භකළ පසු 2012 ජනවාරි 01 සිට 2021 අගෝස්තු 18 දින දක්වා දින 90 කට අඩු කාලයක් සඳහා සාක් රටවලින් එ.ජ. ඩොලර් 10ක් ද, සාක් නොවන රටවලින් එ.ජ. ඩොලර් 20ක් ද ලෙස වීසා ගාස්තු අයකර තිබුණි.

(i) 2021 අගෝස්තු 18 දිනැති අංක 2241/37 දරන ගැසට් පත්‍රය **(ඇමුණුම 08)** මගින් දින 30ක් දක්වා ගාස්තු මාර්ගගත ක්‍රමය (Online) හා පැමිණීමේ පර්යන්තයේ දී (Onarrival) ලෙස සාක් රටවල් හා සාක් නොවන රටවල් සඳහා සංචරණ වීසා හා ව්‍යාපාරික වීසා ලෙස පහත වගුවේ සඳහන් පරිදි ගාස්තු අයකර තිබුණි. තව ද මෙම ගැසට් පත්‍රය යටතේ සාක් නොවන රටවල් සඳහා දින 31 සිට 180 දක්වා එ.ජ. ඩොලර් 100 ක් අයකර තිබුණි.

**වගු අංක 3 – 2241/37 දරන ගැසට් පත්‍රය අනුව වීසා ගාස්තු අයකිරීම්**

| රටවල් කාණ්ඩය | වීසා වර්ගය | Online<br>එ.ජ.ඩො. | On arrival<br>එ.ජ.ඩො. |
|---|---|---|---|
| සාක් රටවල් | සංචාරක වීසා | 20 | 25 |
| | ව්‍යාපාරික වීසා | 30 | 40 |
| සාක් නොවන රටවල් | සංචාරක වීසා | 35 | 40 |
| | ව්‍යාපාරික වීසා | 40 | 50 |

(ii) 2023 නොවැම්බර් 27 දිනැති අංක 2360/24 දරන ගැසට් පත්‍රය **(ඇමුණුම 09)** මගින් දින 30 ක් දක්වා සංචරණ වීසා සඳහා ඉන්දියාව හැර සාක් රටවල් සඳහා හා සාක් නොවන රටවල් සඳහා පහත පරිදි ගාස්තු අයකර තිබුණි.

**වගු අංක 4 - 2360/24 දරන ගැසට් පත්‍රය අනුව වීසා ගාස්තු අයකිරීම්**

| රටවල් කාණ්ඩය | වීසා වර්ගය | දින 30ක් දක්වා | | දින 31ත් 180 දක්වා |
|---|---|---|---|---|
| | | **Online** **එ.ජ.ඩො.** | **On arrival** **එ.ජ.ඩො.** | **Online/ On arrival** **එ.ජ.ඩො.** |
| සාක් රටවල් | සංචාරක වීසා | 20 | 25 | 35 |
| | ව්‍යාපාරික වීසා | - | - | 35 |
| සාක් නොවන රටවල් | සංචාරක වීසා | 35 | 40 | 75 |
| | ව්‍යාපාරික වීසා | - | - | 75 |

(iii) තව ද 2023 නොවැම්බර් 27 දිනැති ගැසට් පත්‍රයට අනුව චීනය, ඉන්දියාව, ඉන්දුනීසියාව, ජපානය, මැලේසියාව, රුසියාව, තායිලන්තය යන රටවල් 07 සඳහා 2024 මාර්තු 31 දක්වා සංචාරක වීසා ගාස්තුවලින් නිදහස්කර තිබුණි. 2024 අප්‍රේල් 16 දිනැති පාලක ජනරාල්ගේ අංක DIE/VISA/01/18(i) දරන ලිපිය **(ඇමුණුම 10)** මගින් නිදහස් කාලය 2024 අප්‍රේල් 30 දක්වා දීර්ඝකර ඇති බවට විගණනයේ දී හෙළිදරව් විය. මෙලෙස දීර්ඝ කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල පූර්ව අනුමැතියක් ලබාගෙන නොතිබූ අතර 2024 මැයි 17 දිනැති ගැසට් පත්‍රය මගින් 2024 අප්‍රේල් 30 දක්වා පසුදාතමකර ගාස්තු නිදහස් කාලය දීර්ඝකර තිබුණි.

(ඇ) වීසා නිකුත්කිරීමේ කටයුතු නව සමාගමට ලබාදීමෙන් පසුව නැවත 2024 මැයි 17 දිනැති අංක 2384/42 ගැසට් පත්‍රය **(ඇමුණුම 11)** මගින් පහත පරිදි චෙක් ජනරජය, මාලදිවයින, සීෂේල්ස් සහ සිංගප්පූරුව හැර වෙනත් රටවල් සඳහා මාර්ගගත ක්‍රමය (Online) හා පැමිණීමේ පර්යන්තයේදී (On arrival) ගාස්තුව දින 30ක කාලයක් සඳහා එ.ජ. ඩොලර් 50ක් දක්වා වැඩිකර තිබූ අතර දින 31ත් 180 ත් අතර කාලයක් සඳහා වන ගාස්තුව එ.ජ. ඩොලර් 35ක් ලෙස දක්වා තිබුණි.

**වගු අංක 5 - 2384/42 දරන ගැසට් පත්‍රය අනුව වීසා ගාස්තු අයකිරීම්**

| රටවල් කාණ්ඩය | වීසා වර්ගය | දින 30ක් දක්වා | දින 31ත් 180 දක්වා |
|---|---|---|---|
| | | Online/On arrival **එ.ජ.ඩො.** | Online/On arrival **එ.ජ.ඩො.** |
| චෙක් ජනරජය, මාලදිවයින, සීෂේල්ස්, සිංගප්පූරුව හැර වෙනත් රටවල් | සංචාරක | 50 | - |
| මාලදිවයින හැර සාක් රටවල් | සංචාරක | - | 35 |
| සාක් රටවල්, චෙක් ජන රජය, සීෂේල්ස්, සිංගප්පූරුව හැර අනෙකුත් රටවල් | සංචාරක | - | 75 |

(ඈ) මාලදිවයින හැර සාක් රටවල් හා සාක් රටවල්, චෙක් ජනරජය, සීෂේල්ස්, සිංගප්පූරුව හැර අනෙකුත් රටවල් සඳහා සංචරණ වීසා ගාස්තු දින 1 සිට 180 දක්වා මාස 03ක් සඳහා පිළිවෙලින් එ.ජ. ඩොලර් 35ක් හා එ.ජ. ඩොලර් 75ක් ලෙස එක ගාස්තුවක් අයකළ හැකි පරිදි ගාස්තු සංශෝධනයකර තිබුණි. එහි වරහන් තුළ "එක් එක් රැඳී සිටීම දින 60ක් දක්වා සීමා වේ" යනුවෙන් දක්වා තිබුණි.

(ඉ) 2024 මැයි 17 දිනැති ගැසට් නිවේදනය මගින් සංශෝධනය කරන ලද වීසා ගාස්තුව අයකළ යුතු ආකාරය පිළිබඳ VFS Global ආයතනය දැනුවත්කරන ලෙස ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ පාලක ජනරාල්වරයා විසින් 2024 මැයි 30 දිනැති අංක DIE/Visa/01/18(1) දරන පාලක (තොරතුරු තාක්ෂණ) අමතන ලද ලිපිය **(ඇමුණුම 12)** මගින් දන්වා තිබුණි.

**2.2 වීසා නිකුත්කිරීමට අදාළ වන නෛතික පසුබිම**

ජාතික ආරක්ෂාව තහවුරු වන පරිදි ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශිකයන්ට මෙරට නීත්‍යානුකූලව රැඳී සිටීම සඳහා වලංගු වීසා බලපත් නිකුත්කිරීම හා වීසා කාලය දිර්ඝකිරීම 1948 අංක 20 දරන ආගාමික හා විගාමික පනතේ III කොටස පරිදි පනතට අදාළව සම්පාදනය වූ 1956 ආගමන හා විගමන රෙගුලාසි අංක 02 සිට අංක 35 දක්වා නියමයන් බලපවත්වනු ලබයි .

**2.2.1 වීසා නිකුත්කිරීමට අදාළ ප්‍රධාන ප්‍රතිපාදන කිහිපයක් පහත පරිදි වේ.**

(අ) අංක 16/1955, 68/1961, 16/1993, 42/1998, 31/2006, 07/2015 හා 27/2021 දරන සංශෝධිත පනත් මගින් සංශෝධිත 1948 අංක 20 දරන ආගාමික හා විගාමික පනත මගින් පුරවැසියන් නොවන තැනැත්තන් ඇතුළ්වීම පාලනයකිරීම, පිටවීම විධිමත් කිරීම, නොමනා තැනැත්තන් ඉවත්කිරීම සඳහා විධිවිධාන සැලසීම සඳහා ප්‍රතිපාදන සලසා ඇත.

(ආ) මේ යටතේ අදාළ වන තැනැත්තන්, ස්ථාන, කාර්ය මණ්ඩලය හා පරිපාලනය, වලංගු බලපත්‍ර හා නියෝග යටතේ ලබාදෙන වීසා පත්‍ර, ඒ තැනැත්තන් අධීක්ෂණය, සාමාන්‍ය විධිවිධාන නියමයන් සහ නියෝග පැනවීමේ පරිපාටි ඇතුළත් වී ඇත.

(ඇ) පනතේ පළමුවන හා දෙවන වගන්ති මගින් නිදහස් පුද්ගලයන් නම් කිරීමේ නියමයන් ඇතුළත් කර ඇති අතර 10 වගන්තිය මගින් වලංගු විදේශ ගමන් බලපත්‍රය හා 52 වගන්තිය යටතේ වූ පරිපාටි මගින් අනුමත නියෝගවලට යටත්ව වීසා බලපත්‍ර නිකුත්කිරීමේ විධිවිධාන සලසා ඇත.

(ඈ) මෙම පනතේ බලතල හා කාර්යයන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නියමයන් හා නියෝග විවිධ වගන්ති යටතේ දක්වා ඇති අතර 23 වන වගන්තිය යටතේ වීසා අයදුම්කිරීම හා ඊට අනුශාංගික ක්ෂේත්‍ර ඇතුළු නියෝග ලබාදිය යුතු විෂයන් මොනවා ද යන්න සඳහන් නොවේ. ඒ අනුව වීසා අයදුම්කිරීම, ගාස්තු ගෙවීම ආදී අනුශාංගික කරුණුවලට අදාළ නියෝග බල සහිත වීම සඳහා එකී නියෝග පාර්ලිමේන්තුව මගින් අනුමතකර, එකී අනුමතකිරීම පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළකළ යුතු ය.

(ඉ) අංක 1739/19 හා 2012 ජනවාරි 05 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය **(ඇමුණුම 13)** මගින් පනතේ 2 වන වගන්තිය යටතේ වූ වීසා නිදහස්කිරීම් සම්බන්ධ පහත නියමයන් ප්‍රකාශයට පත්කර තිබුණි.

(i) මේ දක්වා විවිධ අවස්ථාවලදී අමාත්‍යවරයා විසින් කරන ලද නියමයන් මගින් ශ්‍රී ලංකා රජය විසින් විවිධ රටවල පුරවැසියන්ට නිර්ව්‍යාජ සංචාරකයන් හෝ ව්‍යාපාරිකයන් වශයෙන් ශ්‍රී ලංකාවට ඇතුළ් වී මසක් නොඉක්ම වන කාලයක් ශ්‍රී ලංකාවේ රැඳී සිටීම සඳහා වීසා බලපත්‍රයක් සතුව තිබීම යන නියමයෙන් නිදහස්කිරීම 2012 ජනවාරි 01 දින සිට බලපවත්වන පරිදි මෙයින් අවලංගු කෙරේ.

(ii) එසේ වුව ද, දැනට රටට ඇතුළ්වීමේදී වීසා ලබාගැනීමෙන් නිදහස්කිරීමේ පහසුකම ශ්‍රී ලාංකීක නිර්ව්‍යාජ සංචාරකයන්ට හෝ ව්‍යාපාරිකයන්ට ලබා දී ඇති රටවල්වල පුරවැසියන් නිර්ව්‍යාජ සංචාරකයන් හෝ ව්‍යාපාරිකයන් වශයෙන් ශ්‍රී ලංකාවට ඇතුළ්වීමේදී වීසා ලබාගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස්කිරීම තවදුරටත් ක්‍රියාත්මක වේ.

(iii) ශ්‍රී ලංකා රජය සමග රාජකාරී හා රාජ්‍යතාන්ත්‍රික ගමන් බලපත්‍රධාරීන් සම්බන්ධයෙන් දැනට ක්‍රියාත්මක වන ද්වීපාර්ශවික ගිවිසුම් හරහා එකඟත්වයට පැමිණ ඇති වීසා සම්බන්ධයෙන් වන විධිවිධාන තවදුරටත් අදාළ ගිවිසුම් ප්‍රකාරව ක්‍රියාත්මක වේ.

(iii) ඉහත (ii), (iii) වගන්තිවලින් ආවරණය නොවන සියලුම රටවල පුරවැසියන් කෙටිකාලීන අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකාවට පැමිණීමේ දී 2012 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සංචරණය සඳහා වූ විද්‍යුත් අනුමැතිය (Electronic Travel Authority) ක්‍රමය මගින් වීසා සඳහා පූර්ව අනුමැතිය ලබාගෙන ශ්‍රී ලංකාවට පැමිණිය යුතුය.

**2.2.2** විද්‍යුත් සංචරණ අනුමැතිය ( Electronic Travel Authority – ETA) ක්‍රමය 2012 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මකකිරීම අංක 1739/19 දරන ඉහත ගැසට් පත්‍රයේ පළකිරීම අනුව සිදුකර තිබුණි. ආගාමික හා විගාමික පනතේ 10 වන හා 23 වන වගන්ති යටතේ වීසා සම්බන්ධයෙන් නිකුත්කළ යුතු වූ නියෝග ද 1956 ආගාමික හා විගාමික නියෝග මගින් දක්වා තිබුණි. ආගාමික හා විගාමික නියෝග අංක 4 යටතේ වීසා පත්‍ර පන්ති වෙන් වෙන්ව දක්වා තිබුණු අතර 5 වන වගන්තිය යටතේ වීසා බලපත්‍ර දීමේ, නිකුත්කිරීමේ හෝ දීර්ඝ කිරීමේ කාර්යයන් සඳහා ‘‘නියමිත බලධරයන්’’ නම් කර තිබූ අතර අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය 6 වන වගන්තියේ සිට 10 වන නියෝගය දක්වා ඇතුළත්කර තිබුණි. තව ද 10 වන වගන්තියේ වීසා දීම හෝ නිකුත්කිරීමේ පූර්ව කොන්දේසියක් වශයෙන් ඇප තැබීම සඳහා ‘‘වීසා පත්‍රය ඉල්ලුම්කරුට හෝ ඔහු වෙනුවෙන් නියමිත බලධරයා විසින් අනුමත කරනු ලබන තැනැත්තෙකුට නියම කළ හැකි ය’’ යන්න දක්වා තිබුණි.

**2.3 විද්‍යුත් සංචරණ අනුමැතිය ක්‍රමවේදය මගින් වීසා නිකුත්කිරීමේ ආරම්භය**

**2.3.1 අන්තර්ජාලය ඔස්සේ පහසුවෙන් වීසා නිකුත්කිරීමේ විද්‍යුත් ක්‍රමවේදයක් ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ස්ථාපිත කිරීම සඳහා වූ අමාත්‍ය මණ්ඩල අනුමැතිය**

**(අ) අමාත්‍ය මණ්ඩල සංදේශය/පත්‍රිකාව ඉදිරිපත් කිරීම**

ශ්‍රී ලංකාවට පැමිණෙන හා ශ්‍රී ලංකාව හරහා ගමන් කරන විදේශිකයන් උදෙසා අන්තර්ජාලය ඔස්සේ පහසුවෙන් වීසා නිකුත්කිරීමේ විද්‍යුත් ක්‍රමවේදයක් ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ස්ථාපිත කිරීම යන මැයෙන් වූ අංක MOD/VISA/IE/CAB/e-VISA දරන අමාත්‍ය මණ්ඩල සංදේශය 2011 මැයි මස 09 දින අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත්කර තිබුණි. **(ඇමුණුම 14)** 1948 අංක 20 දරන ආගාමික හා විගාමික පනතෙහි කාර්යන් ඉටු කිරීමේ අධිකාරී බලය ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට පැවරී ඇති බවත්, එම පනතට විටින් විට පනවන ලද නියෝග අනුව ලෝකයේ රටවල් 78කින් ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශිකයන් සඳහා ගොඩබැසීමේ තොටුපළේදී දින 30ක සංචාරක වීසාවක් නොමිලයේ නිකුත්කරනු ලබන බවත්, ශ්‍රී ලාංකිකයන්ට මාලදිවයින හා සිංගප්පුරුව හැර අනෙක් රටවල් 76 ට ඇතුළු වීමට එවැනි පහසුකමක් සලසා නොමැති බවත් එහි දක්වා තිබුණි. තව ද, උක්ත දින 30ක කාලය ඉක්මවා තවදුරටත් දිවයිනේ රැඳී සිටීමට අපේක්ෂා කරන සංචාරකයන්හට වීසා කාලය අවසන්වීමට පෙර ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයට පැමිණ වීසා ගාස්තුව ගෙවා වීසා කාලය දීර්ඝකර ගත යුතු බවත් ඉහත රටවල් 78ට අයත් නොවන රටවලින් පැමිණෙන සංචාරකයන් ශ්‍රී ලංකාවට පැමිණීමට පෙර එම රටවල ශ්‍රී ලංකා දූතමණ්ඩල කාර්යාල හරහා වීසා අනුමතකර ගත යුතු බවත් දක්වා තිබුණි.

**(ආ) අමාත්‍ය මණ්ඩල සංදේශයේ/පත්‍රිකාවේ ඇතුළත් අදහස් දැක්වීම්**

(i) අංක අමප/10/විවිධ(009-I) හා 2010 අගෝස්තු 26 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මෙරටට පැමිණෙන විදේශිකයන්ට අවහිරතාවයකින් තොරව ශ්‍රී ලංකා දූත මණ්ඩල කාර්යාලවලින් හා කොන්සියුලර් ජනරාල් කාර්යාලවලින් වීසා ලබාගැනීම සඳහා අවශ්‍ය විධිවිධාන සකස්කොට ඉදිරිපත්කිරීම සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පත්කරන ලද කමිටුව අනුව එහි සාමාජික ආගමන හා විගමන පාලක ජනරාල් විසින් ලෝකයේ වෙනත් රටවල වීසා ක්‍රමවේදයන් අධ්‍යනය කිරීමෙන් පසු ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශිකයන් සඳහා වීසා නිකුත්කිරීමට නව ක්‍රමවේදයක් යෝජනාකර ඇති බව.

(ii) ඒ අනුව ශ්‍රී ලංකාවට පැමිණෙන සියලුම විදේශිකයන් සඳහා වීසා ලබාගැනීමට පූර්වයෙන් ඉල්ලුම්කළ යුතු අතර ඒ සඳහා ගාස්තු ක්‍රමයක් ද සකස්කොට ඇති බව හා මේ මගින් ශ්‍රී ලංකාවේ විදේශ විනිමය හා අදායම් ඉහළ යන අතර විදේශිකයන් ශ්‍රී ලංකාවට ගොඩ බැසීමට පෙර ඔවුන් පිළිබඳ තොරතුරු දෙපාර්තමේන්තුව වෙත ලබාගැනීමේ අවස්ථාවක් ද උදා වන බව.

(iii) මෙම ක්‍රමවේදය අනුව ලෝකයේ සියලුම රටවල පුරවැසියන්ට පෞද්ගලිකවම ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය මගින් වීසා ඉල්ලුම්කිරීමේ සිට මුදල් ගෙවීම දක්වා සියලු කටයුතුකර ගැනීමේ හැකියාව ලැබෙන බව. එසේම එවැනි පෞද්ගලික පහසුකම් නොමැති අයට මේ සඳහා ස්ථාපිත කිරීමට අපේක්ෂිත පෞද්ගලික නියෝජිත ආයතන මගින් ද, ශ්‍රී ලංකා විදේශ දූතමණ්ඩල කාර්යාල මගින් ද, ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාල මගින් ද වීසා ඉල්ලුම්කළ හැකි බව. මේ තුළින් ශ්‍රී ලංකාවේ අභිමානය, අනන්‍යතාවය තහවුරුවීමක් සිදුවන අතර සංචාරකයන්ට වීසා ලබා ගැනීමේ පහසු ක්‍රමවේදයක් ද සකස්වනු ඇති බව.

(iv) යෝජිත ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමේදී දැනටමත් වීසා නිකුත්කරන ක්‍රමය පරිගණකගත කර ඇති ඉන්ෆොමැටික්ස් ඉන්ටනැෂනල් ආයතනය මගින් අදාළ සේවය ලබාගත හැකි අතර, මුදල් අයකිරීමේ ක්‍රමවේදය ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන නියෝජිතායතනය (ICTA) මගින් ඉටුකර දීමට එකඟතාවය පළකර ඇති බව. වෙබ් අඩවි නිර්මාණය හා පවත්වා ගෙන යාම දැනටමත් අදාළ සන්නිවේදන පහසුකම් ඇති ශ්‍රී ලංකා ටෙලිකොම්හි අනුබද්ධ ආයතනයක් වන මොබිටෙල් පුද්ගලික සමාගම මගින් ඉටුකර දීමටත් ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ දෘඩාංග ස්ථානගතකර පවත්වා ගෙන යාමටත් එකඟතාව පළකර ඇති බව හා ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ වත්මන් වෙබ් අඩවිය ද පවත්වා ගෙන යනු ලබන්නේ ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ අනුග්‍රහයෙන් බව. ඒ අනුව පරිගණක මෘදුකාංග හා දෘඩාංගවල සුරක්ෂිතතාවය හා ආරක්ෂිතභාවය පිළිබඳ වඩා විශ්වාසදායී තත්ත්වයක් ඇති වන බව ද නිරීක්ෂණය කළ හැකි බව.

**(ඇ) සංදේශය මගින් අමාත්‍ය මණ්ඩල අනුමැතිය අපේක්ෂිත වූ නිර්දේශ**

(i) ශ්‍රී ලංකාවට පැමිණෙන හා ශ්‍රී ලංකාව හරහා ගමන් කරන විදේශිකයන් උදෙසා අන්තර්ජාලය ඔස්සේ පහසුවෙන් වීසා නිකුත්කිරීමේ විද්‍යුත් ක්‍රමවේදයක් ආගමන හා විගමන දෙපාර්තමේන්තුව මගින් ස්ථාපිත කිරීමටත්,

(ii) ඉහත ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම සඳහා යෝජිත ව්‍යාපෘතිය සැලසුම්කිරීම හා පිරිවිතර සකස්කිරීම ආදී කරුණු ඇතුළත් වන තාක්ෂණික උපදේශන සේවා මොරටුව විශ්වවිද්‍යාලයේ පරිගණක විද්‍යා හා ඉංජිනේරු දෙපාර්තමේන්තුව වෙතින් ලබා ගැනීමටත් ඒ සඳහා තාක්ෂණික උපදේශන සේවා ගාස්තු ලෙස රුපියල් ලක්ෂ 19ක් එම ආයතනය වෙත ගෙවීමටත්,

(iii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.5.1(ඇ)iii වගන්තිය **(ඇමුණුම 15)** අනුව ප්‍රසම්පාදන ක්‍රියාමාර්ග අනුගමනය කරමින් අදාළ සේවා සපයන්නන් වන ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA), මොබිටෙල් පුද්ගලික සමාගම හා ඉන්ෆොමැටික්ස් ආයතනයන්ගෙන් යෝජනා කැඳවීමටත්,

(iv) මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මකකිරීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් රු. මිලියන 85ක ප්‍රතිපාදන වෙන්කිරීමටත්,

**(ඇ)** අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සඳහා ඉහත"(අ)"හි සඳහන් 2011 මැයි 26 දිනැති අංක PFD/PMD/CM/2011/118 දරන ලිපිය මගින් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයා විසින් ඉහත"(ඇ)" හි සඳහන් නිර්දේශ සඳහා එකඟවන බවට නිරීක්ෂණ ලබා දී තිබුණි.**(ඇමුණුම 16)**

**(ඉ) අමාත්‍ය මණ්ඩල තීරණය**

2011 මැයි 25 දිනැති අංක අමප/11/1100/503/062 දරන අමාත්‍ය මණ්ඩල තීරණය **(ඇමුණුම 17)** මගින් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවේ සඳහන් නිර්දේශ සඳහා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයා විසින් ලබා දී තිබූ නිරීක්ෂණවලට යටත්ව අනුමැතිය ලබා දී තිබුණි.

**(ඊ)** 2012 ජනවාරි 05 දිනැතිව නිකුත් කරන ලද අංක 1739/19 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ නියමයන් මගින් 2012 ජනවාරි 01 දින සිට විදුයුත් සංචරණ වීසා ක්‍රමය ක්‍රියාත්මක කරන බවට නියමකර තිබුණි.

ඒ අනුව විදුයුත් සංචරණ වීසා ක්‍රමය ක්‍රියාත්මකකිරීම සඳහා 2012 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි 2012 අගෝස්තු 28 දින මොබිටෙල් සමාගම සමග වර්ෂ එකක කාලයක් සඳහා ගිවිසුමකට එළැඹ තිබුණි. **(ඇමුණුම 18)** ඉන්පසු අවස්ථා දොළහකදී ගිවිසුමේ කාලය වර්ෂය බැගින් දීර්ඝකර තිබූ අතර අවසාන දීර්ඝකිරීම 2024 අප්‍රේල් 03 දින,2023 ජනවාරි 01 සිට 2023 දෙසැම්බර් 31 දක්වා වන වර්ෂයට අදාළ පරිදි සිදුකර තිබුණි **(ඇමුණුම 19).** 2024 ජනවාරි 01 දිනෙන් පසු කාලය සඳහා වූ ගිවිසුම නීතිපතිගේ නිෂ්කාශනය සඳහා යොමුකර ඇති බව විගණනය වෙත ප්‍රකාශ කරන ලදී.

**2.3.2** මෙම ක්‍රමවේදය ආරම්භකරන විට විදුයුත් සංචරණ අනුමැතිය ලබාදීමට ගැළපෙන පද්ධතියක් නිර්මාණය හා ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් තාක්ෂණික දැනුමක් සහිත පුද්ගලයන් ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සතුව නොමැති බව විගණනයට පැහැදිලිකර තිබූ අතර එකී පද්ධතිය හා බැඳුණු Call Center පහසුකම ද දෙපාර්තමේන්තුව තුළින් ලබාගත නොහැකි වී තිබුණි.

**2.3.3** 2012 වනවිටත් ඇමෙරිකා එක්සත් ජනපදය, කැනඩාව, ජපානය, ඔස්ට්‍රේලියාව වැනි ලෝකයේ බොහෝ රටවල් මෙම ක්‍රමය ක්‍රියාත්මකකරමින් පැවතුණි. විශේෂයෙන් ම ඔස්ට්‍රේලියාව අනුගමනය කරන ක්‍රමවේදය මෙහිදී ආදර්ශයට ගෙන තිබූ අතර 2012 වර්ෂයේදී ශ්‍රී ලංකාව දකුණු ආසියාවේ පළමු වරට වීසා නිකුත්කිරීමේදී මෙම විදුයුත් සංචරණ අනුමැතිය හඳුන්වා දෙන ලද රාජ්‍යය වී තිබුණි.

**2.3.4** මෙම ක්‍රමය යටතේ විද්‍යුත් සංචරණ අනුමැතිය www.eta.gov.lk යන වෙබ් අඩවිය මගින් ඉල්ලුම්කර ඒ අනුව දින 30ක් සඳහා කෙටිකාලීන වීසා බලපත්‍ර ලබාගැනීමේ හැකියාව විදේශිකයන්ට හිමි වූ අතර ඒ මගින් විද්‍යුත් සංචරණ තොරතුරු ලබාගැනීම සඳහා වෙබ් අඩවිය ජාත්‍යන්තර භාෂා 09කින් (ඉංග්‍රීසි, ප්‍රංශ, ස්පාඤ්ඤ, ජර්මානු, චීන, රුසියානු, හින්දි, ජපන් හා අරාබි) භාවිතාකිරීමේ පහසුකම ද අයදුම්කරුවන්ට සපයා දී තිබුණි.

**2.3.5** මොබිටෙල් ආයතනය මගින් 2012 වසරේ සිට 2024 අප්‍රේල් 17 දින දක්වාත් 2024 අගෝස්තු 03 සිට මෙම වාර්තාවේ දිනය දක්වාත් මෙම සේවාවන් ලබාදෙමින් පැවතුණි. ETA පහසුකම ඔස්සේ වීසා නිකුත්කිරීමේ ක්‍රියාවලියේ දී අදාළ මෘදුකාංගයෙහි ඉදිරි මුහුණත (Front end) නිර්මාණයකර එහි සංවර්ධනය, නඩත්තුකිරීම හා පවත්වාගෙන යාම සිදුකිරීම, වීසා අයදුම්කරුවන් වීසා අයදුම්කිරීමේ දී දත්ත ඇතුළත්කිරීම සඳහා අතුරු මුහුණත (Interface) නිර්මාණයකිරීම, වීසා අයදුම්කරුවන්ගේ දත්ත වීසා අනුමැතිය සඳහා දෙපාර්තමේන්තුව වෙත යොමුකිරීම, වීසා අනුමත වූ පසු අයදුම්කරුවන් වෙත අනුමතවීමේ දැන්වීම (Approval Notice) නිකුත්කිරීම, දිනපතා ලැබෙන වීසා අයදුම්පත් සම්බන්ධ සංඛ්‍යා ලේඛන තොරතුරු වාර්තාකිරීම සඳහා දත්ත පුවරුව (Dash Board) පවත්වා ගෙනයාම හා නඩත්තුකිරීම යනා දී සේවාවන් නොමිලේ සපයා දී තිබුණි.

**2.3.6** වසර 12ක් ක්‍රියාත්මක වූ මෙකී ක්‍රියාවලියේදී මොබිටෙල් සමාගම එහි තාක්ෂණික හවුල්කරු වශයෙන් ක්‍රියාකර වීසා නිකුත්කිරීමට අදාළව Front End Data Submission පමණක් සිදුකරනු ලැබී ය. එනම් මෙම ක්‍රමවේදය තුළ මාර්ගගත ක්‍රමයට වීසා අයදුම්කිරීමේදී ඒ සඳහා අනුමැතිය ලබාදීමත් එම අනුමැතිය සහිතව පැමිණෙන විදේශිකයන්ට ශ්‍රී ලංකා ගුවන් තොටුපළේදී වීසා නිකුත්කිරීමත් සිදුවිය. දින දෙකක් වැනි කාලයත් ඇතුළත එම අනුමැතිය ලබාදීමත් ගුවන් තොටුපළේදී මිනිත්තුවක් වැනි ඉතාම අඩු කාලයක් තුළ වීසා නිකුත් කිරීමත් සිදු වේ.

**2.3.7** විද්‍යුත් සංචරණ අනුමැතිය (ETA) පද්ධතිය මොබිටෙල් සමාගම විසින් පවත්වාගෙන යාමේදී එකී පද්ධතියේ සේවා හා නඩත්තු වෙනුවෙන් වාර්ෂිකව අදාළ ගාස්තු ගෙවිය යුතු වූ අතර මොබිටෙල් සමාගමේ නිල ලාංඡනය (Logo) ETA පද්ධතියට අදාළ වෙබ් අඩවියේ ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් වසරකට රු.1,000,000 බැගින් වාර්ෂිකව දෙපාර්තමේන්තුව වෙත ගෙවීම් කිරීමට ගිවිසුම්ගතව තිබුණි. තව ද දෙපාර්තමේන්තුව විසින් ද මෙම සේවාවන් හා නඩත්තු කටයුතු වෙනුවෙන් මොබිටෙල් සමාගමට ගාස්තුවක් ගෙවීමට පැවතුණි.

**2.3.8** අංක 11/1100/503/062 හා 2011 මැයි 09 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් ලබා දී ඇති අනුමැතිය මත පදනම්ව දෙපාර්තමේන්තුවේ පරිගණක මෘදුකාංග හා දෘඩාංගවල සුරක්ෂිතතාවය හා ආරක්ෂිත බව පිළිබඳව වඩා විශ්වාසදායි බවක් ගොඩනගා ගත හැකි රජයේ අනුබද්ධිත සමාගමක් වන මොබිටෙල් පුද්ගලික සමාගම සම්බන්ධයෙන් වූ මූලික හඳුනා ගැනීම මත මොබිටෙල් පුද්ගලික සමාගම මේ සඳහා තෝරාගෙන තිබූ බවට පැහැදිලි කිරීම් කර තිබුණි.

**2.3.9** 2012 සිට 2023 දක්වා අඛණ්ඩව මොබිටෙල් ආයතනය මගින් ඉටුකළ මෙම ETA පහසුකම් සහිත සේවාව මගින් 2012 සිට 2018 දක්වා ඉහළ ආදායමක් වාර්තාකර තිබූ නමුත් 2019 වර්ෂයෙන් පසු එම ආදායම් මට්ටම සීඝ්‍ර පසුබෑමකට ලක් වී තිබුණි. පාස්කු ඉරු දින ප්‍රහාරය හා කොරෝනා වසංගත තත්ත්වය මේ සඳහා හේතු වී තිබූ අතර 2023 වර්ෂයේදී සැලකිය යුතු මට්ටමක් දක්වා නැවත යථා තත්ත්වයට පත්ව තිබුණි. ඒ පිළිබඳ විස්තර පහත වගුවේ දැක්වේ.

**වගු අංක 6 – 2012 සිට 2023 දක්වා වාර්ෂික වීසා අයදුම්පත් සංඛ්‍යාව හා වීසා නිකුත්කිරීමේ ආදායම**

| වර්ෂය | අයදුම්පත් සංඛ්‍යාව | ආදායම එ.ජ.ඩො |
|---|---|---|
| 2012 | 1,136,600 | 17,675,077 |
| 2013 | 1,318,523 | 28,564,335 |
| 2014 | 1,430,894 | 33,484,195 |
| 2015 | 1,736,529 | 40,597,395 |
| 2016 | 2,191,517 | 55,504,655 |
| 2017 | 2,392,489 | 57,190,880 |
| 2018 | 2,406,434 | 63,787,190 |
| 2019 | 1,938,848 | 32,571,985 |
| 2020 | 489,760 | 4,990,279 |
| 2021 | 247,618 | 6,818,652 |
| 2022 | 823,638 | 23,780,296 |
| 2023 | 1,635,269 | 60,016,801 |
| **2024 ජනවාරි 01 සිට අප්‍රේල් 16 දක්වා** | **730,437** | **(රු.)** 6,250,372,042 |

**2.3.10** 2012 සිට හඳුන්වා දුන් මෙම ETA ක්‍රමය තුළ 2023 අප්‍රේල් දක්වා පද්ධතියේ සෙසු නඩත්තු කටයුතු මොබිටෙල් ආයතනය මගින් දරා තිබූ අතර මෙම පද්ධතිය ක්‍රියාත්මකවීම හේතු කොට ගෙන අදාළ ගිවිසුමේ සඳහන් පරිදි කිසිදු වැය බරක් ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් දරා නොතිබුණි.

**2.3.11** මොබිටෙල් සමාගම මෙම සේවාව ලබාදුන් කාලය තුළ ප්‍රමාණාත්මක අයුරින් වාර්තා වූ සේවාව බිඳවැටීම් හෝ මහජන පැමිණිලි පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොවුණි.

**2.3.12** ආගාමික හා විගාමික පනත අනුව වීසා නිකුත්කිරීමේ අධිකාරී බලය ආගමන හා විගමන පාලක ජනරාල් සතු වූ අතර විද්‍යුත් සංචරණ අනුමැතිය නිකුත්කිරීමට අවශ්‍ය තාක්ෂණික සහාය ලබාදීම පමණක් වෙනත් පාර්ශවයකට පැවරිය හැකි විය.

**2.4 ශ්‍රී ලංකාවට පැමිණෙන සහ ශ්‍රී ලංකාවේ සංචාරය කරන විදේශිකයන්ගේ වීසා අයදුම්පත් විද්‍යුත් ගමන් අවසර පද්ධතිය හරහා ඉදිරිපත් කිරීම සඳහා බලයලත් නියෝජිතයින් පත්කිරීම.**

**2.4.1 අමාත්‍ය මණ්ඩල සංදේශය**

උක්ත මැයෙන් වූ අංක MOD/CP/IA/10/2020 හා 2020 ජනවාරී 07 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය **(ඇමුණුම 20)**, මහවැලි, කෘෂිකර්ම,වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍ය සහ අභ්‍යන්තර, වෙළෙඳ ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුභසාධක අමාත්‍ය සහ රාජ්‍ය ආරක්ෂක රාජ්‍ය අමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත්කර තිබුණි. එම සංදේශයෙහි ඇතුළත් පසුබිම, විස්තරය හා නිර්දේශ කෙටියෙන් පහත පරිදි විය.

**(අ) විස්තරය**

ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද අංක 11/1100/503/062 හා 2011 මැයි 09 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය හා මෙම සංදේශය බැඳෙන බව. ඒ අනුව 2012 වර්ෂයේ සිට (ETA) විද්‍යුත් ගමන් අවසර ලබාදීමේ ක්‍රමය භාවිතා කරන අතර එහිදී විදෙස් සංචාරකයින් අනන්‍යතාවය මත පදනම් වූ රටවල්වලින් හැර ශ්‍රී ලංකාවට තම සංචාරය ආරම්භ කිරීමට පෙර විද්‍යුත් ගමන් අවසරය (ETA) ලබාගත යුතු අතර ආගමන හා විගමන දෙපාර්තමේන්තුව එම අයදුම්පත් පිළියෙලකර අනුමත කිරීමේ දැන්වීමක් ලබාදෙන බව.

(i) සෑම රටකම පුරවැසියන්ට ETA වෙබ් අඩවිය හරහා පුද්ගලිකව අයදුම්කිරීමෙන් හා නියමිත වීසා ගාස්තු ගෙවීමෙන් වීසා ලබාගත හැකි අතර එලෙස අන්තර්ජාලයට පිවිසීමට නොහැකි තැනැත්තන් හට ඒ සඳහා පිහිටුවා ඇති පෞද්ගලික නියෝජිතායතන, අදාළ රටේ ශ්‍රී ලංකා දූතමණ්ඩල සහ ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය හරහා වීසා අයදුම්කළ හැකි බව හා එයට අමතරව සංචාරක නියෝජිතයන්, චාරිකා මෙහෙයවන්නන්, ගුවන් ගමන් ප්‍රවේශ පත්‍ර නියෝජිතයින්ට ද තනි හා කණ්ඩායම් අයදුම්පත් ඉදිරිපත්කිරීම විවෘත කිරීම මත සංචාරකයන් පෞද්ගලිකව (ETA) ක්‍රියාවලියට ඇතුළත්වීමට අවශ්‍ය නොවන බව.

(ii) ශ්‍රී ලංකාව චීන සංචාරකයන්ගේ වැඩි ආකර්ශණයක් සහිත රටක් වුවත් චීනයේ අන්තර්ජාල භාවිතයෙන් පවතින සීමාකිරීම්, චීන ජාතිකයන්ට ඉංග්‍රීසි භාෂාව භාවිතයේ අපහසුතාවය ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයේ සහාය ලබාගැනීමේදී එහි කාර්යයන් ද අන්තර්ජාලය හරහා සිදුනොකිරීම වැනි කරුණු මත වීසා නිකුත්කිරීමේ ප්‍රමාදයන් සිදුවන බව. මේ නිසා චීනයේ ක්‍රය ශක්තිය වැඩි පිරිස් සංචාරය සඳහා ශ්‍රී ලංකාව තෝරා නොගන්නා අතර සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය හරහා ආර්ථික වර්ධනය වැඩිකර ගැනීමට කණ්ඩායම් ලෙස සංචාරය කරන්නන්ගේ ආකර්ෂණය ශ්‍රී ලංකාවට යොමුකර ගත හැකි බව.

(iii) ඉහත හේතුවලට විසඳුමක් ලෙස චීනයේ ෂැංහායි පිහිටි පෞද්ගලික නියෝජිත ආයතනයක් වන සීමාසහිත ට්‍රැවල්සන් ඉන්ටර්නැෂනල් ට්‍රැවල් සර්විස් (ෂැංහයි) සමාගම විදෙස් ගමන් අවසර ලබාගැනීමේ අයදුම්පත් ඉදිරිපත්කිරීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කර ඇති බව.

(iv) මෙම යෝජනාව සම්බන්ධයෙන් ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් අධ්‍යයනය කරන ලද අතර, මෙහිදී ඔවුන්ට දෙපාර්තමේන්තු වෙබ් අඩවියට සහ පරිගණක පද්ධතියට කිසිදු බලපෑමක් කිරීමට හැකියාවක් නොමැති බව.

(v) අදාළ ආයතනය විසින් ඉදිරිපත්කර ඇති මෙම රටවල් කිහිපයක ක්‍රියාත්මක වන අතර මේ සඳහා ශ්‍රී ලංකා රජයට කිසිදු පිරිවැයක් දැරිය යුතු නොවන අතර තම මව් භාෂාව ප්‍රමුඛව භාවිතා කරන රටවල්වලට මෙම ක්‍රමවේදය ආදේශකර ගත හැකිවීම මගින් එම සංචාරකයන්ටද වීසා ලබාගැනීමේදී පහසුවක් වන බව.

**(ආ) නිර්දේශ**

(i) ETA පද්ධතිය හරහා චීන ජාතිකයින්ගේ විදෙස් ගමන් අවසර අයදුම්පත් ඉදිරිපත්කිරීම සඳහා සීමාසහිත ට්‍රැවල්සන් ඉන්ටර්නැෂනල් ට්‍රැවල් සර්විස් (ෂැංහයි) සමාගමට බලය ලබාදීම.

(ii) එහි ප්‍රගතිය සැලකිල්ලට ගනිමින්, රජයට කිසිදු වියදමක් නොමැතිව එකී සමාන කාර්යය සඳහා පෞද්ගලික නියෝජිත ආයතන පත්කිරීමට ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට බලය ලබාදීම.

### 2.4.2 සංදේශය සඳහා වූ නිරීක්ෂණ

2020 ජනවාරි 21 දිනැති අංක MOF/DG/LAD/CO/11/2020 දරන මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යවරයා විසින් මාස 06කට පසුව මෙම නව යාන්ත්‍රණයේ ප්‍රගතිය පිළිබඳ ඇඟයීම් වාර්තාවක් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත්කිරීම සුදුසු බවට නිරීක්ෂණ ඉදිරිපත්කර තිබුණි. **(ඇමුණුම 21)**

### 2.4.3 අමාත්‍ය මණ්ඩල තීරණය

සංදේශයේ 3.1 යටතේ දක්වා ඇති ඉහත 2.4.1(ආ) (i)හි දැක්වෙන ETA පද්ධතිය හරහා චීන ජාතිකයන්ගේ විදෙස් ගමන් අවසර අයදුම්පත් ඉදිරිපත්කිරීම සඳහා සීමාසහිත ට්‍රැවල්සන් ඉන්ටර්නැෂනල් ට්‍රැවල් සර්විසස් (ෂැංහයි) සමාගමට බලය ලබාදීම මාස 6ක කාලසීමාවකින් අනතුරුව නව ක්‍රමවේදයේ ප්‍රගතිය ඇගයීමක් සිදුකර සලකා බැලීම පිණිස ඇමතිතුමා මගින් අමාත්‍ය මණ්ඩලය වෙත වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්ට නියම කිරීමට හා එහි ප්‍රතිඵලය මත පදනම්ව සංදේශයේ 3.2 යටතේ දක්වා ඇති ඉහත 2.4.1 (ආ) (ii) හි දැක්වෙන පරිදි එහි ප්‍රගතිය සැලකිල්ලට ගනිමින් රජයට කිසිදු වියදමක් නොමැතිව එකී සමාන කාර්යයක් සඳහා පෞද්ගලික නියෝජිත ආයතන පත්කිරීමට ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට බලය ලබාදීම අංක අමප/20/0089/203/013 හා 2020 ජනවාරි 22 දිනැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදි තීරණයකර තිබුණි. **(ඇමුණුම 22)**

### 2.4.4 අමාත්‍ය මණ්ඩල තීරණය ක්‍රියාත්මක කිරීම

2020 ජනවාරි 22 දිනැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ලබාදුන් තීරණය පරිදි චීන ජාතිකයන් සඳහා විද්‍යුත් සංචරණ අනුමැතිය ලබාදීම සඳහා සීමාසහිත ට්‍රැවල්සන් ඉන්ටර්නැෂනල් ට්‍රැවල් සර්විස් (ෂැංහයි) සමාගම සමග ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ පාලක ජනරාල් ගිවිසුමකට එළැඹ තිබුණු නමුත් එළැඹී දිනය සඳහන් නොවුණි **(ඇමුණුම 23).** ගිවිසුමේ 4 වගන්තිය යටතේ 2019 ජූලි 10 දින මේ සම්බන්ධයෙන් දෙපාර්ශවය අතර අවබෝධතා ගිවිසුමකට එළැඹ තිබුණු බව දක්වා තිබුණි. ගිවිසුම්ගත සේවාවන් 2023 සැප්තැම්බර් 06 දින සිට ආරම්භකර තිබූ අතර මෙම වාර්තාවේ දිනය දක්වා ම එම කටයුතු පවත්වාගෙන යන බව 2025 ජූලි 17 දින පැවති රැස්වීමක දී විගණනය වෙත ප්‍රකාශ කරන ලදී.

## 2.5 මාර්ගගත ක්‍රමය මගින් වීසා නිකුත් කිරීමේ ක්‍රමවේදය වැඩිදියුණු කිරීම

### 2.5.1 මාර්ගගත ක්‍රමය මගින් වීසා නිකුත් කිරීමේ ක්‍රමවේදය වැඩිදියුණු කිරීම සඳහා වූ මොබිටෙල් ආයතනයේ යෝජනා

මාර්ගගත ක්‍රමවේදය මගින් වීසා නිකුත්කිරීමේ ක්‍රමවේදය වැඩිදියුණු කිරීමට අදාළව මොබිටෙල් සමාගම හා ආගමන හා විගමන දෙපාර්තමේන්තුව අතර 2018 සිට 2023 නොවැම්බර් දක්වා අවස්ථා ගණනාවකදී එහි අවශ්‍යතාව පැහැදිලි කරමින් ලිපි හුවමාරුකර ගෙන තිබුණි. එනම් පද්ධතිය සඳහා අවශ්‍ය යටිතල පහසුකම් හා මෘදුකාංග වැඩිදියුණු කිරීම, කල් ඉකුත් වූ ක්‍රියාවලියක් නිසා එම පද්ධතිය අනාරක්ෂිතවීමේ අවදානම පිළිබඳ සඳහන් කිරීම, ජීවමිතික දත්ත සහිත නව පද්ධතියක අවශ්‍යතාවය පැහැදිලි කිරීම, මාස 3කට වඩා වැඩි කාලයක් රැඳී සිටින විදේශිකයන්ගේ පෞද්ගලික දත්ත අධීක්ෂණය කිරීමේ පහසුකම් ඇතුළත් කිරීම, e-gate පද්ධතියක් හඳුන්වා දීම සහ මේ සඳහා රජයට වැයබරක් නොවන පරිදි ඒවා ක්‍රියාත්මකකිරීමේ හැකියාව යන කරුණු මොබිටෙල් ආයතනය විසින් ඉදිරිපත් කරන ලද ලිපිවල ඇතුළත්ව තිබුණි.

### 2.5.2 2021 ජූලි 29 දිනැති අංක MOD/CP/IA/122/2021 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය (ඇමුණුම 24)

එවකට ගරු ජනාධිපති හා ආරක්ෂක අමාත්‍යවරයා විසින් ජාතික ආරක්ෂාව තීව්‍ර කිරීම සඳහා ආගමන හා විගමන දෙපාර්තුමේන්තුවේ ප්‍රත්‍යන්ත පාලනයේ විද්‍යුත් සංචරණ අනුමැතිය (ETA) ලබාගැනීමේ පද්ධතිය වැඩිදියුණු කිරීමේ යෝජනාව යන මැයෙන් උක්ත අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත්කර තිබුණි. එම සංදේශයේ පසුබිම්ගත තොරතුරු, සාධාරණීකරණ කරුණු හා නිර්දේශ යටතේ දක්වා තිබූ කරුණු කෙටියෙන් පහත පරිදි විය.

**(අ) පසුබිම**

(i) දෙපාර්තමේන්තුවේ මෙහෙවරට අනුව යමින් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ප්‍රත්‍යන්ත පාලනය කාර්යක්ෂමව කිරීමේ අරමුණින් 2012 වර්ෂයේ සිට විද්‍යුත් සංචරණ අනුමැතිය (ETA) ක්‍රියාත්මකකරනු ලබන බව.

(ii) විද්‍යුත් සංචරණ අනුමැතිය අදාළ අන්තර්ජාල වෙබ් අඩවිය මගින් ඉල්ලුම්කර ඒ අනුව කෙටිකාලීන වීසා බලපත්‍ර (දින 30ක් සඳහා) ලබාගැනීමේ හැකියාව විදේශිකයන්ට හිමි වන බව සහ මෙම විද්‍යුත් සංචරණ තොරතුරු ලබාගැනීම සඳහා වූ වෙබ් අඩවිය ජාත්‍යන්තර භාෂා 09කින් භාවිතාකිරීමේ පහසුකම් සපයා ඇති බව සහ ක්‍රමවේදයන් 06ක් ඔස්සේ අයදුම් කිරීමේ පහසුකම් සපයා ඇති බව.

(iii) විද්‍යුත් සංචරණ අනුමැතිය සඳහා අයකරන ආකාරය පහත පරිදි වන බව.

**වගු අංක 7 - විද්‍යුත් සංචරණ අනුමැතිය සඳහා අයකරන ආකාරය**

| රටවල් කාණ්ඩය | සංචාරක | ව්‍යාපාරික |
|---|---|---|
| දකුණු ආසියාතික කලාපීය සහයෝගිතා සංවිධානයේ (SAARC) රටවල් සඳහා දින 30ට ETA අනුමැතිය | USD 20 | USD 30 |
| දකුණු ආසියාතික කලාපීය සහයෝගිතා සංවිධානයේ (SAARC) නොවන රටවල් සඳහා දින 30ට ETA අනුමැතිය | USD 35 | USD 40 |

(iv) විද්‍යුත් සංචරණ අනුමැතිය වීසාවක් නොවන බවත් එය රටකට ඇතුළ්වීම සඳහා ලබා දෙනු ලබන පූර්ව නිෂ්කාශනයක් වන බව, 2012 දී දෙපාර්තමේන්තුව විසින් මෙම ක්‍රමය ආරම්භ කරන විට කලාපීය රටවල් විද්‍යුත් සංචරණ ක්‍රමය අනුගමනය නොකළ ද සංදේශයේ දිනය වන විට අනෙකුත් සාක් කලාපීය රටවල් ද මෙම ක්‍රමය අනුගමනය කරන ලද බව සහ මෙම පද්ධතිය නිර්මාණය කිරීම හා සන්නිවේදන පහසුකම් සැපයීම ශ්‍රී ලංකා ටෙලිකොම්හි අනුබද්ධිත ආයතනයක් වන මොබිටෙල් පුද්ගලික සමාගම මගින් මේ දක්වා ඉටුකරනු ලබන බව.

**(ආ) සාධාරණීකරණය**

(i) රජයේ ප්‍රතිපත්ති මත පදනම්ව විශ්වාසදායී සංචාරකයන් සඳහා පහසු වන වඩා මිත්‍රශීලී වීසා ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා විද්‍යුත් සංචරණ පද්ධතියේ වැඩිදියුණු කිරීම අත්‍යාවශ්‍ය කාරණයක් වන බව සහ පද්ධතිය තුළ පහත සඳහන් ගැටළු අනාවරණය වී ඇති බව.

(a) විද්‍යුත් සංචරණ අනුමැතිය (ETA) පූර්ව නිෂ්කාශනයක් බැවින් එවකට පද්ධතිය සකස් කොට තිබුණේ ගමන් බලපත්‍ර තොරතුරු හා සංචාරයට අදාළ තොරතුරු වැනි සීමිත තොරතුරු ප්‍රමාණයක් වන නමුත් ETA පද්ධතිය හරහා සංචරණයන් පුළුල්වීමත් සමගම මෙම තොරතුරු ප්‍රමාණවත් නොවන බව. එසේ ම ජාතික ආරක්ෂාව සම්බන්ධව මිනිස් වෙළඳාම හා අනෙකුත් අපරාධ සම්බන්ධව තොරතුරු ලබාගැනීමට හා තොරතුරු ආවේක්ෂණයට අදාළ තොරතුරු ලබාගැනීමට පද්ධතියේ දැනට ඇති ධාරිතාව ප්‍රමාණවත් නොවන බව.

(b) එසේම දැනට ඇති පද්ධතිය සයිබර් ප්‍රහාර (Cyber-attack) වැනි අවදානම් සහගත තත්ත්වයන්ට මුහුණ දීමට තරම් ආරක්ෂාව සම්බන්ධව ප්‍රමාණවත් පහසුකම්වලින් සමන්විතව ගොඩ නැඟී නොමැති බව.

(c) දැනට ක්‍රියාත්මක පද්ධතිය තුළ අයදුම්පත් යොමුකිරීම පිළිබඳව හා අයදුම්කර සාර්ථක වූ අයදුම්කරුවන් සම්බන්ධ තොරතුරු නිවැරදි පරිදිම ලබාගැනීමේ ගැටළු පවතින බැවින් සහ මේ සඳහා නැවත විශ්ලේෂණය කොට තොරතුරු ලබාගැනීමක් කළ යුතු බව සහ මෙම දත්ත පද්ධතියේ ධාරිතාවය ප්‍රමාණවත් නොවීම හා යාවත්කාලීන නොවීම සම්බන්ධව ඇති ගැටළුවක් වන බව.

(d) දැනට දෙපාර්තමේන්තුවට ලැබී ඇති ප්‍රතිචාර හා අයදුම්කරුවන්ගේ තොරතුරු අනුව මෙය මිත්‍රශීලි පද්ධතියක් නොවන බව සහ අයදුම්කරුවන් නිරන්තර අපහසුවට ලක්වන පද්ධති දෝෂයන් පිළිබඳව අනාවරණය වෙමින් පවතින බව.

(e) මෙම පද්ධතිය 2012 වසරේ සිට ක්‍රියාත්මක වන බැවින් දැනට යල් පැනගිය තත්ත්වයක් පවතින බව නිරීක්ෂණය වන බව සහ නව දෘඩාංග පද්ධතියට ඇතුළත් කොට නව පද්ධතියක් ලෙස වැඩිදියුණු කිරීම අත්‍යාවශ්‍ය වන බව.

(f) තොරතුරු වාර්තාකිරීමේ මෙවලම් හා පාලක පද්ධතිය අතර දත්ත හුවමාරුවේ ඇති ගැටළු දැනට හඳුනාගෙන ඇති බව සහ පද්ධතියට අයදුම්කරන සියලුම අයදුම්කරුවන් (දිනකට) පිළිගැනීමට ලක්කිරීමේ ධාරිතාවයක් ද නොමැති බැවින් පද්ධතිය තුළ ඉල්ලුමට සරිලන සේ මුදල් ගෙවීම සඳහා ද ධාරිතාව දිනකට ගනුදෙනු 5000 කට පමණ සීමා වන බව.

(ii) කොවිඩ් වසංගත තත්වයෙන් පසු සංචාරක ක්ෂේත්‍රයේ සීඝ්‍ර දියුණුවක් අපේක්ෂා කරන තත්ත්වයක් තුළ විද්‍යුත් සංචරණ පද්ධතියේ ධාරිතාවය දියුණුකිරීම දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවයක් වන බව සහ පද්ධතියේ ධාවන කාලසීමාව ඉක්මවා වසර 09ක් පමණ ක්‍රියාකිරීම නිසා පද්ධතියේ ක්‍රියාකාරිත්වය ඉතා අවදානම් මට්ටමක පවතින බව සහ පද්ධති සන්නිවේදන ක්‍රියාකරු වන මොබිටෙල් සමාගම දැඩිව තහවුරුකර ඇති බව.

(iii) පද්ධතියේ ඇති ගැටළු සම්බන්ධව දැනට පද්ධතිය නිර්මාණය හා සන්නිවේදන පහසුකම් සපයන මොබිටෙල් පුද්ගලික සමාගමෙන්ම පද්ධතිය වැඩිදියුණු කිරීම සම්බන්ධ ඉක්මන් යෝජනාවක් කැඳවා ක්‍රියාත්මක කිරීම සඳහා 2020 අප්‍රේල් 21 දින ආරක්ෂක අමාත්‍යාංශයේ දී පැවති සාකච්ඡාවේ දී අමාත්‍යාංශ ලේකම්වරයා විසින් උපදෙස් ලබා දී ඇති බව.

**(ඇ) අනුමැතිය සඳහා වූ නිර්දේශ**

(i) මොබිටෙල් සමාගම මගින් ඉදිරිපත් කරන ලද මූල්‍ය හා තාක්ෂණික යෝජනා තවදුරටත් සමාලෝචනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල සාකච්ඡා කමිටුවක් (Cabinet Appointed Negotiation Committee –CANC) හා යෝජනා ඇගයීම සඳහා තොරතුරු තාක්ෂණික නියෝජිතායතනය (ICTA), රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය, මුදල් අමාත්‍යාංශය යනා දී ආයතනවල නියෝජිතයන්ගෙන් සමන්විත ව්‍යාපෘති කමිටුවක් (Project Committee – PC) පත්කිරීම.

(ii) එම කමිටු යෝජනා පදනම් කරගෙන මොබිටෙල් පුද්ගලික සමාගම සමග ගිවිසුම්ගත වී අදාළ පද්ධතිය දියුණුකිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

**2.5.3 මුදල් අමාත්‍යවරයාගේ නිරීක්ෂණ**

ඒ සම්බන්ධව 2021 අගෝස්තු 15 දිනැති අංක PFD/PMD/01/CM/2021/301 දරන ලිපිය මගින් මුදල් අමාත්‍යවරයා විසින් ලබා දී තිබූ නිරීක්ෂණ පහත පරිදි වේ. **(ඇමුණුම 25)**

(i) සංදේශයේ සඳහන් පරිදි අමාත්‍ය මණ්ඩල සාකච්ඡා කමිටුව (CANC) සහ ව්‍යාපෘති කමිටුව (PC) පත්කිරීමට එකඟ වන බව,

(ii) යෝජිත ව්‍යාපෘතිය රජයේ ආදායමට මූල්‍යමය බරක් නොවිය යුතු බව හා රට තුළ පවතින විදේශ විනිමය තත්ත්වය සැලකිල්ලට ගනිමින් යෝජිත ආයතනය සමග සාකච්ඡා කිරීමෙන් දේශීය මුදලින් අදාළ ගෙවීම් සිදුකිරීම පිළිබඳ CANCහි විශේෂ අවධානය යොමුකළ යුතු බව.

**2.5.4 අමාත්‍ය මණ්ඩල අනුමැතිය**

ඉහත 2.5.3හි දක්වා ඇති මුදල් අමාත්‍යවරයාගේ නිරීක්ෂණයන් සැලකිල්ලට ගෙන ඒ අනුව කටයුතු කරන ලෙස රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ට නියම කරමින් ඉහත නිර්දේශ සඳහා 2021 අගෝස්තු 17 දිනැති අංක අමප/21/1477/303/117 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමැතිය ලබා දී තිබුණි. **(ඇමුණුම 26)**

**2.5.5 අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව කමිටු පත්කිරීම්**

කෙටුම්පත් විගණන වාර්තාවක් සඳහා 2025 මැයි 28 දින මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් විගණනය වෙත ලබාදෙන ලද පිළිතුර අනුව 2021 අගෝස්තු 17 දින ලබාදුන් අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව කමිටු පත්කිරීම් හා ක්‍රියාත්මකකිරීම් පහත පරිදි සිදුකර තිබුණි.

**2.5.5.1 අමාත්‍ය මණ්ඩලය පත්කළ සාකච්ඡා කමිටුව (Cabinet Appointed Negotiation Committee – CANC)**

2021- 2023 කාලය තුළ අමාත්‍යාංශ විෂයවල විෂය පථය වෙනස්වීම නිසා කමිටු සාමාජිකයන් නිතර නිතර වෙනස්වීම මත සාකච්ඡා කමිටු 4ක් පත්කර තිබුණි. විස්තර පහත පරිදි වේ.

**(අ) පළමු අමාත්‍ය මණ්ඩල සාකච්ඡා කමිටුව**

2021 නොවැම්බර් 10 දිනැති රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ (රාජ්‍ය මූල්‍ය) අංක PFD/PMD//NSDM/CANC/2021/01 දරන ලිපිය මගින් පළමු අමාත්‍ය මණ්ඩල සාකච්ඡා කමිටුව පත්කර තිබුණි. එහි සාමාජිකයන් පහත පරිදි වී තිබුණි **(ඇමුණුම 27)**.

(i) විශ්‍රාමික ජනරාල් ජී.ඩී.එච් කමල් ගුණරත්න - සභාපති
ලේකම්, ජාතික ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය

(ii) ඩී.ඩී මාතරආරච්චි - සාමාජික
ලේකම් ,ගබඩා පහසුකම් බහාලුම් අංගන වරාය සැපයුම් පහසුකම් සහ බෝට්ටු සහ නැවිගත කිරීම් කර්මාන්ත සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

(iii) ජයන්ත ද සිල්වා - සාමාජික
ලේකම්, ඩිජිටල් තාක්ෂණික හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

**(ආ) දෙවන අමාත්‍ය මණ්ඩල සාකච්ඡා කමිටුව**

නමුත් 2022 වර්ෂයේ සිදු වූ අමාත්‍යාංශවල විෂය පථය වෙනස්වීම මත අමාත්‍යාංශ ලේකම් තනතුරු වෙනස්වීම හේතුවෙන් අමාත්‍ය මණ්ඩල සාමාජිකයන්ගේ කමිටුවක් පත්කරන ලෙස ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ අතිරේක පාලක ජනරාල්ගේ අංක DIE/PRO/09/2021/29 **(ඇමුණුම 28)** හා 2022 සැප්තැම්බර් 14 දිනැති ලිපියෙන් ආයෝජන හා ප්‍රවර්ධන අමාත්‍යාංශයේ ලේකම් මගින් මුදල් අමාත්‍යාංශයේ ලේකම් වෙතින් ඉල්ලා තිබුණි. ඒ අනුව ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ අතිරේක ලේකම්ගේ (අභ්‍යන්තර කටයුතු) අංක IA/1/3/75/II හා 2022 සැප්තැම්බර් 15 දින ලිපිය මගින් **(ඇමුණුම 29)** මුදල් අමාත්‍යාංශය වෙත එම ඉල්ලීම ඉදිරිපත්කර තිබුණි. ඒ අනුව මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක PFD/PMD/NSDM/CANC/2021/01 හා 2022 සැප්තැම්බර් 22 දිනැති ලිපියෙන් නැවත අමාත්‍ය මණ්ඩල සාකච්ඡා කමිටුව පහත පරිදි වෙනස්කර තිබුණි. **(ඇමුණුම 30)**

(i) කේ.එම්. මහින්ද සිරිවර්ධන මයා - කමිටු සභාපති
ලේකම්, ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය

(ii) එස්. හෙට්ටිආරච්චි මයා - කමිටු සාමාජික
ලේකම්, මහජන ආරක්ෂක අමාත්‍යාංශය

(iii) වසන්තා පෙරේරා මිය - කමිටු සාමාජික
ලේකම් , අධිකරණ බන්ධනාගාර කටයුතු ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ කටයුතු අමාත්‍යාංශය

**(ඇ) තුන්වන අමාත්‍ය මණ්ඩල සාකච්ඡා කමිටුව**

2022 ඔක්තෝබර් 05 දිනැති අංක 2300/24 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව අමාත්‍යාංශවල විෂය පථය නැවත වෙනස්වීම මත නැවත අමාත්‍ය මණ්ඩල සාකච්ඡා කමිටු සාමාජිකයන් වෙනස් වී තිබුණි. ඒ අනුව රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක PFD/PMD/NSDM/CANC/2O21/01 හා 2022 නොවැම්බර් 03 දිනැති ලිපියෙන් **(ඇමුණුම 31)** පහත පරිදි අමාත්‍ය මණ්ඩල සාමාජික කමිටුව වෙනස් වී තිබුණි.

(i) එස්. හෙට්ටිආරච්චි මයා - කමිටු සභාපති
ලේකම් , මහජන ආරක්ෂක අමාත්‍යාංශය

(ii) වසන්තා පෙරේරා මිය - කමිටු සාමාජික
ලේකම් , අධිකරණ බන්ධනාගාර කටයුතු ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ කටයුතු අමාත්‍යාංශය

(iii) මහාචාර්ය එන්.ඩී. ගුණවර්ධන මයා - කමිටු සාමාජික
ලේකම්, තාක්ෂණික අමාත්‍යාංශය

**(ඇ) හතරවන අමාත්‍ය මණ්ඩල සාකච්ඡා කමිටුව**

නැවත වතාවක් ආගමන හා විගමන පාලක ජනරාල්ගේ අංක DIE/PRO/09/2021/29 හා 2023 ජනවාරි 04 දිනැති ලිපිය මගින් **(ඇමුණුම 32)** මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් විශ්‍රාමයාම හා ව්‍යාපෘති කමිටු සමාජිකයෙකු ස්ථාන මාරුවීම නිසා නැවත අමාත්‍ය මණ්ඩල සාකච්ඡා කමිටුව හා ව්‍යාපෘති කමිටුව සංශෝධනය කරන ලෙස ඉල්ලා තිබුණි. ඒ අනුව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක PFD/PMD/NSDM/CANC/2021/01 හා 2023 ජනවාරි 13 දිනැති ලිපියෙන් **(ඇමුණුම 33)** මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් වියානි ගුණතිලක මහතා අමාත්‍ය මණ්ඩල සාකච්ඡා කමිටු සභාපති ලෙස පත්කර තිබුණි.

**2.5.5.2 අමාත්‍ය මණ්ඩල සාකච්ඡා කමිටු ක්‍රියාකාරිත්වය**

2.5.5.1 (අ), (ආ), (ඇ), (ඈ) ඡේද පරිදි 2021 නොවැම්බර් 10 හා 2023 ජනවාරි 04 දක්වා වූ මාස 18කට ආසන්න කාලය තුළ අමාත්‍යාංශ විෂය පථය වෙනස්වීම හා වෙනත් හේතු මත අමාත්‍ය මණ්ඩල සාකච්ඡා කමිටුව අවස්ථා 4කදී වෙනස්කර තිබුණි. එසේ වුව ද එම කිසිදු කමිටුවක් රැස්වීම් පවත්වා තිබූ බවට හෝ එම කමිටු තීරණ පිළිබඳ කිසිදු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොවුණි.

**2.5.5.3 ව්‍යාපෘති කමිටුව**

2021- 2023 කාලය තුළ අමාත්‍යාංශ විෂයවල විෂය පථය වෙනස්වීම නිසා කමිටු සාමාජිකයන් නිතර නිතර වෙනස්වීම මත ව්‍යාපෘති කමිටුව දෙවරක් පත්කර තිබුණි. විස්තර පහත පරිදි වේ.

**(අ) පළමු ව්‍යාපෘති කමිටුව**

2021 අගෝස්තු 17 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි පළමු ව්‍යාපෘති කමිටුව රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ අංක IA/1/3/70/VI(R)I දරන හා 2021 නොවැම්බර් 23 දිනැති ලිපිය **(ඇමුණුම 34)** ප්‍රකාරව පහත සඳහන් නිලධාරීන්ගෙන් සමන්විතව පත්කර තිබුණි.

(i) යූ.කේ බණ්ඩාර - කමිටු සභාපති -අතිරේක ලේකම්, රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය

(ii) යූ.වී. සරත් රූපසිරි - කමිටු සාමාජික - පාලක ජනරාල්, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

(iii) සී.ආර් ද සිල්වා - කමිටු සාමාජික- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, පරිගණක විද්‍යා හා ඉංජිනේරු අධ්‍යනාංශය , මොරටුව විශ්ව විද්‍යාලය

(iv) තුෂාර රූපරත්න - කමිටු සාමාජික - නියෝජ්‍ය පාලක, තොරතුරු තාක්ෂණ ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

(v) ආර්.ඒ.එල්. උදය කුමාර - කමිටු සාමාජික - භාණ්ඩාගාර නියෝජිත, අධ්‍යක්ෂ, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

(vi) නිරෝෂ ආනන්ද - කමිටු සාමාජික - කමාණ්ඩෝ (විශ්‍රාමික) - ප්‍රධාන තොරතුරු ආරක්ෂක, ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය

(vii) අජිත් කුමාර - කමිටු සාමාජික - තාක්ෂණික ප්‍රධානි - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතන

මෙම ව්‍යාපෘති කමිටුව 2021 නොවැම්බර් 24 හා 2022 සැප්තැම්බර් 26 දින යන දෙදින දී රැස් වී තිබූ අතර අදාළ වාර්තා විගණනය වෙත ලබා දී තිබුණි.

**(ආ)** සම්බන්ධිත අමාත්‍යාංශවල විෂය පථය වෙනස්වීම නිසා හා ඇතැම් නිලධාරීන් විදේශ නිවාඩු ලබාගෙන ගොස් තිබූ බැවින් ආගමන හා විගමන පාලක ජනරාල්ගේ අංක DIE/PRO/09/2021/29 හා 2021 නොවැම්බර් 23 දිනැති ලිපියෙන් ව්‍යාපෘති කමිටුව නැවත සංශෝධනය කරන ලෙස මහජන ආරක්ෂක අමාත්‍යාංශ ලේකම් හරහා මුදල් අමාත්‍යාංශයේ ලේකම් වෙතින් ඉල්ලීමක්කර තිබුණු බව 2025 මැයි 28 දිනැති මහජන ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්ගේ පිළිතුර මගින් විගණනය වෙත දන්වා තිබුණි. (එම ලිපිය විගණනය වෙත ඉදිරිපත් නොවුණි.)

ඒ අනුව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක PFD/PMD/NSDM/CANC/2021/01 හා 2022 දෙසැම්බර් 09 දිනැති ලිපියෙන් **(ඇමුණුම 35)** ව්‍යාපෘති කමිටුව පහත පරිදි සංශෝධනයකර තිබුණි.

(i) මාලිකා සූරියප්පෙරුම මිය - සභාපති
අතිරේක ලේකම්, මහජන ආරක්ෂක අමාත්‍යාංශය

(ii) අයි.එස්.එච්.ජේ. ඉලුක්පිටිය මයා - කමිටු සාමාජික
පාලක ජනරාල්, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

(iii) ආචාර්ය ආර් ද සිල්වා මයා - කමිටු සාමාජික
ජ්‍යෙෂ්ඨ කතිකාචාර්ය, මොරටුව විශ්වවිද්‍යාලය

(iv) කේ. ඩබ්ලිව්. ඇලපාත මයා - කමිටු සාමාජික
නියෝජ්‍ය පාලක වීසා, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

(v) (කමාණ්ඩර්) නිරෝෂ ආනන්ද මයා - කමිටු සාමාජික
ශ්‍රී ලංකා හදිසි පරිගණක ප්‍රතිචාර සංසදය

(vi) ආර්. ඒ. එල්. උදය කුමාර මයා - කමිටු සාමාජික
අධ්‍යක්ෂ ,රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

(vii) අජිත් කුමාර මයා - කමිටු සාමාජික
තාක්ෂණික උපදේශක, ශ්‍රී ලංකා සන්නිවේදන හා තොරතුරු තාක්ෂණ නියෝජිත

**2.5.5.4 ව්‍යාපෘති කමිටු වාර්තා හා නිර්දේශ**

ව්‍යාපෘති කමිටුව දෙවරක් රැස්ව තිබූ අතර එම කමිටු වාර්තා හා නිර්දේශ පහත පරිදි විය.

**(අ)** මොබිටෙල් ආයතනය විසින් ලබා දෙන ලද යෝජනාව සමාලෝචනය හා ඇගයීම සඳහා වූ 2021 නොවැම්බර් 24 දිනැති කමිටු රැස්වීම. **(ඇමුණුම 36)**

**(i) පසුබිම**

(a) දේශසීමා නීති උද්ගතවන ත්‍රස්තවාදී හා තර්ජන අනුව නිරතුරුවම වෙනස්කළ යුතු ප්‍රතිපත්තිවලින් සමන්විත වන බව.

(b) 1948 ආගමන හා විගමන දෙපාර්තමේන්තුව පිහිටුවීමේ සිට දේශ සීමා සම්බන්ධ තර්ජන හා අභියෝග වෙනස් වී ඇති බව සහ ඒ අනුව ජාතික ආරක්ෂාව සඳහා අනුගමනය කරන ලද ක්‍රම වෙනස්කර ඇති බව. ජාතික ආරක්ෂාව පිළිබඳ විශේෂඥයින් විසින් පෙන්වා දෙන පරිදි ආගමන සම්බන්ධයෙන් වන අතිරණාත්මක හා ඵලදායී නොවන අවධානයන් දේශ සීමා සම්බන්ධ අනාවරණ බව ඇති කිරීම තුළින් රටෙහි ජාතික ආරක්ෂාව කෙරෙහි සැලකිය යුතු අභියෝගයක් ඇති කරන බව.

(c) 2012 සිට මොබිටෙල් ආයතනයේ සහයෝගයෙන් කෙරෙන විද්‍යුත් සංචරණ අනුමැතිය (ETA) ක්‍රමවේදය මගින් විශ්වාසදායී සංචාරකයින් පමණක් රටට ඇතුලු වන බව.

(d) කෙසේ වුව ද මෙම ක්‍රමය සැලකිය යුතු යථාවත් කිරීමකින් තොරව වර්ෂ 10කට ආසන්න කාලයක් ක්‍රියාත්මක කරමින් පවතින බව.

(e) ගෝලීය වශයෙන් බලන කළ වැඩි දියුණුකළ /මාර්ගගත වීසා සැකසුම් බොහෝ දුරට වර්තමානයේදී වෙනස් වී ඇති බව. එහි ප්‍රතිඵලයක් ලෙස පවත්නා විද්‍යුත් සංචරණ අනුමැතිය ක්‍රමයෙහි අඩුපාඩු හා දුර්වලතාවයන් වැඩිවෙමින් පවත්නා බව සහ මෙම ක්‍රමය භාවිතා කරන තාක්ෂණය යාවත්කාලීන නොවන බව.

(f) මේ සම්බන්ධයෙන් වර්තමාන සැපයුම්කරු වන මොබිටෙල් ආයතනයට යෝජනාවක් ඉදිරිපත් කරන ලෙස ඉල්ලන ලද බව හා ඒ අනුව 2020 නොවැම්බර් 24 එම ආයතනය විසින් අදාළ යෝජනාව ඉදිරිපත්කර ඇති බව.

(g) මේ සඳහා ලබාදෙන ලද 2021 අගෝස්තු 17 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි සාමාජිකයන් 07දෙනෙකුගෙන් සමන්විත මෙම කමිටුව ජාතික ආරක්ෂාව හා ආපදා කළමනාකරණය පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් සමග මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මුදල් දෙපාර්තුමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පත්කරන ලද බව.

**(ii) ව්‍යාපෘති කමිටුවේ නිරීක්ෂණ**

(a) පද්ධතිය වර්තමාන අවශ්‍යතා හා තාක්ෂණය අනුව නැවත නිර්මාණය (redesign) කිරීම අවශ්‍ය බව. පවත්නා අයදුම්පතෙහි පිළිවෙල (design) භාවිතා කරන්නන්ට පහසු (user friendly) නොවන අතර පිටුවේ අවකාශ විවක්ෂණව භාවිතකර නොමැති නිසා තොරතුරු සොයා ගැනීම සඳහා ඉහළට පහළට ගමන් කළ යුතු බව. (Scroll)

(b) දැනට මෙම පද්ධතිය සඳහා දෙපාර්තමේන්තුව හා මොබිටෙල් ආයතනය භාවිතා කරන යටිතල පහසුකම් යල්පැන ගොස් ඇති බව සහ Sever ධාරිතාවයන් එහි සීමා කරා ළඟා වී ඇති බව.

(c) දත්ත පද්ධතිය හා මෘදුකාංග සර්වර් (application servers) වර්ෂ 5ට වඩා වැඩි කාලපරාසයන් ඉකුත් වී ඇති බැවින් එම servers දෙකෙහිම දෘඩාංග අලුත් කළ යුතු බව.

(d) යල්පැන ගිය servers සමහර අවශ්‍ය බලපත්‍ර පවා නොමැතිව භාවිතා කරන නිසා සමස්ත පද්ධතිය සඳහා නව දෘඩාංග පහත පරිදි මිලදී ගත යුතු බව.

- දත්ත පද්ධතිය හා මෘදුකාංග පද්ධතිය සඳහා servers
- ගබඩා පහසුකම්

(e) මෑතකදී දෙපාර්තමේන්තුව විසින් අවදානම් සහිත මගීන් හඳුනාගැනීම සඳහා ජීව දත්ත තහවුරු කිරීම් (biometric verification) හා ජීව රූප (biographic profiling) හඳුනා ගැනීමේ ක්‍රමයක් සීමා ආරක්ෂා කිරීමේ ඒකකය (Border surveillance) විසින් ධාරිතාවක් ගොඩනඟා ඇති බව. කෙසේ වුව ද පවත්නා විද්‍යුත් සංචරණ අනුමැතිය ක්‍රමවේදය සඳහා වූ තාක්ෂණය මේ සඳහා වඩා ඉහළ ලාක්ෂණිකයින් සමග සහාය නොදක්වන බැවින් පද්ධතිය වර්තමාන පාරිසරික තත්ත්වයන් සමග සමපාතවීම සඳහා නැවත නිර්මාණය (redesign) කළ යුතු බව.

(f) වාර්තාකරන පහසුකම් හා පාලන ව්‍යුහය දෙපාර්තමේන්තුවේ පාලනය මගින් පමණක් සිදුකිරීම සඳහා දෙපාර්තමේන්තුව සමග හුවමාරුකර ගත යුතු බව. (Shared)

(g) ගුවන්තොටුපළට පැමිණීමෙන් පසු වීසා ලබාගැනීමේ ක්‍රමවේදයේ දී Front end ක්‍රමය භාවිතා නොකරන බව සහ පාස්පෝට් පිටපතක් වැනි ඉතා අඩු තොරතුරු ප්‍රමාණයක් ලබාගන්නා බව.

(h) දැනට පවත්නා ගෙවීම් ක්‍රමවේදය යටතේ කාඩ්පත් ගෙවීම් පමණක් පහසුකම සැලසෙන නිසා එක් ඒකීය වූ මාර්ගගත ගෙවීම් වේදිකාවක් කාඩ්පත් ගෙවීම්, QR කේත ගෙවීම් ආදී සියලු ගෙවීම් සඳහා ඒකාබද්ධ ක්‍රමයක් හඳුන්වා දිය යුතු බව.

(i) රට තුළට මගීන් පැමිණීමෙන් පසු ඔවුන් කළමනාකරණය සඳහා ක්‍රමවේදයක් නොමැති බව.

(j) ආගමන හා විගමන පනතට මෑත කාලීනව සිදුකරන ලද සංශෝධනවලට අනුකූල වීම සඳහා පවත්නා විද්‍යුත් සංචරණ ක්‍රමවේදය (ETA පද්ධතියට) සමපාතවීම සඳහා වැඩි දියුණු කළ යුතු බව කමිටුවේ සැලකිල්ලට ගත් බව.

**(iii) ව්‍යාපෘති කමිටු නිර්දේශ**

මොබිටෙල් ආයතනය විසින් තාක්ෂණික වැඩිදියුණු කිරීම් සඳහා ඉදිරිපත් කරන ලද යෝජනාව අදියර 2න් කළ යුතුව ඉදිරිපත්කර ඇති බව සහ එමගින් යටිතල පහසුකම් සංවර්ධනයට වැඩි අවධානයක් යොමුකර ඇති බව.

තව ද කාර්ය ගලායාම් (work flow) පනතේ අවශ්‍යතාවයන් ඉටුකිරීම සඳහා අවශ්‍ය වන බව. දැනට පවත්නා ක්‍රමය නිර්මාණය සඳහා මොරටුව විශ්ව විද්‍යාලය සහාය වී ඇති බැවින් එම විශ්ව විද්‍යාලයේ සහාය නැවත ලබාගැනීම නිර්දේශ කරන බව.

(a) පවත්නා ක්‍රමවේදය අනුව දැනට call centre ඇතුළු පහසුකම් අදාළව සෑම ඇමතුමක් සඳහා රු. 20ක මුදලක් ගෙවනු ලබන බව. කමිටුව විසින් මෙය මගින් සංඛ්‍යාව මත පදනම් වන ලාභ බෙදාගැනීමේ ක්‍රමයකට මුදල් අමාත්‍යාංශයේ අදහස පරිදි විය යුතු බව.

(b) විශ්වවිද්‍යාලයේ සහය ඇතිව නිර්මාණය කරන යෝජිත වැඩිදියුණු කරන ලද යෝජනාවඅමාත්‍ය මණ්ඩල සාකච්ඡා කමිටුවට ඉදිරිපත් කළ යුතු බව.

(c) විද්‍යුත් සංචරණ අනුමැතිය ක්‍රමවේදය යටතේ මගින්ගෙන් යම් ආපසු නොගෙවන ගාස්තුවක් අය කිරීම ව්‍යාපෘති කමිටුව නිර්දේශ කරන බව හා ETA ක්‍රමය යටතේ නොවන වීසා අයදුම්පත් සඳහා මෙම ගාස්තු අවශ්‍ය නොවන බව බොහෝ රටවල් අනුගමනය කරන ක්‍රමවේදය මෙය වන බව.

(d) ව්‍යාපෘති කමිටුව මොබිටෙල් (පුද්) සමාගමේ සේවාව ලබාගැනීම නිර්දේශ කරන බව සහ පද්ධතියේ සිදුවන යම් දුර්වලතා හා සම්බන්ධ කරුණු නිසා යම් යම් පාඩුවක් දෙපාර්තමේන්තුවට සිදුවන්නේ නම් එම පාඩු සඳහා මොබිටෙල් සමාගමට දඩ පැනවිය හැකි බවට සමාගම සමගවූ ගිවිසුමට කොන්දේසියක් ඇතුළත්කළ යුතු බව.

(e) වර්ෂ 3කින් පද්ධතිය සංවර්ධනය කරන බවට වූ කොන්දේසියක් සමග වර්ෂ 5ක් සඳහා මොබිටෙල් සමාගම සමග ගිවිසුම් අත්සන්කිරීමට ව්‍යාපෘති කමිටුව නිර්දේශ කරන බව.

(f) 2022 අප්‍රේල් මාසය වන විට නව විදුයුත් සංචරණ අනුමැතිය (ETA) ක්‍රමවේදය සම්පූර්ණකළ යුතු බවට ව්‍යාපෘති කමිටුව නිර්දේශ කරන බව.

(g) SLCERT ආයතනයෙන් යෝජිත පද්ධතිය සඳහා අවශ්‍ය ආරක්ෂක නිශ්කාෂණ (Security clearance) ලබාගත යුතු බව.

(h) රජයේ බැංකු ඇතුළත් රජයේ අනුමත ගෙවීම් ක්‍රමය ETA පද්ධතිය සමග සම්බන්ධ කළ යුතු බවට ව්‍යාපෘති කමිටුව නිර්දේශකර තිබුණි.

**(ආ)** මොරටුව විශ්ව විද්‍යාලය විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සමාලෝචනය කිරීම සඳහා 2022 සැප්තැම්බර් 26 දින පවත්වන ලද ව්‍යාපෘති කමිටුවේ රැස්වීම් වාර්තාව **(ඇමුණුම 37)** මේ සඳහා කමිටු සාමාජිකයින් 4දෙනෙකු සහභාගී වී තිබුණි.

**(i) පසුබිම**

(a) 2012 සිට පැවතෙන ක්‍රමයේ වැඩිදියුණු කිරීමක් අවශ්‍ය බව.

(b) 2021 නොවැම්බර් 24 දින ව්‍යාපෘති කමිටුවේ නිර්දේශ පරිදි යෝජනාවක් ඉදිරිපත් කරන ලෙස මොරටුව විශ්ව විද්‍යාලය වෙතින් ඉල්ලා ඇති බව.

(c) 2022 ජනවාරි 12 දින කරන ලද එම ඉල්ලීම සඳහා ප්‍රතිචාර දක්වමින් උපකුලපතිවරයා විසින් මේ සම්බන්ධයෙන් අවබෝධතා ගිවිසුමක් අත්සන්කර සති 15ක කාලයකින් අදාළ උපදේශන සේවා සැපයීම් සිදුකර ඇති බව සහ ඒ සඳහා රු. මිලියන 4.5ක් උපදේශන ගාස්තුවක් ගෙවිය යුතු බව.

**(ii) නිරීක්ෂණ**

(a) නිකුත්කිරීමේ ක්‍රමවේදයේ වර්තමාන අවශ්‍යතාවයන් සඳහා පවත්නා ක්‍රමය වැඩි දියුණු කිරීම ඉතා හදිසි අවශ්‍යතාවයක් වන බව.

(b) ප්‍රතිපාදන වෙන්කර ගැනීමක් සිදුකර නොමැති නිසා උපදේශන ගාස්තු ගෙවීමට හැකියාවක් නොමැති වන බව.

(c) ETA ක්‍රමවේදයේ අනාගත වැඩිදියුණු කිරීම් සඳහා සේවා සැපයුම්කරු සමග වන ගිවිසුමට වෙනස්කිරීම සඳහා ඉල්ලීම යන වගන්තිය ඇතුළත් කළ යුතු බව.

**(iii) ව්‍යාපෘති කමිටු නිර්දේශ**

(a) දෙපාර්තමේන්තුව විසින් සති දෙකක කාලයක් තුළ පද්ධතියේ වැඩි දියුණු කිරීම් අවශ්‍යතා පිළිබඳ දැනට සේවා සැපයුම්කරු වන මොබිටෙල් සමාගම විස්තර ඉදිරිපත් කිරීමක් කළ යුතු වන බව.

(b) මොබිටෙල් සමාගම විසින් නැවත නිර්මාණය කරන ලද යෝජනාව ව්‍යාපෘති කමිටුව වෙත මාසයක කාලයක් තුළ ලබාදිය යුතු බව.

(c) වර්තමාන ගෙවීම් යෝජනා යටතේ අනාගත වැඩි දියුණු කිරීම් සඳහා අදාළ වන වගන්ති ගිවිසුමට ඇතුළත් කළ යුතු වන බව.

(d) ව්‍යාපෘති කමිටුව විසින් එහි නිර්දේශ අමාත්‍ය මණ්ඩල සාකච්ඡා කමිටුවට ඉදිරිපත් කළ යුතු බව.

(e) 2022 වර්ෂ අවසානය වන විට ETA පද්ධතිය සඳහා වන වැඩි දියුණු කිරීම් අවසන් කළ යුතු බව.

**2.5.5.5 මොබිටෙල් ආයතනය විසින් ලබාදෙන ලද යෝජනාව ක්‍රියාත්මක කිරීම**

**(අ)** මොබිටෙල් ආයතනය විසින් 2023 අගෝස්තු 18 දින වැඩිදියුණු කරන ලද ඒකාබද්ධ, විස්තීරණ, තාක්ෂණික යෝජනාව (Integrated Comprehensive Technical Proposal) දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත්කර තිබුණි.**(ඇමුණුම 38)**

**(ආ)** 2021 දී ලබාගන්නා ලද අමාත්‍ය මණ්ඩල අනුමැතියක් මත පවත්නා ETA ක්‍රමවේදය සඳහා නව මෘදුකාංග හා දෘඩාංග සංවර්ධනයක් මොබිටෙල් ආයතනය හරහා සිදුකරන ලද අතර එය අවසන් අදියරේ පවතින බව හා මෙම කටයුතු සඳහා යන වියදම් පියවාගැනීමට වීසා ඉල්ලුම්කරුවන්ගෙන් එ.ජ.ඩොලර් 1ක් අයකිරීමට ද අනුමැතිය ලබා දී ඇති බව 2023 අගෝස්තු 25 දින ආගමන හා විගමන පාලක ජනරාල් විසින් මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත දන්වා තිබුණි. **(ඇමුණුම 39)** ඊ වීසා, කන්සියුලර් සේවා, වීසා සේවා, ජීවදත්ත සේවා හා සංචාරක ප්‍රවර්ධනය සම්බන්ධයෙන් IVS – GBS Global Services (Pvt) Ltd ආයතනය ඉදිරිපත් කර තිබුණු විස්තීරණ යෝජනාව පිළිබඳ අදහස දැක්වීම සඳහා එම පිළිතුරු ලිපිය ඉදිරිපත්කර තිබුණි.

**(ඇ)** ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශිකයන් සඳහා වන වීසා අයදුම්පත් සහ විදේශීය ශ්‍රී ලාංකිකයන්ගේ ගමන් බලපත්‍ර අයදුම්පත් මාර්ගගත ක්‍රමය ඔස්සේ ඉදිරිපත් කිරීම සඳහා බලයලත් නියෝජිතයන් පත්කිරීම යන මැයෙන් වූ අංක අමප23/1692/626/018 දරන අමාත්‍ය මණ්ඩලය පත්‍රිකාව 2023 සැප්තැම්බර් 08 දින අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත්කර තිබුණි. **(ඇමුණුම 40)** එම අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවේ 2012 වර්ෂයේ සිට මොබිටෙල් ආයතනයේ අනුග්‍රහයෙන් විදුහුත් සංචරණ අනුමැතිය (ETA ) පහසුකම දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන බව සහ එම ක්‍රමය වැඩි දියුණු කිරීම සඳහා වූ 2021 ජූලි 29 දිනැතිව ඉදිරිපත් කරන ලද

එම ආයතනයේ යෝජනාව සඳහා 2021 අගෝස්තු 17 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමැතිය ලැබී ඇතත් පත්‍රිකාවේ දිනය තෙක් එය ක්‍රියාත්මකකර නොමැති බව හා කෙසේ වුව ද ව්‍යාපෘති තාක්ෂණික කමිටුවේ උපදෙස් පරිදි දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවය නැවත සමාලෝචනයකර ව්‍යාපෘති තාක්ෂණ වාර්තාවක් සකස්කර මූලික මෘදුකාංග සංවර්ධන කටයුතු ද අවසන් කර ඇති බව හා පරීක්ෂණ මට්ටමේ පවතින බව සඳහන් කර තිබුණි.

**(ඇ)** මෙම නව යෝජනා මෙම වාර්තාවේ දිනය දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි.

## 2.6 IVS – GBS Global Services ( Powered with UFS Global as a Technical Partner) ආයතනය විසින් 2023 ජූනි මාසයේදී (e –Visa, Consular Services ,Visa Services, Bio Metric Services and Tourism Promotion) ඊ වීසා, කොන්සියුලර් සේවා, වීසා සේවා , ජීව දත්ත, සේවා හා සංචාරක ප්‍රවර්ධනය සඳහා ඒක පාර්ශවික යෝජනාවක් (Unsolicited Proposal) ඉදිරිපත් කිරීම.

### 2.6.1 IVS Global Services Pvt Ltd ආයතනයේ කළමණාකරණ අධ්‍යක්ෂ විසින් ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ පාලක ජනරාල් වෙත ඉදිරිපත් කරන ලද යෝජනාව (ඇමුණුම 41)

2023 අගෝස්තු 18 දිනැතිව IVS – GBS Global Services (Pvt) Ltd ආයතනයේ කළමනාකරණ අධ්‍යක්ෂ විසින් ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ පාලක ජනරාල් වෙත “Proposal for global visa consular, Biomatric services and tourism promotion to facilitate foreign exchange savings and boost revenues to the Democratic Socialist Republic of Sri Lanka “ යන මැයෙන් ලිපියක් හා යෝජනාවක් ද ඉදිරිපත්කර තිබුණු බව ආගමන හා විගමන පාලක ජනරාල් විසින් ඒ සඳහා ඉදිරිපත් කරන ලද ලිපියේ සඳහන්කර තිබුණි.

අදාළ ආවරණ ලිපිය විගණනය වෙත ඉදිරිපත් නොවූ නමුත් යෝජනාව ඉදිරිපත්කර තිබුණි. එම යෝජනාවෙහි ආවරණ පිටුව (Cover page) අනුව එය ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ මහජන ආරක්ෂක අමාත්‍යාංශය හා විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත ඊ වීසා, කන්සියුලර් සේවා, වීසා සේවා, ජීව දත්ත සේවා හා සංචාරක ප්‍රවර්ධනය සම්බන්ධයෙන් වූ විස්තීරණ යෝජනාවක් වූ අතර තාක්ෂණික සහකරු ලෙස UFS Global ආයතනය සම්බන්ධ කරගත් IVS-GBS Global Services ආයතනයෙන් 2023 ජූනි මාසයේදී ඉදිරිපත්කර තිබුණි.

### 2.6.2 IVS – GBS Global Services (Pvt) Ltd හි යෝජනාව සම්බන්ධ ආගමන හා විගමන පාලක ජනරාල්ගේ නිරීක්ෂණ හා නිර්දේශ ඉදිරිපත්කිරීම

ඉහත 2.6.1 හි සඳහන් යෝජනාව පිළිබඳ නිරීක්ෂණ හා නිර්දේශ ලබාදෙමින් 2023 අගෝස්තු 25 දින ආගමන හා විගමන පාලක ජනරාල් විසින් මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ලිපියක් ඉදිරිපත්කර තිබුණි. එම ලිපියේ සඳහන් ප්‍රධාන කරුණු පහත පරිදි විය.

(අ) මාසයක් හෝ ඊට වඩා කෙටි කාලයක් සඳහා සංචාර හෝ ව්‍යාපාර කටයුතු සඳහා මෙරටට පැමිණෙන පුද්ගලයන් සඳහා ඉලෙක්ට්‍රොනික් සංචරණ අනුමැතිය (ETA) ක්‍රමය යටතේ ගමන් අනුමැතිය ලබාදීම 2012 සිට මොබිටෙල් ආයතනයේ සහභාගිත්වයෙන් සිදුකරන බව.

(ආ) මෙම ක්‍රමය යටතේ පැය 24ක් ඇතුළත අනුමැතිය ලැබෙන ලෙස සකස්කර ඇති බව සහ මේ යටතේ ඉල්ලුම්පත්‍රය පිරවිය යුතු අතුරු මුහුණත (Front end interface) මොබිටෙල් ආයතනය විසින් නිර්මාණයකර ඇති බව සහ අනුමැතිය ලබාදීම සඳහා වන (Back end) මෘදුකාංගය ඉන්ෆොමැටික් ආයතනය මගින් නිර්මාණයකර ඇති බව.

(ඇ) 2021 දී ලබා ගන්නා ලද අමාත්‍ය මණ්ඩල අනුමැතියක් මත පවත්නා ETA ක්‍රමවේදය සඳහා නව මෘදුකාංග හා දෘඩාංග සංවර්ධනයක් මොබිටෙල් ආයතනය හරහා සිදුකරන ලද අතර එය අවසන් අදියරේ පවතින බව. මෙම කටයුතු සඳහා යන වියදම් පියවාගැනීමට වීසා ඉල්ලුම්කරුවන්ගෙන් ඒ.ජ.ඩොලර් 1ක් අයකිරීමට ද අනුමැතිය ලබා දී ඇති බව.

(ඈ) විශේෂයෙන් දෙපාර්තමේන්තුව විසින් ගුවන්ගතවීමට පෙර ගුවන් මගීන්ගේ දත්ත පරීක්ෂා කිරීමේ පහසුකම හා විමර්ශන කටයුතු සඳහා නව මොඩියුලයක් ඉල්ලුම්කර ඇති බව හා එම පහසුකම ද එම ලිපියේ දින වන විට සංවර්ධනය කර ඇති බව.

(ඉ) 2021 වර්ෂයේදී සංචාරක අමාත්‍යාංශයේ ඉල්ලීම මත චීන සංචාරකයින් මෙරට තුළ සංචාරය කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා චීනයේ Travelzen ආයතනය සමග ඉලෙක්ට්‍රොනික් ගමන් අනුමැතිය ඉල්ලුම් කිරීමේ මාර්ගගත සේවාවේ ඉල්ලුම්කරුගේ අතුරු මුහුණත (interface ) චීන භාෂාවෙන් සකස්කර චීන ජාතිකයන්ට හඳුන්වා දීමට ගිවිසුම් අත්සන්කර ඇති බව හා එහි සංවර්ධන කටයුතු ලිපියේ දින වන විට පරීක්ෂණ අවස්ථාවේ පවත්නා බව.

(ඊ) මෙම ක්‍රියාවලීන්ට අමතරව VFS Global ආයතනය විසින් රජය වෙනුවෙන් වීසා නිකුත්කිරීම, කොන්සියුලර් සේවා සැපයීම සඳහා සේවා සැකසීම රජයට වැය බරක් නොවන අයුරින් සිදු කිරීමට යෝජනාවලියක් ලබා දී ඇති බව සහ එම යෝජනාවලිය පරීක්ෂාවේදී පහත කරුණු අනාවරණය වූ බව.

(i) විද්‍යුත් සංචරණ අනුමැතිය කෙටි කාලීන වීසා (Visit Visa) හා වාස වීසා ( Residence Visa) ඇතුළු සියලුම වීසා වර්ග සඳහා VFS ආයතනය මගින් ඉල්ලුම්පත් යොමුකිරීම. එහිදී දෙපාර්තමේන්තුව අයකරන ගාස්තු මත VFS ආයතනය සේවා ගාස්තුවක් අය කිරීමට යෝජනාකර ඇති බව.

(ii) මේ සඳහා වන සියලුම මෘදුකාංග VFS ආයතනයෙන් සැපයීම.

(iii) දැනට පවතින තත්ත්වය යටතේ වසරකට ගුවන් මගීන් මිලියන 1.2 පිරිසක් විද්‍යුත් සංචරණ අනුමැතිය ඉල්ලුම් කරන අතර VFS ආයතනය පදනම් වන විට එම පුද්ගලයන්ට ද වැඩි මුදලක් ගෙවා VFS මගින් සේවාව ලබාගැනීමට සිදුවීම.

(iv) විශේෂයෙන් රාජ්‍ය තාන්ත්‍රික මට්ටමින් ගත් කළ ශ්‍රී ලංකාවට පැමිණීම සඳහා සියලුම පුද්ගලයන් VFS ආයතනය මගින් වීසා ඉල්ලුම් කිරීමට සිදුවීම.

(v) රට තුළ පිහිටි ගුවන් තොටුපළවල් හා වරායවල් මධ්‍යස්ථාන 50ක් පිහිටුවා අවශ්‍ය උපකරණ හා කාර්ය මණ්ඩලය යොදවා ජීවමිතික දත්ත ලබාගැනීම.

(vi) විදේශ ගත ශ්‍රී ලාංකිකයන්ගේ විදේශ ගමන් බලපත්‍ර ඉල්ලුම්පත්, ජීවමිතික දත්ත ලබා ගෙන දෙපාර්තමේන්තුව වෙත යොමුකිරීම හා කන්සියුලර් සේවා සැපයීම.

(උ) VFS ආයතනයේ සේවාව ලබාගන්නා අනෙකුත් රටවල් ඊ වීසා ලෙස නිකුත් කරනුයේ සංචාරක වීසා පමණක් බව සහ වාස වීසා ඉල්ලුම්පත් ලබාගෙන අදාළ දූතමණ්ඩල වෙත ඉදිරිපත් කරන බව සහ ඉන්පසු ඉල්ලුම්කරු විසින් මුල් ලේඛන සමග අදාළ දූතමණ්ඩල වෙත ගොස් සම්මුඛ පරීක්ෂණයට පෙනී සිට වීසා ලබාගත යුතු බව.

(ඌ) IVS – Global Services (Pvt) Ltd ආයතනය විසින් 2023 අගෝස්තු 18 දිනැතිව එවන ලද ගිවිසුම අනුව පහත කරුණු අනාවරණය වන බව.

(i) මෙම ගිවිසුමෙහි GBS Technology services, IVS Global – FZCO ,VFS VF Worldwide Holding Ltd යන ආයතන කිහිපයම සමග සම්බන්ධ කොට ඇතත් මෙම කරුණට අදාළව එම ආයතනයන්ගේ ක්‍රියාකාරිත්වය කෙබඳු ද යන්න පැහැදිලි නොවන බව.

(ii) මෙම ගිවිසුමට අනුව ලබාදෙන සේවා ලෙස

- e – Visa
- Consular application processed globally including passport reneval
- Expat visa service applications

(a) ගිවිසුමෙහි අයිතම අංක 2 අනුව සංචාරක වීසා ලබාදීමට අමතරව අනෙකුත් වීසා සඳහා ද සේවා සැපයීම.

(b) ගිවිසුමෙහි වලංගු කාලය මූලික වශයෙන් අවුරුදු 12 ක් සහ ඊට අමතර අවුරුදු 06ක් ලෙස දක්වා ඇති බව.

**2.6.3 ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශිකයන් සඳහා වන වීසා අයදුම්පත් සහ විදේශීය ශ්‍රී ලාංකිකයන්ගේ ගමන් බලපත්‍ර අයදුම්පත් මාර්ගගත ක්‍රමය ඔස්සේ ඉදිරිපත් කිරීම සඳහා බලයලත් නියෝජිතයන් පත්කිරීම සඳහා 2023 සැප්තැම්බර් 08 දින අංක අමප23/1692/626/018 දරන අමාත්‍ය මණ්ඩලය පත්‍රිකාව ඉදිරිපත් කිරීම**

**2.6.3.1 උක්ත අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව එවකට මහජන ආරක්ෂක අමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත්කර තිබුණි**

**(අ) පසුබිම**

(i) සංදේශය සමග ඉදිරිපත් කරන යෝජනාව ව්‍යාපෘති යෝජනාවක් ලෙස ඉදිරිපත් කර සාකච්ඡා කරන ලද බව හා එම සාකච්ඡාවේදී සංචාරකයන්ට වඩා පහසුවෙන් වීසා ලබා ගැනීමට පහසුකම් සැලසීමෙන් වැඩිපුර සංචාරකයන් රට තුළට ආකර්ශනය කර ගැනීමත් ඒ තුළින් ජාතික ආර්ථිකයට එම කර්මාන්තයෙන් ලැබෙන දායකත්වය ප්‍රවර්ධනයකර ගත හැකි බව.

(ii) IVS – GBS Global ආයතනය ලොව පුරා රටවල් 145 ක වීසා ලබාදීමේ සේවා සපයන ප්‍රධානතම ආයතනයක් ලෙස ක්‍රියාත්මක වන අතර එම විස්තර ඉදිරිපත්කර ඇති බව සහ ඒ අනුව මෙම ආයතනය ජාත්‍යන්තර වශයෙන් කීර්තියට පත්ව ඇති ආයතනයක් බව නිරීක්ෂණය වන බව.

(iii) 2012 වර්ෂයේ සිට මොබිටෙල් ආයතනයේ අනුග්‍රහයෙන් විද්‍යුත් සංචරණ අනුමැතිය (ETA) පහසුකම දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන බව සහ එම ක්‍රමය වැඩි දියුණු කිරීම සඳහා වූ එම ආයතනයේ යෝජනාව සඳහා 2021 අගෝස්තු 17 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමැතිය ලැබී ඇතත් පත්‍රිකාවේ දිනය තෙක් එය ක්‍රියාත්මකකර නොමැති බව.

කෙසේ වුව ද ව්‍යාපෘති තාක්ෂණික කමිටුවේ උපදෙස් පරිදි දෙපාර්තුමේන්තුවේ අවශ්‍යතාවය නැවත සමාලෝචනයකර ව්‍යාපෘති තාක්ෂණ වාර්තාවක් සකස්කර මූලික මෘදුකාංග සංවර්ධන කටයුතු ද අවසන්කර ඇති බව හා පරීක්ෂණ මට්ටමේ පවතින බව.

(iv) ශ්‍රී ලංකාවට පැමිණෙන හා ශ්‍රී ලංකාවේ සංචාරය කරන විදේශිකයන්ගේ වීසා අයදුම්පත් විද්‍යුත් අවසර පද්ධතිය හරහා ඉදිරිපත් කිරීම සඳහා බලයලත් නියෝජිතයින් පත් කිරීම යන මැයෙන් 2020 ජනවාරි 07 දින ඉදිරිපත් කරන ලද අංක අමප/20/0089/203/013 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයට 2020 ජනවාරි 22 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයෙන් අනුමැතිය ලැබී ඇති බව. එමගින් ETA පද්ධතිය හරහා චීන ජාතිකයින්ගේ විද්‍යුත් ගමන් අවසර පත්‍ර අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා සීමාසහිත ට්‍රැවල්සන් ඉන්ටර්නැෂනල් ට්‍රැවල් සර්විස් (ෂැංහයි) සමාගමට බලය ලබා දී ඇති අතර පැවති කොවිඩ් 19 තත්ත්වය මත අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවේ දිනය වන විට මෘදුකාංග සංවර්ධන කටයුතු අවසන්කර පරීක්ෂණ මට්ටමේ පැවතිය ද ක්‍රියාත්මකකර නොමැති බව.

**(ආ) සාධාරණීකරණය**

(i) මෙම සේවා ලබාදීම සඳහා IVS – GBS Global Services ආයතනය නිර්මාණය කරන අතුරු මුහුණත ( Fronted user interface) එක් එක් රටවල්වල භාෂාවන්ගෙන් නිර්මාණය කරන බැවින් විදේශිකයන්ට මෙරට සංචාරය කිරීම සඳහා වීසා අයදුම් කිරීමේ වැඩි අවස්ථාවක් සැලසීම සිදුවිය හැකි අතර, මෙම ආයතන මගින් ස්ථාපිත කරන call center පහසුකම හරහා තම මව් භාෂාවන්ගෙන් සන්නිවේදන කටයුතු සිදු කිරීමට හැකියාව ලැබීම තුළින් මෙරටට වැඩි සංචාරක ආකර්ෂණයක් ලබා ගැනීමට ඉඩකඩ විවෘත වන බව ද තව දුරටත් නිරීක්ෂණය කරන බව. ඒ අනුව මෙම ආයතනයෙන් සේවාවන් ලබාගැනීමේදී නවීන තාක්ෂණය මගින් වීසා හා විදේශ ගමන් බලපත්‍ර ලබාදීම කාර්යක්ෂම සිදුකළ හැකි බව.

(ii) මාර්ගගතව වීසා ඉල්ලුම් කිරීමේ මෙම ක්‍රමවේදය සඳහා දෙපාර්තමේන්තුව විසින් අයකරනු ලබන ගාස්තුවලට අමතරව IVS – GBS Global Services ආයතනය තම

සේවාව ලබා දීම සඳහා එ.ජ. ඩොලර් 18.50 මුදලක් සේවා ගාස්තු ලෙස අයදුම්කරුවන් වෙතින් අයකිරීමට යෝජනාකර ඇති බව. එසේම එ.ජ.ඩොලර් 6.50ක මුදලට එ.ජ. ඩොලර් 25,000 ක් වටිනා රක්ෂණාවරණයක් ලබාදීමට ද යෝජනාකර තිබුණු බව හා එය සංචාරක ආකර්ෂණය තවදුරටත් වැඩිකර ගැනීමට ඉවහල් විය හැකි බව. එසේම IVS – GBS Global Services ආයතනය ලොව පුරා රටවල් 66 ඔවුන්ගේ සේවා ගාස්තුව ලෙස අයකරන සේවා ගාස්තුව ඉහත අගයට වඩා ඉහළ අගයක් ගන්නා බවද තවදුරටත් නිරීක්ෂණය කරන බව.

(iii) එසේ ම මෙම ආයතනය විසින් අදාළ සේවා ලබාදීමේදී ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සමග සිදුවිය යුතු පද්ධති ඒකාබද්ධකරණය සඳහා (System integration) අදාළ තාක්ෂණික උපකරණ මෘදුකාංග හා දැනුම ලබාදීම සඳහා IVS – GBS Global Services ආයතනය එ.ජ.ඩොලර් මිලියන 200 මුදලක් යෙදවීමට ද යෝජනාකර ඇති අතර ඒ අනුව මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී රජයට කිසිදු පිරිවැයක් දැරීමට සිදු නොවීම ද විශේෂයෙන් සඳහන් කරන බව.

**(ඇ) අනුමැතිය සඳහා වූ නිර්දේශ**

(i) IVS – GBS Global Services ආයතනය මගින් ඉදිරිපත්කර ඇති ව්‍යාපෘති යෝජනාව හා ගිවිසුම අධ්‍යයනයකර නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා සුදුසු ඇගයීම් කමිටුවක් පත් කිරීම.

(ii) එම ඇගයීම් කමිටුවේ නිර්දේශ සහිත වාර්තාව සහ මෙම ආයතනය සමග අත්සන් කිරීමට යෝජිත ගිවිසුමට නීතිපතිගේ නිශ්කාශන ඇතුළත් වාර්තාව අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීම

**2.6.4 අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සඳහා මුදල් අමාත්‍යාංශයේ නිරීක්ෂණ කැඳවීම**

මෙම අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා මුදල් අමාත්‍යාංශයෙන් නිරීක්ෂණ කැඳවා තිබුණු බව හා ඒ සඳහා පිළිතුරු සකස්කළ බවට විගණනයට ඉදිරිපත් කරන ලද සටහන් පත්‍රය **(ඇමුණුම 42)** අනුව තහවුරු විය. ඒ අනුව මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා 2023 සැප්තැම්බර් මස දින රහිත අංක PFD/PMD/CM/2023/ PS/350 දරන කෙටුම්පත් කරන ලද ලිපිය **(ඇමුණුම 43)** මගින් තම නිරීක්ෂණ මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙතද 2024 සැප්තැම්බර් 15 දින ලේකම්වරයා විසින් ජනාධිපතිවරයා වෙත ද ඉදිරිපත් කර තිබුණු බව විගණන පරීක්ෂාවේ දී හෙළිදරව් විය. එහෙත් අදාළ ලිපිය අමාත්‍ය මණ්ඩල කාර්යාලය වෙත යොමුකර නොතිබුණි. එම ලිපිය මගින් පහත සඳහන් නිරීක්ෂණ ඉදිරිපත්කර තිබුණි.

(i) මේ සඳහා ඉදිරිපත්කර තිබූ ඒකපාර්ශ්වික (Unsolicited) යෝජනාව වෙනුවට, ශ්‍රී ලාංකීය තොරතුරු තාක්ෂණ සමාගම්වලට ද අවස්ථාව ලබාදෙමින් තරඟකාරී පදනමින් Expression Of Interest (EOI) කැඳවීමටත්, මාර්ගගත වීසා කළමනාකරණ පද්ධතියේ

ක්‍රියාත්මක කිරීමේ හවුල්කරු විසින් රටට පැමිණෙන විදේශීකයන්ට මූල්‍ය පිරිවැය අවම වන පරිදි පද්ධතිය සැලසුම්කිරීම සහ ප්‍රසම්පාදන ආයතනයට පිළිගත හැකි විසඳුම් අවශ්‍ය බව.

(ii) මෙම මුල් අදියරේදී ලද GBS Technology Service & IVS Globle-FZCO, VF Worldwide Holding Ltd (GBS & IVS,VF) ආයතනයෙන් ව්‍යාපෘති යෝජනාව සමාලෝචනය කිරීම සඳහා කමිටුවක් පත්කිරීමේ අවශ්‍යතාවයක් නොදකින බවත් එය GBS & IVS,VF වැනි වෙනත් ආයතනවලින් තවදුරටත් යෝජනා කැඳවිය යුතු බව.

**2.6.5 අමාත්‍ය මණ්ඩල තීරණය**

ඉහත 2.6.3 හි (අ), (ආ) සහ (ඇ) පරිදි ඉදිරිපත් කරන ලද අංක අමප 23/1692/626/018 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව 2023 සැප්තැම්බර් 11 දින අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත්කර තිබුණි. 2022 ජනවාරි 22 දිනැති අංක අමප/20/0089/203/013 පිළිබඳ වූ අමාත්‍ය මණ්ඩල තීරණයට අදාළ බව හා මෙම රැස්වීමේ දී සභාගත කරන ලද ඉහත සඳහන් සංදේශය එහි සඳහන් නිර්දේශ සම්බන්ධයෙන් මහජන ආරක්ෂක ඇමතිතුමා විසින් සිදුකරන ලද වැඩිදුර පැහැදිලි කිරීම් සමග සලකා බලන ලද බවත් මේ පිළිබඳ සාකච්ඡා කිරීමෙන් අනතුරුව සංදේශයේ 3 ඡේදයෙහි සඳහන් ඉහත 2.6.3.1 (ඇ)(i) හා (ii) නිර්දේශ සඳහා අනුමැතිය ලබා දීමට තීරණය කරන ලද බව සඳහන්කර තිබුණි. **(ඇමුණුම 44)**

**2.6.6 අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවට ඇමුණුමක් ලෙස ඉදිරිපත්කර තිබූ යෝජනාව**

යෝජනාවෙහි ඇතුළත් ප්‍රධාන කරුණු කිහිපයක් පහත පරිදි වේ.

**2.6.6.1 ක්ෂේත්‍රය පිළිබඳ වෙළෙඳපොළ විග්‍රහය**

මෙම ක්ෂේත්‍රයේ කටයුතු කරන සමාගම් පිළිබඳ පහත විස්තර ඉදිරිපත්කර තිබුණි.

**වගු අංක 8- ක්ෂේත්‍රයේ කටයුතු කරන සමාගම්**

| සේවා සැපයුම්කරුගේ නම | සංස්ථාපිත වර්ෂය | ප්‍රධාන කාර්යාල පිහිටීම | ඊටීඒ (ETA) සේවා අත්දැකීම් | කොන්සියුලර් සේවා අත්දැකීම් | ගෝලීයව නියෝජනය රටවල් ගණන | ලංකාවේ නියෝජනය |
|---|---|---|---|---|---|---|
| VFS Global | 2001 | එක්සත් අරාබි එමීර් රාජ්‍යය | ඇත | ඇත | 145 | ඇත |
| IVS Global | 2006 | ඉන්දියාව, මුම්බායි | ඇත | ඇත | 20 | ඇත |
| TLS Contract | 2007 | ප්‍රංශය, පැරිස් | නැත | නැත | 90 | නැත |
| BLS International | 2005 | ඉන්දියාව, නවදිල්ලිය | නැත | ඇත | 66 | නැත |
| CGI Federal | 2010 | USA, වර්ජිනියා | නැත | ඇත | 70 | නැත |

මෙම යෝජනාව IVS-GBS හා VFS යන ක්ෂේත්‍රයේ සිටින ආයතන එකතුවක් ලෙස ඉදිරිපත් කර තිබුණි. කෙසේ වුව ද, යෝජනාවේ මෙම ආයතන පිළිබඳ විස්තර වෙන වෙනම දක්වා තිබුණි. ඒ අනුව IVS-GBS ආයතනය පිළිබඳ විස්තර පහත පරිදි වේ.

### 2.6.6.2 IVS-GBS ආයතනය පිළිබඳ විස්තර

(අ) ව්‍යාපෘති යෝජනාවේ ආයතනයේ නම IVS-GBS Global, IVS Globle, IVS හෝ IVS-GBS යන නම්වලින් හැඳින්වෙන බව.

(ආ) ප්‍රධාන කළමනාකරණ මණ්ඩල සාමාජිකයින් 04දෙනෙකු පිළිබඳ විස්තර සඳහන්කර ඇත. එනම් කළමනාකරණ අධ්‍යක්ෂ, අධ්‍යක්ෂ මුදල්, උපසභාපති තොරතුරු තාක්ෂණ අංශ ප්‍රධානී ලෙස. එහෙත් ඒ කුමන ආයතනයේ දැයි නිශ්චිත නැත. සේවක සංඛ්‍යාව 300 ට වැඩි වන බව.

(ඇ) 2006 වර්ෂයේදී වීසා සේවා සැපයීම ආරම්භකර තිබූ බව සඳහන්කර තිබුණි. කෙසේ වුව ද, යෝජනාව ඉදිරිපත් කරන ලද වර්ෂය වූ 2023 වර්ෂය වනවිට IVS-GBS ආයතනය විසින් පහත සඳහන් සේවා සැපයීමේ කොන්ත්‍රාත්තු පමණක් ක්‍රියාත්මක කරමින් පවතින බව.

(i) මැලේසියාව, තායිලන්තය, ශ්‍රී ලංකාව, ඉරානය, ජර්මනිය හා බහරේන් යන රටවල් සඳහා ඉන්දියානු වීසා ලබාදීමේ ක්‍රමවේදය ජීවදත්ත සේවා සහිතව ක්‍රියාත්මක කිරීම.

(ii) අබුඩාබි හා ඩුබායි රාජ්‍ය සඳහා ඉන්දියානු කොන්සියුලර් සේවා සැපයීම. (සහතික කිරීම හා නීති සේවා)

(iii) 2023 අප්‍රේල් සිට ග්‍රීසිය සඳහා ඉන්දියානු Schengen Visa ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම හා 2023 අප්‍රේල් සිට ඉන්දියානුවන් සඳහා මැලේසියානු වීසා ලබාදීමේ සේවා සැපයීම.

### 2.6.6.3 VFS ආයතනය හැඳින්වීම

(අ) වීසා, පාස්පෝට් අනන්‍යතා කළමනාකරණය (Identify Management) සහ වෙනත් සේවාවන් සම්බන්ධිත රාජ්‍යයන්වලට හා රාජ්‍යතාන්ත්‍රික ආයතනවලට ලබාදෙන ප්‍රධානම ආයතනය VFS ආයතනය වන බව. අනුග්‍රාහක රාජ්‍යයන් 68කට සේවා සැපයීම සඳහා රටවල් 145ක මධ්‍යස්ථාන 3,361ක් දැනට පවත්වා ගෙන යන බව හා භාෂා 55කින් වෙබ් පිටු 1,920ක් පවත්වා ගෙන යන බව සහ සේවක සංඛ්‍යාව 10,000 කට වැඩි බව.

(ආ) මෙම ආයතනය දැනට ලංකාවේ මධ්‍යස්ථාන 06ක් පවත්වා ගෙන යන බව සහ එයින් 05ක් කොළඹ හා 01ක් යාපනයේ පවත්වා ගෙන යන බව.

(ඇ) රාජ්‍යයන් 36ක් සඳහා නිෂේධාත්මක (Exclusive) වීසා සේවාවන් ලංකාවේ පවත්වා ගෙන යන බව.

**2.6.6.4.1 යෝජනාව පරිදි සංචාරක ප්‍රවර්ධන විධි පහත පරිදි වේ**

(i) කාර්යාල තුළ අභ්‍යන්තර සැකසුම් (රටට ආවේණික ලෙස) සැකසීම.

(ii) කාර්ය මණ්ඩල ඇඳුම් සැකසීම.

(iii) ජාතික උත්සව නිර්මාණශීලි ලෙස සැමරීම.

(iv) සංචාරක ප්‍රවර්ධන ඇඳුම් විකිණීම්.

(v) සමාජ මාධ්‍ය ප්‍රචාරණ ව්‍යාපාර හා ප්‍රවර්ධන අයිතම.

(vi) පිළිගැනීම් කාඩ්පත් හා සංචාරක විස්තර ඇතුළත් තොරතුරු පත්‍රිකා බෙදාහැරීම.

**2.6.6.5 ලංකාවේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති පිළිබඳ යෝජනා**

IVS - GBS ආයතනය විසින් පහත සේවාවන් එකතුව ඉටුකිරීම සඳහා යෝජනා ඉදිරිපත් කරන බව.

(i) විද්‍යුත් වීසා /විද්‍යුත් සංචරණ අනුමැතිය (e - Visa / ETA)

(ii) ලොව පුරා කන්සියුලර් හා පාස්පෝට් සේවා

(iii) රට තුළට පැමිණීමෙන් පසු වීසා Visa – onarrival Services

(iv) Expat Services

(v) ජීවදත්ත ලබා ගැනීමේ සේවා (Bio Metric Services)

(vi) සංචාරක ප්‍රවර්ධන කටයුතු

(vii) සංචාරක රක්ෂණ සේවා

**2.6.6.6 VFS Global සමාගම සමග උපායමාර්ගිකව එකතු වන බව**

යෝජනාව අනුව මෙහෙයුම් ව්‍යුහය පිළිබඳ විග්‍රහ කිරීමේදී යෝජිත මෙහෙයුම්වල ප්‍රමාණය සලකා බලා VFS Global සමාගම සමග උපායමාර්ගිකව එකතුවන බව (Aligned with) ප්‍රකාශ කර ඇත. ඔවුන්ගේ ප්‍රධාන ප්‍රවේශයන් පහත පරිදි වේ.

(i) ලියකියවිලිවල ආරක්ෂාව

(ii) තාක්ෂණය - නවීන තාක්ෂණය, නම්‍යශීලීත්වය හා ගැළපෙන බව.

(iii) ක්‍රියාවලිය අනුකූලතාවය හා තත්ත්ව පාලනය

(iv) අයදුම්පත් කාලීනව ඉදිරිපත් කිරීම.

(v) SLA Monitoring

(vi) මූල්‍ය විනිවිදභාවය

**2.6.6.7 ලංකා රජයට මෙම උපායමාර්ගික සන්ධානයේ (Strategic Association/Alliance) බලපෑම**

ලොව වටා රටවල් 140කට වැඩි සංඛ්‍යාවක් සමග අතිවිශාල හා කඩිනම් සේවාවක් ශ්‍රී ලංකා රජයට ලබාදීම මගින් රජය විසින් පවත්වා ගෙන යන සමහර දූතමණ්ඩල කාර්යාල අවශ්‍ය නොවීමෙන් ඒවා වසා දැමීමෙන් විදේශ විනිමය ඉතිරිකර ගත හැකි බව.

### 2.6.6.8 උපායමාර්ගික සන්ධානයේ ප්‍රධාන ලක්ෂණ

(i) නව අයදුම් කිරීමේ ලක්ෂණ සමග භාවිතා කරන්නේ අත්දැකීම් ඉහළ නැංවීම සඳහා ප්‍රථම වතාවට ලංකාව ලොව පුරා වීසා හා කොන්සියුලර් සේවා බාහිරකරණයට (Outsources) තීරණයකර ඇති බව.

(ii) ගෝලීය අවශ්‍යතාවයන් හා ප්‍රමිතීන් සමග සමපාත වන, සවිමත්, පැතිරුණු, ඵලදායී සේවාවක් ශ්‍රී ලංකා රජයට ලබාදීමට IVS ආයතනය කැමති බැවින් VFS ආයතනය සමග උපායමාර්ගිකව පාර්ශවකරුවෙකු විය හැකි බව.

(iii) ඊවීසා / ඊටීඒ (e-Visa/ETA), සංචාරක ප්‍රවර්ධන, පැමිණි පසු වීසා නිකුත්කිරීම් (On arrival Visa) හා ජීවදත්ත සේවා වැනි සංකීර්ණ වූ සේවා ගෝලීය වශයෙන් සැපයිය යුතු මෙවැනි පුළුල් විෂය පථයක් සහිත අවස්ථාවල සමාන සේවා සපයන්නන් අතර මෙවැනි උපායමාර්ගික සන්ධාන ඇතිකිරීම ධෛර්යමත් කරන බව සහ අදාළ විෂය පථයන් සැලකිල්ලට ගැනීමෙන් ඒවා පිළිගන්නා බව.

(iv) ශ්‍රී ලංකාවේ යෝජිත සේවාවට සමාන සේවයක් සපයන ඉන්දියාවේ සිට ග්‍රීසිය සඳහා වීසා සේවා සැපයීමේ සේවය සඳහා ද VFS ආයතනය සමග සමාන හවුල්කාරිත්වයක් පවත්වා ගෙන යන බව.

(v) IVS ආයතනය දැනට ලංකාවේ ස්ථානගතව සිටින බව සහ දශක ගණනාවක සිට ගමන් බලපත්‍ර හා කොන්සියුලර් සේවා සැපයීමේ ගෝලීය සේවාවන් ලබාදෙන බව.
   (a) ඉන්දියාව වැනි රජයන් ඇතුළු බොහෝ රටවල් නියෝජනය කරන බව.
   (b) ශ්‍රී ලංකාවේ වීසා හා අවශ්‍යතා ළඟාකර ගත හැකි පරිදි අයදුම්පත් මධ්‍යස්ථාන ගෝලීයව ඇති කිරීමේ හැකියාව.
   (c) ගෝලීය වශයෙන් විවධ භාෂාවලින් මෙහෙයුම් කටයුතු ඵලදායී ලෙස සිදුකිරීමේ හැකියාව.
   (d) විශේෂයෙන් රුසියාව වැනි රටවල නව්‍යභාවයෙන් යුතු ගෙවීම් පහසුකම් (Payment gateway) ඇති කිරීමේ හැකියාව.

(vi) VFS ආයතනයට පහත පහසුකම් ඇති බව.
   (a) අනුග්‍රාහක රාජ්‍යයන් 09ක රජයන් සමග කටයුතු කරන ලෝක ව්‍යාප්ත ඊ වීසා/ඊටීඒ වේදිකාවක් පවතින බව.
   (b) තායිලන්තය වැනි රටවල සංචාරක ව්‍යාපාරය දියුණුකර අත්දැකීම් සහිත බව.
   (c) රටවල් 140කට වැඩි සංඛ්‍යාවක ස්ථානගතව සිටින VFS ආයතනය ඌන පූරකයක් ලෙස කටයුතු කරන බව.

**2.6.6.9 යෝජනාවලිය මගින් ලංකාව සඳහා විසඳුම් යෝජනා 07ක් ඉදිරිපත් කිරීම**

ආයතන පිළිබඳ හැඳින්වීමෙන් පසු යෝජනාවලිය මගින් ලංකාව සඳහා විසඳුම් යෝජනා 07ක් පහත මාතෘකා හා උපමාතෘකා යටතේ ඉදිරිපත්කර තිබුණි.

**1.** ඊ වීසා / ඊටීඒ **(e – Visa / ETA)** සේවා සැපයීම.
- 1.1 ශ්‍රී ලංකාවේ සංචාරක පසුබිම.
- 1.2 ආයතනයේ ඊ වීසා සේවය ලබාගන්නා අනුග්‍රාහක රටවල්.
- 1.3 VFS ඊ වීසා / ඊටීඒ සේවාව මගින් වැඩිදියුණු කළ සේවා හා ක්‍රියාකාරකම් ලබාදීම.
- 1.4 VFS Global සමාගමේ ඊ වීසා සේවාවේ ප්‍රධාන ලක්ෂණ
- 1.5 යෝජිත භාවිතා කරන්නන්ගේ ගමන් මඟ
- 1.6 ශ්‍රී ලංකාව සඳහා වූ ඊටීඒ වේදිකාවේ මූලරූපය (Prototype).
- 1.7 තාක්ෂණික කරුණු (Technology Stack)
- 1.8 තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සංවිධානය.
- 1.9 ආරක්ෂණ හා දත්ත සුරක්ෂණභාවය.
- 1.10 ඊටීඒ වේදිකාවක වාසි

**2.** ගෝලීය වශයෙන් කොන්සියුලර් හා පාස්පෝට් සේවා සැපයීම.
- 2.1 වර්තමාන අනුග්‍රාහක විස්තරය.
- 2.2 යෝජනා විස්තරය.
- 2.3 සේවා විෂය පථය.
- 2.4 පිටරට සිටින ශ්‍රී ලාංකිකයන්ට එක් නැවතුමකින් ගමන් බලපත්‍ර හා කොන්සියුලර් අයදුම් කිරීමේ හැකියාව.
- 2.5 යෝජිත කාර්යාල ලැයිස්තුව (රටවල් 11ක නගර 68ක)
- 2.6 සෞදි අරාබි රාජ්‍යයේ ශ්‍රී ලංකා රාජ්‍ය තාන්ත්‍රික කාර්යාලය සමග පවත්වන ලද සම්බන්ධතාවයන්.
- 2.7 යෝජිත ගමන් බලපත්‍ර හා කොන්සියුලර් සේවාවේ වාසි.

**3.** පැමිණීමේදී වීසා නිකුත්කිරීම (On-arrival Visa Service).

**4.** ලංකාව තුළ සිටින විදේශිකයන්ගේ වීසා සේවා සැපයීමේ මධ්‍යස්ථාන (Expat Service)

**5.** ලංකාව තුළ ජීව දත්ත සේවා.
- 5.1 අරමුණු.
- 5.2 යෝජිත ජීව දත්ත සේවා පිළිබඳ විස්තර.
- 5.3 ජීවදත්ත යෝජනාවලිය.

**6**. ගෝලීය සංචාරක ප්‍රවර්ධනය.
- 6.1 දළ විශ්ලේෂණය (Overview)
- 6.2 අනුග්‍රාහක රාජ්‍ය විස්තරය.
- 6.3 සාර්ථකත්වය පිළිබඳ සාක්ෂි.
- 6.4 ලංකාව සඳහා වූ සංචාරක ප්‍රවර්ධන විසඳුම්.
- 6.5 වෙළඳපොළ සංවර්ධනය.
- 6.6 අංශක 360 සංචාරක ප්‍රවර්ධනය.

7. සංචාරක රක්ෂණය.
   7.1 දළ විශ්ලේෂණය (Overview)
   7.2 ප්‍රතිපත්තියේ වාසි
   7.3 මිලදී ගැනීමේ ප්‍රවේශය

**2.6.7 IVS-GBS Technology Service ආයතන විසින් ඉදිරිපත් කරන ලද යෝජනා හා ගිවිසුම අධ්‍යනය කිරීම සහ නිර්දේශ ලබාදීමට කමිටුවක් පත්කිරීම හා කමිටු නිර්දේශ ලබාදීම**

**2.6.7.1 යෝජනා හා ගිවිසුම අධ්‍යනය කිරීම සහ නිර්දේශ ලබාදීමට කමිටුවක් පත්කිරීම**

මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ 2023 සැප්තැම්බර් 21 දිනැති අංක PS/03/PB/PR/05/33/23 දරන ලිපිය **(ඇමුණුම 45)** මගින් 2023 සැප්තැම්බර් 11 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි GBS & IVS,VF ආයතනය මගින් ඉදිරිපත්කර තිබූ ව්‍යාපෘති යෝජනාව හා ගිවිසුම අධ්‍යනයකර නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා ඇගයීම් කමිටුවක් පත්කර තිබුණි. එම කමිටුව මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (සංවර්ධන හා සැලසුම්) ගේ සභාපතිත්වයෙන් හා පහත පරිදි සාමාජිකයින් පස්දෙනෙකුගෙන් සමන්විත වී තිබුණි.

(i) ටී.වී.ඩී. දමයන්ති එස්.කරුණාරත්න මිය - සභාපති - අතිරේක ලේකම් (සංවර්ධන හා සැලසුම්) මහජන ආරක්ෂක අමාත්‍යාංශය

(ii) අයි.එස්.එච්.ජේ. ඉලුක්පිටිය මයා - සාමාජික - ආගමන විගමන පාලක ජනරාල්, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

(iii) චම්පික රාමවික්‍රම මයා - සාමාජික - ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

(iv) එම්.පී.ඩී.පී. පතිරණ මිය - සාමාජික - ප්‍රධාන මූල්‍ය නිලධාරී, මහජන ආරක්ෂක අමාත්‍යාංශය

(v) එම්.ආර්.ජී.ඒ. මුතුකුඩ මයා - සාමාජික - අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, මුල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව (භාණ්ඩාගාර නියෝජිත)

**2.6.7.2 ඇගයීම් කමිටු වාර්තාව ලබාදීම**

ඉහත 2.6.7.1 පරිදි පත්කරන ලද කමිටුව විසින් 2023 ඔක්තෝබර් 26 දින සියලු සාමාජිකයන්ගේ එතඟතාවයෙන් කමිටුවේ වාර්තාව **(ඇමුණුම 46)** ඉදිරිපත්කර තිබුණි. මෙම වාර්තාවේ ඇතුළත් ප්‍රධාන කරුණු පහත පරිදි වේ.

(අ) IVS-GBS Global Service ලෙස ආයතනය විසින් යෝජනාව ඉදිරිපත්කර තිබුණ ද එහි ලියාපදිංචි නාමය GBS Technology Service & IVS Global – FZCO(IVSGBS) හා VFS VF Worldwide Holding LTD (VFS Global) වශයෙන් වන බව.

(ආ) යෝජනාව මගින් ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙත සැපයීමට නියමිත සේවාවන් 9ක් හඳුනාගත හැකි වන බව.

(ඇ) යෝජනාව සැලකූ විට ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙත පහත ප්‍රතිලාභ ලැබෙයැයි නිගමනය කළ හැකි බව.

(i) නවීන තාක්ෂණයෙන් යුතු වීසා සැකසීමේ මෘදුකාංගයක් මගින් මෙරට වීසා ඉල්ලුම් කරන විදේශිකයන් හට කාර්යක්ෂමව සේවා සැපයිය හැකිවීම.

(ii) සංචාරක ප්‍රවර්ධනය මගින් මෙරටට වැඩි සංචාරක ආකර්ෂණයක් ඇති වීම තුළ වීසා ගාස්තු ඇතුළුව මෙරටට වැඩි විදේශ විනිමය ආදායමක් ලබාගත හැකිවීම.

(iii) ජීවමිතික දත්ත (Biometric) හඳුනා ගැනීමේ උපකරණ ගුවන් තොටුපළෙහි ස්ථාපිත කිරීමට හැකිවීම තුළ ගුවන් මගීන්ගේ අනන්‍යතාව නිවැරදිව හඳුනාගැනීමට හැකිවීම.

(iv) විශේෂයෙන් ඉංග්‍රීසි භාෂාව භාවිතා නොවන රටවල් සඳහා ද පහසුවෙන් සේවාවන් සැපයීමට හැකිවීම.

(ඈ) කමිටුව විසින් යෝජනාවලිය අධ්‍යයනය කිරීමේදී වැඩිදුරටත් නිරීක්ෂණය කරන ලද කරුණු ලෙස පහත සඳහන් කරුණු 6 දක්වා තිබුණි.

(i) "ජාතික ආරක්ෂාව තීව්‍ර කිරීම සඳහා ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ප්‍රත්‍යන්ත පාලනයේ විද්‍යුත් සංචරණ අනුමැතිය (ETA) ලබාගැනීමේ පද්ධතිය වැඩිදියුණු කිරීමේ (Revamp) යෝජනාව" යන මැයෙන් 2021 ජූලි 29 දිනැති ව ඉදිරිපත් කරන ලද අංක අමප21/1477/303/117 හා 2021 අගෝස්තු 17 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමැතිය ලැබී ඇති අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව මොබිටෙල් ආයතනය විසින් එම පද්ධතිය සකස්කර අවසන්කර ඇති බවත්, රජයට කිසිදු වැය බරකින් තොරව කෙටිකාලීන වීසා සඳහා ඉල්ලුම්කරුවෙකුගෙන් එ.ජ.ඩොලර් 01ක් පමණක් අයකර අදාළ මෘදුකාංගය සැපයීමට එකඟ වී ඇති බවත්, එසේම එම මෘදුකාංගයට වීසා අයදුම්කරුවන්ගේ අනන්‍යතාවය පිළිබඳ අවදානම් මට්ටම හඳුනාගත හැකිවන පරිදි (Risk Profiling) හා ගුවන් මගීන්ගේ තොරතුරු පරීක්ෂා කිරීමේ පහසුකම් ඇතුළත්ව ඇති බවත්, මේ වනවිටත් අදාළ මෘදුකාංගය සකසා අවසන්කර ඇති අතර ක්‍රියාත්මක කළ හැකි මට්ටමේ පවතින බව හා IVS- GBS Global Services (Powered with VFS Global as a Technical Partner) ආයතනය මගින් යෝජිත මෘදුකාංගය තුළ මෙම පහසුකම් ඇතුළත්ව ඇති බවට නිරීක්ෂණය නොවන බව.

(ii) "ශ්‍රී ලංකාවට පැමිණෙන හා ශ්‍රී ලංකාවේ සංචාරය කරන විදේශිකයන්ගේ වීසා අයදුම්පත් විද්‍යුත් ගමන් අවසර පද්ධතිය හරහා ඉදිරිපත් කිරීම සඳහා බලයලත් නියෝජිතයින් පත් කිරීම " යන මැයෙන් 2020 ජනවාරි 07 දින ඉදිරිපත් කරන ලද 2020 ජනවාරි 22 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමත කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය මගින් චීන ජාතිකයන් සඳහා පමණක් වීසා නිකුත්කිරීමේ අරමුණින් සීමාසහිත ට්‍රැවල්සන් ඉන්ටර්නැෂනල් ට්‍රැවල් සර්විසස් (ෂැංහයි) සමාගම සමග ගිවිසුම් ගතව මෘදුකාංගයක් සංවර්ධනයකර ඇති අතර එය මේ වන විට පරීක්ෂා කිරීම් සිදුකර දියත් කිරීමට බලාපොරොත්තුවෙන් පවතී. එම අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව IVS- GBS Global

Services (Powered with VFS Global as a Technical Partner) ආයතනය වැනි වෙනත් ආයතන කෙටි කාලීන වීසා පහසුකම් සැපයීමට නියෝජිත ආයතන ලෙස පත් කිරීමට පාලක ජනරාල්වරයා වෙත බලය ලබා දී ඇති අතර ඒ තුළින්ම IVS- GBS Global Services (Powered with VFS Global as a Technical Partner) ආයතනය ද මේ සඳහා නියෝජිතායතනයක් ලෙස පත්කිරීමට හැකියාවක් ඇති බව වැඩි දුරටත් නිරීක්ෂණය වන බව.

(iii) IVS- GBS Global Services (Powered with VFS Global as a Technical Partner) ආයතනය මගින් කෙටි කාලීන වීසාවලට අමතරව වාස වීසා ඇතුළු සියලු ම වීසා සඳහා අයදුම්පත් සැකසීම සඳහා යෝජනාවලියක් ඉදිරිපත්කර ඇත. විශේෂයෙන් ආරක්ෂක හේතූන් මත හා රාජතාන්ත්‍රික තත්ත්වයන් මත මහකොමසාරිස් කාර්යාල හා තානාපති කාර්යාල හා විශේෂ අන්තර්ජාතික ආයතන පිළිගත් ක්‍රමවේදය අනුව මෙරට විදේශ කටයුතු අමාත්‍යාංශය මගින් වීසා ඉල්ලීම් දෙපාර්තමේන්තුව වෙත යොමුකරනු ලබයි. නමුත් උක්ත යෝජනාවලිය තුළ මෙම රාජතාන්ත්‍රික වීසා ඉල්ලීම් ද තෙවන පාර්ශවීය නියෝජිත ආයතනයක් මගින් ඉල්ලුම් කිරීමට සිදුවීම උක්ත රාජතාන්ත්‍රික පිළිගත් ක්‍රමවේදය ගැටළු සහගත තත්ත්වයකට පත් කරයි. එසේම ආරක්ෂක හේතූන් මත රාජ්‍යතාත්ත්‍රික මට්ටමින් වීසා ලබාදීමේදී වෙනත් තෙවන පාර්ශවයක් වෙත හෙළි නොකළ යුතු තොරතුරු ද මෙමගින් IVS- GBS Global Services (Powered with VFS Global as a Technical Partner) ආයතනය වෙතට පත් වේ. ඒ අනුව IVS- GBS Global Services (Powered with VFS Global as a Technical Partner) ආයතනය වෙතින් මෙම සේවාව ලබාගැනීමට පෙර ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් වන බලපෑම පිළිබඳව ආරක්ෂක අංශ වෙතින් වාර්තාවක් කැඳවීම සුදුසු බව.

(iv) IVS- GBS Global Services (Powered with VFS Global as a Technical Partner) ආයතනය විසින් කොන්සියුලර් සේවා සැපයීම සඳහා ද ඉල්ලීම් ඉදිරිපත්කර ඇති අතර ආගාමික හා විගාමික පනත ප්‍රකාරව ශ්‍රී ලාංකිකයන්ගේ විදේශ ගමන් බලපත්‍ර සැකසීමේ කටයුතු වෙනත් තෙවන පාර්ශවයක් වෙත පැවරීමේ හැකියාවක් නොමැති බවත් එසේ සිදුකරන්නේ නම් ආගාමික හා විගාමික පනත සංශෝධනයකර ඊට අදාළ පහසුකම ඇතිකර ගත යුතු බව.

(v) IVS- GBS Global Services (Powered with VFS Global as a Technical Partner) ආයතනය මගින් වීසා සැකසීමේ සම්පූර්ණ පද්ධතියම ලබාදීම මත (Frontend හා Backend) පරිගණක පද්ධතියෙහි පරිපාලන බලය (Administrative Power) ආගමන හා විගමන දෙපාර්තමේන්තුවෙන් ගිලිහී යන බව.

(vi) මෙම යෝජනාවලිය IVS, GBS හා VFS යන ආයතන තුනෙහි එකතුවක් ලෙස ඉදිරිපත් වන අතර මේ සම්බන්ධයෙන් එම ආයතන අතර වගකීම් බෙදී යන ආකාරය පිළිබඳ ගිවිසුමෙහි හෝ යෝජනාවලියෙහි ප්‍රමාණවත් කරුණු අඩංගු නොවන බවත් IVS

හා GBS එක ආයතනයක් ලෙස කටයුතු කරන බවට ඩුබායි රාජ්‍යයේ Dubai Integrated Economic Zones හි අංක 12734 යටතේ ලියාපදිංචි වෙළෙඳ බලපත්‍රයක් ඉදිරිපත්කර ඇති බවත් VFS ආයතනය වෙනම Dubai Multi Commodities Center (DMCC) හි බලපත්‍ර අංක DMCC-353188 යටතේ ලියාපදිංචි වී ඇති බවත් එම ආයතන එක්ව Consortium ලෙස ක්‍රියාත්මක වන බව පැහැදිලි කර ඇති අතර ගිවිසුම්ගතවීමේ දී ඉතා පැහැදිලි ලෙස වගකීම් නිර්වචනයකර ගත යුතු බවට දන්වා ඇති බව.

(ඉ) කමිටුව විසින් ඉහත කරුණු සියල්ල සලකා බලන ලද බවත් ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ වීසා නිකුත්කිරීමේ බලයලත් නියෝජිත ලෙස IVS- GBS Global Services (Powered with VFS Global as a Technical Partner) ආයතනය පත් කිරීමට අදාළව පහත යෝජනා ඉදිරිපත් කරන බව.

(i) ආයතන තුන අතර වගකීම් බෙදී යන ආකාරය මෙන්ම පාර්ශවයන් තුන වෙන් වෙන්ව හා සාමූහිකව දෙපාර්තමේන්තුවට වග වන ආකාරය හා දෙපාර්තමේන්තුව සමග ගිවිසුම්ගත වීමේදී ආයතන එක් ආයතනයක් ලෙස හෝ වෙන වෙනම හෝ තම ආයතනයේ වගකීම් පැහැදිලි වන ආකාරයෙන් ගිවිසුම්ගත වීම.

(ii) එම අවස්ථාව ලබාදීමට අනුව දෙපාර්තමේන්තුව වෙත ලබාදීමට යෝජනාකර ඇති මෘදුකාංග හා අනෙකුත් පහසුකම් සුදුසු පරිදි ලබාගැනීම හා එම කරුණු ක්‍රියාත්මක කිරීමේ වගකීම ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙත පැවරීම.

(iii) ඉහත දක්වා ඇති කමිටු නිරීක්ෂණ අංක 2.6.7.2(ඈ)(iii) අනුව IVS-GBS Global Services (Powered with VFS Global as a Technical Partner) ආයතනය වෙතින් මෙම සේවාව ලබාගැනීමට පෙර ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන්වන බලපෑම පිළිබඳව ආරක්ෂක අංශ වෙතින් වාර්තාවක් කැඳවීම.

(iv) සාමාන්‍ය දත්ත ආරක්ෂණ නියාමන ක්‍රියාවලියට (General Data Protection Regulation) යටත්ව දත්ත ආරක්ෂණ සහතිකයක් (Data Protection Certificate) ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

(v) IVS- GBS Global Services (Powered with VFS Global as a Technical Partner) ආයතනය විසින් ඉදිරිපත් කර ඇති තාක්ෂණිකව වීසා දෙපාර්තමේන්තුව වෙත යොමුකර අනුමත කිරීමේ සමස්ත ක්‍රියාවලියම එම ආයතනයේ පරිගණක පද්ධතිය තුළ වන පරිදි ස්ථාපිතව පවතින බව නිරීක්ෂණය කරන අතර වීසාවන්ට අදාළ දත්ත දෙපාර්තමේන්තු පරිගණක පද්ධතිය වෙත ලබාගැනීමේ ක්‍රියාවලිය පමණක් ඉහත ආයතනයේ පරිගණක පද්ධතිය තුළින් ලබාගෙන අනුමත කිරීමේ ක්‍රියාවලිය දෙපාර්තමේන්තු පද්ධතිය තුළ සිදුකර අදාළ අනුමැතිය ඉහත ආයතනයේ පරිගණක පද්ධතියට යොමු කිරීම හා අදාළ අයදුම්කරුවන් වෙත දැන්වීම.

(vi) ඉදිරි වසර 12 තුළ ශ්‍රී ලංකාවේ සංචාරක ප්‍රවර්ධනය කරන ආකාරය පිළිබඳව අදාළ ආයතන විසින් පුරෝකථනයක් ලබා දී ඇති අතර එම යෝජනා අනුව සියයට 80 සංචාරක ප්‍රවර්ධනයක් විය යුතු වන අතර ඔවුන්ගේ ප්‍රාග්ධන වියදම් හා එම සංචාරක පුරෝකථනය සමපාත වන වර්ෂයෙන් (වසර පහක් තුළ සමපාත වන බව ඉදිරිපත්කර ඇති දත්ත අනුව පැහැදිලි වේ.) වසර තුනක සහන කාලයක් ලබා දී මෙම ආයතනයේ ක්‍රියාවලිය පිළිබඳ සමාලෝචනයක් ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් සිදු කර ඉදිරි වර්ෂ පිළිබඳ තීරණ ගැනීම.

(vii) වීසා Onarrival ලබාගැනීමේදී අයදුම්කරුවන් සඳහා දෙපාර්තමේන්තු පරිගණක පද්ධතිය හා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් මගින් පහසුකම් සැපයිය හැකි බැවින් දෙපාර්තමේන්තුව අයකරන ගාස්තුවට අමතර ගාස්තුවක් අයකිරීම සුදුසු නොවන බැවින් ඒ සඳහා දෙපාර්තමේන්තු පද්ධතිය තුලින් වීසා ලබාදීම සුදුසු බවට නිර්දේශ කිරීම.

(viii) ඉහත අංක (i),(ii),(iii),(iv),(v) හා (vi) කරුණුවලට යටත්ව IVS – GBS Global Services (Powered with VFS Global as a Technical Partner ) ආයතනය විසින් ඉදිරිපත් කර ඇති යෝජනාවලිය පරිදි මෙම ආයතනයට වීසා ලබාදීමට අදාළ අයදුම්පත් මාර්ගගතව ආගමන විගමන දෙපාර්තමේන්තුව වෙත යොමුකිරීමට අදාළ අනුමැතිය ලබාදීම සුදුසු බවට නිර්දේශ කිරීම.

(ix) මෙම යෝජනාවලිය ක්‍රියාත්මක කිරීම හේතුවෙන් IVS- GBS Global Services (Powered with VFS Global as a Technical Partner) ආයතනය විසින් සපයනු ලබන කුමන හෝ සේවාවක් කුමන හෝ කරුණක් මත වන කුමන හෝ ගාස්තුවක් ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට හෝ ශ්‍රී ලංකා රජයට වැය බරක් ලෙස නොපැවතිය යුතු වන අතර එම සියලු වැය IVS- GBS Global Services (Powered with VFS Global as a Technical Partner) ආයතනය විසින් අදාළ අයදුම්කරුවන් වෙතින් අයකරනු ලබන එ.ජ. ඩොලර් 1850 ක ගාස්තු මුදල තුළ ම අදාළ ආයතනය ආවරණයකර ගත යුතු ය.

(x) සංචාරක ව්‍යාපාරය හා සම්බන්ධ සියලු කරුණු සඳහා සංචාරක කටයුතු අමාත්‍යාංශයේ එකඟතාවය ලබාගත යුතු බව.

(xi) යෝජිත ගිවිසුම සම්බන්ධයෙන් කමිටු නිරීක්ෂණ නීතිපතිවරයා වෙත ලබාදීමෙන් අනතුරුව නීතිපතිවරයාගේ උපදෙස් අනුව ඉදිරි කටයුතු කිරීම සුදුසු බව.

### 2.6.8 ගිවිසුම සම්බන්ධයෙන් නීතිපතිවරයාගේ නිෂ්කාශණ ලබා ගැනීම

2023 නොවැම්බර් 09 දිනැති ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ පාලක ජනරාල්ගේ ලිපිය මගින් 2023 සැප්තැම්බර් 11 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් නීතිපතිවරයාගේ නිශ්කාෂණ ලබාගන්නා ලෙස නිර්දේශකර තිබූ ගිවිසුම නිශ්කාෂණය සඳහා නීතිපතිවරයා වෙත ඉදිරිපත්කර තිබුණි. ඒ සඳහා 2023 නොවැම්බර් 15 දින නීතිපති දෙපාර්තමේන්තුවේ

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිස්ටර් ජනරාල්ගේ (නීතිපති වෙනුවට) අනුදැනුම ඇතිව (Sgd) රජයේ නීතීඥ විසින් නිරීක්ෂණ ඉදිරිපත්කර තිබුණි. **(ඇමුණුම 47)** එම නිරීක්ෂණවල ඇතුළත්ව තිබූ ප්‍රධාන කරුණු කිහිපයක් පහත පරිදි වේ.

(i) මණ්ඩල තීරණය අනුව ගිවිසුමට එළැඹීම සඳහා අනුමැතිය ලබා දී ඇත්තේ IVS-GBS Global Services ආයතනය සඳහා පමණක් වුව ද, කෙටුම්පත් ගිවිසුම අනුව එම ආයතන නාමයන් GBS Technology Services හා IVS Global – FZCO හා VFS VF Worldwide Holdings ලිමිටඩ් යන ආයතන සඳහන් වන බව සහ අමාත්‍ය මණ්ඩල තීරණය හෝ සංදේශයෙහි යොමු දක්වා නොමැති පසුව සඳහන් ආයතනය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබේ ද යන්න තහවුරු කරගත යුතු බව.

(ii) ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට නීතිමය පුද්ගලභාවයක් නොමැති බැවින් ගිවිසුමේ ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ පාලක ජනරාල් වෙනුවට ශ්‍රී ලංකා රජයේ නියෝජිත වශයෙන් ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ පාලක ජනරාල් ලෙස සඳහන් කළ යුතු වන බව.

(iii) ගිවිසුමට එළැඹීමට පෙර අදාළ සමාගම්වල නීතිමය තත්ත්වය තහවුරු කරගත යුතු බව.

(iv) GBS Technology Services හා IVS Global – FZCO හා VFS VF Worldwide Holdings Ltd යන නාමයන්හි ඇති කෙටි යෙදුම් භාවිතා කිරීමේ නිවැරදිභාවය පිළිබඳ නැවත තහවුරුකර ගත යුතු බව.

(v) කෙටි යෙදුම් යෙදීමේදී සෑම අවස්ථාවකම එකම යෙදුම භාවිතා කළ යුතු වන බව හා e - Visa හා ETA යන යෙදුම් නිර්වචනයන්ට ඇතුළත්ව නොමැති බව.

(vi) ගිවිසුම්වලට ඇතුළත් නොකළ යුතු වචන ඇතුළත් කිරීම්, අවිනිශ්චිත වචන භාවිත ආදී නිවැරදි කළ යුතු අවස්ථා 08ක් පිළිබඳව පෙන්වා දී තිබූ අතර ව්‍යාකරණ දෝෂ හා යතුරුලියන දෝෂ පිළිබඳ සැලකිලිමත් වී නිවැරදි වචන යොදන ලෙස දන්වා තිබුණි.

(vii) තවද, නිශ්කාශනය සඳහා ඉදිරිපත් කර තිබූ ගිවිසුමෙහි උපවගන්ති අංක 2.10, 4.2, 4.3, 4.4, 5.1, 5.2, 5.3, 7.1, 7.6, 7.8, 7.10, 7.13, හා 7.17. ඇතුළත් දේ නැවත සළකා බලන ලෙස හා යම් යම් වැරදි නිවැරදි කිරීම් සිදුකරන ලෙස උපදෙස් ලබා දී තිබුණි.

(viii) තවද ඇමුණුම් සම්බන්ධ නිරීක්ෂණ නොමැති බවත් ව්‍යාකරණ හා යතුරුලියන වැරදි සම්බන්ධ නිරීක්ෂණ ඉදිරිපත් නොකරන බව ද පෙන්වා දී තිබුණි.

(ix) ඉහත නිවැරදි කිරීම්වලට යටත්ව ගිවිසුම ක්‍රියාත්මක කිරීමට නීතිමය බධාවක් නොමැති බව සහ ගිවිසුම සම්බන්ධ සියලුම මූල්‍යමය හා තාක්ෂණික කරුණු පිළිබඳ ඉතා හොඳින් සළකා බලා ඇති බව හා අවශ්‍ය සියලු අනුමැතීන් දැනටමත් ලබාගෙන හෝ ඉදිරියේදී ලබාගෙන ඇති බවට තමා විසින් උපකල්පනය කරන බව.

**2.6.9 2023 දෙසැම්බර් 04 දිනැති අංක අමප23/2323/626/018-1 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව**

"ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශිකයන් සඳහා වන වීසා අයදුම්පත් මාර්ගත ක්‍රමය ඔස්සේ ඉදිරිපත් කිරීම සඳහා බලයලත් නියෝජිතයින් පත්කිරීම සම්බන්ධ වාර්තාව හා නීතිපති නිෂ්කාශණ ඇතුළත් ගිවිසුම ඉදිරිපත් කිරීම" යන මැයෙන් එවකට මහජන ආරක්ෂක අමාත්‍යවරයා විසින් උක්ත අමාත්‍ය මණ්ඩල සංදේශය අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර තිබුණි **(ඇමුණුම 48).** එම සංදේශයේ පසුබිම්ගත කරුණු හා නිර්දේශ පහත පරිදි වේ.

**(අ) පසුබිම**

(i) ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශිකයින් සඳහා වන වීසා අයදුම්පත් සහ විදේශික ශ්‍රී ලාංකිකයන්ගේ ගමන් බලපත්‍ර අයදුම්පත් මාර්ගගත ක්‍රමය ඔස්සේ ඉදිරිපත් කිරීම සඳහා බලයලත් නියෝජිතයන් පත්කිරීම යන මැයෙන් 2023 සැප්තැම්බර් 08 දිනැතිව ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2023 සැප්තැම්බර් 11 දින අමාත්‍ය මණ්ඩල තීරණ අංක අමප/23/1692/626/018 යටතේ අනුමැතිය ලැබී ඇති බව.

(ii) ඒ අනුව GBS Technology Services & IVS Global – FZCO ආයතනය මගින් ඉදිරිපත් කර ඇති ව්‍යාපෘති යෝජනාව හා ගිවිසුම අධ්‍යනය කර නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා සුදුසු ඇගයීම් කමිටුවක් පත් කරන ලෙස හා එම ඇගයීම් කමිටුවේ නිර්දේශ සහිත වාර්තාව මෙම ආයතනය සමග අත්සන් කිරීමට යෝජිත ගිවිසුම සඳහා නීතිපතිවරයාගෙන් ලබාගත් නිෂ්කාශන ද සහිතව ඉදිරිපත් කරන ලෙස උක්ත අමාත්‍ය මණ්ඩල තීරණය මගින් දන්වා ඇති බව.

(iii) උක්ත තීරණය අනුව මහජන ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්ගේ අංක PS/03/PB/PR/05/33/23 හා 2023 සැප්තැම්බර් 21 දිනැති ලිපිය මගින් ඉහත ආයතනය මගින් ඉදිරිපත් කර ඇති ව්‍යාපෘති යෝජනාව හා ගිවිසුම අධ්‍යයනය කර නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා පත්කරන ලද ඇගයීම් කමිටුවේ වාර්තාව හා නීතිපතිගේ නිශ්කාශන අනුව සකස්කරන ලද යෝජිත ගිවිසුම ඇමුණුමක් ලෙස ඉදිරිපත් කරන බව.

(iv) 2023 සැප්තැම්බර් 08 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයේ සඳහන් IVS Global Services යන්න එම ආයතනය ලියාපදිංචි වී ඇති ආකාරය අනුව එළැඹීමට යෝජිත ගිවිසුමේ පරිදි GBS Technology Services & IVS Global – FZCO හා VFS VF Worldwide Holdings Ltd ලෙස සංශෝධනය විය යුතු බව.

(v) මෙම යෝජනාවලිය ක්‍රියාත්මක කිරීම සඳහා 2023 සැප්තැම්බර් 11 දින අමාත්‍ය මණ්ඩල තීරණ අංක අමප/23/1692/626/018 යටතේ අනුමැතිය ප්‍රකාරව මේ සඳහා නිර්දේශ ලබා දීම පිණිස පත් කළ කමිටුවේ නිර්දේශයන් ද ලබා දී ඇති බව හා GBS Technology Services & IVS Global – FZCO හා VFS VF Worldwide Holdings Ltd ආයතනය සමග ගිවිසුම් ගත වීම සඳහා යෝජිත ගිවිසුම නීතිපතිවරයාගේ නිරීක්ෂණවලට අනුකූලව සකස්කර ඉදිරිපත්කර ඇති බව.

**(ආ) නිර්දේශ**

(i) 2023 සැප්තැම්බර් 11 දින අමාත්‍ය මණ්ඩල තීරණ අංක අමප/23/1692/626/018 යටතේ අනුමැතිය මත මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් පත්කරන ලද ඇගයීම් කමිටුව විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවේ අංක 01 සිට 09 දක්වා වන නිර්දේශ ක්‍රියාත්මක කිරීමට හා යෝජිත ගිවිසුමට එළඹීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම.

(ii) 2023 සැප්තැම්බර් 11 දිනැති ව ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයේ සඳහන් IVS GBS Technology Services යන්න කමිටු වාර්තාවේ සඳහන් පරිදි හා අත්සන් කිරීමට යෝජිත ගිවිසුමේ පරිදි GBS Technology Services & IVS Global – FZCO හා VFS VF Worldwide Holdings Ltd ලෙස සංශෝධනය කිරීම.

**(ඇ) මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති ඇමතිතුමාගේ නිරීක්ෂණ**

2023 දෙසැම්බර් 11 දිනැති අංක PFD/PMD/CM/2023/PS/488 දරන ලිපිය මගින් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් මෙම අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවේ යෝජනා (නිර්දේශ) සඳහා පහත නිරීක්ෂණ ලබා දී තිබුණි. **(ඇමුණුම 49)**

යෝජනාව (i) ඇගයීම් කමිටුව විසින් විශේෂයෙන් දක්වා ඇති කරුණුවලට යටත්ව ඉහත සඳහන් වාර්තාව නිර්දේශ කර ඇති බව නිරීක්ෂණය කරන බව සහ දක්වා ඇති එම නිර්දේශ අතර ජාතික ආරක්ෂාව හා ජාත්‍යන්තරව හඳුනාගත් දත්ත සුරක්ෂණය පිළිබඳ සහතික ආදිය ලබා ගැනීම ඉතා වැදගත් බව.

ඒ අනුව ඇගයීම් කමිටු නිර්දේශවලට හා ගිවිසුමට එළඹීමට පෙර මහජන ආරක්ෂක අමාත්‍යාංශ ගිවිසුම සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුව ඉදිරිපත් කළ නිර්දේශයන් දැඩි ලෙස අනුගත වීමට යටත්ව ඉහත සඳහන් (i) යෝජනාව සම්බන්ධයෙන් විරෝධතාවක් නොමැති බව.

**(ඈ) අමාත්‍ය මණ්ඩල අනුමැතිය**

2023 දෙසැම්බර් 11 දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී මුදල්,ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති ඇමතිතුමාගේ නිරීකෂණවලට අනුගතව කටයුතු කිරීමට යටත්ව අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවේ සඳහන් ඉහත 2.6.9 (ආ) (i) හා (ii) හි සඳහන් නිර්දේශ සඳහා අනුමැතිය ලබා දී තිබුණි. **(ඇමුණුම 50)**

**(ඉ) අමාත්‍ය මණ්ඩල තීරණය දැනුම් දීම**

(i) අමාත්‍ය මණ්ඩලයේ ලේකම්ගේ 2023 දෙසැම්බර් 13 දිනැති අංක 23/2323/626/018-1 දරන ලිපිය මගින් **(ඇමුණුම 51)** අමාත්‍ය මණ්ඩල තීරණ මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත දන්වා තිබුණි.

(ii) මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් 2023 දෙසැම්බර් 13 දින සටහනක් මගින් ඉදිරි කටයුතු සඳහා ආගමන විගමන පාලක ජනරාල් වෙත යොමු කරන ලෙස අතිරේක ලේකම් (සංවර්ධන) වෙත දන්වා තිබුණි.

(iii) මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ අතිරේක ලේකම්ගේ 2023 දෙසැම්බර් 13 දිනැති අංක PS/10/01/30/CPV දරන ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ පාලක ජනරාල් අමතන ලද ලිපිය මගින් **(ඇමුණුම 52)** අමාත්‍ය මණ්ඩල තීරණ සම්බන්ධව අවශ්‍ය කටයුතු නොපමාව සිදුකරන ලෙස දන්වා තිබුණි.

### 2.6.10 IVS-GBS හා VFS Worldwide Holding Ltd යන ආයතන සමඟ ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ පාලක ජනරාල් (CG – DIE) ගිවිසුමකට එළැඹීම

ඉහත 2.6.9(ඇ)හි සඳහන් අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි IVS-GBS හා VFS Worldwide Holding Ltd සමඟ 2023 දෙසැම්බර් 21 දින CG – DIE ගිවිසුමකට එළැඹ තිබුණි **(ඇමුණුම 53).** එම ගිවිසුමේ සඳහන් ප්‍රධාන කරුණු කිහිපයක් පහත පරිදි වේ.

#### 2.6.10.1 ගිවිසුමට සම්බන්ධ ප්‍රධාන පාර්ශ්වයන්

**(අ) GBS Technology Services & IVS Global – FZCO**

ගිවිසුමේ පළමු පාර්ශවකරු වේ. අංක DSO-FZCO-11487 යටතේ ඩුබායිහි ලියාපදිංචි සමාගමක් ලෙස ගිවිසුමේ දක්වා ඇත. ප්‍රධාන කාර්යාලය එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ, ඩුබායි හි ඩුබායි සිලිකෝන් ඔයසිස්, IFZA ඩුබායි ඩිජිටල් පාර්ක් හි පිහිටා ඇති බව දක්වා තිබුණි.

**(ආ) ශ්‍රී ලංකාවේ ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ පාලක ජනරාල්**

ගිවිසුමේ දෙවන පාර්ශවකරු වේ. ශ්‍රී ලංකාවේ ආගමන හා විගමන පාලක ජනරාල් නියෝජනය කරමින් ඉලුක්කුඹුරගේ ශ්‍රීනාත් හර්ෂදේව ජයසේන ඉලුක්පිටිය ගිවිසුමට අත්සන්කර තිබුණි.

**(ඇ) VF Worldwide Holdings Ltd**

ගිවිසුමේ තෙවන පාර්ශවකරු වේ. DMCCහි ලියාපදිංචි සමාගමක් ලෙස සඳහන්කර ඇත. ප්‍රධාන කාර්යාලය එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ඩුබායි හි JLT, ක්ලස්ටර් ජී, ජුමේරියා ව්‍යාපාර මධ්‍යස්ථානය, ඒකක 3101 හි පිහිටා ඇති බව දක්වා තිබුණි.

**(ඈ) ශ්‍රී ලංකාවේ සමාගම් පනත යටතේ ස්ථාපිත කරන ලද සමාගම්**

මෙම ව්‍යාපෘතියට අදාළ ගිවිසුමෙහි සඳහන් මෙම ආයතන 03ට අමතරව GBS Technology Services Lanka (Pvt) Ltd නමින් 2007 අංක 07 දරන සමාගම් පනතේ 27 වන වගන්තිය යටතේ පුද්ගලික සමාගමක් ලෙස 2024 පෙබරවාරි 08 දින සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් යටතේ ලියාපදිංචි කර තිබුණි **(ඇමුණුම 54).** මෙම සමාගමේ පරමාර්ථ ලෙස, ශ්‍රී ලංකා රජය

සමග එලඹී ගිවිසුම අනුව e – Visa සේවා සැපයීම, Visa ආශ්‍රිත සේවා සැපයීම සහ 2021 පෙබරවාරි 03 දිනැති අංක 2213/35 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය **(ඇමුණුම 55)** මගින් ප්‍රකාශිත තාක්ෂණික, පරිපාලන හා සම්බන්ධිත සේවා සැපයීම ලෙස දක්වා තිබුණි.

එසේ ම මෙම සමාගමේ අවම අධ්‍යක්ෂවරු ගණන දෙදෙනෙක් වූ අතර තනි අයිතිකරු ලෙස GBS Technology Services and IVS Global –FZCO නමින් එක්සත් අරාබි එමිරේට් රාජ්‍යයේ සමාගම් ලියාපදිංචි කිරීමේ අංක DSO-FZCO-11487 යටතේ ලියාපදිංචිකර තිබූ සහ අංක 12734 **(ඇමුණුම 56)** යටතේ ඩුබායි විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයේ වෙළඳ බලපත්‍රය ලබා තිබූ සමාගම විසින් මෙම සමාගමේ නිකුත්කළ කොටස් 100ම හිමි කරගෙන තිබුණි. තවද මෙම සමාගම ලියාපදිංචි කිරීම 2017 අංක 12 දරන විනිමය පනතේ 7 වන වගන්තිය සමග කියවිය යුතු 29 වන වගන්තිය යටතේ සාදනු ලබන නියෝගවලට අනුකූලව සිදුකළ යුතු බව ද දක්වා තිබුණි.

**2.6.10.2 ගිවිසුමේ 1 වන ඡේදය - ගිවිසුම යටතේ වන සේවා හඳුනාගැනීම**

ගිවිසුම අනුව පහත සඳහන් සේවා සම්පූර්ණ පදනමට (Exclusive Basis) සැපයීමට එකඟව තිබුණි.

(i) ඊ වීසා / ඊටීඒ (e- Visa / ETA) වේදිකාවක් ගොඩනැගීම හා මෙහෙයුම් කිරීම.

(ii) ලංකාවේ දැනට සංචාරක හා වාස වීසා මත රැඳී සිටින විදේශිකයන්ගේ වීසා සම්බන්ධව කටයුතු කිරීම.

(iii) සංචාරක ප්‍රවර්ධන සඳහා ප්‍රචාරණ මත වැඩසටහන් සිදු කිරීම.

**2.6.10.3 ගිවිසුමේ 2 වන ඡේදය - සේවා සැපයීමේ විෂය පථය**

ගිවිසුමේ 2.1 ඡේදය පරිදි ඇමුණුම 1හි සඳහන් සේවා සම්පූර්ණ පදනමෙන් (exclusive) සැපයීමට ගිවිසුම්ගත වී තිබුණි.

**(අ) ගෝලීය ඊ වීසා වේදිකාව (e - Visa platform)**

(i) ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ පාලක ජනරාල් වෙනුවෙන් පිටුවක් නිර්මාණය කිරීම හා කළමනාකරණය, අයදුම්පත් ක්‍රියාවලිය, වීසා නීතිරීති, වීසා අයදුම්පත් තත්ත්වයන් හා පැමිණිලි ආදිය සඳහා දුරකථන හා ඊ තැපැල් සේවාවන් පැවැත්වීම සහ පාලක ජනරාල් දන්වා ඇති පරිදි වීසා නීති පිළිබඳ දැනුවත් කිරීම.

(ii) මාර්ගගත අයදුම්පත් ඉදිරිපත් කිරීමේ සේවාව.

(iii) පාලක ජනරාල්ට අවශ්‍ය අයදුම්කරුවන්ගේ විස්තර ලබාදීම හා අයදුම්පත්වල නිවැරදිභාවය තහවුරුකර ගැනීම.

(iv) එකඟ වූ කාලපරාස අනුව අයදුම්පත් පාලක ජනරාල් වෙත ඉදිරිපත් කිරීම.

(v) වීසා ගාස්තු හා සේවා ගාස්තු අය කිරීම.

එක්සත් ජනපද ඩොලර්වලින් වීසා ගාස්තු අයකරන අතර ඒවා බත්තරමුල්ල ලංකා බැංකුවේ අංක 71963786 දරන බැංකු ගිණුමේ තැන්පත් කරන බව හා අයදුම්පත් සඳහා තහවුරු කිරීම් ලද පසු වීසා ගාස්තුව ප්‍රේෂණය කරන බව.

(vi) දත්ත සුරක්ෂණය පිළිබඳ පාලක ජනරාල් හා එකඟ වූ ප්‍රමිතින් අනුව කටයුතු කිරීම හා වෙබ් ඩේටා සේවා පැවැත්වීම.

(vii) දත්ත ඉවත්වීමේ / කිරීමේ පාලක ජනරාල් සමග එකඟ වන ප්‍රතිපත්තිය අනුව සිදු කරනු ඇත.

(viii) දුරකථන, ඊ තැපෑල හා Chat පහසුකම් භාෂා ගණනාවකින් ලබාදීම.

**(a) පහත සඳහන් අගය එකතු සේවාවන් ද ලබාදීමට එකඟ වී තිබුණි**

(i) IVS GBS විසින් ආගමන විගමන පාලක ජනරාල් ලබාදෙන පණිවුඩ මෙහෙයුම් කිරීමට සහ ලංකාවේ වීසා ක්‍රියාවලිය හා සංචාරක තොරතුරු ඇතුළත් වෙබ් පිටුවක් නිර්මාණය කිරීමට.

(ii) IVS GBS සහ VFS විසින් සංචාරක නියෝජිතයන්ට (Travel agent & their third parties) හා ඔවුන්ගේ තෙවන පාර්ශවයන්ට දැනුවත් කිරීමේ පණිවුඩ (Electronic alerts) මගින් විසා සේවා හා සංචාරක ප්‍රවර්ධන කිරීම් පිළිබඳ දැනුම්දීම.

(iii) ඇතුල්වීමේ ස්ථානවල (Entry Points Airports & Seaports) භාවිතා කිරීම සඳහා ජීවදත්ත ලබාගත හැකි යන්ත්‍ර 50ක් හා ස්ථාන 72ක් අනුව මුහුණු හඳුනාගත හැකි කැමරා 50ක් IVS GBS හා VFS විසින් දෙපාර්තමේන්තුව වෙත සැපයීම.

**(b) ගෙවීම් සුරක්ෂණ ලබා දීම**

ලංකාවේ විසා ගාස්තු ගෙවීම් අවශ්‍යතා සපුරාලීම පිණිස පාලක ජනරාල් නිර්දේශ කරන බැංකුවක ගිණුමක් විවෘතකර පාලක ජනරාල් එකඟ වන මුදලක් එහි තැන්පත් කරන බව සහ අවශ්‍ය බැංකු සුරක්ෂණයක් ද ලබාදෙන බව.

**(ආ) ලංකාව තුළ සිටින විදේශිකයින්ගේ වීසා පිළිබඳ සේවා (Expat Visa Service In Sri Lanka)**

(a) මෙම සේවාව සඳහා පහත කාණ්ඩ 2 ඇතුළත් වන බව.

(i) දැනට ශ්‍රී ලංකාවේ ජීවත්වන විදේශිකයන්ගේ සංචාරක හා වාස වීසා දිගු කිරීම්. ඒ අනුව ගුවන්තොටුපළ හා නැව්තොටුපළවල පවත්නා කවුන්ටර් දක්වා ක්‍රියාවලිය මෙම Expat Visa Service මගින් ආවරණයකර ඇත. (ඉහත e - Visa / ETA ක්‍රමයේ මෙන්)

(ii) මෙම ක්‍රමය යටතේ වීසා නිකුත් කිරීමේදී සේවා ගාස්තු පිළිබඳ එකඟතාවයකට පැමිණ නොතිබූ අතර එය පාර්ශව අතර අනොන්‍යව එකඟතාවයකට පත්විය යුතු බව දක්වා තිබුණි.

(b) අදාළ සේවා සැපයුම්කරුගේ වෙබ් පිටුව වෙත උඩුගත කරන වීසා සම්බන්ධ තොරතුරු බුද්ධිමය දේපළ අයිතිවාසිකම් පිළිබඳ තුන්වන පාර්ශවයක් හිමිකම් පෑමට යටත් නොවන බව.

(c) ආගමන හා විගමන පාලක ජනරාල් විසින් ඊ වීසා හා ඊටීඒ හා ලාංකික නොවන වාස හා සංචාරක විසා සම්බන්ධ අයදුම්පත් පරීක්ෂා කර අනුමත කිරීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ හා එකම නීත්‍යානුකූල බලය (Competence) පවත්වාගෙන යන බව.

(d) දෙපාර්තමේන්තුව වෙත පැමිණ ඉදිරිපත් කරන අයදුම්පත් හා අනෙකුත් ලේඛන පිළිබඳ වගකීම පාලක ජනරාල් සතු බව හා ඊ වීසා ඊටීඒ හා expat වීසා පිළිබඳ IVS GBS ගැළපුම් වේදිකාව මගින් අවසන් තීරණය ගත යුතු බව.

(e) පාලක ජනරාල් විසින් එකිනෙකට වෙනස් වීසා වර්ග සම්බන්ධ වීසා නිකුත්කිරීමේ සම්පූර්ණ බලය දෙපාර්තමේන්තුව සතු බව.

(f) දෙපාර්තමේන්තුව එකඟ වී ඇති නීතිරීති හා ඉදිරියේදී කලින් කළ හඳුන්වාදෙන නීතිරීති අදාළ වන බව.

(g) කලින් නොදන්වා පද්ධති පරීක්ෂණ සිදුකිරීම සඳහා පාලක ජනරාල්ට හිමිකම් ඇති බව.

(h) මෙහෙයුම් කටයුතු ක්‍රියාත්මක කිරීම:- පාලක ජනරාල්ගේ නිලධාරීන් සමග පද්ධතිය පිළිබඳ හා එය අවශ්‍ය පරිදි.

(i) සේවා සපයන්නා විසින් තම (Territory) සේවාව ගෝලීය වශයෙන් ලබාදෙන බව.

(j) ගෙවීම් කොන්දේසි:- IVS GBS විසින් පාලක ජනරාල් විසින් නිර්දේශ කරන ලංකාවේ බැංකුවක එක්සත් ජනපද ඩොලර්වලින් ගිණුමක් ආරම්භ කිරීමට එකඟ වන බව IVS GBS පූර්ව එකඟ වූ තැන්පතු ප්‍රමාණයක් එහි පවත්වාගෙන යන බව සහ එකඟ වූ අවම ප්‍රමාණයක් එහි තිබිය යුතු බව.

(k) සම්බන්ධිත අමතර සේවා වෙනම ගාස්තු අයකර ලබාදිය හැකි බව.

**2.6.10.4 ගිවිසුමේ 3 වන ඡේදය - සේවා ගාස්තු**

(අ) සේවා ලබාගන්නා අයදුම්කරුවන් විසින් ගිවිසුමේ ඇමුණුම 2හි සඳහන් පරිදි පහත සේවා ගාස්තු ගෙවිය යුතු බව.

(a) සාමාන්‍ය වීසා වර්ග සඳහා එක් පුද්ගයෙකු විසින් ගෙවිය යුතු සේවා ගාස්තුව එ.ජ.ඩොලර් 18.50.

(b) මුළු සේවා ගාස්තුව පහත පරිදි සංයුත වන බව.

- අයදුම්පතක් සඳහා සේවා ගාස්තුව එ.ජ.ඩොලර් 18.50.
- මෙම ගාස්තුව තුළ ගෙවීම් ක්‍රමවේදයට දේශීය බදු සඳහා සහ වෙනත් ගනුදෙනු ගාස්තු අඩංගු නොවන බව.

(ආ) පාලක ජනරාල් සමග එකඟ වූ පරිදි IVS GBS ආයතනය විසින් සේවා ගාස්තු සඳහා එකඟ වී ඇත්තේ බදු රහිතව බව හා ඊ වීසා, ඊටීඒ හා Expat වීසා සේවා සැපයීමේදී බදු අයකරන බව.

(ඇ) ගිවිසුම අත්සන් කිරීමෙන් පසු වීසා ගාස්තු සංශෝධනය වුව ද සේවා ගාස්තු දිගින් දිගටම එකඟ වූ පරිදි අය කරන බව.

(ඈ) ගිවිසුමට අදාළ සෑම පාර්ශවයක් විසින්ම තම ව්‍යාපාරයට අදාළ බදු ගෙවිය යුතු අතර එය කලින් කළ වෙනත් පාර්ශවයකට පැවරිය නොහැකි බව.

(ඉ) මෙම ගිවිසුම යටතේ වන සියලු ගෙවීම් සඳහා රඳවා ගැනීම් බදු අදාළ වන බව.

**2.6.10.5 ගිවිසුමේ 4 වන ඡේදය - ගිවිසුම් කාලය හා අවසන් කිරීම**

(අ) මෙම ගෝලීය තනි අයිතිය (Exclusive) සහිත ගිවිසුම වර්ෂ 10ක කාලයක් සඳහා එළැඹෙන අතර තවත් වර්ෂ 06ක් දක්වා දීර්ඝකළ හැකි බව.

(ආ) ප්‍රමාණාත්මක වූ යම් ගිවිසුම් ප්‍රතිපාදන කඩකිරීම, අනෙක් පක්ෂය බුන්වත්භාවයට පත්වීම හා අනෙක් පක්ෂය විසුරුවා හැරීමට ලක්වීම යන අවස්ථාවල ගිවිසුම අවසන් කළ හැකි බව.

(ඇ) ගිවිසුම අවසන් කිරීමට පෙර තිබූ අයිතීන්, වගකීම් සහ ඉල්ලීම් ගිවිසුම අවසන්වීමෙන් බලපෑමට ලක්නොවන බව.

**2.6.10.6 ගිවිසුමේ 5 වන ඡේදය - වන්දි හා වගකීම්**

(අ) ගිවිසුම යටතේ භාණ්ඩාගාරය (Outsources) කරන ලද කිසිදු සේවාවක් වෙනුවෙන් දෙපාර්තමේන්තුවෙන් කිසිදු ප්‍රතිපූරණයක් සිදුනොකරන බව.

(ආ) ගිවිසුම යටතේ IVS GBS හා VFS ආයතන ඔවුන්ගේ උපකොන්ත්‍රාත්කරුවන් නියෝජිතයන් හෝ සේවකයන් විසින් මෙහෙයුම් කාර්යයන් ඉටුකිරීමේදී හෝ ඉටුනොකිරීම නිසා පැන නගින පාඩු පිරිවැය හා හානි සඳහා වන්දි ගෙවීමට බැඳෙන බව.

(ඇ) ගිවිසුම යටතේ වක්‍රව යම් බැඳීමකට යටත් වේ නම් එහි උපරිම වගකීම පසුගිය මාස 06 තුළ උපයන ලද ආදායම නොඉක්මවිය යුතු බව.

**2.6.11 සේවා සැපයුම්කරු වූ GBS Technology Service & IVS Globle-FZCO, VF Worldwide Holding Ltd යන ආයතන ගිවිසුම යටතේ සේවා සැපයීම් සිදුකිරීම හා සේවාවන් සැපයීම පිළිබඳ වීසා අයදුම්කරුවන්ගෙන් ලැබී තිබූ පැමිණිලි පිළිබඳ විස්තර**

**2.6.11.1** 2.6.7 ඡේදයෙහි සඳහන් 2023 දෙසැම්බර් 21 දින එළැඹෙන ලද ගිවිසුම යටතේ වූ සේවා සැපයීම සඳහා වූ පූර්ව කටයුතු සිදුකර 2024 අප්‍රේල් 17 දින 00.00 පැයට ප්‍රථමයෙන්ම මාර්ගගත වීසා ක්‍රමය යටතේ වීසා සේවා සැපයීමේ කටයුතු ආරම්භකර තිබුණි. ගිවිසුම යටතේ වූ ඉතිරි සේවාවන් සැපයීම ආරම්භ කරන දින වකවානු පිළිබඳ දෙපාර්තමේන්තුව සමග එකඟතාවයක්, වැඩපිළිවෙළක් හෝ කාලවකවානු පිළිබඳ සැලැස්මක් සකස්කර තිබූ බවට සාක්ෂි ඉදිරිපත් නොවුණි.

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ තොරතුරු තාක්ෂණ අංශය විසින් ඉදිරිපත් කර තිබූ තොරතුරු අනුව 2024 අප්‍රේල් 17 සිට 2024 අගෝස්තු 02 දින දක්වා කාලය තුළ ගිවිසුම්ගත සේවා සැපයුම්කාර ආයතනය හරහා නිකුත්කර තිබුණි.

**2.6.11.2** 2024 මැයි 01 දින සිට කටුනායක ගුවන්තොටුපළේ on arrival ක්‍රමයට වීසා නිකුත්කිරීම සිදුකළ ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඉහළ නිලධාරීන්ගේ ගේ උපදෙස් අනුව තම සේවාවලින් ඉවත්ව තිබුණි. එම නිලධාරීන් විසින් ඉටුකරමින් සිටි on arrival වීසා නිකුත්කිරීමේ ක්‍රියාවලිය GBS Technology Service & IVS Globle-FZCO, VF WorldWide Holding Ltd ආයතනයේ නිලධාරීන් විසින් ඉටුකිරීම ආරම්භකර තිබුණි. ඒ

අනුව on arrival ක්‍රමයට වීසා ලබාගැනීමට පැමිණෙන විදේශිකයන් හට GBS Technology Service & IVS Globle-FZCO, VF WorldWide Holding Ltd ආයතනයේ පද්ධතිය හරහා මාර්ගගත ක්‍රමයට වීසා අයදුම් කිරීමට සිදුව තිබූ අතර ඒ සඳහා සේවා ගාස්තුව වූ එ.ජ.ඩොලර් 18.50 ක් ඇතුළු ගාස්තු ගෙවීමට සිදුව තිබුණි. මාර්ගගත ක්‍රමය මගින් ඊ වීසා නිකුත්කිරීමේ සාමාන්‍ය ක්‍රමවේදය පරිදි කටුනායක ගුවන්තොටුපළට පැමිණෙන විදේශිකයන්ට සේවා සැපයුම්කාර ආයතනයේ පද්ධතිය මගින් අයදුම්පත් ඉදිරිපත්කර (Front end) එම තොරතුරු ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ වීසා නිකුත්කිරීමේ පද්ධතියට ඇතුළත්කර (Back end) රටට ඇතුළ්වීම සඳහා අනුමැතිය නැවත පද්ධතිය හරහා විදේශිකයන්ට ලබාදිය යුතු විය. මේ සඳහා on arrival ක්‍රමය යටතේ කෙලින්ම ආගමන හා විගමන දෙපාර්තමේන්තුව ගත කළ කාලයට වඩා සැලකිය යුතු කාලයක් ගතවීම හේතුවෙන් ගුවන්තොටුපළේ තදබදයක් ඇති වී තිබුණි. මෙසේ 2024 මැයි 01 දින ගුවන්තොටුපළේ ඇතිව තිබූ කළහකාරී තත්ත්වය ජනමාධ්‍ය හා සමාජ මාධ්‍ය මගින් පුළුල් ප්‍රචාරයක් ලබා දී තිබුණි. මේ නිසා එදිනම සේවා සැපයුම්කාර ආයතනයේ නිලධාරීන් ඉවත්කර නැවත ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හරහා on arriaval ක්‍රමයට වීසා නිකුත් කිරීම ආරම්භකර තිබුණි.

**2.6.11.3** වීසා අයදුම් කළ කැනඩා ජාතික සංචාරකයෙකු ඉදිරිපත් කරන ලද පැමිණිල්ලකට අනුව GBS Technology Service & IVS Globle-FZCO සමාගම විසින් නිකුත්කළ 2024 අප්‍රේල් 30 දිනැති වෙබ් අඩවි යොමු අංක N2404301YT12133Y හා අභ්‍යන්තර අංක IMM/300424/1721/01 දරන ඉන්වොයිසිය එම සංචාරකයා ආගමන විගමන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබුණි **(ඇමුණුම 57).** එහි සඳහන් විස්තර පහත පරිදි වේ. එම සංචාරකයාගෙන් වීසා ලබාගැනීමට එ.ජ. ඩොලර් 232.69 ක ගාස්තුවක් අය කර තිබුණි. එම ඉන්වොයිසියේ වීසා ගාස්තුව ලෙස එ.ජ. ඩොලර් 200 ක් ද, සේවා ගාස්තුව ලෙස එ.ජ. ඩොලර් 18.50 ක් ද, පහසුකම් සැපයීමේ ගාස්තුව ලෙස එ.ජ. ඩොලර් 14.19 ක් ලෙස ද, අයකර තිබූ බව නිරීක්ෂණය විය. තවද ගාස්තු අය කිරීම පිළිබඳ තබා තිබූ සටහනක් අනුව ලංකා රජය විසින් ගාස්තු සඳහා කිසිදු බදු මුදලක් අය නොකරන බවත් VFS ආයතනය සඳහා අය කරන සියලු ගාස්තු සඳහා සියයට 2.5 ක සමාජ ආරක්ෂණ බද්දක් (SSCL) හා සියයට 18 ක එකතු කළ අගය මත බදු මුදලක් අයකරන බව දක්වා තිබුණි. 2024 අප්‍රේල් 30 වන විට කැනඩා රජය සඳහා සංචාරක වීසා ගාස්තුව දින 30 ක් දක්වා එ.ජ.ඩොලර් 50 ක්ද දින 30-60 දක්වා එ.ජ.ඩොලර් 150 ක්ද දින 181 සිට 270 දක්වා එ.ජ.ඩොලර් 200ක්ද වී තිබුණි. එහෙත් මෙම ඉන්වොයිසිය මෙයින් කුමන වර්ගීකරණයට අයත්දැයි පැහැදිලිව දක්වා නොතිබුණි.

**2.6.11.4** ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ පාලක(වීසා)ගේ 2024 ජුනි 04 දිනැති අංක DIA/VISA/1/89 දරන පාලක (තොරතුරු තාක්ෂණ හා ප්‍රත්‍යන්ත පාලක) අමතන ලද ලිපිය මගින් GBS Technology Services & IVS Global – FZCO හා VFS VF Worldwide Holdings Ltd ආයතනය හරහා වීසා අයදුම් කිරීමේදි හා නිකුත් කිරීමේ දී, ඇති වූ ගැටළු සම්බන්ධයෙන් වීසා අයදුම්කරුවන් ඉදිරිපත් කළ පැමිණිලි අනුව ඔවුන්ගේ පද්ධතියේ පවතින අඩුපාඩු 10ක් සම්බන්ධයෙන් පහත පරිදි සුදුසු ක්‍රියාමාර්ග ගන්නා ලෙස දන්වා යවා තිබූ බව නිරීක්ෂණය විය.

(i) UN (United Nations) ගමන් බලපත්‍රධාරීන්ට Nationality ලෙස "UN" තෝරා ගැනීමට VFS පද්ධතිය තුළ අවකාශ සලසා නොමැති බැවින්, අයදුම්කරුවන්ට එම වීසාව අයදුම් කළ නොහැකි බව,

(ii) Approval Notice නියමාකාරයෙන් නියමිත කාලය තුළ අයදුම්කරු වෙත නොලැබෙන බවට පැමිණිලි ලැබෙන බව,

(iii) ඇතැම් අයදුම්කරුවන්ගේ e-mail වෙත වෙනත් අයදුම්කරුවන්ගේ විමසීම් වලට අදාළ වන පිළිතුරු යොමුවන බවට වාර්තා වන බව,

(iv) VFS පද්ධතියේ බිඳවැටීම් සිදුවන බවට අයදුම්කරුවන්ගෙන් පැමිණිලි ලැබෙන බව.

(v) ගැටළුවක් මතු වූ අවස්ථාවක දෙපාර්තමේන්තුව සමග ඍජුව සම්බන්ධ වීමට (focal point) අදාළ ආයතනයේ නියෝජිතයකු නම් කිරීමට කටයුතු කර නොමැති බව.

(vi) යම් අයදුම්කරුවකුට වලංගු වීසාවක් තිබිය දී තවත් වීසාවක් අයදුම් කිරීමට VFS පද්ධතිය තුළින් ඉඩ ලබාදී තිබීම නිසා වීසා ගාස්තු ගෙවීම් ආදී කරුණු සම්බන්ධයෙන් ගැටළුකාරී තත්ත්වයක් උද්ගත වී තිබුණි. එබැවින් යම් වලංගු වීසාවක් පවතින පුද්ගලයෙකුට සිය කැමැත්තෙන් එය අවලංගු කිරීමටත්, එම වීසාව අවලංගු කර ගැනීමෙන් පසුව පමණක් නව වීසාවක් ඉල්ලුම් කිරීමටත් හැකි වනසේ පද්ධතිය සකස් කර නොමැති බව.

(vii) VFS ආයතනය මගින් අයදුම්කරුවන්ට වීසා අයදුම් කිරීම සම්බන්ධව නිවැරදි තොරතුරු ලබා නොදෙන බව.

(viii) ගාස්තු වලින් නිදහස් වීසා වලට ද VFS ආයතනය වෙත අතිරේක ගාස්තුවක් ගෙවීමට සිදුවන බව.

(ix) අයදුම්කරුවන්ගේ විදේශ ගමන් බලපත්‍ර වල තොරතුරු (ගමන් බලපත්‍ර අංක ආදීය) නිවැරදිව පරීක්ෂා කිරීමකින් තොරව, e- Visa අනුමැතිය ලබා දීම නිසා අදාළ වීසාව සක්‍රිය තත්ත්වයට පත් නොවීම හේතුවෙන් අයදුම්කරුවන් රට තුළට පැමිණීමේ දී විවිධ දුෂ්කරතා වලට ලක්වීම මෙන්ම වීසා ගාස්තු දෙවරක් ගෙවීමට සිදු වී ඇති බව.

(x) අයදුම්කරුවන්ගේ e- Visa අයදුම්පත් සම්බන්ධ ගැටළු ඍජුව ඉදිරිපත් කිරීමට VFS ආයතනය මගින් විද්‍යුත් තැපැල් ලිපිනයක් (e – mail address) හඳුන්වා දී නොතිබීම හා අදාළ ගැටළු වලට කඩිනම් විසඳුම් ලබා දී නොතිබීම. ඒ අනුව මෙම පද්ධතිය හඳුන්වා දීමේදී ඉහත අඩුපාඩු පිළිබඳව අවධානය යොමු කර නොතිබූ බව නිරීක්ෂණය වූ අතර මෙවැනි අඩුපාඩු තිබියදී වීසා නිකුත් කිරීම සඳහා GBS Technology Service & IVS Globle-FZCO, VF Worldwide Holding Ltd සමාගමට ලබාදී තිබූ බව නිරීක්ෂණය විය.

**2.6.11.5** වීසා අයදුම්කරුවන් වෙත නිකුත් කර තිබූ ඉන්වොයිසි පරීක්ෂාවේදී GBS Technology Service & IVS Globle-FZCO, VF Worldwide Holding Ltd ආයතනය විසින් එම ඉන්වොයිසිවල "All VFS Fees are inclusive of 2.5% SSCL and 18% VAT" යනුවෙන් දක්වා තිබුණි. එහෙත් එලෙස එකතු කර ගත් බදු මුදල් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබූ බව ස්වාධීන විගණන පරීක්ෂාවකදී නිරීක්ෂණය විය. මෙම සමාගම විසින් සිදු කරනු ලබන වීසා නිකුත් කිරීම පිළිබඳව නිවැරදි තොරතුරු ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට ලබාදෙන ක්‍රමවේදයක් නොතිබූ නිසා මෙමගින් රජයට අහිමි වූ සමාජ ආරක්ෂණ (SSCL) හා එකතු කළ අගය මත ගෙවීම් බදු (VAT) ඇතුලු බදු ආදායම් වටිනාකම ගණනය කළ නොහැකි විය. GBS Technology Service & IVS Globle-FZCO, VF Worldwide Holding Ltd ආයතනය විසින් මෙම සේවාව සැපයීම වෙනුවෙන් වීසා අයදුම්කරුවන්ගෙන් 2024 අප්‍රේල් 16 සිට 2024 අගෝස්තු 02 දක්වා කාලය තුළ එකතු කරන ලද වීසා ආදායම මත ගණනය කළ හැකි සමාජ ආරක්ෂණ හා එකතු කළ අගය මත ගෙවීම් බදු ආදායම් අවම වශයෙන් එ.ජ.ඩොලර් 1,418,360 ක් පමණ විය හැක. අධික වටිනාකමක් ආදායම් ලෙස රැස්කර ගෙන තිබුණ ද GBS Technology Service & IVS Globle-FZCO ආයතනය, VF Worldwide Holding Ltd ආයතනය විසින් කිසිදු බදු මුදලක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ගෙවා නොතිබුණි.

**2.6.12 සේවා සැපයුම්කරු වූ GBS Technology Service & IVS Globle-FZCO, VF Worldwide Holding Ltd යන ආයතනයේ සේවාව ශ්‍රේෂ්ඨාධිකරණ අතුරු තහනම් නියෝගයක් මත අත්හිටුවීම**

**2.6.12.1 අධිකරණ අතුරු තහනම් නියෝගයක් ලබාදීම**

(අ) ගුවන්තොටුපළ ආශ්‍රිතව විදුහුත් වීසා ලබාදීමේ සේවාව විදේශීය සමාගම් දෙකකට ලබා දීමට ගෙන ඇති තීරණය ක්‍රියාත්මක කිරීම අත්හිටුවා පෙර පැවති ක්‍රමයට වීසා නිකුත් කරන ලෙසට විවිධ පාර්ශවයන් 08 ක් විසින් අධිකරණයට පෙත්සම් ගොනුකර තිබූ අතර ඒවා මෙම වාර්තාවේ දින වන විටත් විභාග වෙමින් පැවතුණි. එයින් අංක SC FR 203/2024,SC FR 204/2024 හා SC FR 205/2024 යන නඩුකර තුන සඳහා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබා දෙන ලද අතුරු තහනම් නියෝගයක් මත 2024 අගෝස්තු 02 දින සිට GBS Technology Service & IVS Globle-FZCO, VF Worldwide Holding Ltd ආයතනය හරහා වීසා නිකුත් කිරීමේ ක්‍රමය නතර කළ යුතු පෙර පැවති ක්‍රමයට වීසා නිකුත් කරන ලෙස නියම කර තිබුණි. **(ඇමුණුම 58)**

(ආ) මාසයකට අධික කාලයක් ගත වී තිබුණද අධිකරණය ලබා දුන් නියෝගය අනුව කටයුතු නොකිරීම මත ආගමන හා විගමන පාලක ජනරාල්වරයා අත්අඩංගුවට ගැනීමේ නීතිමය පියවර 2024 සැප්තැම්බර් 25 දින ක්‍රියාත්මක කර තිබුණි.

**2.6.12.2 අමාත්‍ය මණ්ඩල තීරණ**

(අ) GBS Technology Service & IVS Globle-FZCO, VF Worldwide Holding Ltd ආයතනය හරහා වීසා නිකුත් කිරීමේ ක්‍රමය සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අතුරු තහනම් නියෝග නිකුත් කිරීමත්, මෙරටට පැමිණෙන ඇතැම් සංචාරකයින්ගෙන් කටුනායක ගුවන් තොටුපලේදී වීසා නිකුත් කිරීමේ දී අපහසුතාවයට පත් වන බවත්, මේ තුළින් ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපයට හානියක් සිදු වන බව පෙනී යන බැවින්, මෙරටට පැමිණෙන ඇතැම් විදේශිකයන්ට කඩිනමින් හා පහසුවෙන් වීසා ලබා ගැනීමට හැකි වන පරිදි සරල හා විධිමත් ක්‍රමවේදයක් වහාම හඳුන්වාදීම සඳහා අදාළ බලධාරීන්ට නියම කිරීමට ගරු ජනාධිපතිවරයාට බලය පැවරීමටත්. ගරු ජනාධිපතිතුමා විසින් ගනු ලබන පියවර පිළිබඳව වාර්තාවක් අමාත්‍ය මණ්ඩල සටහනක් මගින් මීලඟ අමාත්‍ය මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස ජනාධිපති ලේකම් වෙත දැනුම් දීමටත් 2024 සැප්තැම්බර් 02 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර තිබුණි. **(ඇමුණුම 59)**

(ආ) ගරු ජනාධිපතිවරයාගේ 2024 සැප්තැම්බර් 06 දිනැති අංක PS/EAD/NC/348/2024 දරන "ශ්‍රී ලංකාවට පැමිනෙන විදේශිකයින් සඳහා වීසා නිකුත් කිරීම වෙනුවෙන් සරල හා විධිමත් ක්‍රමවේදයක් හඳුන්වාදීම" මැයෙන් ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සටහන **(ඇමුණුම 60)** මගින් ගනු ලැබූ කඩිනම් ක්‍රියාමාර්ග පහකින් සමන්විත සංක්ෂිප්ත වාර්තාවක් ඉදිරිපත් කර තිබූ අතර 2024 සැප්තැම්බර් 09 දිනැති අංක අමප/24/1878/601/111 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් **(ඇමුණුම 61)** ඒ සඳහා අමාත්‍ය මණ්ඩලයේ එකඟතාවය ලබා දී තිබුණි.

(ඇ) 2024 අප්‍රේල් 16 දින සිට 2024 අගෝස්තු 02 දින දක්වා GBS Technology Service & IVS Globle-FZCO, VF Worldwide Holding Ltd සමාගම හරහා වීසා නිකුත් කිරීමට කටයුතු කර 2024 අගෝස්තු 03 දින කටුනායක බන්ඩාරණායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ මගීන්ගේ සිදු වූ නොසන්සුන්තාවය පිළිබඳ සිද්ධිය පදනම් කරගෙන එම සමාගම මගින් වීසා නිකුත් කිරීමේ ගැටළුව සමාජ ගත වීමෙන් පසුව 2024 සැප්තැම්බර් 25 දක්වා විද්‍යුත් සංචරණ වීසා නිකුත් කිරීම අත්හිටුවා On Arrival Visa පමණක් නිකුත් කර තිබූ බවට නිරීක්ෂණය විය. නව රජය නැවත 2024 සැප්තැම්බර් 24 දින සිට පෙර පැවති ETA පද්ධතිය හරහා මොබිටෙල් ආයතනය මගින් නැවත මාර්ගගත ක්‍රමයට වීසා නිකුත් කිරීම ආරම්භ කර තිබුණි.

**2.6.13 GBS Technology Service & IVS Globle-FZCO, VF Worldwide Holding Ltd ආයතන විසින් වීසා ආදායම රැස් කිරීම හා බැංකුගත කිරීම**

(අ) GBS Technology Service ආයතන සමග 2023 දෙසැම්බර් 21 දින එළඹෙන ලද ගිවිසුමේ 3 වන ඇමුණුමේ 4.D ඡේදය අනුව ආයතනය විසින් අයකරන වීසා ගාස්තු සේවා ගාස්තු හෝ අනෙකුත් ගාස්තු ආයතනයේ විදේශ බැංකු ගිණුමකට බැර කරනු ලැබිය යුතුය. දින 7 කට පසුව අදාළ වීසා ගාස්තුව පමණක් ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ගිණුමකට බැරකළ යුතු වේ. එසේම එම විදේශීය සමාගම ශ්‍රී ලංකාවේ ආගමන හා විගමන දෙපාර්තමේන්තුව යෝජනා කරන, ලංකාවේ බැංකුවක ඩොලර් ගිණුමක් විවෘත කර වීසා සඳහා අයකරන මුදල් එ.ජ.ඩොලර්වලින් එකතු කර ගැනීමට ගිවිසුම්ගතව තිබුණි.

(ආ) එසේවුවද භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක TO/BE02/02/02/02(2023-226) හා 2024 පෙබරවාරි 28 දිනැති ලිපියේ **(ඇමුණුම 62)** අනුමත කර ඇති පරිදි මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ දෙපාර්තමේන්තුවට ලැබිය යුතු වීසා ආදායම් වීසා ගාස්තු අයකළ දිනට පසු දින ආගමන හා විගමන පාලක ජනරාල්වරයාගේ නිල බැංකු ගිණුමට බැර කළ යුතු විය.

(ඇ) ගිවිසුමේ 2.10 ඡේදයේ සඳහන් පරිදි GBS Technology Services & IVS Global –FZCO ආයතනය විසින් අවම එ.ජ.ඩොලර් වටිනාකමක් තැන්පතු ලෙස ලංකා බැංකුවේ බත්තරමුල්ල ශාඛාවේ ආගමන හා විගමන පාලක ජනරාල්ගේ අංක 71963786 දරන නිල බැංකු ගිණුමේ පවත්වාගත යුතු බවට එකඟ වී තිබුණි. එහෙත් එම වටිනාකම නිශ්චය කර නොතිබුණු අතර මේ සඳහා ආගමන විගමන පාලක ජනරාල්වරයා මුලින් තීරණය කර තිබූ වටිනාකම එ.ජ.ඩොලර් 200,000ක් වී තිබුණි. 2024 මාර්තු 23 දිනැති DIE/FIN/R/3/20 දරන **(ඇමුණුම 63)** හා 2024 මැයි 10 දිනැති **(ඇමුණුම 64)** හා සමාංක දරන අධ්‍යක්ෂ, GBS Technology Services & IVS Global –FZCO ආයතනය වෙත ආගමන හා විගමන පාලක ජනරාල් විසින් යොමුකරන ලද ලිපි මගින් එම තැන්පතු වටිනාකම පිළිවෙලින් එ.ජ.ඩොලර් 300,000 සිට එ.ජ.ඩොලර් 500,000ක් දක්වා වැඩිකර තිබුණි.

2024 ජූලි 02 දින වීසා නිකුත් කිරීමේ ආදායම වූ එ.ජ.ඩොලර් 199,410 ක් ආගමන විගමන පාලක ජනරාල්වරයාගේ ගිණුම වෙත 2024 ජූලි 08 දින ගෙවා තිබුණි. ඒ අනුව 2024 ජූලි 03 සිට 07 දක්වා වූ දින පහක ආදායම ඇමෙරිකානු ඩොලර් 798,520 ක් බව නිරීක්ෂණය විය. තවද ගිවිසුමේ ඇමුණුම 03 හි 4(b) අනුව GBS Technology Service & IVS Globle-FZCO, යන ආයතන විසින් දින 07 ක් ආදායම රඳවා ගත් බවට උපකල්පනය කළවිට එය එ.ජ.ඩොලර් මිලියන 1කට ආසන්න බවත් එය දින 7ක් තුළ උපයන වීසා ආදායමට සාපේක්ෂව ප්‍රමාණවත් නොවන අගයක් වී තිබුණි.

**2.6.14 ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කිරීම, අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම, ගිවිසුමට එළඹීම හා ක්‍රියාත්මක කිරීම දක්වා වූ කාලවකවානු**

(අ) "IVS – GBS Global Services" ආයතනය ඉදිරිපත් කර තිබූ ඒක පාර්ශ්වික ව්‍යාපෘති යෝජනාව සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම, ගිවිසුමට එළඹීම හා ක්‍රියාත්මක කිරීම දක්වා වූ කටයුතු පහත පරිදි ඉතා කෙටි කාල පරාසයන් තුළ සිදු කර තිබුණි.

**වගු අංක 09 - ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කිරීම, අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම, ගිවිසුමට එළඹීම හා ක්‍රියාත්මක කිරීම දක්වා වූ කාලවකවානු**

| විස්තරය | දිනය |
|---|---|
| ව්‍යාපෘති යෝජනාව හා ගිවිසුම් ලද දිනය | 2023.08.18 |
| පළමු අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කළ දිනය | 2023.09.08 |
| සංදේශයට මුදල් අමාත්‍යාංශය නිර්දේශ ඉදිරිපත් කළ දිනය | 2023.09.13 |
| පළමු අමාත්‍ය මණ්ඩල අනුමත කරන ලද දිනය | 2023.09.11 |
| අමාත්‍යාංශ ලේකම්වරයා ව්‍යාපෘති ඇගයීම් කමිටුව පත්කළ දිනය | 2023.09.24 |
| කමිටු වාර්තා ඉදිරිපත් කළ දිනය | 2023.10.26 |
| ව්‍යාපෘති යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කළ දිනය | 2023.12.04 |
| අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලද දිනය | 2023.12.11 |
| අමාත්‍ය මණ්ඩල අනුමැතිය අමාත්‍යාංශයට දැන්වූ දිනය | 2023.12.13 |
| අමාත්‍ය මණ්ඩල අනුමැතියට අනුව කටයුතු කිරීම සඳහා පාලක ජනරාල්ට දැන් වූ දිනය | 2023.12.13 |
| GBS Technology Services හා VFS සමාගම සමග ගිවිසුම්ගත වූ දිනය | 2023.12.21 |
| VISA අයදුම්පත් භාර ගැනීම ආරම්භ කළ දිනය | 2024.04.17 |
| VISA අයදුම්පත් භාර ගැනීම අත්හිට වූ දිනය | 2024.08.02 |
| නැවත මොබිටෙල් ආයතනය වෙත ලබා දුන් දිනය | 2024.09.27 |

(ආ) 2023 දෙසැම්බර් 13 දිනැති ලිපිය මගින් උක්ත අමාත්‍ය මණ්ඩල තීරණය මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත දැනුම් දී තිබූ අතර එදිනම ලේකම්වරයා අවශ්‍ය කටයුතු සඳහා පාලක ජනරාල්වරයා දැනුවත් කරන ලෙස අතිරේක ලේකම් (සංවර්ධන) වෙත දන්වා තිබුණි. ඒ අනුව අතිරේක ලේකම් (සංවර්ධන) විසින් අමාත්‍ය මණ්ඩල තීරණය ආගමන විගමන පාලක ජනරාල් වෙත එදිනම දන්වා තිබූ බවට නිරීක්ෂණය වන බැවින් ක්‍රියාවලියේ අසාමාන්‍ය කඩිනම් ස්වභාවයක් විගණනයේ දී නිරීක්ෂණය විය.

**2.6.15 මොබිටෙල් ආයතනය සමග වූ ගිවිසුම පැවති ක්‍රමය වැඩි දියුණු කිරීම සඳහා වූ GBS Technology Services and IVS Global –FZCO, VF Worldwide Holding Ltd සමග ගිවිසුම්වල ඇතුළත් විශේෂිත හා සමාන කරුණු**

**වගු අංක 10 - ගිවිසුම්වල ඇතුළත් විශේෂිත හා සමාන කරුණු**

| විස්තරය | **2012 වර්ෂයේ සිට සී/ස මොබිටෙල් සමාගම විසින් ක්‍රියාත්මක කරන ලද ETA ක්‍රමවේදය** | **සී/ස ට්‍රැවල්සන් ඉන්ටර්නැෂනල් සර්විස් (ෂැංහයි) සමාගම** | **GBS Technology Services & IVS Global-FZCO and VFS VF Worldwide Holdings Ltd** | **සී/ස මොබිටෙල් සමාගම විසින් ක්‍රියාත්මක කරන ලද වැඩිදියුණු කිරීමේ යෝජනාව** |
|---|---|---|---|---|
| ගිවිසුමට එළඹී දිනය හා ගිවිසුම් කාලය | 2012/08/28 වර්ෂ 1යි. වාර්ෂික දීර්ඝ කිරීම් සිදු කරයි. | ගිවිසුමේ දිනය සඳහන් කර නැත. ගිවිසුම ක්‍රියාත්මක වන දින සිට වසර 10 ක් දක්වා ක්‍රියාත්මක වේ. | 2023/12/21 ගිවිසුම අත්සන් කළ දින සිට වසර 10 ක්. තවත් වසර 06 ක් දක්වා දීර්ඝ කළ හැක. | 2023 අගෝස්තු කොන්ත්‍රාත් කාලය වර්ෂ 10 කි. |
| ක්‍රියාත්මක කළ දිනය | 2012 ජනවාරි 01 | 2023 සැප්තැම්බර් 06 | 2023 අප්‍රේල් 17 | ක්‍රියාත්මක කර නොතිබුණි |
| ගිවිසුමේ පාර්ශවයන් | • ශ්‍රී ලංකා ආගමන විගමන දෙපාර්තමේන්තු වේ පාලක ජනරාල්<br>• සී/ස මොබිටෙල් සමාගම | • ශ්‍රී ලංකා ආගමන විගමන දෙපාර්තමේන්තු වේ පාලක ජනරාල්<br>• ට්‍රැවල්සන් ඉන්ටර්නැෂනල් ට්‍රැවල් සර්විස් (ෂැංහයි) සී /ස සමාගම | • GBS Technology Services & IVS Global-FZCO<br>• ශ්‍රී ලංකා ආගමන විගමන දෙපාර්තමේන්තුවේ පාලක ජනරාල්<br>• VF Worldwide Holdings Ltd (VFS/VFS Global) | - |
| ගිවිසුම අනුව විෂය පථය | කෙටිකාලීන වීසා ඉල්ලුම්කරුවන් සඳහා විද්‍යුත් සංචරණ අනුමැතිය ලබා දීමට www.eta.gov.lk වෙබ් අඩවිය හරහා ලබා ගන්නා අයදුම්පත් ආගමන විගමන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම. | චීන ජාතිකයන් සඳහා සියලු වර්ගවල විද්‍යුත් සංචරණ අනුමැතිය ලබා දීමට www.eta.gov.lk වෙබ් අඩවිය හරහා ලබා ගන්නා අයදුම්පත් ආගමන විගමන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම. | ඊ වීසා/ ඊටීඒ (e-Visa/ ETA) සේවා සැපයීම, ගෝලීය වශයෙන් කොන්සියුලර් හා පාස්පෝර්ට් සේවා සැපයීම, පැමිණීමේදී වීසා නිකුත් කිරීම (On-Arrival Visa Service), ලංකාව තුළ සිටින විදේශිකයන් සඳහා වීසා සේවා සැපයීමේ මධ්‍යස්ථාන (Expat Service), ලංකාව තුළ ජීව දත්ත සේවා, ගෝලීය සංචාරක ප්‍රවර්ධනය හා සංචාරක රක්ෂණය | කෙටිකාලීන වීසා ඉල්ලුම්කරුවන් සඳහා විද්‍යුත් සංචරණ අනුමැතිය ලබා දීමට www.eta.gov.lk වෙබ් අඩවිය හරහා ලබා ගන්නා අයදුම්පත් ආගමන විගමන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම. |

| | | | | |
|---|---|---|---|---|
| වීසා ගාස්තු අය කිරීම් | ආගමන විගමන පාලක ජනරාල්ගේ ගිණුමට ගාස්තු අයකිරීම් සිදු නොකරයි. | • ට්‍රැවල්සන් ඉන්ටර්නැෂනල් සමාගම විසින් අයකර දෙපාර්තමේන්තුව ට අයදුම්පත ඉදිරිපත් කරන අවස්ථාවේ ගාස්තු ප්‍රේෂණය කරයි. | • DIE නිර්දේශිත ලංකාවේ බැංකුවක එ.ජ.ඩො ගිණුමක් විවෘත කිරීම සහ DIE සමග එකඟ වූ තැන්පතුවක් පවත්වා ගත යුතුය.<br>• සමාගම විසින් ඩුබායිහි පිහිටි බැංකු ගිණුමක් වෙත අයකර දින 07 ක් ඇතුළත දෙපාර්තමේන්තුව වෙත එවිය යුතුය. | - |
| සේවා ගාස්තු | නැත | • එ.ජ.ඩොලර් 35 හෝ ආගමන විගමන දෙපාර්තමේන්තුව විසින් අය කරන වීසා ගාස්තුව යන දෙකෙන් වැඩි අගය. | • වීසා ගාස්තු තනි පුද්ගලයකුට එ.ජ.ඩො. 18.50 කි (බදු හැර).<br>• දීර්ඝ කිරීම් ඇතුළුව සෑම වසර 2 කට වරක් පවතින මිල ගණන් වලින් 10%ක් වැඩි කළ හැකි වේ. | • සෑම අයදුම්පතක් සඳහාම එ.ජ.ඩො 1ක් අය කෙරේ. (VAT හා අනෙකුත් බදු හැර)<br>• උද්ධමනයේ ප්‍රතිඵලයක් ලෙස නොවැලක්විය හැකි ගාස්තු වැඩි වීමක් සිදු විය හැක. |
| අනෙකුත් සේවා | භාෂා 9 කින් අන්තර්ගතය සපයනු ලැබේ. | භාෂා 2 යි. (ඉංග්‍රිසි හා චීන) | භාෂා 10 | - |

**3. විගණන නිරීක්ෂණ**

- **අංක 16/1955, 68/1961, 16/1993, 42/1998 , 31/2006 ,07/2015 හා 27/2021 දරන සංශෝධිත පනත් මගින් සංශෝධිත 1948 අංක 20 දරන ආගාමික හා විගාමික පනතේ ප්‍රතිපාදනවලට අනුගතවීම පිළිබඳ නිරීක්ෂණ.**

**3.1** ඉහත 2.2.1 (ඈ),(ඉ) (i),(ii),(iii) හා (iv) යන ඡේද පරිදි ආගාමික හා විගාමික පනතේ 2 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තියට අනුව 2012 ජනවාරි 05 දිනැති අංක 1739/19 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් වීසා නිකුත් කිරීමේ ක්‍රමවේදයට අදාළ නියමයන් 4 ක් ප්‍රසිද්ධියට පත් කර තිබුණි. මෙම ‘‘නියමයන්’’ අතරින් 2.2.1(ඉ) (iv) හි දක්වා ඇති නියමය මගින් 2012 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සංචරණය සඳහා වූ විද්‍යුත් අනුමැතිය (Electronic Travel Authorisation) ක්‍රමය මගින් වීසා සඳහා පූර්ව අනුමැතිය ලබාගෙන ශ්‍රී ලංකාවට පැමිණිය යුතු බවට වන නියමයක් ප්‍රසිද්ධියට පත්කර තිබුණි. නමුත් ආගාමික හා විගාමික පනතේ 10 වැනි වගන්තියේ (ආ) ඡේදය හා 23 වන වගන්තිය අනුව වීසා නිකුත් කිරීමේ ක්‍රමවේදය වෙනස්කිරීම ‘‘නියෝග’’ මගින් සිදුකළ යුතු අතර එම නියෝගයන් පනතේ 52 වන වගන්තිය ප්‍රකාර පරිපාටි අනුගමනය කර පාර්ලිමේන්තු අනුමැතියක් තුලින් සිදු කළ යුතු බවට නිරීක්ෂණය විය. ඒ අනුව ‘‘නියෝගයකින්’’ සිදු කළයුතු කටයුත්තක් ‘‘නියමයක්’’ මගින් සිදුකර තිබුණු බවත් එය පනතේ 10 වැනි වගන්තියේ (ආ) ඡේදයට හා 23 වන වගන්තියේ සඳහන් ප්‍රතිපාදනවලට අනනුකූලව කටයුතු කිරීමක් බව නිරීක්ෂණය විය.

**3.2** ආගාමික හා විගාමික පනතේ 10 වන වගන්තිය හා 23 වන වගන්තිය අනුව වීසා සම්බන්ධයෙන් 1956 පෙබරවාරි 24 දින නිකුත් කර තිබූ ආගාමික හා විගාමික නියෝග අංක 4 යටතේ වීසා බලපත්‍ර පන්ති වෙන් වෙන්ව දක්වා තිබුණු අතර 5 වන වගන්තිය යටතේ වීසා බලපත්‍ර අයදුම් කිරීමේ , නිකුත් කිරීමේ හෝ දීර්ඝ කිරීමේ කාර්යයන් සඳහා ‘‘නියමිත බලධරයන්’’ නම්කර තිබුණි. අයදුම්පත් ඉදිරිපත් කළයුතු ආකාරය පිළිබඳව 6 වන වගන්තියේ සිට 10 වන වගන්තිය දක්වා වූ වගන්තිවල නියෝග ඇතුළත් කර තිබුණද ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ කවුරුන් විසින්ද යන්න එම වගන්තිවල නිශ්චිතව දක්වා නොතිබුණි.

**3.3** 1948 අංක 20 දරන ආගාමික හා විගාමික පනත සඳහා වූ 1956 ආගාමික හා විගාමික නියෝග අංක 10 අනුව වීසා ලබාදීම හෝ නිකුත් කිරීමේ පූර්ව කොන්දේසියක් වශයෙන් ඇප තැබීම සඳහා ‘‘වීසා පත්‍රය ඉල්ලුම්කරුට හෝ ඔහු වෙනුවෙන් නියමිත බලධරයා විසින් අනුමත කරනු ලබන තැනැත්තෙකුට නියම කළ හැකිය’’ යන්න දක්වා තිබුණි. නමුත් එම නියෝගයේ 5 වන වගන්තියේ නිශ්චය කර ඇති නියමිත බලධරයන් ලෙස ඇතුළත් නොවූ පාර්ශවයන් 3ක් වූ සංචාරක නියෝජිතයන්, ගුවන් සමාගම්, මිතුරන් හෝ ඥාතීන් මගින් අයදුම්පත් ඉදිරිපත් කිරීමේ පහසුව නිල වෙබ් අඩවිය මගින් ලබාදීම නීතියට අනුකූල නොවීමක් බව නිරීක්ෂණය විය.

**3.4** 2.1.4.1 ඡේදය පරිදි ආගමන හා විගමන දෙපාර්තමේන්තුව 2015 සිට 2022 දක්වා කාල වකවානුව තුළ අමාත්‍යාංශ 04ක විෂය පථයන් යටතට පත්කර තිබූ බව නිරීක්ෂණය විය.

❖ **මාර්ගගත ක්‍රමයට වීසා අයදුම්කිරීම ක්‍රියාත්මක කිරීම පිළිබඳ නිරීක්ෂණ**

**3.5** 2012 ජනවාරි 01 සිට 2025 අගෝස්තු 20 දක්වා මාර්ගගත ක්‍රමවේදය මගින් වීසා නිකුත් කිරීමට සම්බන්ධ කරගෙන තිබූ ආයතන පහත පරිදි වේ.

**වගු අංක 11 - 2012 ජනවාරි 01 සිට 2025 අගෝස්තු 20 දක්වා මාර්ගගත ක්‍රමවේදය මගින් වීසා නිකුත් කිරීමට සම්බන්ධ කරගෙන තිබූ ආයතන**

| | ආයතනය | විෂය පථය | කාල පරාසය |
|---|---|---|---|
| 01. | සී/ස මොබිටෙල් සමාගම | කෙටිකාලීන වීසා (දින 30 ට අඩු) ඉල්ලුම්කරුවන් සඳහා විද්‍යුත් සංචරණ අනුමැතිය ලබා දීමට www.eta.gov.lk වෙබ් අඩවිය හරහා ලබා ගන්නා අයදුම්පත් ආගමන විගමන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම. | 2012 ජනවාරි 01 සිට 2024 අප්‍රේල් 16 දක්වා නැවත 2024 සැප්තැම්බර් 27 සිට |
| 02. | සී/ස ට්‍රැවල්සන් ඉන්ටර්නැෂනල් සර්විස් (ෂැංහයි) සමාගම | චීන ජාතිකයන් සඳහා සියලු වර්ගවල විද්‍යුත් සංචරණ අනුමැතිය ලබා දීමට www.eta.gov.lk වෙබ් අඩවිය හරහා ලබා ගන්නා අයදුම්පත් ආගමන විගමන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම. | 2023 සැප්තැම්බර් 06 සිට |
| 03. | GBS Technology Services & IVS Global-FZCO and VFS VF Worldwide Holdings Ltd | ඊ වීසා/ ඊටීඒ (e-Visa/ ETA) සේවා සැපයීම, ගෝලීය වශයෙන් කොන්සුයුලර් හා පාස්පෝර්ට් සේවා සැපයීම, පැමිණීමේදී වීසා නිකුත් කිරීම (On-Arrival Visa Service), ලංකාව තුළ සිටින විදේශිකයන් සඳහා වීසා සේවා සැපයීමේ මධ්‍යස්ථාන (Expat Service), ලංකාව තුළ ජීව දත්ත සේවා, ගෝලීය සංචාරක ප්‍රවර්ධනය හා සංචාරක රක්ෂණය | 2024 අප්‍රේල් 17 සිට 2024 අගෝස්තු 02 දක්වා |

2012 වර්ෂයේ සිට 2024 අප්‍රේල් 16 දක්වා වර්ෂ 12 යි මාස 4 ½ ක කාලයක් හා නැවත 2024 සැප්තැම්බර් 27 සිට මෙම වාර්තාව සකස් කරන දිනය වූ 2025 අගෝස්තු 20 දින වන විට මාස 10 කට වැඩි කාලයක් 2.5.1 ඡේදයෙහි සඳහන් අඩුපාඩු සහිතව මොබිටෙල් (පුද්) සමාගම විසින් පවත්වාගෙන යන බවත් වර්තමානයට ගැලපෙන පරිදි පද්ධතියේ වැඩිදියුණු කිරීමක් සිදුකර නොතිබූ බව නිරීක්ෂණය විය. ඒ පිළිබඳව මොබිටෙල් (පුද්) සමාගම විසින් බොහෝ අවස්ථාවලදී පෙන්වාදී තිබූ නමුත් තාක්ෂණය දිනෙන් දින වැඩිදියුණු වන වර්තමානයේදී ජාතික වශයෙන් ඉතා වැදගත් සේවාවක් සපයන ආයතනයක් ලෙස හිතකර ආකාරයෙන් නවීන තාක්ෂණය භදුන්වාදෙමින් වැඩිදියුණු කළ කාර්යක්ෂම සේවාවක් පාරිභෝගිකයන් වෙත ලබාදීමට ආගමන හා විගමන දෙපාර්තමේන්තුව උනන්දුවෙන් කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය.

2.3.1(ඇ)(iii) ඡේදය පරිදි අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවේ සඳහන් නිර්දේශයක් වූ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.5.1 (ඇ) (iii) වගන්තිය අනුව ප්‍රසම්පාදන ක්‍රියාමාර්ග අනුගමනය කරමින් අදාළ සේවා සපයන්නන් වන ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA), මොබිටෙල් පුද්ගලික සමාගම හා ඉන්ෆොමැටික්ස් ආයතනයන්ගෙන් යෝජනා කැඳවීමට 2011 මැයි 25 දිනැති අංක අමප/11/1100/503/062 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමැතිය ලබා දී තිබුණි. එහෙත් මෙම ආයතන තෝරා ගැනීමට අදාළ අමාත්‍ය මණ්ඩල අනුමැතියක් හෝ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයක් හෝ විගණනයට ඉදිරිපත් නොවුණි.

**3.6** 2012 ජනවාරි 01 දින සිට 2023 දෙසැම්බර් 31 දක්වා වූ වර්ෂ 12 ක කාලය සඳහා විද්‍යුත් සංචරණ අනුමැතිය (Electronic Travel Authorisation –ETA) ක්‍රමය යටතේ වීසා නිකුත් කිරීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම සඳහා මොබිටෙල් සමාගම සමග අවස්ථා දොළහකදී ගිවිසුමේ කාලය වර්ෂය බැගින් දීර්ඝ කරමින් නව ගිවිසුම්වලට එළඹ තිබූ අතර අවසාන දීර්ඝ කිරීම 2024 අප්‍රේල් 03 දින 2023 ජනවාරි 01 සිට 2023 දෙසැම්බර් 31 දක්වා වර්ෂයට අදාළ වන පරිදි සිදුකර තිබුණි. ඉහත ගිවිසුම්වලට එළඹීමේදී සෑම අවස්ථාකදීම ගිවිසුම යටතේ වූ සේවා කාලය ආරම්භ කර මාස ගණනාවක් ගතවූ පසුව හෝ සේවා කාලය අවසන් වූ පසු එනම් දීර්ඝ කාල පමාවකින් පසු ගිවිසුම්වලට එළඹ තිබුණු බව නිරීක්ෂණය විය. විස්තර පහත පරිදි වේ.

**වගු අංක 12 - මොබිටෙල් සමාගම සමග ගිවිසුම්වලට එළැඹී අවස්ථා**

| ගිවිසුම් අනු අංකය | ගිවිසුම යටතේ වූ සේවා කාලය | ගිවිසුම්ගත දිනය |
|---|---|---|
| මූලික ගිවිසුම | 2012.01.01සිට 2012.12.31 දක්වා | 2012.08.28 |
| පළමු අතිරේකය (1st addendum) | 2013.01.01 සිට 2013.12.31 දක්වා | 2013.12.09 |
| දෙවන අතිරේකය (2nd addendum) | 2014.01.01 සිට 2014.12.31 දක්වා | 2014.12.17 |
| තෙවන අතිරේකය (3rd addendum) | 2012.01.01 සිට 2012.12.31 දක්වා | 2015.11.09 (මූලික ගිවිසුම් කාලයට අදාළව) |
| හතරවන අතිරේකය (4th addendum) | 2015.01.01 සිට 2015.12.31 දක්වා | 2015.12.22 |
| පස්වන අතිරේකය (5th addendum) | 2016.01.01 සිට 2016.12.31 දක්වා | 2016.08.26 |
| හයවන අතිරේකය (6th addendum) | 2017.01.01 සිට 2017.12.31 දක්වා | 2019.09.26 |
| හත්වන අතිරේකය (7th addendum) | 2018.01.01 සිට 2018.12.31 දක්වා | 2019.01.21 |

| | | |
|---|---|---|
| අටවන අතිරේකය (8th addendum) | 2019.01.01 සිට 2019.12.31 දක්වා | 2019.08.08 |
| නවවන අතිරේකය (9th addendum) | 2020.01.01 සිට 2020.12.31 දක්වා | 2021.02.18 |
| දහවන අතිරේකය (10th addendum) | 2021.01.01 සිට 2021.12.31 දක්වා | 2021.12.17 |
| එකොලොස්වන අතිරේකය (11th addendum) | 2022.01.01 සිට 2022.12.31 දක්වා | 2023.08.23 |
| දොලොස්වන අතිරේකය (12th addendum) | 2023.01.01 සිට 2023.12.31 දක්වා | 2024.04.03 |
| දහතුන්වන අතිරේකය (13th addendum) | 2024.01.01 සිට 2024.12.31 දක්වා | 2025 අගෝස්තු 20 දින වන විටත් ගිවිසුමට එළඹ නොතිබුණි. |

**3.7** 2024 ජනවාරි 01 දින සිට 2024 දෙසැම්බර් 31 දක්වා වූ වර්ෂයක කාලය සඳහා වූ ගිවිසුම නීතිපතිගේ නිෂ්කාශනය සඳහා 13 වන අතිරේකය ලෙස 2024 දෙසැම්බර් 01, 12 සහ 20 යන දිනවලදී යොමුකර තිබූ අතර 2025 පෙබරවාරි 21 දින ඒ සඳහා නීතිපති නිෂ්කාශන ලබා දී තිබුණි. එහෙත් ගිවිසුමට එළඹ නොතිබුණු බව නිරීක්ෂණය විය. මේ අනුව 2024 ජනවාරි 01 සිට මෙම වාර්තාව සකස් කරන දිනය වූ 2025 අගෝස්තු 20 දක්වාම ගිවිසුමක් රහිතව දෙපාර්තමේන්තුව විසින් අදාළ සේවා ලබාගනිමින් හා මොබිටෙල් (පුද්) සමාගම විසින් සේවා සපයමින් සිටින බව නිරීක්ෂණය විය.

**3.8** 2.5.2 ඡේදය පරිදි විද්‍යුත් සංචරණ අනුමැතිය (ETA) ලබාගැනීමේ පද්ධතිය වැඩි දියුණු කිරීම සඳහා මොබිටෙල් සමාගම විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සහිත අමාත්‍ය මණ්ඩල සංදේශය 2021 ජූලි 29 දින ඉදිරිපත් කර තිබුණු අතර එහි සඳහන් නිර්දේශ සඳහා 2021 අගෝස්තු 17 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි. 2.5.2 (ඇ) (i) ඡේදයෙහි සඳහන් පරිදි එකී එක් නිර්දේශයක් වූ අමාත්‍ය මණ්ඩලය පත් කළ සාකච්ඡා කමිටුව (Cabinet Appointed Negotioation Commitee-CANC) 2.5.3.1(අ),(ආ),(ඇ) හා (ඈ) ඡේද පරිදි 2021 නොවැම්බර් 10 සිට 2023 ජනවාරි 04 දක්වා කාලය තුළ අවස්ථා 4 කදී පත්කර තිබුණද එම කමිටු එක්වරක් හෝ රැස්වී සාකච්ඡා කළ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි. මේ අනුව එම කමිටුව පත්කිරීමේ අරමුණු ඉටු වී නොතිබූ බව නිරීක්ෂණය විය.

**3.9** ඉහත 3.8 ඡේදයෙහි සඳහන් 2.5.2(ඇ) (i) ඡේදයෙහි ඇතුළත් අනෙක් නිර්දේශය අනුව ව්‍යාපෘති කමිටුව (PC) 2.5.3.3(අ) සහ (ආ) ඡේදවල සඳහන් පරිදි 2021 නොවැම්බර් 23 සහ 2022 දෙසැම්බර් 09 යන දිනවලදී පත්කර තිබූ බව නිරීක්ෂණය විය. 2.5.3.4(අ) සහ (ආ) ඡේද පරිදි මෙයින් පළමු කමිටුව 2021 නොවැම්බර් 24 හා 2022 සැප්තැම්බර් 26 යන දිනවලදී රැස්ව තිබූ බවත් දෙවන වරට පත්කරන ලද කමිටුව එක්වරක් හෝ රැස්ව නොතිබූ බවත් මේ අනුව එම කමිටුව ද ප්‍රමාණාත්මක මට්ටමකට ක්‍රියාකාරී වී නොතිබූ බවත් නිරීක්ෂණය විය.

**3.10** 2.5.3.4(අ) පරිදි 2021 නොවැම්බර් 24 දින රැස්ව තිබූ කමිටුව විසින් දැනට පවත්නා කාර්ය ගලායාම් ක්‍රමය (work flow) නිර්මාණය සඳහා මොරටුව විශ්ව විද්‍යාලය සහාය වී ඇති බැවින් එම විශ්වවිද්‍යාලයේ සහාය නැවත ලබා ගැනීමට නිර්දේශ කර තිබූ අතර එයින් මාස 10 කට පසුව එනම් 2022 සැප්තැම්බර් 26 දින පවත්වා තිබූ ඊළඟ කමිටු රැස්වීම සඳහා විශ්වවිද්‍යාලය විසින් ලබා දෙන ලද උපදේශාත්මක සේවා සඳහා වූ යෝජනාව ඉදිරිපත් කර තිබුණි. එහෙත් ප්‍රතිපාදන වෙන් කර නොමැති හෙයින් එම යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා අරමුදල් නොමැති බව නිරීක්ෂණය කර තිබූ අතර ඒ අනුව අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි විශ්වවිද්‍යාලයේ සහය ලබා ගෙන යෝජනාව සකස් කර තිබුණු බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි. මේ අනුව 2023 අගෝස්තු 18 දින මොබිටෙල් (පුද්) සමාගම ඉදිරිපත් කර තිබූ ඒකාබද්ධ යෝජනාවේ එම තාක්ෂණික කොටස් ආවරණය කළ ආකාරය හා එම කටයුතුවල වෘත්තීයමයභාවය පිළිබඳ ගැටළු පැන නඟී.

**3.11** 2.5.3.4(අ) සහ (ආ) ඡේද පරිදි පවත්වන ලද ව්‍යාපෘති කමිටු රැස්වීම් අවස්ථා දෙකෙහිදීම පිළිවෙළින් 2022 අප්‍රේල් මාසය වනවිට හා 2022 වර්ෂය අවසාන වනවිට මෙම ව්‍යාපෘතිය අවසන් කළ යුතු වන බවට නිර්දේශකර තිබුණද එම ඉලක්කවලට ලහාවීමට නොහැකිවී තිබුණි.

**3.12** 2.4.3 ඡේදයෙහි සඳහන් පරිදි අමාත්‍ය මණ්ඩල අනුමැතිය පරිදි මාස 6කට පසුව ට්‍රැවල්සන් සමාගමේ නව ක්‍රමවේදයේ ප්‍රගතිය වාර්තා කළ යුතු වුවද එබඳු වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ බවට විගණනයට තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. තවද, 2024 අගෝස්තු 30 දින අමාත්‍යාංශ ලේකම් විසින් විගණනය වෙත ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සහ 2023 සැප්තැම්බර් 09 දින ඉදිරිපත් කර තිබූ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව පරිදි ට්‍රැවල්සන් සමාගම විසින් ගිවිසුම යටතේ සේවා සැපයීම සඳහා ආරම්භ කර නොමැති බව සඳහන් කර තිබුණද 2025 අගෝස්තු 21 දින විගණනය වෙත ඉදිරිපත් කර තිබූ තොරතුරු අනුව 2023 සැප්තැම්බර් 06 දින පළමු අයදුම්පත ලබා ගෙන තිබූ බවත් 2025 අගෝස්තු 21 දින වන විට වීසා 13,669ක් නිකුත් කළ බව දක්වා තිබුණි. ඒ අනුව නිවැරදි තොරතුරු විගණනය වෙත ලබා දී නොතිබූ බව නිරීක්ෂණය විය.

❖ **IVS – GBS Global Services ආයතනය විසින් ඒක පාර්ශ්වික යෝජනාවක් ඉදිරිපත් කිරීම හා ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම පිළිබඳ නිරීක්ෂණ**

**3.13** 2.6.1 ඡේදය පරිදි 2023 අගෝස්තු 18 දිනැතිව IVS – GBS Global Services (Pvt) Ltd ආයතනයේ කළමණාකරණ අධ්‍යක්ෂ විසින් ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ පාලක ජනරාල් වෙත “Proposal for global visa consular, Biomatric services and tourism promotion to facilitate foreign exchange savings and boost revenues to the Democratic Socialist Republic of Sri Lanka” යන මැයෙන් ලිපියක් හා යෝජනාවක්ද ඉදිරිපත් කර තිබුණු බව ආගමන විගමන පාලක ජනරාල් විසින් ඒ සඳහා ඉදිරිපත් කරන ලද පිළිතුරු ලිපියේ සඳහන් කර තිබුණි. එසේවුවද, අදාළ ආවරණ ලිපිය විගණනය වෙත ඉදිරිපත් නොවුණු අතර ඒ අනුව එම යෝජනාව කවුරුන් විසින් ඉදිරිපත් කරන ලද්දේදැයි නිශ්චිත නොවුණි.

**3.14** 2.6.2 ඡේදය පරිදි ඉහත 3.13 හි සඳහන් යෝජනාව පිළිබඳ අදහස් දැක්වීම් ආගමන විගමන පාලක ජනරාල් විසින් මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත යොමුකර තිබුණි. එහෙත් එම පිලිතුර ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවය හා කුමන නිලධාරියකුගේ නියෝගයකට/උපදේශයකට ඉදිරිපත් කර තිබුණේදැයි විගණනයට නිශ්චය කර ගැනීමට තොරතුරු ඉදිරිපත් නොවුණි.

**3.15** 2.6.3 හා 2.6.3.1 ඡේද පරිදි ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශිකයින් සඳහා වන වීසා අයදුම්පත් සහ විදේශීය ශ්‍රී ලංකිකයන්ගේ ගමන් බලපත්‍ර අයදුම්පත් මාර්ගගත ක්‍රමය ඔස්සේ ඉදිරිපත් කිරීම සඳහා බලයලත් නියෝජිතයින් පත් කිරීම සඳහා යන මැයෙන් වූ අංක අමප 23/1692/626/018 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව 2023 සැප්තැම්බර් 08 දින එවකට මහජන ආරක්ෂක අමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර තිබුණි.

**3.16** 2.6.3.1(අ) (i) ඡේදයෙහි සඳහන් පරිදි 2023 සැප්තැම්බර් 08 දිනැති සංදේශය සමග ඉදිරිපත් කරන යෝජනාව ව්‍යාපෘති යෝජනාවක් ලෙස කලින් ඉදිරිපත් කර සාකච්ඡා කරන ලද බව හා එම සාකච්ඡාවේදී සංචාරකයන්ට වඩා පහසුවෙන් වීසා ලබා ගැනීමට පහසුකම් සැලසීමෙන් වැඩිපුර සංචාරකයන් රට තුළට ආකර්ශනය කර ගැනීමත් ඒ තුළින් ජාතික ආර්ථිකයට එම කර්මාන්තයෙන් ලැබෙන දායකත්වය ප්‍රවර්ධනය කර ගත හැකි බව හා අදාළ යෝජනාව සාකච්ඡා කරන ලද බව දක්වා තිබුණද එම සාකච්ඡා පවත්වන ලද පාර්ශවයන්, දින වකවානු, ස්ථාන, සාකච්ඡා සටහන් ආදිය පිළිබඳ විස්තර කිසිවක් යෝජනාවේ සඳහන් කර නොතිබුණු අතර විගණනයටද එම විස්තර ඉදිරිපත් කර නොතිබුණි.

**3.17** 2.6.3.1(ඇ) (i) හා (ii) පරිදි IVS – GBS Global Services ආයතනය මගින් ඉදිරිපත් කර තිබූ ව්‍යාපෘති යෝජනාව හා ගිවිසුම අධ්‍යයනය කර නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා සුදුසු ඇගයීම් කමිටුවක් පත් කිරීම හා එම ඇගයීම් කමිටුවේ නිර්දේශ සහිත වාර්තාව සහ මෙම ආයතනය සමග අත්සන් කිරීමට යෝජිත ගිවිසුමට නීතිපතිගේ නිෂ්කාශන ඇතුළත් වාර්තාව අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීමට සංදේශය මගින් අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබූ නිර්දේශ (යෝජනා) ද්විත්වය වී තිබුණි. එහෙත් 2.6.3 හි සඳහන් මෙම ඒකපාර්ශ්වික යෝජනාව අනුමැතිය සඳහා ඉදිරිපත් කරන අවස්ථාවාවේදීම එය ක්‍රියාත්මක කිරීම සඳහා වූ ගිවිසුමේ කෙටුම්පතක්ද අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම මතභේදයට තුඩුදෙන ගැටළුවක් වේ.

**3.18** 2.6.3.1(අ)(iii) හා (iv) ඡේද පරිදි 2021 අගෝස්තු 17 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමැතිය ලැබී තිබුණු මොබිටෙල් ආයතනයේ අනුග්‍රහයෙන් ක්‍රියාත්මක කරන විද්‍යුත් සංචරණ අනුමැතිය (ETA) පහසුකම වැඩිදියුණු කිරීම සඳහා වූ එම ආයතනයේ යෝජනාව ව්‍යාපෘති තාක්ෂණික කමිටුවේ උපදෙස් පරිදි දෙපාර්තුමේන්තුවේ අවශ්‍යතාවය නැවත සමාලෝචනය කර ව්‍යාපෘති තාක්ෂණ වාර්තාවක් සකස් කර මූලික මෘදුකාංග සංවර්ධන කටයුතු ද අවසන් කර ඇති බව හා පරීක්ෂණ මට්ටමේ පවතින බව 2023 සැප්තැම්බර් 08 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවේ දක්වා තිබුණි. තවද 2020 ජනවාරි 22 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයෙන් ETA පද්ධතිය හරහා චීන ජාතිකයින්ගේ විද්‍යුත් ගමන් අවසර පත්‍ර

අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා සීමාසහිත ට්‍රැවල්සන් ඉන්ටර්නැෂනල් ට්‍රැවල් සර්විස් (ෂැංහයි) සමාගමට බලය ලබා දී ඇති බවත් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවේ දිනය වන විට ඒ සඳහා මෘදුකාංග සංවර්ධන කටයුතු අවසන් කර පරීක්ෂණ මට්ටමේ පවතින බවත් එම අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවේ පසුබිමේ දක්වා තිබුණි. එසේ අමාත්‍ය මණ්ඩල තීරණ දෙකක් මගින් ලබා දී තිබූ අනුමැතීන් යටතේ වූ ක්‍රියාකාරකම් සිදුකරමින් පැවතියදී එම තීරණවල නීත්‍යානුකූලභාවය හා ක්‍රියාත්මක කිරීමේ පිරිවැය පිළිබඳ නොසලකා හරිමින් එම තීරණ යටතේ වූ ක්‍රියාකාරම් වළක්වාලන/නවතාදමන ඒකපාර්ශවික යෝජනාවක් හදිසියේ ඉදිරිපත් කිරීම මතභේදයට තුඩුදෙන කරුණක් වේ.

**3.19** 2.6.3.1(අ)(ii) ඡේදයෙහි සඳහන් පරිදි යෝජනාවේ සඳහන් IVS – GBS Global Services ආයතනය විසින් සේවා සපයන රටවල් සංඛ්‍යාව 145 ක් බව සඳහන් කර තිබුණද, අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සමග ඉදිරිපත් කරන ලද යෝජනාව පරීක්ෂාවේදී 2.6.6.2 (ඇ)(i),(ii),(iii) ඡේද පරිදි රටවල් 6 ක් සඳහා ඉන්දියානු වීසා ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම, අබුඩාබි හා ඩුබායි රාජ්‍ය සඳහා ඉන්දියානු කොන්සියුලර් සේවා සැපයීම සහ 2023 අප්‍රේල් සිට ග්‍රීසිය සහ මැලේසියාව සඳහා ඉන්දියානුවන් වෙත වීසා ලබා දීමේ සේවා සැපයීම පමණක් සිදුකරනු ලබන බව නිරීක්ෂණය විය. මේ අනුව පරිදි IVS – GBS Global Services ආයතනය පිළිබඳ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවේ සඳහන් තොරතුරු නිවැරදි නොවන බව නිරීක්ෂණය විය.

**3.20** 2.6.3.1(ආ)(i) ඡේදය පරිදි නව ආයතනය විසින් නිර්මාණය කරන අතුරු මුහුණත (front end area /user interface) එක් එක් රටවල භාෂාවන්ගෙන් නිර්මාණය කරනබවට සාධාරණීකරණය කර තිබුණද 2.6.10.3 ඡේදය අනුව ආයතනය සමග එළඹී ගිවිසුම අනුව එය භාෂා 10 ක් පමණක් බව නිරීක්ෂණය විය. දැනට පවත්නා ක්‍රමවේදය අනුව එය භාෂා 9 ක් මගින් සේවය සැපයෙන නිසා එක් භාෂාවක් පමණක් සේවය සැපයීම සඳහා වැඩි වී ඇති බව නිරීක්ෂණය විය. අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් නිෂ්චිතව එම භාෂා සංඛ්‍යාව නොදැක්වීම මගින් නොමඟ යැවීමක් සිදුකර ඇති බව නිරීක්ෂණය වන අතර එක් භාෂාවකින් පමණක් වැඩිකිරීම, යෝජනාව ඉදිරිපත් කිරීම සඳහා හේතුවක් කර ගැනීමේ සාධාරණත්වය පිළිබඳ ගැටළු මතුවේ

**3.21** 2.6.3.1 (ආ)(ii) ඡේදය පරිදි IVS – GBS Global Services ආයතනය විසින් අය කරන වීසා ගාස්තුවට අමතරව එ.ජ.ඩොලර් 18.50 ක සේවා ගාස්තුවක් නිදහස් වීසා ඇතුලු සියලු වීසා ඉල්ලුම්කරුවන්ගෙන් අයකරන නමුත් පැවති ETA ක්‍රමවේදය අනුව සේවා ගාස්තුවක් අය නොකරන අතර අනුමත කරන ලද වැඩිදියුණු කිරීමේ යෝජනාව අනුව එය එ.ජ.ඩොලර් 1ක් පමණක් බවද නිරීක්ෂණය විය. මේ අනුව මෙම නව වීසා ගාස්තු ක්‍රමය මගින් විශේෂයෙන්ම නිදහස්, සංචාරක හා ව්‍යාපාරික වීසා ඉල්ලුම් කිරීම ප්‍රවර්ධන වන බවට සාධාරණීකරණය කරන්නේ කෙසේදැයි විගණනයේදී ගැටළු මතුවේ.

**3.22** 2.6.3.1(ආ)(ii) ඡේදය පරිදි වීසා අයදුම්කරුවන් වෙත එ.ජ.ඩොලර් 6.50 ක මුදලක් අය කිරීම මගින් එ.ජ.ඩොලර් 25,000 ක අගයට රක්ෂණාවරණයක් කැමැත්ත පරිදි ලබාදීම සංචාරක ආකර්ෂණය සඳහා හේතු වන්නේ කෙසේ දැයි පැහැදිලි හා නිශ්චිත නොවූ අතරම විස්තරාත්මක රක්ෂණ යෝජනා ක්‍රමයක් ද ඉදිරිපත් කර නොතිබුණි. තවද රක්ෂණ ක්‍රමය සම්බන්ධ කොන්දේසි ගිවිසුමටද ඇතුළත් කර නොතිබුණි. එසේම 2024 අප්‍රේල් 17 සිට 2024 අගෝස්තු 02 දින දක්වා මෙම ආයතනය විසින් සේවා සපයන ලද කාලය තුළ මෙම රක්ෂණාවරණය අභිමතය පරිදි හෝ අනිවාර්යයෙන් අය කරන ලද දැයි විස්තර විගණනයට ඉදිරිපත් නොවුණි.

**3.23** 2.6.3.1(ආ)(ii) ඡේදයේ සඳහන් පරිදි IVS – GBS Global Services ආයතනය අය කරන සේවා ගාස්තුව රටවල් 66 ක ඔවුන් අය කරන ගාස්තුවට වඩා පහළ අගයක් ගන්නා බව දක්වා තිබුණද IVS – GBS Global Services ආයතනය ක්‍රියාත්මක වන්නේ රටවල් 10 ක පමණක් බව නිරීක්ෂණය විය. තවද, පවත්නා ක්‍රමය වැඩිදියුණු කිරීම සඳහා වූ යෝජනාව අනුව එය එ.ජ.ඩොලර් 1ක් පමණක් බවත් ඒ අනුව නව ක්‍රමය ක්‍රියාත්මක කිරීමෙන් එ.ජ.ඩොලර් 17.50ක් වීසා අයදුම් කරන්නන්ගේ සේවා ගාස්තු ලෙස වැඩියෙන් අයකරනු ලබන බව නිරීක්ෂණය විය. සේවා ගාස්තු අයකිරීම, වීසා ගාස්තුවෙන් යම් ප්‍රතිශතයත් වැනි යම් තර්කානුකූල කරුණක් මත පදනම් විය යුතු බවත් සංචාරක ප්‍රවර්ධනය සඳහා එම ගාස්තු සඳහා ද සහන ලබා දිය යුතු බවත් නිරීක්ෂණය විය.

**3.24** 2.6.3.1(ආ)(iii) ඡේදයේ සඳහන් පරිදි නව යෝජනාව මගින් රජයට කිසිදු වැය බරක් නොවන බව සඳහන් කර තිබූ අතර පැවති ක්‍රමය වැඩිදියුණු කිරීමේ යෝජනාව මගින්ද රජයට කිසිදු පිරිවැයක් දැරීමට සිදු නොවන බවද නිරීක්ෂණය විය. කෙසේ වුවද නව ක්‍රමයේදී අයදුම්කරුවන්ට වීසා ගාස්තුවට අමතර වැය බරක් දැරීමට සිදුවන බව නිරීක්ෂණය විය.

**3.25** 2.6.3.1(ආ)(i) (ii) හා (iii) ඡේද යටතේ දක්වා ඇති සාධාරණීකරණය සඳහා වූ කරුණු තාර්කික හා වීසා අයදුම්කරුවන්ට වඩා වාසිදායක කරුණු ලෙස සැලකිය නොහැකි බවද එවකට ක්‍රියාත්මක වෙමින් පැවති ක්‍රමවේදය වැඩිදියුණු කිරීම සඳහා වූ යෝජනාව සමග සන්සන්දනය කිරීමේදී සාධාරණීකරණය කිරීමට නොහැකි බවද ඉහත නිරීක්ෂණ 3.20 සිට 3.24 දක්වා කරුණු අනුව නිරීක්ෂණය විය.

**3.26** 2.6.3.1(ඇ) ඡේදයේ සඳහන් පරිදි අමාත්‍ය මණ්ඩල නිර්දේශ සඳහා ඉදිරිපත් කරන ලද පලමු යෝජනාව "IVS – GBS Global Services ආයතනය මගින් ඉදිරිපත් කර ඇති ව්‍යාපෘති යෝජනාව හා ගිවිසුම අධ්‍යයනය කර නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා සුදුසු ඇගයීම් කමිටුවක් පත් කිරීම" වූ අතර ඒ අනුව රජයට වාසි සහගත වන විකල්ප අවස්ථා ඇගයීම බැහැර කර මෙම යෝජනාව පමණක් ඇගයීමට සීමා කර තිබූ බව නිරීක්ෂණය විය.

**3.27** 2.6.3.1(ඇ) ඡේදයේ සඳහන් පරිදි අමාත්‍ය මණ්ඩල නිර්දේශ සඳහා ඉදිරිපත් කරන ලද දෙවන නිර්දේශය, ‘‘එම ඇගයීම් කමිටුවේ නිර්දේශ සහිත වාර්තාව සහ මෙම ආයතනය සමග අත්සන් කිරීමට යෝජිත ගිවිසුමට නීතිපතිගේ නිෂ්කාශන ඇතුළත් වාර්තාව අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීම’’ ලෙස දක්වා තිබූ අතර මේ අනුව යෝජනාව අනුමත කිරීමටත් පූර්වයෙන් ගිවිසුම ද සකස් කර අවසන් කර තිබූ බව නිරීක්ෂණය විය.

**3.28** 2.6.4 ඡේදයේ සඳහන් පරිදි අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සඳහා අමාත්‍ය මණ්ඩල කාර්යාලය විසින් මුදල් අමාත්‍යාංශයෙන් නිරීක්ෂණ කැඳවා තිබූ අතර අදාළ ලිපිය, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත 2024 සැප්තැම්බර් 11 දින ලැබී තිබුණු බව විගණන පරීක්ෂාවකදී නිරීක්ෂණය විය. ඒ අනුව මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිරීක්ෂණ ඇතුළත් කර කෙටුම්පත් කරන ලද ලිපිය අංක PFD/PMD/CM/2023/PS/350 යටතේ 2023 සැප්තැම්බර් 13 දින මුදල් අමාත්‍යාංශයේ ලේකම් වෙත ද අනතුරුව 2025 සැප්තැම්බර් 15 දින ලේකම් විසින් ගරු ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබූ බව විගණනයේදී හෙළිදරව් විය. එහෙත් අදාළ ලිපිය අමාත්‍ය මණ්ඩල කාර්යාලය වෙත යොමු කර නොතිබුණි. 2023 සැප්තැම්බර් 11 දින අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සම්බන්ධයෙන් වූ අමාත්‍ය මණ්ඩල තීරණය ගෙන තිබූ නිසා එහි ඇතුළත් කර තිබූ නිරීක්ෂණයන් සළකා බැලීමට නොහැකි වී තිබුණු බව නිරීක්ෂණය විය. මෙහිදී මුදල් අමාත්‍යවරයාගේ නිරීක්ෂණ ලබා ගැනීමට වැඩ කරනඑක් දිනයක තරම්වත් ප්‍රමාණවත් කාලයක් ලබා දී නොතිබීම ජාතික ආරක්ෂාවට හා රටේ ආර්ථිකයට බලපාන මෙම ප්‍රතිපත්තිමය තීරණය ගැනීමේදී ඉතා වැදගත් වන මුදල් අමාත්‍යාංශයේ නිරීක්ෂණ නොසලකා හැරීමක්/මඟහැරීමක් සිදු කර ඇති බව විගණනයේදී බැහැර කළ නොහැක.

**3.**29 අමාත්‍ය මණ්ඩලයේ ලේකම්ගේ 2025 අප්‍රේල් 24 දිනැති අංක23/1692/626/018 දරන විගණකාධිපතිට පිටපත් සහිතව වැඩබලන ආගමන හා විගමන පාලක ජනරාල් අමතන ලද ලිපිය මගින් 2023 සැප්තැම්බර් 08 දිනැති මෙම කැබිනට් පත්‍රිකාව 2023 සැප්තැම්බර් 11 දින පෙරවරු 8.00 ට පමණ ලැබුණ බවත් ඇමතිතුමාගේ ඉල්ලීම මත එදින පස්වරු 3.00 පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එම සංදේශය සභාගත කරනු ලැබූ බවත් දක්වා එවා තිබුණි.

**3.30** 2.6.5 ඡේදය පරිදි අංක අමප 23/1692/626/018 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සඳහා 2023 සැප්තැම්බර් 11 දින අමාත්‍ය මණ්ඩලය විසින් ලබාදී තිබූ තීරණය අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක අමප 20/0089/203/013 සඳහා 2020 ජනවාරි 22 දිනැති ව ලබාදෙන ලද තීරණයට අදාළ බව සඳහන් කර තිබුණද ඉහත ඡේද අංක 2.4.1(ආ)(i) හා (ii) හි සඳහන් පරිදි එම තීරණ ලබා දී තිබුණේ ETA පද්ධතිය හරහා චීන ජාතිකයින්ගේ විද්‍යුත් ගමන් අවසර අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා සීමාසහිත ට්‍රැවල්සන් ඉන්ටර්නැෂනල් ට්‍රැවල් සර්විසස් (ෂැංහයි) සමාගමට බලය ලබාදීමට හා එහි ප්‍රගතිය සැලකිල්ලට ගනිමින්, රජයට කිසිදු වියදමක් නොමැතිව එකී සමාන කාර්යය සඳහා පෞද්ගලික නියෝජිත ආයතන පත් කිරීමට ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට බලය ලබාදීම සඳහා වේ. එහෙත් 2023 සැප්තැම්බර් 11 දිනැති

අමාත්‍ය මණ්ඩල තීරණය මගින් ඒ සමග ඉදිරිපත් කර තිබූ යෝජනාව පරිදි විද්‍යුත් සංචරණ ක්‍රමය ( ETA), On arrival, කොන්සියුලර් සේවා හා සංචාරක ප්‍රවර්ධනය ඇතුලු සේවාවන් 7ක් සඳහා අනුමැතිය අපේක්ෂා කර තිබුණි. මේ අනුව මෙම අමාත්‍ය මණ්ඩල පත්‍රිකා දෙකෙහි විෂයපථය ඉතා පුලුල් ලෙස වෙනස්වන බව නිරීක්ෂණය වේ. තවද, මෙම 2023 සැප්තැම්බර් 11 දිනැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී සභාගත කරන ලද ඉහත සඳහන් 2023 සැප්තැම්බර් 08 දිනැති සංදේශය හා එහි සඳහන් නිර්දේශ සම්බන්ධයෙන් මහජන ආරක්ෂක ඇමතිතුමා විසින් සිදු කරන ලද වැඩිදුර පැහැදිලි කිරීම් සමග සලකා බලන ලද බවත් මේ පිළිබඳ සාකච්ඡා කිරීමෙන් අනතුරුව සංදේශයේ 3 ඡේදයෙහි සඳහන් (i) හා (ii) නිර්දේශ සඳහා අනුමැතිය ලබා දීමට තීරණය කරන ලද බව සඳහන් කර තිබුණි.

**3.31** ඉහත 3.13 සිට 3.30 දක්වා වූ කරුණු අනුව මෙම අමාත්‍ය මණ්ඩල සංදේශය සකස් කිරීමේදී ඒක පාර්ශවික වූ මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහාම වූ විශේෂ උනන්දුවකින් යුතුව විනිවිදභාවයකින් තොරව කටයුතු කර ඇති බවත් මේ සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල සංදේශය සකස් කරන ලද පාර්ශවයන් වගකීමට බැඳෙන බවත්, මුදල් අමාත්‍යාංශයේ නිරීක්ෂණ හා අනෙකුත් සම්බන්ධිත කරුණු සැලකිල්ලට ගෙන ඇති බවත් නිරීක්ෂණය නොවේ.

- **IVS – GBS Global Services ආයතනය ඉදිරිපත් කර තිබූ ඒකපාර්ශවික යෝජනාවේ ඇතුළත් කරුණු පිළිබඳ නිරීක්ෂණ**

**3.32** 2.6.6.8(i) ඡේදය පරිදි යෝජනාවේ සඳහන් උපායමාර්ගික සංධානයේ ප්‍රධාන ලක්ෂණයක් ලෙස ලොවපුරා වීසා හා කොන්සියුලර් සේවා සඳහා අයදුම් කිරීමේදී නව අයදුම් කිරීමේ ලක්ෂණ සමග වඩා ඉහළ නංවන ලද සේවයක් සැපයීම සඳහා ලංකාව ප්‍රථමවරට එම සේවා භාහිරකරණයට (Outsource) තීරණය කර ඇති බව දක්වා තිබුණි. එහෙත් එම යෝජනාවේ දිනය වූ 2023 ජූනි වන විට එබඳු භාහිරකරණය පිළිබඳ තීරණයක් ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් හෝ අමාත්‍යාංශය විසින් ගෙන තිබූ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.

**3.33** 2.6.6.8(ii) ඡේදය අනුව ගෝලීය අවශ්‍යතාවයන් හා ප්‍රමිතීන් සමග සම්පාත වන, සවිමත්, පැතිරුණු, ඵලදායී සේවාවක් ශ්‍රී ලංකා රජයට ලබාදීමට IVS ආයතනය කැමති බැවින් VFS ආයතනය සමග උපායමාර්ගිකව පාර්ශවකරුවකු වූ බව යෝජනාවේ දක්වා තිබුණි. 2.6.6.1 ඡේදය අනුව IVS ආයතනය ගෝලීය වශයෙන් රටවල් 20 ක් සඳහා සේවය සපයන බව දක්වා තිබුණද යෝජනාව මගින් ඉදිරිපත් කර ඇති 2.6.6.2 ඡේදයන්හි විස්තර අනුව IVS හා VFS යනු සමාන සේවා සපයන ආයතන වුවද යෝජනාව ඉදිරිපත් කරන දින වූ 2023 ජූනි වනවිට IVS ආයතනය විසින් ශ්‍රී ලංකාව අතුලු රටවල් 06ක ඉන්දියානු වීසා සේවා පවත්වාගෙන යෑම, අබුඩාබි හා ඩුබායිවල ඉන්දියානු කොන්සියුලර් සේවා පවත්වාගෙන යෑම (සහතික කිරීම හා නීත්‍යානුකූල කිරීම් - Attestation & Legalization Services) සහ ග්‍රීසිය හා මැලේසියාව යන රටවල් සඳහා ඉන්දියානුවන්ට අවශ්‍ය වීසා සැකසීම් කටයුතු සිදුකිරීම ඇතුලු රටවල් 10 ක

පමණක් සේවා සැපයීමේ කොන්ත්‍රාත්තු ඉටුකරමින් පවතින බවද එයින්ද ග්‍රීසිය සඳහා විසා නිකුත් කිරීමට VFS ආයතනය හා හවුල්කාරීත්වයක් ඇති කරගෙන ඇති බවද ආයතනයේ සේවක සංඛ්‍යාව 300කට ආසන්න බවද නිරීක්ෂණය විය. මේ අනුව තමාට තනිව සේවය සැපයීමේ හැකියාවක් නොමැති ආයතනයක් විසින් තෙවන පාර්ශවයක් ලෙස සකස් කරන ලද මෙම යෝජනාව ඒක පාර්ශවික යෝජනාවක් (Unsolicited Proposal) ලෙස අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීමට පෙර එහි පවත්නා වාසි අවාසි සහගත තත්ත්වයන් සලකා බලා නොමැති බව නිරීක්ෂණය විය. තවද, ලංකාවට මෙම සේවා භාහිරකරණය අවශ්‍යවූයේ නම් තෙවන පාර්ශවයක් ලෙස IVS- GBS ආයතනය සම්බන්ධකර ගැනීම අවශ්‍ය නොවන බවත් ලංකාව තුළද ශාඛා කාර්යාල 6 ක් පමණ පවත්වා ගෙන යන VFS ආයතනයෙන් සෘජුවම යෝජනා ලබාගත හැකිව තිබූ බවත් බැහැර කළ නොහැක. තෙවන පාර්ශවයක් සම්බන්ධවීමෙන් සේවා ගාස්තුවල ඉහළ යෑමක් පමණක් සිදුවිය හැකිව තිබූ බව නිරීක්ෂණය වේ.

**3.34** 2.6.6.8(iii) ඡේදය අනුව යෝජනාකරු වූ IVS ආයතනය විසින්ම සන්ධානයක් පිළිබඳව සඳහන් කර තිබුණද IVS – GBS ආයතනය හා VFS ආයතනය අතර ඇතිකර ගන්නා ලද කවර ආකාරයක හෝ සන්ධානයක් පිළිබඳ නීතිමය ලියවිල්ලක් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. එසේම 2.6.10.1 ඡේදය පරිදි ආගමන විගමන පාලක ජනරාල් සමග ගිවිසුමට එළඹීමේදීද පාර්ශවයන් දෙකක් ලෙස වෙන වෙනම ගිවිසුමට එළඹ තිබුණි. මේ අනුව සන්ධානයක් පවත්නා බව යෝජනාවෙහි සඳහන් කර තිබුණද එබඳු සන්ධානයක පැවැත්ම නීතිමය ලියවිලි මගින් තහවුරු කර නොතිබූ බව නිරීක්ෂණය විය.

❖ **ඒක පාර්ශවීය වූ යෝජනාව ඇගයීම සඳහා පත් කරන ලද කමිටුවේ වාර්තාව පිළිබඳ නිරීක්ෂණ**

**3.35** 2.6.7.1 ඡේදය අනුව 2023 සැප්තැම්බර් 11 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව IVS – GBS Global Services ආයතනය ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනාව ඇගයීමට සුදුසු ව්‍යාපෘති ඇගයීම් කමිටුවක් පත්කිරීම අනුමත කර තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1(ආ) ඡේදය අනුව සුදුසු ව්‍යාපෘති ඇගයීම් කමිටුවක් යනු අදාළ ව්‍යාපෘතිය ඇගයීම සඳහා ඊට අදාළ වන ආයතනවල සාමාජිකයින්ගෙන් සමන්විත කමිටුවක් වේ. ඒ අනුව මෙම යෝජනාව තොරතුරු තාක්ෂණ අංශය පිළිබඳ යෝජනාවක් වන නිසා ඒ පිළිබඳ ප්‍රවීණතාවක් ඇති නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් විය යුතු වුවද මෙම කමිටුවට තොරතුරු තාක්ෂණ අංශය නියෝජනය කරන නිලධාරීන් ඇතුළත් වී නොතිබුණු බව නිරීක්ෂණය විය.

**3.36** 2.6.7.2 ඡේදය පරිදි 2023 සැප්තැම්බර් 11 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ව්‍යාපෘති යෝජනාව හා ගිවිසුම අධ්‍යයනය කර නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා පත්කළ ඇගයීම් කමිටුව වැඩිදුරටත් අවධාරණය කර තිබූ නිරීක්ෂණයන් 5 ක් ඉදිරිපත් කර තිබුණි. නමුත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ඉල්ලීමේදී එම නිරීක්ෂණයන් පිළිබඳව අවධානය යොමුකර නොතිබුණු බව නිරීක්ෂණය විය.

**3.37** 2.6.7.2 (ඈ)(i) හා (ii) ඡේද මගින් මොබිටෙල් (පුද්) සමාගම හා ට්‍රැවල්සන් ඉන්ටර්නැෂනල් ට්‍රැවල් සර්විසස් (ෂැංහයි) සමාගම යන සමාගම් විසින් අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත සකස් කරන ලද යෝජනා අවසන් අදියරේ පවත්නා බව ගණන්දීමේ නිලධාරි හා ප්‍රධාන ගණන්දීමේ නිලධාරි දැනුවත්ව තිබියදී නව යෝජනාව ඇතුළත් අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කර තිබූ බව නිරීක්ෂණය විය.

**3.38** 2.6.7.2(ඈ) (iii) ඡේදය අනුව පිළිගත් ක්‍රමවේදය යටතේ විශේෂයෙන් ආරක්ෂක හේතූන් පදනම් කරගෙන විදේශ කටයුතු අමාත්‍යාංශය මගින් රහස්‍යතාවය ආරක්ෂා කරමින් දෙපාර්තමේන්තුව වෙත යොමුකරන රාජ්‍යතාන්ත්‍රික වීසා ඉල්ලුම් කිරීමද මෙම නව ක්‍රමය මගින් බාහිර පාර්ශවයක් වෙත පැවරීමෙන් රාජ්‍යතාන්ත්‍රික ක්‍රමවේදය ගැටළු සහගත තත්ත්වයකට පත්වන බව වාර්තාව මගින් පෙන්වා දී තිබුණි. මේ පිළිබඳව අවධානය යොමු වී තිබුණු බව නිරීක්ෂණය නොවුණි.

**3.39** 2.6.7.2 (ඈ)(iv) ඡේදය හා 1948 අංක 20 දරන ආගමන විගමන පනත හා එහි සංශෝධන අනුව ශ්‍රී ලාංකිකයන්ගේ ගමන් බලපත්‍ර සැකසීම දෙපාර්තමේන්තුව කළ යුතුවේ. මෙයට පටහැනිව ආගමන හා විගමන පනත සංශෝධනය නොකර කන්සියුලර් සේවාවද බාහිරකරණයට ගිවිසුමට එළඹීම පනතේ වගන්තිවලට අනනුකූලවීමක් බව නිරීක්ෂණය විය.

**3.40** අමාත්‍ය මණ්ඩල කාර්යාලය වෙත "2023 වර්ෂයේ තුන්වන හා හතරවන කාර්තුවේ දී එළඹී අමාත්‍ය මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරීම පිළිබඳ ප්‍රගතිය" දැනුම් දීම සඳහා 2024 සැප්තැම්බර් 13 දිනැති අංක PS/10/03/GEN දරන ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පුද්ගල අනන්‍යතා) විසින් ඉදිරිපත් කළ වාර්තාවේ 2023 දෙසැම්බර් 11 දින අංක 23/2323/626/018-1 දරන "ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශිකයින් සඳහා වන වීසා අයදුම්පත් මාර්ගගත ක්‍රමය ඔස්සේ ඉදිරිපත් කිරීම සඳහා බලයලත් නියෝජිතයින් පත් කිරීම සම්බන්ධ වාර්තාව හා නීතිපති නිශ්කාෂණ ඇතුළත් ගිවිසුම් ඉදිරිපත් කිරීම මැයෙන්" වූ අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා ලබා දුන් අමාත්‍ය මණ්ඩල අනුමැතියට අනුව (7.2.2.1 ඡේදය) කටයුතු සම්පූර්ණයෙන් ම ක්‍රියාත්මක කර ඇති බවට දන්වා තිබුණි. ඒ අනුව අමාත්‍ය මණ්ඩල තීරණයේ දක්වා ඇති පරිදි අමත්‍ය මණ්ඩලය විසින් පත්කළ කමිටු වාර්තාවේ සඳහන් නිර්දේශයන් ක්‍රියාත්මක කර නොතිබිය දී එලෙස සිදු කර ඇති බවට අමාත්‍ය මණ්ඩල කාර්යාලය වෙත කරුණු දන්වා තිබූ බව නිරීක්ෂණය විය.

### ❖ IVS – GBS Global Services ආයතනය විසින් ඉදිරිපත් කර තිබූ ගිවිසුම සම්බන්ධ නිරීක්ෂණ

**3.41** 2.6.10.1 (අ) ඡේදය අනුව ගිවිසුමට සම්බන්ධ පළමු පාර්ශවකරු GBS Technology Services & IVS Global – FZCO ලෙස දක්වා ඇත. එය සමාගමක් ලෙස ඩුබායිහි ලියාපදිංචි කර ඇති බව දක්වා තිබුණද එම ලියාපදිංචි අංකය වූ 11487 දරන අංකය සහිත සමාගම් ලියාපදිංචි සහතිකයක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

ඩුබායි ඒකාබද්ධ ආර්ථික කලාප අධිකාරිය (Dubai Integrated Economic Zone Authority ) විසින් 2024 ජනවාරි 02 දින දක්වා වර්ෂ දෙකක කාලයක් සඳහා නිකුත් කරන ලද අංක 12734 දරන වෙළඳ බලපත්‍රයක් පමණක් විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි. එහි ආයතනයේ නීතිමය තත්වය නිදහස් කලාප සමාගමක් ලෙස දක්වා තිබුණි. මේ අනුව වර්ෂ දෙකකට පමණක් වෙළඳ බලපත්‍රයක් හිමි ආයතනයක් සමග වර්ෂ 10 ක ගිවිසුමකට එළඹීම මතභේදයට තුඩු දෙන තත්වයක් බව නිරීක්ෂණය විය.

තවද, 2.6.10.1(අ) ඡේදය අනුව සමාගමේ ප්‍රධාන කාර්යාලය එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ, ඩුබායිහි , ඩුබායි සිලිකොන් ඔයසිස්, IFZA, ඩුබායි ඩිජිටල් පාර්ක්හි පිහිටා ඇති බව සඳහන් කර තිබුණද අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද යෝජනාවෙහි ඇතුළත් වෙළඳපල විග්‍රහය අනුව IVS Global ආයතනයේ ප්‍රධාන කාර්යාලය ඉන්දියාවේ මුම්බායි පිහිටා ඇත. ඒ අනුව ඉදිරිපත් කර ඇති තොරතුරුවල පරස්පරතාවක් පවතින බවද ගිවිසුමට එළඹීමට පෙර මෙම නීතිමය තත්වය පිළිබඳ පවත්නා පරස්පරතාවයන් පිළිබඳ තහවුරු කර ගැනීමක් සිදුකර නොතිබූ බවද නිරීක්ෂණය විය.

**3.42** 2.6.8(ii) ඡේදය මගින් දක්වා ඇති පරිදි ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට නීතිමය පුද්ගලභාවයක් නොමැති හෙයින් ශ්‍රී ලංකා රජය නියෝජන කරමින් (As the representation of Government of Sri Lanka (GOSL) යන්න සඳහන් කරමින් ගිවිසුම සංශෝධනය කර ගිවිසුමට එළඹෙන ලෙස නීතිපතිවරයා විසින් උපදෙස් ලබා දී තිබුණද එළඹෙන ලද ගිවිසුම එපරිදි සංශෝධනය කර නොතිබුණු බව නිරීක්ෂණය විය. මේ නිසා ගිවිසුමේ නීතිමය තත්වය පිළිබඳ ගැටළු මතුවිය හැකි බවට බැහැර කළ නොහැක.

**3.43** 2.6.10.1(ඇ) ඡේදයෙහි සඳහන් පරිදි තෙවන පාර්ශවකරු වූ VF WORLDWIDE HOLDINGS LTD සමාගම ලෙස දක්වා තිබුණද එම සමාගමේ ලියාපදිංචි සහතිකයද ඉදිරිපත් කර නොතිබුණි. ඒ වෙනුවට ඩුබායි DMCC (Dubai Multi Commodities Centre) විසින් 2017 ඔක්තෝම්බර් 17 සිට 2026 ඔක්තෝම්බර් 16 දක්වා වූ වර්ෂ 9 ක් සඳහා ලබා දෙන ලද අංක DMCC-353188 දරන සේවා බලපත්‍රය (Service License) ඉදිරිපත් කර තිබූ බව නිරීක්ෂණය විය. එහි නීතිමය තත්වය (Legal Status) නිදහස් කලාප සමාගමක් (Free zone company) ලෙස දක්වා තිබුණි.

**3.44** 2.6.7.2(ඉ)(i) ඡේදයෙහි සඳහන් පරිදි ඇගයීම් කමිටු වාර්තාව මගින්ද නිරීක්ෂණය කර තිබූ පරිදි ව්‍යාපෘති යෝජනාවට සම්බන්ධ ආයතන තුන අතර වගකීම් බෙදී යන ආකාරය, එම පාර්ශවයන් තුන වෙන්වෙන්ව හා සාමූහිකව දෙපාර්තමේන්තුවට වගවන ආකාරය හා දෙපාර්තමේන්තුව සමග ගිවිසුම්ගතවීමේ දී ආයතන එක් ආයතනයක් ලෙස හෝ වෙන වෙනම හෝ තම ආයතනයේ වගකීම් පැහැදිළි වන ආකාරයෙන් ගිවිසුම්ගත වීම හා එම ආයතන අතර සන්ධානගතවීමේ නිතිමය තහවුරුව ගිවිසුම අත්සන් කිරීමට පෙර ලබාගැනීම අවශ්‍ය විය. තවද, 2.6.8(i) හා (iii) ඡේදවල සඳහන් නීතිපති නිශ්කාශණ පරිදි ගිවිසුමට එළඹීමට පෙර නීතිමය තත්ත්වය ප්‍රමාණවත් පරිදි තහවුරු කරගෙන නොතිබුණු බවද නිරීක්ෂණය වේ.

ගිවිසුමට සම්බන්ධ සියළු පාර්ශවයන්ගේ නීතිමය තොරතුරු ලබාගෙන නීතිමය පුද්ගලභාවය තහවුරු කර නොගෙන රජය වෙනුවෙන් පුද්ගලයන්ගේ තොරතුරු ලබා ගන්නා මෙවැනි සේවාවක් පැවරීම සිදුකළ නොහැකි බව නිරීක්ෂණය වේ.

තවද, ශ්‍රී ලංකා රජය සමග මෙවැනි ජාතික අනන්‍යතාව, පුද්ගල අනන්‍යතාව හා ජාතික ආරක්ෂාවට හානියක් නොවිය යුතු වැදගත් වූ ව්‍යාපෘතියක් සඳහා ගිවිසුම්ගත වීමේ දී එම සමාගම්වල මූල්‍ය ස්ථාවරත්වය, අදාළ ක්ෂේත්‍රය පිළිබඳ තාක්ෂණික ප්‍රවීනතාවය, අදාළ ක්ෂේත්‍රය පිළිබඳ පලපුරුද්ද, හිමිකාරිත්වය, නිත්‍යානුකූලභාවය, අදාළ සමාගම් කටයුතු කළයුතු සීමාවන් හා පුද්ගල තොරතුරු වල රහස්‍යභාවය වැනි කරුණු පිළිබඳව නිවැරදි ඇගයීමක්, අවබෝධයක්, සීමාවන් පිළිබඳ අදහසක් ඇති කරගත වුව ද දෙපාර්තමේන්තුව ඒ අනුව කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

**3.45** 2.6.8 ඡේදයේ සඳහන් කර ඇති පරිදි නීතිපති වෙත ඉදිරිපත් කරන ලද ගිවිසුම අත්සන් කරන විට යම් යම් වෙනස්කම් සිදු කර තිබුණද එම වෙනස්කම් සහිත ගිවිසුම නීතිපති වෙත නැවත ඉදිරිපත් කර එම සංශෝධනවල නිවැරදි බව පිළිබඳ නීතිපති නිශ්කාශණ ලබා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. 2023 දෙසැම්බර් 11 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතියට අනුව අත්සන් කිරීමට යෝජිත සේවා සැපයීමට ගිවිසුම්ගත වීමට නියමිත ආයතනයේ IVS – GBS Global Services යන නම GBS Technology Services & IVS Global – FZCO හා VFS Worldwide Holding Ltd ලෙස සංශෝධනය කරන ලෙස දන්වා තිබුණද ගිවිසුමට එළඹීමේදී එම නම GBS Technology Services & IVS Global – FZCO හා VF Worldwide Holdings Ltd ලෙස VFS යන්න VF ලෙස පමණක් දක්වා තිබුණු බව නිරීක්ෂණය විය.

**3.46** 2.6.6.9 ඡේදයෙහි සඳහන් යෝජනාවන්හි vi වන යෝජනාව සංචාරක ප්‍රවර්ධනය ලෙසද 2.6.10 ඡේදයේ සඳහන් පරිදි පාර්ශව 3 අතර එළඹෙන ලද ගිවිසුමේ පලවන ඡේදයේ iii කොටස අනුව ලංකාව වෙනුවෙන් සංචාරක ප්‍රවර්ධනය පූර්ණ වශයෙන් (exclusively) සිදු කිරීමට සේවා සැපයුම්කාර ආයතන හාරගෙන තිබුණි. එහෙත් ලංකාවේ සංචාරක ප්‍රවර්ධනය සම්බන්ධ වගකිව යුතු අමාත්‍යාංශය ඇතුලු කිසිදු ආයතනයක මේ සමග සම්බන්ධ කර ගෙන තිබූ බවට කිසිදු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. සේවා සැපයුම් ආයතන විසින් සිදුකරන ප්‍රචාරක වැඩසටහන් නියාමනයක් හෝ අනුමත කිරීමක් හෝ අධීක්ෂණයක් රජය වෙනුවෙන් කිසිදු පාර්ශවයක් සිදු නොකරන බව නිරීක්ෂණය විය.

තවද, මහජන ආරක්ෂක අමාත්‍යාංශය හෝ ආගමන විගමන දෙපාර්තමේන්තු විෂය පථයට කිසිසේත්ම අදාළ නොවන සංචාරක තොරතුරු ඇතුළත් වෙබ් අඩවියක් පවත්වා ගැනීමට හා සංචාරක කටයුතු සහ සංචාරක නියෝජිතයන් සමග වීසා සේවාවන්ට අදාළ විද්‍යුත් පණිවුඩ යෝජනා කිරීම වැනි පහසුකම් ඇමුණුම 01 හි 1(a)(iii) හා (iv) යටතේ ලබාදී තිබුණු බවද නිරීක්ෂණය විය.

**3.47** 2.6.10 ඡේදය පරිදි විදේශීය සමාගම් සමග ගිවිසුම්ගතවීමේ දී එම සමාගම් වල ශාඛා හෝ දේශීය නියෝජිතයකු ශ්‍රී ලංකාව තුළ නියෝජනය වීම සාමාන්‍ය ක්‍රමවේදය වුවද එළඹ තිබූ ගිවිසුමේ පාර්ශවයන් දෙකම විදේශීය ආයතන වූ බැවින් රටේ නෛතික සීමාවන් තුළ කටයුතු කිරීමේ දී මෙම යෝජනාව හරහා විදේශීය ආයතනවල සෘජු මැදිහත් වීමක් නිරීක්ෂණය විය.

**3.48** එළඹ තිබූ ගිවිසුමේ 2.11 ඡේදය අනුව අයදුම්කරුවන්ගෙන් අතිරේක ගාස්තුවක් අයකර අනුබද්ධ සේවාවන් (Allied Service to applicant for an extra charge ) සැපයිය හැකි බවට දක්වා ඇති අතර "Allied Service" යන්නට නිර්වචනය ලෙස "සපයනු ලබන කුමන හෝ සේවාවක්"(Allied service means any services that are provided by company on payment basis) ලෙස විවෘත නිර්වචනයක් ගිවිසුම තුළ ඇතුළත් කර තිබුණි. ඒ අනුව මෙම සේවා ගිවිසුම තුළ වීසා නිකුත් කිරීමේ මූලික ක්‍රියාවලියට අමතරව ඕනෑම අමතර සේවාවන් වෙනුවෙන් ගාස්තු අයකිරීමට විවෘත ඉඩකඩක් අදාළ පාර්ශවයන්ට සලසා දී තිබූ බව නිරීක්ෂණය විය.

**3.49** සේවා ගාස්තු ලෙස ගිවිසුමේ අංක 03 හා ගිවිසුම සඳහා ඇමුණුම 02 යටතේ සාමාන්‍ය වීසා වර්ගීකරණයේ දී අයදුම්කරුවකුගෙන් එ.ජ. ඩොලර් 18.50 ක් අය කරන බව දක්වා ඇතත් Express/Priority වීසා ඇතුළු සාමාන්‍ය වීසාවලින් පරිභාහිර වීසා නිකුත් කිරීමේ දී සේවා ගාස්තු වර්ගීකරණයක් ඇතුළත් කර නොතිබුණි. මේ නිසා අමතර සේවා සැපයීම මගින් ඉපයීමට තිබූ සම්පූර්ණ අවස්ථාව සේවා සපයන GBS Technology Service & IVS Globle-FZCO, VF Worldwide Holding Ltd ආයතනයට ලබා ගැනීමට ඉඩ සළසා තිබූ බව නිරීක්ෂණය විය.

❖ **පොදු නිරීක්ෂණ**

**3.50** ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට සිය සේවා භාහිරකරණයක් අවශ්‍ය වූයේ නම් භාහිරකරණය කිරීමට අවශ්‍ය සේවාවන් ප්‍රවීණයන්ගෙන් සමන්විත කමිටුවක් මගින් හඳුනාගෙන තරඟකාරී පදනමින් අභිලාෂ කැඳවීමක් (Expression Of Interest (EOI) කළ හැකිව තිබුණි. එවිට ශ්‍රී ලාංකීය තොරතුරු තාකෂණ සමාගම්වලට හා IVS-GBS හා VFS වැනි සමාගම්වලටද මේ සඳහා යෝජනා ඉදිරිපත් කිරීමේ අවස්ථාව සැලසිය හැකිව තිබුණු බව නිරීක්ෂණය විය. එහෙත් එබඳු ක්‍රියාමාර්ග අනුගමනය නොකර හදිසියේ ඉදිරිපත් කරන ලද ගැටළු සහගත වූ ඒක පාර්ශවීය (Unsolicited) යෝජනාවක් පිළිගැනීම ගැටළු සහගත වේ. 2.6.4. ඡේදය පරිදි මේ පිළිබඳව 2023 සැප්තැම්බර් 15 දින මුදල් අමාත්‍යාංශය විසින් අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා ඉදිරිපත් කිරීමට සකස් කරන ලද මුදල් අමාත්‍යවරයාගේ නිරීක්ෂණ මගින්ද මේ බව පෙන්වා දී තිබුණි.

**3.51** 2.6.11 ඡේදය පරිදි එමෙන්ම "IVS – GBS Global Services" ආයතනය ඉදිරිපත් කර තිබූ ව්‍යාපෘති යෝජනාව ලබා ගෙන ගිවිසුම්ගතව ක්‍රියාත්මක කිරීම දක්වා වූ කටයුතු කාලවකවානු පිළිබඳ පරීක්ෂවේදී අදාළ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ දී අසාමාන්‍ය කඩිනම් ස්වභාවයක් පැවති බව නිරීක්ෂණය විය.

**3.52** 2.6.7.2 ඡේදයෙහි ඇතුළත් ඇගයීම් කමිටු වාර්තාවේ ඇතුළත් කරුණු පරීක්ෂා කිරීමේ දී වාර්තාවේ සඳහන් පසුබිම් තොරතුරු හා වැඩි දුරටත් නිරීක්ෂණය කරන ලද කරුණු (2.6.7.2(ඇ) ඡේදය) කරුණු අනුව නව ව්‍යාපෘති යෝජනාව ක්‍රියාත්මක කිරීමට සුදුසු තත්ත්වයක නොතිබූ බව ගම්‍ය වන නමුත් මෙම වාර්තාවේ 2.6.7.2(ඉ) හි සඳහන් පරිදි කමිටු වාර්තාවේ අවසානයේදී ලබා දී ඇති යෝජනා මගින් නව ව්‍යාපෘති යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කර තිබූ බව නිරීක්ෂණය විය. එහි 09 වන යෝජනාව මගින් අත්සන් කිරීමට යෝජිත නව ගිවිසුම නිර්දේශ කර තිබූ බවට නිරීක්ෂණය විය.

**3.53** ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ පාලක ජනරාල්වරයාගේ 2023 අගෝස්තු 25 දිනැති අංක DIE/IT/23/11 දරණ මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් අමතන ලද ලිපියෙහි IVS – GBS Global Services (PVT) Ltd ආයතනය ඉදිරිපත් කර තිබූ ව්‍යාපෘති යෝජනාවලියෙහි අඩංගු කරුණු සම්බන්ධයෙන් පාලක ජනරාල් වරයාගේ නිරීක්ෂණ හා නිර්දේශ ඉදිරිපත් කර තිබූ අතර ඉදිරිපත් කර තිබූ ව්‍යාපෘති යෝජනාවලිය හා ඊට අදාළ ගිවිසුම එලෙසම ක්‍රියාත්මක කළහොත් ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට හිමි බලතල අභියෝගයට ලක්වන බවත්, උද්ගත වන තත්ත්වයන් පහත කරුණු යටතේ සිදුවන බවට අවධාරණය කර ඉදිරිපත් කර තිබූ බවට නිරීක්ෂණය විය.

(i) විදේශ දූත මණ්ඩල ජාත්‍යන්තර නියෝජිත ආයතන වලින් විවිධ රාජකාරී කටයුතු සඳහා පැමිණෙන විදේශිකයන් ඇතුළු සියළු දෙනාගට VFS ආයතනය මගින් සියළුම වීසා වර්ග ඉල්ලුම් කිරීමට සිදුවීම මත ගැටළුකාරී තත්ත්වයන්ට මුහුණ දීමට සිදුවන බව,

(ii) ඉදිරිපත් කර ඇති ව්‍යාපෘති යෝජනාවලියේ සඳහන් සේවාවන් සඳහා සියළුම මෘදුකාංගයන් සැපයීම VFS ආයතනය සිදු කරන බැවින් මෘදුකාංග සම්බන්ධයෙන් වන පරිපාලනමය බලය ආගමන විගමන දෙපාර්තමේන්තුවෙන් ගිලිහී යන බව,

(iii) ඉදිරිපත් කර ඇති ගිවිසුමෙහි අයිතම අංක 2ට අදාළව (Scope of Service) ක්‍රියාවලියන් සිදු කිරීම සඳහා ආගමන හා විගමන පනතින් බලයක් ලබා දිය නොහැකි බව,

(iv) පාලක ජනරාල්වරයා විසින් ලිපිය මගින් නිර්දේශ කළ අවධාරණය කර ඇති කරුණු පිළිබඳව පුළුල්ව සාකච්ඡා කර ප්‍රතිපත්තිමය තීරණ වලට එළඹීමෙන් අනතුරුව VFS ආයතනය වෙතින් නැවත සංශෝධිත යෝජනාවලියක් ලබා ගැනීම වඩාත් සුදුසු බවත් පවතින තත්ත්වය තුළ,

- සංචාරක කටයුතු ප්‍රවර්ධනය කර ශ්‍රී ලංකාවේ සංචාරය කිරීමට ආකර්ශණය වන පරිදි ඔවුන්ගේ වෙබ් අතුරු මුහුණු භාවිතා කර ඉලෙක්ට්‍රොනික් සංචරණ අනුමැතිය (Visit Visa) සඳහා ඉල්ලුම් කිරීමේ පහසුකම ලබා දීම
- දැනට දෙපාර්තමේන්තුවේ මොබිටෙල් ආයතනය හා Travelzen ආයතනය සමග කරගෙන යමින් පවතින මෘදුකාංග සංවර්ධන කටයුතු ඒ ආකාරයෙන්ම කරගෙන යාම
- විදේශගත ශ්‍රී ලාංකිකයන්ගේ විදේශ ගමන් බලපත්‍ර සැකසීම සඳහා දෙපාර්තමේන්තුව විසින් දැනට සංවර්ධනය කරගෙන යනු ලබන මෘදුකාංග යොදා ගැනීම යන කරුණු ක්‍රියාත්මක කිරීම සුදුසු බව සඳහන් කර තිබුණි.

පාලක ජනරාල්වරයා විසින් ආගමන විගමන පනත පරිදි හිමිවී ඇති බලතල ප්‍රකාරව ඉදිරිපත් කර තිබූ මෙම ලිපියේ ඇතුළත් ඉහත කරුණු සම්බන්ධයෙන් 2023 සැප්තැම්බර් 08 දින අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කිරීමේදී මැදිහත්ව කටයුතු කර නොතිබූ බව නිරීක්ෂණය විය.

❖ **වීසා ආදායම් රැස් කිරීම හා බැංකුගත කිරීම පිළිබඳ නිරීක්ෂණ**

**3.54** පනත පරිදි රජය වෙනුවෙන් ආගමන විගමන ක්ෂේත්‍රයට අදාළව ආදායම එකතු කිරීමේ නිලධාරී වශයෙන් රාජ්‍ය ආදායම එකතු කිරීමේ බලය හා වගකීම ආගමන විගමන පාලක ජනරාල්වරයා වෙත පවරා ඇත. එම බලය රාජ්‍ය යාන්ත්‍රණයෙන් පිටත නියෝජිතයන් වෙත පැවරීම සඳහා ප්‍රතිපාදන නොතිබියදීත් රාජ්‍ය ආදායම එකතු කිරීම සඳහා පුද්ගලික අංශයේ විදේශ සමාගමක් වෙත, ශ්‍රී ලංකාවෙන් පිටත විදේශ රාජ්‍යයක පිහිටි බැංකු ගිණුමකට හා ගෙවීම් කවුළුවක් (Payment gateway) වෙත පැවරීමට කටයුතු කිරීමේ නීත්‍යානුකූලභාවය ගැටළු සහගත වේ. එළඹී ගිවිසුමේ ඇමුණුම 03 හි 1.1(III) වගන්තිය අනුවද ගාස්තුව පිළිබඳ කරුණු ඇතුළත් කිරීම මගින් එම අයිතිය මෙම සමාගමට ලබා දී තිබූ බව තවදුරටත් තහවුරු වේ.

**3.55** 2.6.13.1(ආ) ඡේදය පරිදි භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය පරිදි මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ දෙපාර්තමේන්තුවට ලැබිය යුතු වීසා ආදායම් වීසා ගාස්තු අයකළ දිනට පසු දින ආගමන හා විගමන පාලක ජනරාල්වරයාගේ නිල බැංකු ගිණුමට බැර කළ යුතු වුවද ගිවිසුමේ ඇමුණුම 03 (04)d ඡේදය පරිදි වීසා ආදායම් ආගමන හා විගමන පාලක ජනරාල්වරයාගේ නිල බැංකු ගිණුමට බැර කිරීමට දින 7ක් දක්වා කාල පරාසයක් ලබාදීමට එකඟ වී තිබුණි. ගිවිසුම්ගත පරිදි GBS Technology Services & IVS Global – FZCO හා VFS VF Worldwide Holdings Ltd ආයතන විසින් සේවා සපයන ලද කාලපරිච්ඡේදය තුළ වීසා ගාස්තු හා සේවා ගාස්තු සේවා සැපයුම්කාර ආයතනයට අයත් විදේශ බැංකු ගිණුමක් වෙත අය කර තිබූ බවත් දින 01 සිට 06 දක්වා වූ කාල ප්‍රමාදයකින් පසු ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබූ බව නිරීක්ෂණය විය. සමාගම දෛනිකව එකතු කර ගන්නා වීසා ගාස්තු ආදායම දින ගණන් අත රඳවා ගැනීමට ඉඩහැරීම හේතුවෙන් රාජ්‍ය ආදායම මත අලාභයක් සිදුවන බව නිරීක්ෂණය විය.

**3.56** 2.6.13.1(ඇ)ඡේදය අනුව ගිවිසුමේ 2.10 ඡේදයේ සඳහන් අවම ඩොලර් වටිනාකම එ.ජ. ඩොලර් 500,000ක් දක්වා වැඩිකර තිබුණද එයද ප්‍රමාණවත් වූ තැන්පතුවක් නොවන බවද නිරීක්ෂණය විය. උදාහරණයක් ලෙස 2024 අප්‍රේල් 29 දිනට GBS Technology Services & IVS Global – FZCO හා VFS VF Worldwide Holdings Ltd ආයතන විසින් උපයන ලද වීසා ගාස්තු ලෙස එ.ජ. ඩොලර් 952,860ක් බවත් ඒ අනුව එ.ජ. ඩොලර් 500,000 තැන්පතුව ප්‍රමාණවත් නොවන බවත් නිරීක්ෂණය විය.

**3.57** IVS Global – FZCO හා VFS VF Worldwide Holdings Ltd ආයතනය විසින් ගිවිසුම්ගත සේවා සපයන ලද කාලපරිච්ඡේදයේදී (2024 අප්‍රේල් 17 සිට 2024 අගෝස්තු 02) එක් එක් දිනයන්ට අදාළව විදේශීය සමාගම විසින් දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලද ප්‍රේෂණ වාර්තාවේ සඳහන් අයදුම්පත්‍ර සංඛ්‍යාව පිළිබඳ තොරතුරු තාක්ෂණ අංශයෙන් ලබාගත් වාර්තා හා ආයතනික පරිගණක පද්ධතියෙන් ලබාගත් වාර්තාවල සඳහන් අයදුම්පත් සංඛ්‍යාව අතර වෙනස්කම් නිරීක්ෂණය විය. මෙකී වෙනස්කම් සැසඳීම් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු තොරතුරු තාක්ෂණ අංශය හා ගිණුම් අංශය අතර විධිමත් වූ ක්‍රමවේදයක් ස්ථාපිතව නොතිබූ අතර මේ සම්බන්ධයෙන් 2024 අප්‍රේල් 19, 2024 මැයි 13 හා 2024 මැයි 30 යන දිනයන්හී දී ප්‍රධාන ගණකාධිකාරී විසින් පාලක(වීසා) හා පාලක(තොරතුරු තාක්ෂණ) වෙත දැනුවත් කිරීම්ද සිදුකර තිබුණි. මේ අනුව GBS Globle service IVS Globle-FZCO, VF World Wide Holding Ltd ආයතනය මගින් වීසා අයදුම්පත් ඉදිරිපත් කරන ලද සංඛ්‍යාව හා නිකුත් කරන ලද වීසා බලපත්‍ර සංඛ්‍යාව නිශ්චිතව හඳුනා ගැනීමට නොහැකිව තිබුණි.

**3.58** උක්ත කාලපරිච්ඡේදයට අදාළව GBS Technology Services and IVS Global –FZCO ආයතනය වීසා ගාස්තු ලෙස අයදුම්කරුවන් 373,991 ක් වෙනුවෙන් ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට මුදල් ගෙවා තිබුණ ද ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ පාලක(තොරතුරු තාක්ෂණ) අංශයෙන් ලබා ගත් තොරතුරු අනුව අයදුම්කරුවන් 375,004 ක් වෙනුවෙන් වීසා නිකුත් කර තිබුණි. ඒ අනුව අයදුම්කරුවන් 1013 දෙනෙකුගෙන් ලබා ගත් වීසා ගාස්තුව සමාගම විසින් ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට ලබා දී නො තිබූ බව නිරීක්ෂණය විය.

**3. 59** 2.6.13.1(අ) ඡේදය පරිදි අයදුම්කළ වීසා අයදුම්පත් සංඛ්‍යාව අනුව කොපමණ වීසා ගාස්තුවක් අයවිය යුතු ද යන්න ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් ගණනය කර අයවිය යුතු ගාස්තුව එම සමාගමෙන් අය කර ගන්නවා වෙනුවට, අයකරන ගාස්තු වීසා ගාස්තුව ඇතුලුව එම සමාගම විසින්ම තිරණය කර ඩුබායිහි පිහිටි ඔවුන්ගේ ගිණුමකට රැස්කර තිබූ බව නිරීක්ෂණය විය. පසුව නිකුත් කරන ලද වීසා වෙනුවෙන් වීසා ගාස්තුව ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ අංක 71963786 දරන ලංකා බැංකුවේ විදේශ මුදල් ගිණුමට මාරුකර තිබුණි. මේ හේතුවෙන් අය කරන ලද වීසා ගාස්තුවල නිරවද්‍යතාවය හා අදාළ නිවැරදි වීසා ගාස්තුව දෙපාර්තමේන්තුවට ලැබුණේද යන්න තහවුරු කරගෙන නොතිබූ අතර දේශීය වශයෙන් ඉපයෙන මෙම වීසා ගාස්තු ආදායම විදේශ සමාගමකට අයත් විදේශ බැංකු ගිණුමක් හරහා සිදුකිරීම පිළිබඳව මහා භාණ්ඩාගාරය සහ මහ බැංකුවේ හෝ විධිමත් අවසරයක් ලබා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**3.60** ආදායම් ගණන්දීමේ නිලධාරියෙකු ලෙස ආදායම් තක්සේරු කිරීම, එකතු කිරීම හා ප්‍රතිග්‍රහණය නිවැරදිව සිදුවන බවට වගබලා ගැනීම ආගමන හා විගමන පාලක ජනරාල්ගේ ප්‍රමුඛ කාර්යයක් බැවින් GBS Technology Services & IVS Global – FZCO හා VFS VF Worldwide Holdings Ltd ආයතනය හරහා වීසා නිකුත් කිරීමේදී ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික

සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 127(1)(ආ) අනුව නිසි පරිදි ආදායම් එකතු කිරීම සිදුවන්නේදැයි තහවුරු කර ගැනීම සඳහා ක්‍රමවේදයක් ආයතනය තුළ ස්ථාපිත කර නොතිබූ බව නිරීක්ෂණය විය.

**3.61** මොබිටෙල් ආයතනය හරහා ETA ක්‍රමය ක්‍රියාත්මක වූ වකවානුවේ දී වීසා අයදුම්කළ හා නිකුත් කිරීම් පිළිබඳ තොරතුරු දිනපතා ගිණුම් අංශය වෙත ලැබී තිබුණත් GBS Technology Services & IVS Global – FZCO හා VF ආයතනය හරහා වීසා නිකුත් කිරීමේ නව ක්‍රමය ආරම්භ කළ පසු එම තොරතුරු එවීමට කටයුතු කර නොතිබුණි. ඒ අනුව ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරවරයා විසින් GBS Technology Services and IVS Global –FZCO- VF ආයතනය විසින් නිකුත් කර ඇති වීසා බලපත්‍රවලට අදාළ තොරතුරු පද්ධතිය හරහා සංසන්දනය කිරීමේ පහසුකම ගිණුම් අංශය වෙත ලබා දෙන ලෙස පාලක(තොරතුරු තාක්ෂණ) වෙත දන්වා ඇතත් එම පහසුකම ලබා දීමට කටයුතු කර නොතිබුණි.

- **GBS Technology Service & IVS Globle-FZCO, VFS VF World Wide Holding Ltd ආයතනය විසින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ නිරීක්ෂණ.**

**3.62** 2.6.11.3 ඡේදය පරිදි කැනඩා ජාතිකයකු විසින් ඉදිරිපත් කර තිබූ පැමිණිල්ලක් අනුව ශ්‍රී ලංකාවේ සංචාරය කරන විදේශිකයන්ගෙන් විවිධ පදනම් යටතේ ගාස්තු අය කර තිබූ බව හා මෙලෙස ගාස්තු අයකිරීම සම්බන්ධයෙන් විදේශිකයින් අවස්ථා ගණනාවකදී ආගමන විගමන දෙපාර්තමේන්තුවට පැමිණිලි කර තිබූ බවද නිරීක්ෂණය විය. GBS Technology Service & IVS Globle-FZCO, VFS VF Worldwide Holding Ltd යන ආයතන සේවා සැපයීම සඳහා තෝරා ගැනීමේදී රජයට කිසිදු වැය බරක් නොවන බවට හා ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම පිළිබඳ සාධාරණීයකරණය කර තිබුණි. එසේ වුවද ශ්‍රී ලංකාවේ සංචාරය සඳහා පැමිණෙන සංචාරකයින්ගෙන් විවිධ ගාස්තු අයකිරීම සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය වීම වෙනුවට සංචාරකයින් ලංකාවට පැමිණීම අධෛර්යමත් කිරීමට හා ඔවුන් සංචාරය සඳහා වෙනත් ගමනාන්ත තෝරා ගැනීමට නැඹුරුවිය හැකි බවද නිරීක්ෂණය විය.

**3.63** 2.6.11.4 ඡේදය පරිදි United Nations ගමන් බලපත්‍රධාරීන්ට Nationality ලෙස “UN” තෝරා ගැනීමට VFS පද්ධතිය තුළ අවකාශ සලසා නොමැතිවීම, වීසා අනුමත කිරීමේ පණිවුඩ නියමාකාරයෙන් නියමිත කාලය තුළ අයදුම්කරු වෙත නොලැබීම, විද්‍යුත් තැපැල් පණිවුඩ මාරුවීම, VFS පද්ධතියේ බිඳවැටීම් සිදුවීම, VFS ආයතනය මගින් අයදුම්කරුවන්ට වීසා අයදුම් කිරීම සම්බන්ධව නිවැරදි තොරතුරු ලබා නොදීම, ගාස්තුවලින් නිදහස් වීසා වලට ද VFS ආයතනය වෙත අතිරේක ගාස්තුවක් ගෙවීමට සිදුවීම, යම් අයදුම්කරුවකුට වලංගු වීසාවක් තිබිය දී තවත් වීසාවක් අයදුම් කිරීමට VFS පද්ධතිය තුළින් ඉඩ ලබාදී තිබීම නිසා වීසාව සක්‍රිය තත්ත්වයට පත් නොවීම හේතුවෙන් අයදුම්කරුවන් රට තුළට පැමිණීමේ දී විවිධ දුෂ්කරතා වලට ලක්වීම හා වීසා ගාස්තු දෙවරක් ගෙවීමට සිදු වීම, අයදුම්කරුවන්ගේ e- Visa අයදුම්පත් සම්බන්ධ ගැටළු සෘජුව ඉදිරිපත් කිරීමට VFS ආයතනය මගින් විද්‍යුත් තැපැල් ලිපිනයක් (e – mail address) හඳුන්වා දී නොතිබීම ආදී අඩුපාඩු GBS Technology Service

& IVS Globle-FZCO, VFS VF Worldwide Holding Ltd ආයතන විසින් සේවා සැපයීමේදී සිදුව තිබුණද මේ සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ගගත් බවට තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි.

**3.64** 2.6.11.5 ඡේදය පරිදි GBS Technology Service & IVS Global -FZCO, VFS VF Worldwide Holding Ltd යන ආයතන විසින් සේවා සපයන ලද කාලය තුළ වීසා අයදුම්කරුවන් වෙතින් අයකරගන්නා ලද සියයට 2.5 ක් වූ සමාජ ආරක්ෂණ බදු (SSCL) හා සියයට 18 ක් වූ එකතු කළ අගය මත බදු (VAT) මුදල් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබූ බව නිරීක්ෂණය විය. විගණනය වෙත ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සේවා සැපයුම්කාර ආයතන විසින් 2024 අප්‍රේල් 16 සිට 2024 අගෝස්තු 02 දක්වා කාලය තුළ වීසා අයදුම්පත් 373,991 ක් සඳහා මුදල් ගෙවා තිබුණි. ඒ අනුව මෙම සේවාව සැපයීම වෙනුවෙන් වීසා අයදුම්කරුවන්ගෙන් එකතු කරන ලද සේවා ගාස්තු ආදායම අවම වශයෙන් එ.ජ.ඩොලර් 6,918,833.5 ක් බවද ඒ අනුව ගණනය කළ හැකි සමාජ ආරක්ෂණ බද්ද එ.ජ.ඩොලර් 172,970 ක් හා එකතු කළ අගය මත බද්ද එ.ජ.ඩොලර් 1,245,390 ක් බවද නිරීක්ෂණය විය. ඒ අනුව එ.ජ.ඩොලර් 1,418,360 ක් වූ බදු ආදායමක් රජයට අහිමි වී ඇති බවත් GBS Technology Service & IVS Globle-FZCO ආයතනය, VFS VF Worldwide Holding Ltd ආයතනය යන ආයතනවලින් එම ආදායම් අය කර ගත යුතු බවත් නිරීක්ෂණය විය.

**3.65** GBS Technology Services & IVS Global – FZCO හා VFS VF Worldwide Holdings Ltd ආයතනය හරහා මාර්ගගත ක්‍රමයට වීසා නිකුත් කළ 2024 අප්‍රේල් 17 ත් 2024 අගෝස්තු 02 ත් අතර කාලච්ඡේදය තුළ වීසා ගාස්තු නිදහස් කළ රටවල් වෙනුවෙන් වීසා අයදුම් පත්‍ර 98,401 ක් වෙනුවෙන් වීසා ගාස්තු අය කිරීමකින් තොරව වීසා නිකුත් කිරීම නිසා, ශ්‍රී ලංකා රජයට වීසා ගාස්තු ආදායමක් නොලැබුණු ද එම අයදුම්පත්‍ර සංඛ්‍යාව වෙනුවෙන් GBS Technology Services & IVS Global – FZCO හා VFS VF Worldwide Holdings Ltd ආයතනය අවම වශයෙන් එ.ජ. ඩොලර් 1,820,418 ක ආදායමක් උපයාගත හැකිව තිබූ බව නිරීක්ෂණය විය. ගාස්තු අයකිරීමෙන් තොරව වීසා නිකුත් කිරීමේ අරමුණ සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම වූවත් GBS Technology Services & IVS Global – FZCO හා VFS VF Worldwide Holdings Ltd ආයතනය මෙලෙස සේවා ගාස්තු ලෙස මුදල් අයකර තිබූ අතර පෙර පැවති ක්‍රමයට ETA පද්ධතිය හරහා වීසා නිකුත් කළේ නම් සංචාරකයින්ට සේවා ගාස්තුවකින් තොරව වීසා ලබා ගැනීමේ හැකියාව පැවතුණු බව නිරීක්ෂණය විය.

**3.66** 2.6.11.2 ඡේදය 2024 මැයි 01 දින කටුනායක ගුවන් තොටුපලේ Onarrival ක්‍රමයට වීසා නිකුත් කිරීම සිදුකළ ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඉවත්ව තිබූ අතර On arrival වීසා නිකුත් කිරීමේ ක්‍රියාවලිය GBS Technology Services and IVS Global –FZCO ආයතනයේ පද්ධතිය හරහා වීසා නිකුත් කිරීම ආරම්භ කර තිබුණි. ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඉවත්වීම හා ඔවුන්ගේ නිලධාරීන් මෙසේ යෙදවීම සඳහා කිසිදු බලධාරියෙකුගේ ලිඛිත අවසරයක් ලබා දී නොතිබූ බවට නිරීක්ෂණය විය.

**3.67** GBS Technology Services and IVS Global –FZCO ආයතනය හරහා වීසා නිකුත් කිරීමේ ක්‍රමවේදය ආරම්භ කළ පසු අදාළ නොවන වෙනත් තෙවන පාර්ශවයන් විසින් විවිධ විදේශීය ආයතන විසින් ගාස්තු අයකර ශ්‍රී ලංකාවේ වීසා අයදුම්පත්‍ර භාර ගන්නා බවට අන්තර්ජාලයේ දැන්වීම් පළකර තිබූ බවට නිරීක්ෂණය විය. විවිධ විදේශ ආයතන වෙත ශ්‍රී ලංකා රාජ්‍ය සිදු කරන නිල කාර්යයන් සඳහා එවැනි දැන්වීම් පල කිරීමට ඇති හැකියාව මතභේදයට තුඩුදුණි.

**3.68** GBS Technology Services & IVS Global – FZCO හා VFS VF Worldwide Holdings Ltd ආයතනය හරහා වීසා නිකුත් කිරීමේ ක්‍රමය සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් 2024 අගෝස්තු 02 දින අතුරු තහනම් නියෝගයක් නිකුත් කර තිබුණි. මෙරටට පැමිණෙන ඇතැම් සංචාරකයින්හට ගුවන් තොටුපලේදී වීසා ලබාගැනීමේ දී අපහසුතාවයට පත් වන බවට සිද්ධීන් වාර්තා වීමත් මේ තුළින් ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපයට හානියක් සිදු වියහැකි බව පෙනී යන බැවින්, මෙරටට පැමිණෙන ඇතැම් විදේශිකයන්ට කඩිනමින් හා පහසුවෙන් වීසා ලබා ගැනීමට හැකි වන පරිදි සරල හා විධිමත් ක්‍රමවේදයක් වහාම හඳුන්වාදීම සඳහා අදාළ බලධාරීන්ට නියම කිරීමට ජනාධිපතිවරයාට බලය පැවරීමටත්, ජනාධිපතිතුමා විසින් ගනු ලබන පියවර පිළිබඳව වාර්තාවක් අමාත්‍ය මණ්ඩල සටහනක් මගින් මීලඟ අමාත්‍ය මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස ජනාධිපති ලේකම් වෙත දැනුම් දීමටත් 2024 සැප්තැම්බර් 02 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර තිබූණි. එබැවින් 2024 අප්‍රේල් 17 දින ආරම්භ කර තිබූ නව වීසා නිකුත් කිරීමේ ක්‍රමවේදය තුළ නොවිසඳුණු ගැටළු පවතින බව තවදුරටත් තහවුරු විය.

❖ **වීසා ගාස්තු**

**3.69** 2023 නොවැම්බර් 27 දිනැති අංක 2360/24 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් මාලදිවයින හැර සාක් රටවල් හා සාක් රටවල්, චෙක් ජනරජය, සීෂේල්ස්, සිංගප්පූරුව හැර අනෙකුත් රටවල් සඳහා සංචාරක වීසා ගාස්තු දින 1 සිට 180 දක්වා මාස 03 ක් සඳහා පිලිවෙලින් එ.ජ. ඩොලර් 35 ක් හා එ.ජ. ඩොලර් 75 ක් ලෙස එක් ගාස්තු කාණ්ඩයක් ලෙස අය කළ හැකි වන පරිදි ගාස්තු සංශෝධනය කර තිබූ බවට නිරීක්ෂණය වූ අතර එහි වරහන් තුළ ‘‘එක් එක් රැඳී සිටීම දින 60ක් දක්වා සීමා වේ.’’ යනුවෙන් දක්වා තිබුණි.

ඒ අනුව දින 180ක් සඳහා ගාස්තු අය කළ ද රැඳී සිටිය හැක්කේ දින 60ක් පමණක් බැවින් දින 60ක් ගත වූ පසුව නැවත අයදුම්කර දින දීර්ඝ කර ගත යුතු විය. ඒ අනුව නැවත දින දීර්ඝ කිරීම සඳහා අයදුම් කිරීමේදී 2024 අප්‍රේල් 17 දින සිට ක්‍රියාත්මක වූ GBS Technology Services & IVS Global – FZCO හා VFS VF Worldwide Holdings Ltd ආයතනයට අමතර සේවා ගාස්තුවක් ගෙවීමට සිදු ව තිබූ බව නිරීක්ෂණය වේ.

**3.70** 2024 මැයි 17 දිනැති ගැසට් නිවේදනය මගින් කරන ලද වීසා ගාස්තු සංශෝධනය මගින්ද මාලදිවයින හැර සාක් රටවල් සඳහා දින 01 සිට 180 දක්වා අය කළ යුතු ගාස්තුව එ.ජ. ඩොලර් 35ක් වේ. මේ අතර 2024 මැයි 17 දිනැති ගැසට් නිවේදනය මගින් සංශෝධනය කරන

ලද වීසා ගාස්තුව අයකළ යුතු ආකාරය පිළිබඳ VFS Global ආයතනය දැනුවත් කරන ලෙස පාලක ජනරාල්වරයා විසින් 2021 මැයි 30 දිනැති අංක DIE/Visa/01/18(1) දරණ පාලක (තොරතුරු තාක්ෂණ) අමතන ලද ලිපිය මගින් දන්වා තිබුණි. GBS Technology Services & IVS Global – FZCO හා VFS VF Worldwide Holdings Ltd ආයතනය විසින් සාක් රටවල් ඇතුළු සියළුම රටවල් වලින් දින 01 සිට දින 180 දක්වා කාලය සඳහා එ.ජ. ඩොලර් 75 බැගින් අයකර තිබූ බැවින් ඉහත ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවය ඉටු වී නොතිබුණි. ඒ අනුව 2024 මැයි 31 දින සිට 2024 අගෝස්තු 02 දක්වා කාලපරිච්ඡේදය තුළ සාක් රටවල් සඳහා අයදුම්කරුවන් 827ක ගෙන් එ.ජ.ඩොලර් 33,080ක් වැඩියෙන් අය කර තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

තව ද එවකට ගරු ජනාධිපතිවරයාගේ අංක 24/1650/601/099 හා 2024 අගෝස්තු 15 දිනැති "සංචාරක වීසා ගාස්තු රහිතව නිකුත් කිරීම පිළිබඳව විශේෂඥ කමිටු වාර්තාව" මැයෙන් ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සටහන මගින් රටවල් 35ක් සඳහා දින 30ක් සඳහා නොමිලයේ වීසා නිකුත් කිරීම සඳහා 2024 අගෝස්තු 21 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබූ නමුත් මෙම යෝජනාව ක්‍රියාත්මක වී නොතිබූ බව නිරීක්ෂණය විය.

- **GBS Technology Services & IVS Global – FZCO හා VFS VF Worldwide Holdings Ltd ආයතනය සම්බන්ධ පොදු කරුණු**

**3.71** එම සමාගම්වල යෝජනා අතර ශ්‍රී ලංකාව වෙනුවෙන් විදේශයන්හි ශ්‍රී ලංකාවේ සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීමත් විදේශිකයන්ට සංචාරක රක්ෂණාවරණ ලබාදීමත් අන්තර්ගත වන අතර ශ්‍රී ලංකාවේ සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා අමාත්‍යාංශය සහ ඒ යටතේ ආයතන තිබියදී මෙම ආයතනයට අදාළ කටයුතු පැවරීමේ අරමුණු කුමක් ද යන්න පැහැදිළි නොවිණි. එසේම ශ්‍රී ලංකාව ඇතුළු බොහෝ රටවල සංචාරය කිරීම සඳහා සංචාරක රක්ෂණාවරණයක් අනිවාර්ය වන අතර එය ලෝකයේ ඉතා ලාභදායී ව්‍යාපාරයක් බවට පත්ව තිබුණි. එහෙත් මෙම යෝජනාවලියට අනුමැතිය ලබා දී අදාළ ගිවිසුම් අත්සන් කිරීම් මගින් සංචාරක රක්ෂණාවරණයන් සිදු කරන එක් ආයතනයක් සඳහා අනවශ්‍ය වක්‍ර අනුමැතියක් ලබාදීමක් ද මෙහි දී සිදුවේ. වීසා නිකුත් කිරීමට ප්‍රථම මෙම සංචාරක රක්ෂණාවරණය ලබා ගත්තේ ද යන්න පරීක්ෂාවට ලක් කරන බැවින් සංචාරක රක්ෂණාවරණයක් ලබා ගැනීම සම්බන්ධයෙන් ලබැඳියාවන් අතර පිළිගැටුමක් (Conflict of interst) මේ තුළින් ඇති කරන අතර එය එම ආයතනයට වෙනත් ව්‍යාපාරයක් කරගෙන යෑමට ශ්‍රී ලංකා රජය ලබා දෙන නිළ නොවන පිලිගැනීමක් ලෙස ද සැලකිය හැකිය.

**3.72** අවිධිමත් ආකාරයට මාර්ගගත ක්‍රමයට වීසා නිකුත් කිරීම GBS Technology Service & IVS Globle - FZCO, VF Worldwide Holding Ltd සමාගමට ලබාදීම මත ඇති වූ ගැටළුකාරී තත්ත්වය හේතුවෙන් 2024 අගෝස්තු 03 දින සිට 2024 සැප්තැම්බර් 25 දක්වා මාස 02කට ආසන්න කාලපරිච්ඡේදය තුළ මාර්ගගත ක්‍රමයට වීසා නිකුත් කිරීමට නොහැකිව තිබූ බව නිරීක්ෂණය විය. ඒ අනුව මේ වන විට එම කාල පරිච්ඡේදය තුළ On Arrival Visa ක්‍රමයට

පමණක් වීසා නිකුත් කිරීම යටතේ ශ්‍රී ලංකාවට පැමිණීමට අපේක්ෂිත වූ සංචාරකයින් හට වීසා ලබා ගැනීමේ අපහසුතාවය මත රජයට ලැබිය යුතු වීසා ආදායම් හා සංචාරක ආදායම් අහිමි වී පැවතුණි.

**3.73** 2007 අංක 07 දරන සමාගම් පනතේ 01 වන වගන්තිය ප්‍රකාරව අංක P.V. 00293873 දරන සංස්ථාගත කිරීමේ සහතිකය යටතේ GBS Technology Service Lanka (Pvt) Ltd සමාගම 2024 පෙබරවාරි 08 දින ලියාපදිංචි කිරීමේදී සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින්මෙම සමාගම පිළිබඳ පහත අවශ්‍යතා සපුරා ගැනීම තහවුරු කර ගැනීමට අපොහොසත් වී ඇති බව නිරීක්ෂණය විය.

(i) ශ්‍රී ලංකාව තුළ නව සමාගමක් ලියාපදිංචි කිරීම සඳහා එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ සමාගම් විසින් ගනු ලැබූ අධ්‍යක්ෂ මණ්ඩල තීන්දුවක් සමාගම් ලියාපදිංචියේ දී ලබාගෙන නොමැති බව.

(ii) අදාළ විදේශීය සමාගමේ සමාගම් ලියාපදිංචියට අදාළ සහතික කිසිවක් සමාගම් ලියාපදිංචියේ දී ලබාගෙන නොමැති බව.

(iii) අදාළ විදේශීය සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල විස්තර, සමාගම් ලියාපදිංචියේ දී ලබාගෙන නොමැති බව.

(iv) අදාළ විදේශීය සමාගමට මෙවැනි කටයුතු සඳහා සාංගමික ව්‍යවස්ථාවලියෙන් ප්‍රතිපාදන තිබෙදැයි තහවුරු කර ගැනීමට එම ව්‍යවස්ථාවලියේ පිටපතක් සමාගම් ලියාපදිංචියේ දී ලබාගෙන නොමැති බව.

**3.74** ශ්‍රී ලංකා රජයේ හෝ රජයට අනුබද්ධ Domain ඒකකයකින් බැහැරව මෙම ආයතනය, තෝරාගත් බාහිර Domain ඒකකයක් හා ආගමන විගමන දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියක් හෝ Server ඒකක හරහා අයදුම්පත් තොරතුරු හා දත්ත රැස්කිරීමට හා ගබඩා කිරීමට ගිවිසුමේ ඇමුණුම 03(1.1) (vi), ඇමුණුම 03.3 හා ඇමුණුම 03(4)(b) හි යටතේ ලබාදී තිබුණි.

**3.75** මෙම වාර්තාව සකස් කරන දිනය වූ 2025 අගෝස්තු 20 දින වන විට විද්‍යුත් සංචරණ අනුමැතිය පද්ධතිය මොබිටෙල් සමාගම විසින් පවත්වාගෙන යාමේ දී එකී පද්ධතියේ සේවා හා නඩත්තු වෙනුවෙන් අදාළ ගිවිසුම පරිදි දෙපාර්තමේන්තුව විසින් 2023 වර්ෂයේ සිට ගෙවීම් සිදු කර නොමැති බව නිරීක්ෂණය විය. තවද, මොබිටෙල් සමාගමේ ලාංඡනය, ETA පද්ධතියට අදාළ වෙබ් අඩවියේ ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් ද මොබිටෙල් සමාගම විසින් වසරකට රු.1,000,000 බැගින් දෙපාර්තමේන්තුව වෙත ගෙවීමට අදාළ ගිවිසුමේ ප්‍රතිපාදන ඇතුළත් වී තිබූ නමුත් එම ආයතනයද 2021 වර්ෂයේ සිට අදාළ මුදල් නිරවුල් කර නොතිබුණු බව ද නිරීක්ෂණය විය.

## 4. විගණන නිර්දේශ

4.1 1948 අංක 20 දරන ආගාමික හා විගාමික පනත යටතේ වූ ක්‍රියාකාරකම් ඉටුකිරීම සඳහා විසා නිකුත් කිරීමේ ක්‍රියාවලියට අදාළ නෛතික ප්‍රතිපාදන හඳුනාගෙන ඒ අනුව කටයුතු කිරීම හෝ අවශ්‍ය විටකදී සංශෝධනය කර කටයුතු කළ බව. (යොමු අංක: 3.1, 3.2, 3.3)

4.2 කාලීනව, නාක්ෂණ දියුණුවත් සමග බද්ධව වැඩිදියුණු කළ ක්‍රමෝපාය භාවිතා කරමින් වඩා කාර්යක්ෂම හා මිත්‍රශීලී සේවාවක් සිය පාරිභෝගිකයන්ට ලබාදීමට කටයුතු කිරීම ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ වගකීම හා කාර්යභාරය වන බැවින් ඒ සඳහා නිරන්තරයෙන් කටයුතු කළ යුතු වන බව.( යොමු අංකය : 3.5)

4.3 ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සිය සේවාවන් භාහිරකරණයේදී (Outsource) භාහිරකරණය කළයුතු සේවා පිළිබඳ පිරිවැය ඵලදායිතා අධ්‍යයනයක් සිදුකර උනන්දුවක් දක්වන සියලු පාර්ශ්වයන්ට සහභාගී විය හැකි පරිදි ටෙන්ඩර් පටිපාටි අනුගමනය කර, රජයට ලාභදායී හා පාරිභෝගිකයන්ට යහපත සැලසෙන කොන්දේසි මත ආයතන තෝරාගෙන භාහිරකරණය කළයුතු බව. (යොමු අංකය : 3.5)

4.4 දේශීය/ විදේශීය සේවා සැපයුම්කරුවන් සමග ගිවිසුම්වලට එළඹීමේදී එම ආයතනවල නීත්‍යානුකූලභාවය, ලංකාව තුළ පවත්නා බදු ඇතුළු අනෙකුත් නීතිරීති රාමුව තුළ ඔවුන්ගේ බැඳීමගත වගකීම් ක්‍රියාත්මක වන ආකාරය, රජය වෙනුවෙන් හා ඔවුන් විසින් අයකරන ගාස්තුවල හා ආදායම් ලැබීම්වල විනිවිදභාවය ආදී කරුණු පිළිබඳ නිශ්චය කරගත යුතුවන බව. (යොමු අංක : 3.34, 3.41, 3.44, 3.45, 3.46, 3.47, 3.48, 3.49)

4.5 GBS Technology Service & IVS Globle-FZCO, VF Worldwide Holding Ltd ආයතනය කටයුතු කළ කෙටි කාලසීමාව තුළ මෙම ආයතනය විසින් ශ්‍රී ලංකා රජය වෙනුවෙන් විසා අයදුම්කරුවන්ගෙන් ලබාගත් සියයට 18 වැට් හා සියයට 2.5 සමාජ ආරක්ෂණ බද්ද (SSCL)රජයට අයකර ගැනීමට කටයුතු කිරීම හා උපයාගත් ආදායම් මත ගෙවිය යුතු ආදායම් බදු වටිනාකම් ගණනය කර එය දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කරවීම පිණිස බලයලත් ආයතන වල අවධානය යොමු කරවීම. (යොමු අංක : 3.64 )

4.6 GBS Technology Service & IVS Globle - FZCO, VF Worldwide Holding Ltd ආයතනය විසින් ඉදිරිපත් කළ ඒකපාර්ශවික යෝජනාව ආරම්භයේ සිට කෙටිකාලීන වශයෙන් ක්‍රියාත්මක නත්ත්වයට පත්වීම දක්වා කටයුතු කිරීමේ දී, අමාත්‍ය මණ්ඩල පත්‍රිකා පිළියෙල කිරීම, කම්ටු පත් කිරීම, කම්ටු වාර්තා ඇගයීමට ලක් කිරීම, රාජ්‍ය ආදායම රැස්කිරීමට බලය පවතින මුදල් අමාත්‍යාංශයේ නිරීක්ෂණ ලබා නොගැනීම සම්බන්ධයෙන් හා නිසි අවසරයකින් තොරව විසා ආදායම් විදේශීය රටක බැංකු ගිණුමකට රැස් කිරීමට ඉඩ හැරීම වැනි මූලික කාර්යයන් ඉටු කරනු ලැබූ නිලධාරීන් සම්බන්ධයෙන් මෙම වාර්තාවේ සඳහන් නිරීක්ෂණයන් අනුව සිදු කර නිබූ අනපසු වීම්, බැහැර වීම් හා වගකීම් විරහිතව කටයුතු කළ අය සම්බන්ධයෙන් විමර්ශනයන් සිදු කර අදාළ චිනය හා අනෙකුත් ක්‍රියාමාර්ග ගැනීම. (යොමු අංක : 3.15, 3.18, 3.26, 3.28, 3.35, 3.36, 3.43, 3.55, 3.56,)


83

4.7 නව ව්‍යාපෘති යෝජනාව ක්‍රියාත්මක කිරීම තුළින් රජයට සිදුව ඇති අලාභය හා අහිමිවී ගිය ආදායම ගණනය කර වගකිව යුතු අයගෙන් අයකර ගැනීමට කටයුතු කිරීම.

4.8 ශ්‍රේෂ්ඨාධිකරණයේ මේ සම්බන්ධයෙන් විභාග වෙමින් පවතින නඩුකරවල නිරණයන්ට යටත්ව ඉදිරියේ දී වඩා සුදුසු e-Visa ක්‍රමවේදයක් විනිවිදභාවයකින් යුතුව සුදුසු ලංසු කැඳවීමක් මගින් සේවා සපයන්නෙකු තෝරා ගැනීමට කටයුතු කිරීම.

4.9 මෙම වාර්තාවේ විගණකාධිපති සතු බලතල, සම්පත්, කාලය හා ඉදිරිපත් කරන ලද තොරතුරු යන විෂය සීමා තුළ සිදුකරන ලද හෙයින් ඉන් ඔබබට ගොස් විගණකාධිපතිට නිගමනය කළ නොහැකි මට්ටමේ නීතිවිරෝධී හෝ සාපරාධී කටයුතු සිදුවී ඇත්දැයි යන්න මාගේ පරීක්ෂාවට ලක් නොකෙරුණි. එබැවින් එවැනි පරීක්ෂාවක් කළ යුතු යැයි හැඟියන්නේ නම් ඒ සඳහා විශේෂිත වූ ආයතනයන්හි හෝ කොටසක සහාය ලබා ගැනීම සුදුසු බව නිර්දේශ කරනු ලැබේ.

ජී. ඊව්. ඩී. ධර්මපාල
විගණකාධිපති (වැඩබලන)

2025 ඔක්තෝබර් 03 දින.


84

ඇමුණුම 01



# ආගාමික හා විගාමික පනත

(1984 දෙසැම්බර් මස 31 වන දින දක්වා කරන ලද සංශෝධන ඇතුළත් වේ.)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

ශ්‍රී ලංකා රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

මිල : රු. 3.30 තැපැල් ගාස්තුව : රු. 1.80

229

## ආගාමික හා විගාමික පනත

(351 වන අධිකාරය)

ආගාමික හා විගාමික පනතේ මෙම පුනර් මුද්‍රණයෙහි, 1984 දෙසැම්බර් 31 වන දින දක්වා ඒ පනතට කරන ලද සංශෝධන ඇතුළත් කොට ඇත. එසේ වුවද මෙය ව්‍යවස්ථාපිත පුනර් මුද්‍රණයක් නොවේ. මෙය නිකුත් කරනු ලබන්නේ හුදෙක් පහසුව සඳහායය.

සංශෝධන ඇතුළත් කිරීමේ දී සහ ශෝධ්‍ය පත්‍ර කියවීමේ දී ප්‍රකාශන සහකාර ඩබ්ලිව්. ගුණසේන, අයි. ඒ. ඩබ්ලිව්. පෙරේරා සහ ජ්‍යෙෂ්ඨ පරිවර්තක එල්. ඩබ්ලිව්. ඒ. ද වෝස් ගුණවර්ධන යන මහත්වරුන්ගේ සේවය ලබා දීම සම්බන්ධයෙන් නීති පෙදුම්පත් සම්පාදක එන්. ජේ. අබේසේකර මහතාට මගේ කෘතඥතාවය පළ කරමි.

ඩී. ඩබ්ලිව්. සිරිවර්ධන.
ආගමන හා විගමන පාලක.

1—ඒ 084528—1,510 (85/06)

## ආගමිකයන් සහ විගාමිකයන්

1948 අංක 20, 1955 අංක 16, 1961 අංක 68 දරන පනත්.

ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන තැනැත්තන් ශ්‍රී ලංකාවට ඇතුල්වීම පාලනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන වෙනත් පුරවැසියන් සහ කැනැත්තන් ශ්‍රී ලංකාවෙන් පිටවීම විධිමත් කිරීම සඳහා, ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන නොමිනා තැනැත්තන් ශ්‍රී ලංකාවෙන් ඉවත් කිරීම සඳහා සහ ඉහත කී කරුණු වලට ආනුෂංගික හෝ සම්බන්ධ වෙනත් කරුණු සඳහා විධිවිධාන සැලසීම පිණිස වූ පනතකි.

(1941 නොවැම්බර් මස 1 වන දින)

සංක්ෂිප්ත නාමය.

1. මේ පනත ආගාමික හා විගාමික පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

## I වන කොටස

### ප්‍රාරම්භය

පනත ක්‍රියාත්මක වීමෙන් නිදහස් කිරීම.

2. (1) (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කෘෂිකර්මාන්තය, යුද්ධ හෝ ගුවන් හමුදාවල සාමාජිකයකු වූ; හෝ

(ආ) වෙනත් යම් රටක ආණ්ඩුව විසින් ශ්‍රී ලංකාණ්ඩුවට යටත් පරිදි පත් කරනු ලැබූ; හෝ

(ඇ) වෙනත් යම් රටක ආණ්ඩුව විසින් විශේෂ දූත මෙහෙවරක් සඳහා ශ්‍රී ලංකාවට එවනු ලැබූ; හෝ

(ඈ) ශ්‍රී ලංකාණ්ඩුව විසින් වැටුප හෝ මූලික පඬිනඩි ගෙවනු නොලබන්නා වූ ද එක්සත් ජාතීන්ගේ සංවිධානයේ යම් විශේෂඥතා නියෝජ්‍යායතනයක් මගින් හෝ ඇමරිකා එක්සත් ජනපදයේ ආණ්ඩුවේ චතුර්විධ ආධාර වැඩ සටහන යටතේ හෝ කොළඹ ක්‍රමය සංවිධානය (එහි කාර්මික ආධාර කාර්යාංශය ඇතුළුව) හෝ අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද ඒ සමාන සංවිධානයක් මගින් ශ්‍රී ලංකාණ්ඩුව විසින් ශ්‍රී ලංකාවට ගෙන්වනු ලැබූ යම් විශේෂඥයකු, උපදේශකයකු, කාර්මික ශිල්පියකු හෝ නිලධාරියකු වූ; හෝ [1955 අංක 16 § 2]

(ඉ) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සහ එහි විශේෂඥ නියෝජ්‍යායතනවල හෝ කොළඹ ක්‍රමය සංවිධානයේ යම් කාර්මික සහයෝගතා වැඩ සටහනක් යටතේ හෝ අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ ඒ සමාන සංවිධානයක් යටතේ විදේශීය රටකින් ශ්‍රී ලංකාවට එවනු ලැබූ යම් අභ්‍යාසලාභියකු වූ; හෝ [1955 අංක 16 § 2]

2—J 064626 (85/06)

(ඊ) ශ්‍රී ලංකාණ්ඩුවේ සේවයට ඇතුළත් වූ හෝ නිවිහ්ම් සේ සටහන් එලෙස සේවයට ඇතුළත් වූ; හෝ

(උ) ඉහතින් වූ (අ) ඡේදයේ සිට (ඊ) ඡේදය දක්වා වූ යම් ඡේදයක සඳහන් යම් තැනැත්තකුගේ නීල කාර්ය මණ්ඩලයේ හෝ පවුලේ සාමාජික සකු වූ; හෝ

(ඌ) ඉහතින් වූ (අ) ඡේදයේ සිට (උ) ඡේදය දක්වා වූ යම් ඡේදයක සඳහන් යම් තැනැත්තකුගේ භාර්යාව හෝ ඔහුගෙන් යැපෙන යම් ළමයකු වූ; හෝ

(එ) ශ්‍රී ලංකාවේ දේශීය ජල තීරයෙහි ඇති තැවත නාවික පිරිසේ සාමාජිකයකු වූ

සෑම තැනැත්තකුම, අමාත්‍යවරයා විසින් නියමයක් මගින් නියම කරනු ලබන යම් කොන්දේසිවල හෝ පරිසීමාවල ප්‍රමාණයට හෝ ඊට යටත්ව, මේ පනතේ III වන, IV වන, V වන, VI වන සහ VII වන කොටස් ක්‍රියාත්මක වීමෙන් නිදහස් විය යුතු ය.

මේ උපවගන්තිය යටතේ යම් නියමයක් යම් තැනැත්තකු හෝ තැනැත්තන් කණ්ඩායමක් සම්බන්ධයෙන් වන විශේෂ නියමයක් හෝ යම් පංතියකට හෝ විස්තරයකට අයත් තැනැත්තන්ට අදාළ කරනු ලැබිය හැකි සාමාන්‍ය නියමයක් විය හැකි අතර මේ අවස්ථා දෙකින් කුමන අවස්ථාවේ දී වුවද මේ උපවගන්තියේ සඳහන් තැනැත්තන් විය යුතු ය.

(2) (අ) (1) වන උපවගන්තියෙහි සඳහන් තැනැත්තන් හැර, මේ පනතේ යම් විධිවිධානයකින් නිදහස් කිරීමක් ප්‍රදානය කරනු ලැබිය හැකි තැනැත්තන් අයත් පංතී හෝ විස්තරය; සහ

(ආ) ඒ නිදහස් කිරීම් ප්‍රදානය කරනු ලබන ප්‍රමාණය, එය යටත්වන නියමයන්, කොන්දේසි හෝ පරිසීමාවන් නියම කිරීමේ කාර්යය සඳහා, මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයකට අනුකූලව, අමාත්‍යවරයා විසින්, නියමයක් මගින් නියමිත ප්‍රමාණයට, හෝ නියමිත නියමයන්, කොන්දේසි හෝ පරිසීමාවන්ට යටත්ව, යම් නියමිත පංතියකට හෝ විස්තරයකට අයත් තැනැත්තන් නිදහස් කරනු ලැබිය හැකිය:

එසේ වුවද එවැනි යම් නියෝගයක් කිසිවක් නොමැති විට, හෝ යම් මහජන හදිසි අවස්ථාවක් ඇතිවීම මත, අමාත්‍යවරයා විසින්, මහජන ආරක්ෂාව සඳහා අවශ්‍ය යයි ඔහුට පෙනී යන යම් ප්‍රමාණයකට හෝ යම් නියමයන්ට, කොන්දේසිවලට හෝ පරිසීමාවන්ට යටත්ව, මේ පනතේ යම් විධිවිධානයකින් යම් තැනැත්තකු හෝ යම් පංතියකට හෝ විස්තරයකට අයත් තැනැත්තන් එසේ නිදහස් කරනු ලැබිය හැකි ය.

2

II වන කොටස.

පරිපාලන විධිවිධාන

ඇතුල්වීමේ සහ පිටවීමේ වරාය වල්.

3. අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මඟින්, මේ පනතේ කාර්ය සඳහා අනුමත කළ ඇතුල්වීමේ වරායක් වශයෙන් හෝ අනුමත කළ පිටවීමේ වරායක් වශයෙන් මූ ලංකාවේ යම් ස්ථානයක් ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකි ය.

නිලධරයන් සහ සේවකයන්.

4. (1) මේ පනතේ කාර්ය සඳහා—

(අ) ආගමන හා විගමන පාලකවරයා වශයෙන් හෝ එලෙස වැඩ බැලීමට සුදුසු හා නිසි තැනැත්තකු;

(ආ) ආගමන හා විගමන නියෝජ්‍ය පාලකවරයා වශයෙන් හෝ එලෙස වැඩ බැලීමට සුදුසු හා නිසි තැනැත්තකු;

(ඇ) ආගමන හා විගමන සහකාර පාලකවරයකු වශයෙන් හෝ එලෙස වැඩ බැලීමට සුදුසු හා නිසි තැනැත්තකු හෝ එවැනි තැනැත්තන් දෙදෙනෙකු හෝ වැඩි දෙනකු සම්බන්ධයෙන් ඒ එක් එක් තැනැත්තකු;

(ඈ) බලයලත් නිලධරයකු වශයෙන් හෝ එලෙස වැඩ බැලීමට සුදුසු හා නිසි තැනැත්තකු හෝ එවැනි තැනැත්තන් දෙදෙනෙකු හෝ වැඩි දෙනකු සම්බන්ධයෙන් ඒ එක් එක් තැනැත්තකු

නමින් හෝ ධුරයෙන් පත් කරනු ලැබිය හැකි ය.

(2) මේ පනත ක්‍රියාත්මක කිරීමෙහිලා ඉහත කී නිලධරයන්ට සහාය වීමට අවශ්‍ය යම් ලිපිකරු සහ සුළු සේවක කාර්ය මණ්ඩලයක් ද පත් කරනු ලැබිය හැකි ය.

නිලධරයන්ගේ බලතල සහ කාර්ය.

5. (1) මේ පනතින් හෝ ඒ යටතේ පවරන ලද, නියම කරන ලද හෝ වෙන්කොට දෙන ලද බලතල, කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටු කිරීමේ දී හෝ කිරීමේ දී—

(අ) අමාත්‍යවරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධිවිධානවලට පාලකවරයා යටත් විය යුතු ය.

(ආ) පාලකවරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධිවිධානවලට නියෝජ්‍ය පාලකවරයා, එක් එක් සහකාර පාලකවරයා සහ එක් එක් බලයලත් නිලධරයා යටත් විය යුතු ය.

(2) මේ පනතින් හෝ ඒ යටතේ බලයලත් නිලධරයකු වෙත භාර කරන ලද හෝ නියම කරන ලද හෝ පවරන ලද යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් පාලකවරයා, නියෝජ්‍ය පාලකවරයා සහ සෑම සහකාර පාලකවරයකු විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකිය, ඉටු කරනු ලැබිය හැකිය නැතහොත් කරනු ලැබිය හැකි ය.

(8) මේ පනතින් හෝ ඒ යටතේ පාලකවරයා හෝ බලයලත් නිලධරයකු වෙත පැවරුණ හෝ පවරන ලද හෝ නියම කරන ලද යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් ස්ථිර ලේකම්වරයා හෝ යම් සහකාර ලේකම්වරයකු මිනිත් ක්‍රියාත්මක කරනු ලැබිය හැකිය, ඉටු කරනු ලැබිය හැකිය නැතහොත් කරනු ලැබිය හැකිය.

කෘෂි වෙනුවෙන් ක්‍රියා කිරීමට අමාත්‍යවරයා විසින් පාලකවරයාට බලය පැවරීම. [1955 අංක 16 වන 3]

4. මේ පනතින් හෝ ඒ යටතේ අමාත්‍යවරයා වෙත පැවරුණ හෝ පවරන ලද හෝ නියම කරන ලද හෝ පවරන ලද (2 වන වගන්තියෙන් හෝ 31 වන වගන්තියෙන් හෝ 52 වන වගන්තියෙන් පවරන ලද බලයක් නොවන) යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් ක්‍රියාත්මක කිරීමට, ඉටු කිරීමට හෝ කිරීමට අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාට හෝ යම් සහකාර ලේකම්වරයකුට හෝ පාලකවරයාට අමාත්‍යවරයා විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් බලය පවරනු ලැබිය හැකි ය.

කෘෂි වෙනුවෙන් ක්‍රියා කිරීමට පාලකවරයා විසින් වෙනත් නිලධරයෙකු වෙත බලය පැවරීම.

7. මේ පනතින් හෝ ඒ යටතේ පාලකවරයා වෙත පැවරුණ හෝ පවරන ලද හෝ නියම කරන ලද හෝ පවරන ලද යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් ක්‍රියාත්මක කිරීමට, ඉටු කිරීමට හෝ කිරීමට හෝ නියෝජ්‍ය පාලකවරයාට හෝ යම් සහකාර පාලකවරයකුට පාලකවරයා විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් බලය පවරනු ලැබිය හැකි ය.

හමුදාවල බලයලත් නිලධාරියෙක්ගේ බලතල යෙදෙන කාර්ය. [1961 අංක 68 වන 3]

7අ. (1) ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන නියමයක් මඟින් මේ පනතේ කාර්ය සඳහා ජනාධිපතිවරයා විසින්—

(අ) ශුද්ධ හමුදා පනතේ විධිවිධානවලට අනුකූලව පත්කොට පවත්වාගෙන යනු ලබන ශුද්ධ හමුදාවේ සාමාජිකයන්;

(ආ) නාවික හමුදා පනතේ විධිවිධානවලට අනුකූලව, පත්කොට පවත්වා ගෙන යනු ලබන නාවික හමුදාවේ සාමාජිකයන්; සහ

(ඇ) ගුවන් හමුදා පනතේ විධිවිධානවලට අනුකූලව පත්කොට පවත්වාගෙන යනු ලබන ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සාමාජිකයන්

සියලුදෙනාම හෝ ඉන් කිසිවකු හමුදාවල බලය ලත් සාමාජිකයන් වශයෙන් පදවි ගැන්විය හැකි ය.

(2) ශුද්ධ හමුදා පනතේ, නාවික හමුදා පනතේ, ගුවන් හමුදා පනතේ විධිවිධාන මඟින් යම් බලතල සහ කාර්ය බලයලත් සාමාජිකයන් වෙත පවරනු නොලැබුවද නැතහොත් ඔවුන්ට නියම කරනු

කොලැබුවද මේ වගන්තියෙන් ගම්මදාවල බලයලත් සාමාජිකයන්ව පවරන ලද සහ නියම කරන ලද ඒ බලතල සහ කාර්ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම ඔවුන් විසින් කරනු ලැබිය යුතු ය.

(3) ගම්මදාවල බලයලත් සාමාජිකයන් විසින් මේ පනත යටතේ වූ බලතල සහ කාර්ය ක්‍රියාත්මක කරනු ලැබිය හැකි සහ ඉටුකරනු ලැබිය හැකි ප්‍රදේශය හෝ ප්‍රදේශ ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන නියමයක් මඟින්, අමාත්‍යවරයා විසින් නිශ්චිත වශයෙන් සඳහන් කරනු ලැබිය හැකි ය.

(4) (අ) 45 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (අ) ඡේදය යටතේ වූ යම් වරදක්,

(ආ) 45 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (අ) ඡේදයට අදාළ වන තැන් දුරට ඒ වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ වූ යම් වරදක්, සහ

(ඇ) 45අ වගන්තියේ (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය යටතේ වූ යම් වරදක්

සම්බන්ධයෙන්, (3) වන උපවගන්තිය යටතේ නිශ්චිත යම් ප්‍රදේශයක් ඇතුළත ගම්මදාවල යම් බලයලත් සාමාජිකයකු අපරාධ නඩු විධාන සංග්‍රහයෙන් සහ නීතිගරයකු වෙත පවරන ලද යම් බලයක් ක්‍රියාත්මක කිරීමේ කාර්යය පිණිසක් සඳහා ඒ සංග්‍රහයේ අර්ථානුකූලව සහ නීතිගරයකු වශයෙන් සලකනු ලැබිය යුතු ය.

(5) ගම්මදාවල බලයලත් සාමාජිකයකු විසින් වරෙන්තුවක් නොමැතිව සිර භාරයට ගනු ලබන අවස්ථාවක දී එසේ සිර භාරයට ගනු ලැබූ තැනැත්තා හොඳමාව පොලිස් නිලධරයකුගේ භාරයට පත් කරනු ලැබිය යුතු ය.

## III වන කොටස

## ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන තැනැත්තන් ශ්‍රී ලංකාවට ඇතුළුවීම් පාලනය කිරීම

III වන කොටස අදාළ කිරීම.

8. ශ්‍රී ලංකාවට ඇතුල්වීමට අපේක්ෂා කරන හෝ * තුල්වන සෑම තැනැත්තකුටම—

(අ) ඔහු ශ්‍රී ලංකාවේ පුරවැසියකු නම් මිස, හෝ

(ආ) තත්කාලයෙහි බලපවත්නා I වන කොටස යටතේ වූ යම් නියමයක් ප්‍රකාර, ඔහු මේ කොටසේ විධි විධාන වලින් නිදහස් කර ඇත්නම් මිස

මේ කොටස අදාළ විය යුතු ය.

අනුමත කළ ඇතුළු වීමේ වරායන්හි දී පරීක්ෂක ඇතුල්විය යුතු බව.

9. මේ කොටස අදාළ වන නෑනැත්තකු, අනුමත කළ ඇතුළුවීමේ වරායක් නොවන යම් ස්ථානයක දී ශ්‍රී ලංකාවට ගොඩබැසීම යුතු ය.

ඇතුල්වන අවස්ථාවේ දී අවසර ලේඛන.

[1955 අංක 16 §4]

10. මේ කොටස අදාළ වන්නේ යම් නෑනැත්තකුට ද ඒ නෑනැත්තාගේ සන්තකයෙහි—

(අ) බලයලත් නිලධරයකු විසින් මේ කොටස යටතේ ඔහුට ප්‍රදානය කරන ලද නියමිත ආකෘතියෙහි වූ පිළිගැනීම දරන වලංගු විදේශ බලපත්‍රයක්; සහ

(ආ) මේ පනත යටතේ සාදන ලද නියෝග මඟින් නියම කර ඇත්නම්, ඒ නියෝග යටතේ ඔහුට ප්‍රදානය කරන ලද හෝ නිකුත් කරන ලද විසා පත්‍රයක්

ඇත්නම් මිස, ඔහු ශ්‍රී ලංකාවට ඇතුල් වෙනවිය යුතු ය.

ඇතැම් නෑනැත්තන්ට ඇතුල්වීමේ ලේඛන නිකුත් නොකළ යුතු බව.

[1955 අංක 16 §5]

[1955 අංක 16 §5]

11. (1) යම් නෑනැත්තකුගේ සන්තකයෙහි—

(අ) වලංගු විදේශ ගමන් බලපත්‍රයක් වූ විදේශ ගමන් බලපත්‍රයක්; සහ

(ආ) මේ පනත යටතේ සාදන ලද නියෝග මඟින් නියම කර ඇත්නම්, ඒ නියෝග යටතේ ඔහුට ප්‍රදානය කරන ලද හෝ නිකුත් කරන ලද විසා පත්‍රයක්

ඇත්නම් මිස, බලයලත් නිලධරයකු විසින්, ඒ නෑනැත්තාට මේ කොටස යටතේ විසිමේ පිරිහෙළක් ප්‍රදානය නොකළ යුතු ය.

(2) නියම කරනු ලබන යම් අවස්ථාවල දී හැර—

(අ) ඇතුල්වීමේ යම් ලේඛන ප්‍රදානය කිරීමේදී හෝ නිකුත් කිරීමට බලය දෙනු ලැබූ අධිකාරියේ මතය අනුව, නම්, සහ නම් යෙදෙන්නන් හඳුනා කිරීමට අපොහොසත් යම් නෑනැත්තකුට;

(ආ) සිතියමකල් හෝ මානසික විශයෙන් ඌනතාවයක් ඇති යම් නෑනැත්තකුට;

(ඇ) වෛද්‍ය පරීක්ෂණ නියා ශ්‍රී ලංකාවට ඇතුල් කර නැවතීමට නොමැනෙන නෑනැත්තකු බවට නියමිත වෛද්‍ය නිලධරයකු විසින් සහතික කර ඇති යම් නෑනැත්තකුට;

(ඈ) පළායන නෑනැත්තන්ට සහ ඔවුන් උද්දීපනය කිරීම ඉට අදාළව ශ්‍රී ලංකාවෙන් බලාත්මක වූ හෝ බලාත්මක වන යම් නීතියක අර්ථානුකූලව උද්දීපන නීය වරදක් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත දී දණ්ඩනීයමයක් කරනු ලබ ඇත්තා වූ යම් නෑනැත්තකුට; හෝ

(ඉ) ගණිකාවක් වූ හෝ ගණිකාවන් සපයන්නකු වූ හෝ වෙනත් නෑනැත්තන් ගණිකා වෘත්තියෙහි යෙදවීමෙන් ජීවනෝපාය ලබන යම් නෑනැත්තකුට; හෝ

(ඩ) කාර්යය සඳහා නිකුත් කරන ලද විශේෂ හෝ සාමාන්‍ය උපදෙස් මගින් මහජන ගබඩා සඳහා අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන වෙනත් යම් නියමයක් ඉටු කිරීම පැහැර හරින යම් කෙනෙක් කෙනෙකුට; හෝ

(ඒ) මේ පනතේ යටතේ බලපත්‍ර රැවියේ පිළි කිරීමේ නියමයක විෂය කරුණකට වූ යම් කෙනෙක් කෙනෙකුට; හෝ

(ඓ) නැවතීමේ යන කෙනෙක් කෙනෙකුට; හෝ

(ඔ) සහනදී කරනු ලැබූ ආගන්තුකයෙකු හෝ තහනම් කරනු ලැබූ ආගන්තුකයෙක් වෙට 12 වන වගන්තිය යටතේ අමාත්‍යවරයාගේ නියමයක් මගින් ප්‍රකාශයට පත් කරන ලද යම් කෙනෙක් කෙනෙකුට

කිසිම පිටසනක් හෝ වියා පවුයෙක් ප්‍රදානය නොකළ යුතු ය; කෙතෙහෙත් නිකුත් කළාකළ යුතු ය.

(3) මේ වගන්තියේ ඉහතින් වූ වීඩිම්ඛාන කඩකරමින් ප්‍රදානය කරන ලද හෝ නිකුත් කරන ලද යම් පිටසනක් හෝ වීසා පත්‍රයක් අවලංගු බවට සහ ඒවි පනතෙන් කාර්ය සඳහා බලරහිත බවට සලකනු ලැබිය යුතු ය. [1955 අංක 16 වන]

12. මේ කොටස අදාළ වන්නා වූ සහ —

තහනම් කරනු ලැබූ ආගන්තුකයන් හෝ තහනම් කරනු ලැබූ ආගන්තුකයන් බවට නෑගැත්තන් ප්‍රකාශයට පත් කිරීමට අමාත්‍යවරයාගේ බලය.

(අ) නීල හෝ ඌප් තාන්ත්‍රික තාර්කයන් මගින් නමා වෙත ලැබුණ තෝරතුරු අනුව ශ්‍රී ලංකාවට ඇතුල් කර ගැනීමේ කාර්යයන් සඳහා සුදුසු නැතැත් නැතැ බවට අමාත්‍යවරයා විසින් සලකනු ලබන්නා වූ ; හෝ

(ආ) ශ්‍රී ලංකාවේ යම්කිසි ගබඩා ගබඩාවක් පැවැත්වෙ අන්තරා ඇසුරු විය හැකි යම්දිදි තැන් ශ්‍රී ලංකාණ්ඩුව සම්බන්ධයෙන් අනාප්තියට පත්වීමේ හැකියි ඇවිස්සෙන පරිදි හෝ ශ්‍රී ලංකාණ්ඩුවේ බලයට විරුද්ධව කුමන්ත්‍රණය ඇති කෙරෙන පරිදි හැසිරීමට ඉඩ ඇති බවට ප්‍රමාණවත් යයි අමාත්‍යවරයා සලකනු ලබන්නා වූ; හෝ

(ඇ) යම් රටක දී වරදකරුවකු කරනු ලැබූ බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයක් ප්‍රකාශයට පත් කරන ලද වරදක් සම්බන්ධයෙන් නීදහස් සමාවක් නොලැබ ඇත්තා වූ සහ ඊට සම්බන්ධ අවශ්‍යතා ගත කරුණුවල හේතුවෙන් ශ්‍රී ලංකාවට ඇතුල් කර ගැනීම සඳහා නොමනා කෙනෙකු බවට අමාත්‍යවරයා විසින් සලකනු ලබන්නා වූ

7

යම් තැනැත්තකු මේ පනතේ කාර්ය සඳහා තහනම් කරනු ලැබූ ආගමිකයකු හෝ තහනම් කරනු ලැබූ ආගන්තුකයකු බවට නිසි මූලයක් මඟින් අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකි ය.

පිරිසක් කිරීම පිළිබඳ නියමයන්.

13. (1) මේ කොටස අදාළ වන යම් තැනැත්තකු ශ්‍රී ලංකාවේ යම් ස්ථානයකට නැව් මඟින් පැමිණි විට, ඒ තැනැත්තා ශ්‍රී ලංකාවට ඇතුල් වීමට සහ කවර වූ යම් කාලයක් හෝ කාර්යයක් සඳහා එහි රැඳී සිටීමට අපේක්ෂා කරනු ලබන සෑම අවස්ථාවක දීම මේ කොටස යටතේ පිටසතක් ලබා ගැනීමට ඒ තැනැත්තාට බලයලත් නිලධරයකු විසින් නියම කරනු ලැබිය යුතු ය.

(2) මේ කොටස යටතේ බලයලත් නිලධරයකු විසින් යම් තැනැත්තකුට ප්‍රදානය කරනු ලබන සෑම පිටසතක්ම--

(අ) ඒ නිලධරයා විසින් අත්සන් කරනු ලැබිය යුතු ය;

(ආ) නියමිත ආකෘතියෙහි විය යුතු ය; තවද

[1955 අංක 10-5]

(ඇ) ඒ තැනැත්තා විසා පත්‍රයක් දරන්නකු නොවන්නේ නම්, ඒ තැනැත්තා ශ්‍රී ලංකාවට ඇතුල්ව එහි රැඳී සිටිය හැකි කාලය සහ ඔහු යටත් නියමයන් සහ කොන්දේසි එහි සඳහන් කරනු ලැබිය යුතු ය.

(3) මේ කොටස යටතේ යම් තැනැත්තකුට පිටසතක් ප්‍රදානය කිරීම සඳහා පූර්ව කොන්දේසියක් වශයෙන්, ඒ තැනැත්තා සම්බන්ධයෙන් දරනු ලබන වියදම් සහ ගෙන්වූ ආණ්ඩුවට ආපසු ගෙවීම් පිණිස බලයලත් නිලධරයා විසින් සුදුසු යයි සලකනු ලබන නියමිත මුදලට නොවැඩි වූ ද මුදලක් තැන්පත් කිරීමෙන් හෝ නියම කරනු ලබන වෙනත් යම් ආකාරයකින් ඒ තැනැත්තා විසින් ශ්‍රී ලංකාවේ වාසය කරන්නා වූ ද බලයලත් නිලධරයා විසින් අනුමත කරනු ලබන්නා වූ ද වෙනත් යම් තැනැත්තකු විසින් ඒ තැනැත්තා වෙනුවෙන් ඇප තැබිය යුතු බවට බලයලත් නිලධරයා විසින් නියම කරනු ලැබිය හැකි ය. ඇප වශයෙන් එසේ තැන්පත් කරනු ලබන සියලු මුදල් සම්බන්ධයෙන් නියමිත ආකාරයෙන් සුදුස්සක් කළ යුතු ය.

විසා පත්‍ර සම්බන්ධයෙන් නියමයන්. [1955 අංක 16§7]

14. (1) විසා පත්‍රයෙහි නිශ්චිත ලෙස සඳහන් කරනු ලබන පරිදි අවුරුදු දෙකක් නොඉක්මවන යම් කාලයක් සඳහා නියමිත අධිකාරිය විසින් විසා පත්‍රයක් ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

(2) විසා පත්‍රයෙහි නිශ්චිත ලෙස සඳහන් කරනු ලබන පරිදි අවුරුදු දෙකක් ඉක්මවන එහෙත් අවුරුදු පහක් නොඉක්මවන යම් කාලයක් සඳහා නියමිත අධිකාරිය විසින්, අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව, විසා පත්‍රයක් ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

(3) යම් විසා පත්‍රයක නිශ්චිතව සඳහන් කාලසීමාව නියමිත අධිකාරිය වෙත තත්කාර්ය සඳහා ඉල්ලීමක් කරනු ලැබූ විට, නියම කරනු ලබන යම් කාලයක් සහ කොන්දේසිවලට යටත්ව ඒ අධිකාරිය විසින් කලින් කල දීර්ඝ කරනු ලැබිය හැකි ය. විසා පත්‍රය ප්‍රදානය කරන ලද අධිකාරිය විසින්, මේ වගන්තියේ (2) වන උප වගන්තිය හේතුකොටගෙන ප්‍රදානය කිරීමට පෙර අමාත්‍යවරයාගේ

අනුමතය ලබාගෙන ඇති අවස්ථාවක, වීසා පත්‍රය දීර්ඝ කිරීමට පෙර ඒ සමාන ආකාරයකින් ඒ අධිකාරිය විසින් අමාත්‍යවරයාගේ අනුමතය ලබාගත යුතු ය.

(4) යම් තැනැත්තකු තත්කාලයෙහි ශ්‍රී ලංකාවේ සිටීම හිසා ඔහු සම්බන්ධයෙන් වීසා පත්‍රයක් හෝ පිටසනක් ප්‍රදානය කිරීම හෝ නිකුත් කිරීම හෝ ඔහු සම්බන්ධයෙන් ඒ වීසා පත්‍රයෙහි හෝ පිට යසොහි නිශ්චිත කාලය දීර්ඝ කිරීම වළක්වනු නොලැබිය යුතු ය. නැතහොත් වළක්වන්නේ යයි සේරුම් නොගත යුතු ය.

15. මේ කොටස අදාළ සහ ශ්‍රී ලංකාවට ඇතුල්වන සිසිම තැනැත්තකු—

මේ කොටස අදාළ තැනැත්තන් ශ්‍රී ලංකාවේ තැවතී සිටීම.
[1955 අංක 16 § 8]

(අ) ඔහු වීසා පත්‍රයක් දරන්නකු නොවේ නම්, ඔහු ඇතුල් වූ අවස්ථාවේ දී ඔහුට ප්‍රදානය කරන ලද පිටතින් ලංකාවේ තැවතී සිටීමට ඔහුට බලය දෙනු ලැබූ කාලය අවසන් වීමෙන් පසුව ලංකාවේ තැවතී නොසිටිය යුතු ය; නැතහොත්

(ආ) ඔහු යම් වීසා පත්‍රයක් දරන්නකු නම්, ඒ වීසා පත්‍රයෙන් හෝ ඒ වීසා පත්‍රයේ යම් දීර්ඝ කිරීමක් ශ්‍රී ලංකාවේ තැවතී සිටීමට ඔහුට බලය දෙනු ලැබුවේ යම් කාලයක් සඳහා ද ඒ කාලය අවසන් වීමෙන් පසුව ඔහු ශ්‍රී ලංකාවේ තැවතී නොසිටිය යුතු ය; හෝ

[1955 අංක 16 § 8]

(ඇ) ඔහුගේ ශ්‍රී ලංකාවට ඇතුල්වීම 9 වන වගන්තියේ හෝ 10 වන වගන්තියේ විධිවිධාන කඩ කෙරෙන පරිදි වූයේ නම් ඔහු ශ්‍රී ලංකාවේ තැවතී නොසිටිය යුතු ය.

[1955 අංක 16 § 8]

16. මේ කොටස අදාළ වන්නා වූ සහ ශ්‍රී ලංකාවට ඇතුල් වන්නා වූ තැනැත්තකු—

ඇතුල්වීමේ ලේඛනවල සිටයම් යෙන් සහ කොන්දේසි අනුව කටයුතු කළ යුතු බව.
[1955 අංක 16 § 9]

(අ) ඔහු වීසා පත්‍රයක් දරන්නෙක් නොමේ නම්, ඔහු ඇතුල්වන අවස්ථාවේ දී ඔහුට ප්‍රදානය කරන ලද පිටසනොහි සඳහන් නියමයන් සහ කොන්දේසි අනුව ඔහු ශ්‍රී ලංකාවේ තැවතී සිටින තෙක් කල් කටයුතු කළ යුතු ය: නැතහොත්

(ආ) ඔහු වීසා පත්‍රයක් දරන්නෙක් නම්, ඒ වීසා පත්‍රයේ නියමයන් සහ කොන්දේසි අනුව ඔහු ශ්‍රී ලංකාවේ තැවතී සිටින තෙක් කල් කටයුතු කළ යුතු ය.

[1955 අංක 16 § 9]

17. යම් තැනැත්තකු සම්බන්ධයෙන් මේ පනත ඇරඹෙන් පසු කිරීමේ නියෝගයක් හෝ ඉවත් කිරීමේ නියෝගයක් කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ තැනැත්තාට ප්‍රදානය කරන ලද හෝ නිකුත් කරන ලද යම් පිටසනක් හෝ වීසා පත්‍රයක් ශූන්‍ය බවට සහ මේ පනතේ කාර්ය සඳහා බලරහිත බවට සලකනු ලැබිය යුතු ය.

ඇතැම් අවස්ථාවල දී ඇතුල්වීමේ ලේඛන බලරහිත බව.
[1955 අංක 16 § 10]

221

පැමිණි විට පරීක්ෂා කිරීම් හෝ වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කිරීම.

18. (1) (අ) මේ කොටස අදාළ වන තැනැත්තකු යම් අනුමත ගුදම් ප්‍රාංගණයකට ගොඩ බැසීමෙදී හෝ ශ්‍රී ලංකාවට ඇතුල්වීමට අදහස් කරන්නේ නම් බලයලත් නිලධරයකු මඟින් ඔහු පරීක්ෂා කිරීම හෝ නියමිත වෛද්‍ය නිලධරයකු විසින් ඔහු වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කිරීම කළ හැකි ය.

(ආ) එවැනි සෑම පරීක්ෂණයක්ම, ඒ තැනැත්තා විරාගව පැමිණි අවස්ථාවේ දී හෝ ඉන් පසුව හැකි ඉක්මනින් පවත්වනු ලැබිය හැකි ය.

(ඇ) ඒ පරීක්ෂණය භාර්ය සඳහා එම්බැති යම් තැනැත්තකුට ගොඩ බැස, ඉගාඩබිම් යම් නිශ්චිත ස්ථානයක පවතී නිවසට ගමන්කළ නිල ධරයකු විසින් හෝ නියමිත වෛද්‍ය නිලධරයා විසින් හෝ නියම කරනු ලැබිය හැකි ය.

(ඈ) ඉහත කී පරිදි බලයලත් නිලධරයකුගෙන් හෝ නියමිත වෛද්‍ය නිලධරයාගෙන් යම් විමසීමක් අනුව කටයුතු කිරීමේ භාර්ය සඳහා ඉගාඩබිම යම් ශ්‍රී ලංකාවේ යම් නිශ්චිත ස්ථානයකට ඇතුල් වීම තැනැත්තකු එලෙස ඇතුල්වීමේ හේතුව නිසාම මේ පාදයේ වෙනත් විධිවිධාන කිසි වක් යටතේ වූ යම් වරදකට වරදකරු යැයි සලකනු ලැබිය නොහැකි ය.

(2) ශ්‍රී ලංකාවේ යම් ස්ථානයකට පැමිණෙනතෙක් හේ ඒ වෙනුවෙන් පොලිස්පතිවරයා මඟින්, යම් තැනැත්තකු පරීක්ෂා කරනු ලබන තෙක් හෝ පරීක්ෂා කිරීම සඳහා නොඑ මඟින් තෙක්, මේ කොටස අදාළ වන යම් තැනැත්තකු නැවතී රඳවා ගනු ලැබිය යුතු ය.

ලිපි ආදිය පරීක්ෂා කිරීම.

19. මේ කොටස අදාළ වන තැනැත්තකු ශ්‍රී ලංකාවට ඇතුල්වන අවස්ථාවේ දී, ඔහු විසින් ලිපි, ලිඛිත පණිවුඩ, සන්දේශ හෝ මුද්‍රිත රූපයාරූප සහ වෙනත් පින්තූර නිරූපණ ඇතුළත් යම් ලිඛිත හෝ මුද්‍රිත ද්‍රව්‍ය ගෙන යනු ලැබේ ද නැතහොත් රැගෙන යනු ලැබේද නැද්ද යන බවට ප්‍රකාශයක් කරන ලෙස බලයලත් නිලධරයා විසින් නියම කරනු ලැබූ විට, ඔහු ඒ බවට ප්‍රකාශයක් කළ යුතු අතර, එසේ නියම කරනු ලැබුවහොත් එවැනි යම් ලිපි, පණිවුඩ, සන්දේශ හෝ ලිඛිත හෝ මුද්‍රිත ද්‍රව්‍ය ඒ නිලධරයා වෙත, ඉදිරිපත් කළ යුතු ය. තවද, ඒ තැනැත්තා විසින් එවැනි යම් ලිපි, පණිවුඩ, සන්දේශ හෝ ලිඛිත හෝ මුද්‍රිත ද්‍රව්‍ය ගෙන යනු ලබන්නේ දැයි හෝ රැගෙන යනු ලබන්නේ දැයි නිර්මාණ කර ගැනීමේ අරමුණින් එවිට එවැනි යම් තැනැත්තකු හෝ ඔහුට අයත් හෝ ඔහුගේ පාලනය යටතේ ඇති ගමන්මල් මලු කිසිවක් ඒ නිලධරයා විසින් සෝදිසි කරනු ලැබිය හැකි අතර, ඔහු වෙත ඉදිරිපත් කරන ලද හෝ ඒ සෝදිසි කිරීමේ දී සොයාගනු ලැබූ ලිපි, පණිවුඩ, සන්දේශ හෝ ලිඛිත හෝ මුද්‍රිත ද්‍රව්‍ය කිසිවක් පරීක්ෂා කිරීම සහ ඒ පරීක්ෂා කිරීමේ කාර්ය සඳහා සුදුසු යයි ඒ නිලධරයා විසින් අදහස් කරනු ලබන යම් කාලයක් රඳවා තබනු ලැබිය හැකි ය.

220

ආගාමික හා විහාමික [අති. විශේ

20. ඉහතින් වූ ඡේදය යටතේ යම් පරීක්ෂණයක හෝ සෝදිසියක කාර්ය සඳහා බලයලත් නිලධරයකු විසින් හොබාගැසීමට සහ හොබවීම යම් ස්ථානයකට ඇතුල්වීමට විධානය කරනු ලැබූ තැනැත්තකු ඒ පරීක්ෂණය හෝ සෝදිසිය සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය යම් කාලයක් මුළුල්ලේ අමාත්‍යවරයා විසින් තත් කාර්යය සඳහා අනුමත කරන ලද යම් ස්ථානයක රඳවා තබනු ලැබිය හැකි ය.

පරීක්ෂා කිරීම සහ සෝදිසි කිරීම සඳහා තැනැත්තන් රඳවා තැබීම.

ඇතැම් තැනැත්තන් රඳවා තැබීම සහ ඉවත් කිරීම

21. (1) ශ්‍රී ලංකාවේ යම් ස්ථානයකට පැමිණෙන යම් නැවක නොකාඩිපතිවරයා හිඟියා, බලයලත් නිලධරයකුගේ ඉල්ලීම පිට, ඒ නිලධරයා විසින් පිටසනක් ප්‍රතික්ෂේප කරනු ලැබූ යම් තැනැත්තකු හෝ 10 වන වගන්තියේ විධිවිධාන කඩකරමින් ඒ නැවෙන් ශ්‍රී ලංකාවට ඇතුල්වන යම් තැනැත්තකු නැවෙහි රඳවා තබා ගත යුතු ය.

ඇතැම් තැනැත්තන් රඳවා තැබීම. [1955 අංක 16 § 12]

(2) මේ කොටස අදාළ වන තැනැත්තකුට බලයලත් නිලධරයකු විසින් පිටසනක් ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක, හෝ 10 වන වගන්තියේ විධිවිධාන කඩකරමින් යම් තැනැත්තකු ශ්‍රී ලංකාවට ඇතුල්වන අවස්ථාවක, යම් හේතුවක් නිසා ඒ තැනැත්තා ශ්‍රී ලංකාවට ගමන් කළ නැවෙහි රඳවා තැබීමට නොහැකි නම් එසේ නම් ඒ නැව ශ්‍රී ලංකාවෙන් ඉවත්ව ගොස් නිමේ නම් අමාත්‍යවරයා විසින් දෙනු ලබන යම් සාමාන්‍ය හෝ විශේෂ විධාන යන සඳහන් කරනු ලබන යම් ආකාරයකින් සහ යම් ස්ථානයක තාවකාලික විශයෙන් ඔහු රඳවා තබනු ලැබිය හැකි ය.

[1955 අංක 16 § 12]

ඇතැම් තැනැත්තන් ශ්‍රී ලංකාවෙන් ඉවත් කිරීම. [1955 අංක 16 § 13]

22. (1) මේ කොටස අදාළ වන්නා වූ සහ පිටසනක් ප්‍රතික්ෂේප කරනු ලැබ ඇත්තා වූ හෝ 10 වන වගන්තියේ විධිවිධාන කඩකරමින් ශ්‍රී ලංකාවට අතුල්වන්නා වූ යම් තැනැත්තකු, ඒ තැනැත්තා ශ්‍රී ලංකාවට ගමන් කළ නැවේ නොකාඩිපතිවරයා විසින් හෝ ඒ නැවේ අයිතිකරු විසින් හෝ අයිතිකරුගේ අනුයෝජිතයා විසින් හෝ ඒ තැනැත්තා ජාතිකයකු වන දේශයට හෝ ඒ තැනැත්තා ශ්‍රී ලංකාව හැර තැති තැගුනු දේශයට ශ්‍රී ලංකාවෙන් ගෙන යන ලෙස බලයලත් නිලධරයකු විසින් අත්වීමක් මඟින් විධාන කරනු ලැබිය හැකි ය.

නැවේ නොකාඩිපතිවරයා හෝ නැවේ අයිතිකරු හෝ අයිතිකරුගේ අනුයෝජිතයා ඒ දැන්වීම අනුව කටයුතු කළ යුතු ය.

(2) මේ කොටස අදාළ වන්නා වූ සහ පිටසනක් ප්‍රතික්ෂේප කරනු ලැබ ඇත්තා වූ යම් තැනැත්තකුට, මේ පනතේ විධිවිධාන කඩකරමින් ශ්‍රී ලංකාවට ඇතුල්වීමට දැන දැනම ඉඩ දෙන්නා වූ හෝ 10 වන වගන්තියේ විධිවිධාන කඩකරමින් තම නැවෙන් ශ්‍රී ලංකාවට ඇතුල්වීමට යම් තැනැත්තකුට දැන දැනම ඉඩ දෙන්නා වූ හෝ එවැනි යම් තැනැත්තකු තම නැවට හැර ගැනීම ප්‍රතික්ෂේප කරන්නා වූ හෝ එවැනි යම් තැනැත්තකු සිය නැවෙහි හෝ බලයලත් නිලධරයකු විසින් අනුමත කරන ලද යම් ස්ථානයක හෝ තැබීම සඳහා යුක්තියහගත ක්‍රියා මාර්ග ගැනීම පැහැර

[1955 අංක 16 § 13]

11

97

හරින්නා වූ යම් නැවක නෞකාධිපතිවරයා මේ පනත යටතේ වරද කට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

මේ වගන්තිය යටතේ නැවක නෞකාධිපතිවරයා මත නියම කරනු ලැබූ සම්පූර්ණ දඩය හෝ ඉන් යම් කොටසක් හෝ ඒ දඩය නියම කරන ලද දින සිට දින හතක් ඇතුළත නොගෙවා ඉතිරිව ඇති අවස්ථාවක; නොගෙවා ඉතිරිව ඇති මුදල නැව තහනම් කොට විකිණීමෙන් අයකර ගැනීමට ඒ දඩය නියම කළ අධිකරණය විසින් විධාන කළ හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ වරදක් සඳහා නැවක නෞකාධිපතිවරයාට විරුද්ධව අධිකරණයක නඩු කටයුතු පවරා ඇති අවස්ථාවක, ඒ නඩු කටයුතු අවසාන වන තෙක් සහ අධිකරණය විසින් දඩයක් නියම කර ඇත්නේත්, ඒ දඩය ගෙවන තෙක් නැවට පිටවීමේ බලපත්‍රය ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

1955 අංක 16 §13] (4) මේ කොටස අදාළ වන්නා වූ සහ පිටිසනක් ප්‍රතික්ෂේප කරනු ලබ ඇත්නා වූ නැනැත්තකු ශ්‍රී ලංකාවට ඇතුල්වන්නා වූ හෝ 10 වන වගන්තියේ විධිවිධාන කඩකරමින් නැනැත්තකු ශ්‍රී ලංකාවට ඇතුල්වන්නා වූ යම් නැවක නෞකාධිපතිවරයා, අයිති කරු සහ අයිතිකරුගේ අනුශෝජිතයා, ඒ නැනැත්තා සම්බන්ධයෙන් ආණ්ඩුව විසින් දරනු ලබන සියලු වියදම් පහ ගෙවීමට ආණ්ඩුවට ගෙවීමට එක්ව හා වෙන් වෙන්ව යටත් විය යුතු ය.

[1955 අංක 16§13] (5) යම් නැවක් ශ්‍රී ලංකාවෙන් පිටත්ව යන විට, නැවට එක්වීමට අපොහොසත්වන ඒ නැවේ යම් සංක්‍රමික මිනියකු සම්බන්ධයෙන් ආණ්ඩුව විසින් දරන ලද සියලු ගාස්තු සහ වියදම් ආණ්ඩුවට ගෙවීමට ඒ නැවේ නෞකාධිපතිවරයා, අයිතිකරු සහ අයිතිකරුගේ අනුශෝජිතයා එක්ව හා වෙන් වෙන්ව, යටත් විය යුතු ය.

නියෝග. 23. (1) මේ කොටසේ කාර්ය සඳහා පහත දැක්වෙන සියලු කාරණ හෝ ඉන් කිසිවක් සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය:—

(අ) නියම් කළයුතු යැයි මේ කොටසෙහි සඳහන් හෝ නියමිත යම් කරුණක්;

[1955 අංක 16 §14] (ආ) මේ කොටස යටතේ පිටසන් ප්‍රදානය කිරීම් ඒ පිට සන්වල ආකෘතිය, (මහජන සඳහා අවශ්‍ය යැයි අමාත්‍යවරයා විසින් සලකනු ලබන යම් නියම යන් සහ කොන්දේසි ඇතුළුව) පිටසන් කිරීම් ප්‍රදානය කරනු ලබන්නේ යම් නියමයන්ට සහ කොන්දේසිවලට යටත්වා ද ඒ නියමයන් සහ කොන්දේසි, නියමිත අධිකාරියේ පරම අභිමතය අනුව වුවද නැතහොත් නියමිත අවස්ථානුගත කරුණු අනුව වුවද ඒ පිටසන් කිරීම් හෝ ඒවායෙහි සඳහන් නියමයන් හෝ කොන්දේසි කිසිවක් අවලංගු කිරීම්, මෙනස් කිරීම් හෝ සංශෝධනය කිරීම් සහ ඒ පිටසන් කිරීම්වල ඇතුළත් කරනු ලැබිය යුතු විස්තර;

(ඇ) නියම කරනු ලබන තැනැත්තන්ගේ යම් පංතියකට හෝ විස්තරයකට අයත් යම් තැනැත්තකු සම්බන්ධ යෙහි වීසා පත්‍රයක් ඇත්නම් මිස, ඒ තැනැත්තාට ශ්‍රී ලංකාවට ඇතුල්වීම තහනම් කිරීම; [1955 අංක 16§14

(ඈ) වීසා පත්‍ර සඳහා ඉල්ලීම් ඉදිරිපත් කිරීමේ, ඒ ඉල්ලීම් වල ආකෘතිය, ඒ ඉල්ලීම්වලට ඇමිණිය යුතු ඡායා රූප ඇතුළු ලේඛන සහ ඒවායෙහි ඇතුළත් කළ යුතු විස්තර; [1955 අංක 16§14

(ඉ) ඒ වීසා පත්‍ර ප්‍රදානය කරනු ලබන හෝ නිකුත් කරනු ලබන අධිකාරිය හෝ අධිකාරීන්; [1955 අංක 16§14

(ඊ) නියමිත අධිකාරියේ පරම අභිමතය අනුව වුවද, නැත හොත් නියමිත අවශ්‍යතාවලට යටත් කරුණු අනුව වුවද, වීසා පත්‍ර ප්‍රදානය කිරීම හෝ නිකුත් කිරීම සහ වීසා පත්‍ර ප්‍රතික්ෂේප කිරීම; [1955 අංක 16§14

(උ) යම් තැනැත්තන්ට වීසා පත්‍ර ප්‍රදානය කිරීමේ හෝ නිකුත් කිරීමේ පූර්ව කොන්දේසියක් වශයෙන් ඇප තැබීම, ඒ ඇපය තැබිය යුතු ආකාරය, මුදල් තැන්පත් කිරීමෙන් ද නැතහොත් නිශ්චල දේපල යටතක් කොට බැඳ තැබීමෙන් ද නැතහොත් අන්‍ය කාරයකින් ද යන වග සහ ඒ ඇපය මුළුමනින්ම හෝ ඉන් කොටසක් රාජසන්තක කිරීම; [1955 අංක 16§14

(ඌ) මහජන ශාසපත සඳහා අවශ්‍ය යයි අමාත්‍යවරයා විසින් සලකනු ලබන යම් නියමයන් සහ කොන්දේසි ඇතුළුව) වීසා පත්‍ර ප්‍රදානය කරනු ලබන්නේ හෝ නිකුත් කරනු ලබන්නේ යම් නියමයන්ට සහ කොන්දේසි වලට යටත්ව ද ඒ නියමයන් සහ කොන්දේසි, නියමිත අධිකාරියේ පරම අභිමතය අනුව වුවද, නැතහොත් නියමිත අවශ්‍යතා ගත කරුණු අනුව වුවද ඒ වීසා පත්‍ර හෝ ඒවායෙහි සඳහන් නියමයන් හෝ කොන්දේසි කිසිවක් අවලංගු කිරීම, වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම; [1955 අංක 16§14

(එ) වීසා පත්‍රවල ආකෘති සහ ඒවායෙහි ඇතුළත් කරනු ලැබිය යුතු විස්තර; [1955 අංක 16§14

(ඒ) වීසා පත්‍ර ප්‍රදානය කිරීම හෝ නිකුත් කිරීම සම්බන්ධයෙන් ගාස්තු නියම කිරීම, අය කිරීම සහ සුදුස්සන් කිරීම, නියමිත අවශ්‍යතාවලට කරුණු අනුව ඒ ගාස්තු ගෙවීමෙන් තැනැත්තන් නිදහස් කිරීම, සහ එම අවශ්‍යතාවලට කරුණු අනුව ඒ, ගාස්තු ආපසු ගෙවීම; [1955 අංක 16§14

(ඔ) ඉහත කී කරුණු කිසිවක් සඳහා තැනැත්තන් විසින් ඉදිරිපත් කළ සුතු වාර්තා සහ සැපයිය යුතු තොරතුරු;

(ඕ) මේ වගන්තියේ සඳහන් කරුණු වලට හෝ විෂය යන්ට ආනුෂංගික හෝ සම්බන්ධ සියලු කාරණා.

[1955 අංක 16 §14] (2) 1955 ජූනි මස 6 වන දිනට පෙර නිකුත් කරනු ලැබුවා වූ ද ඒ දිනයට පසුව වලංගුව පවත්නා යම් විසා පත්‍රයක් හෝ අවසර පත්‍රයක් ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් තබන ලද සම් පූර්ණ ඇපය හෝ ඉන් යම් කොටසක් රාජසන්තක කිරීමේ කාර්යය සඳහා සහ ඉහත කී දිනයට පසුව නිකුත් කරන ලද විසා පත්‍ර සම් බන්ධයෙන් එම කාර්ය සඳහා නියෝග සාදනු ලබන පරිදි, එම ආකාරයෙන්ම ඒ විසා පත්‍රය හෝ අවසර පත්‍රය අවලංගු කිරීමේ හෝ වෙනස් කිරීමේ කාර්යය සඳහා නියෝග සාදනු ලැබිය හැකි ය.

## IV වන කොටස

IV වන කොටස අදාළ කිරීම.

### ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන තැනැත්තන්ගේ කටයුතු අධීක්ෂණය කිරීම

24. යම් තැනැත්තකුවම—

(අ) ඔහු ශ්‍රී ලංකාවේ පුරවැසියකු නම් මිස; හෝ

(ආ) තත් කාලයෙහි බලපවත්නා I වන කොටස යටතේ වූ යම් නියමයක් ප්‍රකාර ඔහු මේ කොටසේ විධිවිධාන වලින් නිදහස් කර ඇත්නම් මිස

ශ්‍රී ලංකාවේ නැවතී සිටින කාලය තුළ ඔවුන්ගේ සැම ඊම් සහ සටයුතු සම්බන්ධයෙන් පරීක්ෂාවන් ඔහු විසින් නියමයක් මගින් නියම කරනු ලැබිය හැකි ය. තවද, පහත දැක්වෙන සියලු කාරණා හෝ ඉන් කිසිවක් සම්බන්ධයෙන් විධිවිධාන ඒ නියමයෙන් සලස්වනු ලැබිය හැකි ය:—

නියමයක් මගින් තැනැත්තන් මත පරීක්ෂාවන් නියම කිරීමේ බලය.

(අ) බලයලත් නිලධරයන් වෙත වාර්තා සැපයීමට ඒ තැනැත්තන්ව නියම කරනු ලබන හෝ යම් අවස්ථානුගත කරුණු සම්බන්ධයෙන් සහ කාර්ය සඳහා ද ඒ අවස්ථානුගත කරුණු සහ කාර්ය, ඒ වාර්තාවල අන්තර්ගත සහ ඒවායෙහි ඇතුළත් කළ යුතු විස්තර;

216

ආඥාමක හා විධාමක [අධි. විශේ

(අ) නියමය යටතේ ඉදිරිපත් කරන ලද වාර්තාවල සඳහන් විස්තරවල නිරවද්‍යතාවය කෙරෙහි යම් ආකාරයකින් බලපාන අවස්ථානුගත කරුණු කිසි වක් සිදුවීමට අදාළව ඒ තැනැත්තන් විසින් සපයන ලද තොරතුරු ;

(ආ) ඒ නියමයෙන් නියම කරනු ලබන පරිදි පදිංචි ස්ථානය, පදිංචි ස්ථානය වෙනස් කිරීම, ගමන් හෝ අන්‍යාකාරයක් සම්බන්ධයෙන් වූ ඒ විධිවිධානවලට අනුව ඒ තැනැත්තන් විසින් කටයුතු කිරීම ;

(ඇ) මහජන යහපත සඳහා අවශ්‍ය යයි අමාත්‍යවරයා විසින් සලකනු ලබන පරිදි ඒ තැනැත්තන්ගේ කටයුතු හෝ සම්බන්ධතා පිළිබඳව යම් සෙදීම් නියම යන්, කොන්දේසි හෝ පරිසීමාවන් නියම කිරීම ;

(ඈ) බලශලත් නිලධරයන් විසින් තබාගත යුතු ලේඛන වල ආකෘතිය සහ ඒවායෙහි ඇතුළත් කළ යුතු විස්තර ;

(ඉ) ඒ තැනැත්තන් සම්බන්ධයෙන් ගිරහාරයට ගැනීමේ, රඳවා තැබීමේ සහ ස්ථාන හෝ තැනැත්තන් හෝදිසි කිරීමේ බලතල බලශලත් නිලධරයන් සහ පොලිස් නිලධරයන් විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි අවස්ථා සහ නියමය සම්පූර්ණයෙන් බලාත්මක කිරීමේ අරමුණ ඇතිව විධිවිධාන සැලැස් වීමට අවස්ථානුකූල යයි පෙනීයන වෙනත් යම් අනුශාත කරුණු ;

(උ) මෙම උපවගන්තියෙහි සඳහන් කාරණාවලට සහ විෂයයන්ට ආනුෂංගික හෝ සම්බන්ධ කාරණා.

(2) මේ වගන්තිය යටතේ නියමයක්, යම් තැනැත්තකු හෝ තැනැත්තන් කණ්ඩායමක් සම්බන්ධයෙන් වූ විශේෂ නියමයක් හෝ යම් සංවිධානයකට හෝ විස්තරයකට අයත් තැනැත්තන්ට අදාළ විය යුතු සාමාන්‍ය නියමයක් විය හැකි ය.

බලශලත් නිලධරයන් විසින් ලේඛන තබාගත යුතු බව.

20. (1) සෑම බලශලත් නිලධරයකු විසින් ම, මේ පනතේ කාර්ය සඳහා, මේ කොටස අදාළ වන තැනැත්තන් සම්බන්ධයෙන් ලේඛනයක් තබා ගත යුතු අතර, එය පවත්වා ගෙන යා යුතු ය. ඒ නිලධරයා වෙත වාර්තාවක් ඉදිරිපත් කිරීමට 25 වන වගන්තිය යටතේ සඳහන් කළ නියමයෙන් නියම කරනු ලැබූ විට එක් තැනැත්තා සම්බන්ධයෙන් ඒ ලේඛනයෙහි ඇතුළත් කරනු ලැබීමට නියමිත තැනැත්තාට අදාළ විස්තර ඒ නිලධරයා විසින් ලේඛනයෙහි ඇතුළත් කළ යුතු ය.

(2) බලශලත් නිලධරයා වෙත කලින් සපයනු ලැබූ විස්තරවල නිරවද්‍යතාවය කෙරෙහි යම් ආකාරයකින් බලපාන්නා වූ අවස්ථානුගත කරුණු කිසිවක් සිදුවීම සම්බන්ධයෙන් මේ කොටස අදාළ වන යම් තැනැත්තකු විසින් ඒ නිලධරයා වෙත දන්වනු ලැබූ විට,

ලේඛනයේ කිරවද්‍යතාවය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ඒ නැතැත්තාට අදළ ලේඛනයෙහි සටහන්වල යම් වෙනස් කිරීම් ඉහත කී බලයලත් නිලධරයා විසින් කරනු ලැබිය යුතු ය.

V වන කොටස

ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන තැනැත්තන් ශ්‍රී ලංකාවෙන් ඉවත් කිරීම

V වන කොටස අදළ කිරීම.

27. සෑම තැනැත්තකුට ම—

(අ) ඔහු ශ්‍රී ලංකාවේ පුරවැසියකු නම් මිස; හෝ

(ආ) තත් කාලයෙහි බලපවත්නා I වන කොටස යටතේ වූ යම් නියමයක් ප්‍රකාර ඔහු මේ කොටසේ විධිවිධාන වලින් නිදහස් කර ඇත්නම් මිස

මේ කොටස අදළ විය යුතු ය.

ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන තැනැත්තන් ශ්‍රී ලංකාවෙන් ඉවත් කිරීම විධාන කිරීමට අමාත්‍යවරයාගේ බලය.

[1955 අංක 16 §15]

28. (1) මේ කොටස අදළ වන තැනැත්තකු—

(අ) ඔහුට III වන කොටසේ හෝ ඒ කොටසින් පවරන ලද බලතල ප්‍රකාර සාදන ලද යම් නියෝගයක විධිවිධාන කිසිවක් කඩකරමින් ඔහු ශ්‍රී ලංකාවට ඇතුල්ව සිටීමේ හෝ එහි නතරව සිටීමේ; හෝ

(ආ) ඔහුට පවරන ලද හෝ නිකුත් කරන ලද යම් පිට සහනක් හෝ වීසා පත්‍රයක් මඟින් ඔහුට නියම කරන ලද නියමයන්, කොන්දේසි හෝ පරිසීමාවන් කිසිවක් අනුව කටයුතු කිරීමට පැහැර හැරීමේ; හෝ

[1955 අංක 16 §15]

(ඇ) I වන් කොටස යටතේ සාදන ලද යම් නියමයක් මඟින් ඔහුට නියම කරන ලද නියමයන්, කොන්දේසි හෝ පරිසීමාවන් කිසිවක් අනුව කටයුතු කිරීමට පැහැර හැරීමේ හේතුවෙන් මේ කොටස යටතේ වරදකට වරදකරු කරනු ලැබූ අවස්ථාවක, එසේ වරදකරු කරනු ලැබූ තැනැත්තකු සිරහාරයට ගැනීමට, රඳවා තැබීමට සහ තැවකට ගෙනයාමට (මේ පනතෙහි "ඉවත් කිරීමේ නියමය ගනුවෙන් සඳහන් කරනු ලබන) නියමයක් මඟින් අමාත්‍ය වරයා විසින් නියමිත නිලධරයකුට විධාන කරනු ලැබිය හැකි ය. තවද, ඒ තැනේ නොකාධිපතීවරයා විසින්, ඒ තැනැත්තා ශ්‍රී ලංකාවෙන් ඉවත් කළ යුතු බවට ඒ නියමයෙන් හෝ යම් තදනන්තර නියමයක් මඟින් ඔහු විසින් වැඩදුරුවන් විධාන කරනු ලැබිය හැකි ය.

[1955 අංක 16 §15]

(2) මෙම කොටස අදාළ වන තැනැත්තකු— [1955 අංක 16 සිට 15]

(අ) III වන කොටසේ හෝ ඒ කොටසින් පවරන ලද බලතල ප්‍රකාර සාදන ලද යම් නියෝගයක විධි විධාන කිසිවක් කඩකරමින් ශ්‍රී ලංකාවට ඇතුල් වන බවට හෝ එහි නැවතී සිටින බවට; හෝ

(ආ) ඔහුගේ දීසා පත්‍රය හෝ පිටඅනු අවලංගු කොට ඇති බව; හෝ

(ඇ) දීසා පත්‍රයේ හෝ පිටඅනුවෙහි නිශ්චිතව සඳහන් කාලය ඉක්මවා තැනැත්තා සිටින බවට

අමාත්‍යවරයා සෑහීමට පත්වූ අවස්ථාවක, ඒ තැනැත්තා ශිරහාර යට ගෙන රැඳවා තබා තැවකිරීමේ අණපනතින් හෝ ඒ සඳහා වූ නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියමිත නිලධරයකුට විධාන කරනු ලැබිය හැකි ය. තවද, ඒ තැනේ නොකාධිපතිවරයා විසින්, ඒ තැනැත්තා ශ්‍රී ලංකාවෙන් ඉවත් කළ යුතු බවට ඒ නියමයෙන් හෝ යම් තදනන්තර නියමයක් මගින් ඔහු විසින් වැයිදුරටත් දරිනා කරනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් නියමයක් සාදනු ලැබිය හැකි අතර, මේ පනත යටතේ හෝ වෙනත් යම් නීතියක් යටතේ අධිකරණයක් විසින් නියම කරන ලද බන්ධනාගාරගත කිරීමේ දණ්ඩනීය නියමයක් යම් තැනැත්තකු විසින් භුක්ති කරනු ලබන්නේ වුවද් ඒ නියමයෙන් පවරන ලද බලතල කිසිවක් ඒ තැනැත්තා සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

(4) මේ වගන්තිය යටතේ සාදන ලද යම් නියමයක් බලාත්මක කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය සියලු බලය යම් සෙම නිලධරයකු විසින් යොදනු ලැබිය හැකි ය.

(5) මේ වගන්තිය යටතේ සාදන ලද යම් නියෝගයක් කිසිම [1955 අංක 16 සිට 15]
අධිකරණයක දී විවාදයට භාජනය නොකළ යුතු ය.

(6) මේ වගන්තිය යටතේ වූ යම් නියෝගයක සඳහන් තැනැත්තකු ශ්‍රී ලංකාවෙන් ඉවත් කිරීමට ඒ නියෝගයෙන් කැමැත්ත නොකාධිපතිවරයකුට විධාන කරනු ලැබ ඇත්තා වූ ද, එසේ කිරීමට ඒ නොකාධිපතිවරයා පැහැර හරිනු ලබන්නා වූ අවස්ථාවක, ඔහු මේ පනත යටතේ වරදකට වරදකරු කිරීම සඳහා වූ අතර, වරදකරු කරනු ලැබූ විට 45 වන වගන්තියෙහි සඳහන් දණ්ඩනයට ඔහු යටත් විය යුතු ය.

එකී වරද සඳහා කැමැත්ත නොකාධිපතිවරයා මින පසු කරන ලද දණ්ඩනය දඩයකින් සමන්විත වන විට, හෝ එහි දඩයක් ඇතුළත් වන විට සහ දඩය නියම කරනු ලැබූ දින සිට දින සතක් ඇතුළත ඒ දඩය සම්පූර්ණයෙන් හෝ එහි කොටසක් නොගෙවා ඉතිරිව ඇති අවස්ථාවක, කැවි තබනමට ගෙන විසිකිරීමෙන් නොගෙවා ඉතිරිව ඇති මුදල අයකර ගැනීමට දඩය නියම කළ අධිකරණය විසින් නියම කරනු ලැබිය හැකි ය.



2—ඒ 084528 (85/08)

[1955 අංක 16 සි 15] (7) (6) වන උපවගන්තිය යටතේ වූ වරදක් සඳහා තැවත අභාෂාධිපතිවරයකුට විරුද්ධව නඩු කටයුතු පවරා ඇති අවස්ථාවක. ඒ නඩු කටයුතු අවසන් වින තෙක්, හෝ අධිකරණය විසින් නියම කරනු ලබූ යම් දඩයක් ඇත්නම්, ඒ දඩය ගෙවනු ලබන තෙක්, තැවත ඉවත් නිලීමේ බලපැනය ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

[1955 අංක 16 සි 15] (8) විසා පත්‍රයක් හෝ පිටපතක් ප්‍රදානය කොට ඇති තැනැත්ත තුට එම වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන අදාළ වන ආකාරයෙන් මේ, 1955 ජූනි මස 01 වන දින ස්ථිර වාස අවසර පත්‍රයක් හෝ තාවකාලික වාස අවසර පත්‍රයක් (ඒ අවසර පත්‍රය බලාත්මක වූවද නොවූවද) දරන්නාගේ එම විධිවිධාන අදාළ විය යුතු ය. (2) වන උපවගන්තිය යටතේ වූ නියමයකට අදාළ විය යුතු මේ කොටසේ වෙනත් යම් විධිවිධාන ඒ දරන්නා සම්බන්ධයෙන් කරන ලද නියමයකට අදාළ විය යුතු ය.

ඉවත් කරනු ලැබූ තැනැත්තන්ගේ මුදල් සහ දේපළ වියදම් සහ ගාස්තු පෙවෙමෙන්ලා අදාළ කරනු ලැබිය හැකි බව.
[1955 අංක 16 සි 16]

29. යම් තැනැත්තකු සම්බන්ධයෙන් අවන් කිරීමේ නියමයක් හෝ 28 වන වගන්තියේ (2) වන වගන්තිය යටතේ වූ යම් නියමයක් කරනු ලැබ ඇති අවස්ථාවක, සුදුසු සැසි අණාත්‍යවරයා විසින් අදහස් කරනු ලැබුවහොත්, ඒ තැනැත්තා සම්බන්ධයෙන් ආණ්ඩුව විසින් දරන ලද වියදම් සහ යාච්ඤා සම්පූර්ණයෙන් හෝ ඉන් යොදවන්නේ හෙයින්මෙයි ලා ඒ තැනැත්තාගේ මුදල් හෝ දේපළ කුසිවිස් අදල කරනු ලැබිය හැකි ය.

## VI වන කොටස

## ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන තැනැත්තන් ශ්‍රී ලංකාවෙන් පිට කිරීම

VI වන කොටස අදාළ කිරීම

30. සෑම තැනැත්තකුට—

(අ) ඔහු ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් යැයි මිස; හෝ

(ආ) සන්කාලයෙහි බලපවත්නා I වන කොටස යටතේ වූ යම් නියමයක් ප්‍රකාර ඔහු මේ කොටසේ විධිවිධාන වලින් නිදහස් කර දැන්නවා නම්

මේ කොටස අදාළ විය යුතු ය.

ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන තැනැත්තන් ශ්‍රී ලංකාවෙන් පිට කිරීමට අමාත්‍යවර යාගේ බලය

31. (1) අභ්‍යන්තරය විසින් පහත දක්වෙන යම් අවස්ථාවල දී මේ කොටස අදාළ වන යම් තැනැත්තකුට ශ්‍රී ලංකාවෙන් පිටවීමට සහ ඉන්පසුව ශ්‍රී ලංකාවෙන් පිටත තැනකී සිටීමට නියම කරමින් (මේ පනතෙහි "රටින් පිට කිරීමේ නියමය" යනුවෙන් හඳහන් කරනු ලබන) නියමයක් කරනු ලැබිය හැකිය :—

(අ) ඒ තැනැත්තා—

(i) තමා සහ තම යැපෙන්නන් නඩත්තු කිරීමට තොහැකි තැනැත්තකු බවට;

(ii) සිහි විකල වූ හෝ මානසික ආබාධයක් ඇති තැනැත්තකු බවට;

(iii) ගණිකාවක්, ගණිකාවන් සපයන්නකු හෝ වෙනත් තැනැත්තන් ගණිකා වෘත්තියෙහි යෙදවීමෙන් ජීවනෝපාය ලබන තැනැත්තකු බවට;

(iv) අවෛද්‍ය හේතූන් නිසා ශ්‍රී ලංකාවේ තැවතී සිටීමට ඉඩ දීමට නොහැකි තැනැත්තකු බවට

ප්‍රමාණවත් යයි අමාත්‍යවරයා විසින් සලකනු ලබන සාක්ෂි මඟින් දක්වනු ලබන අවස්ථාවක;

(ආ) ඒ තැනැත්තා ශ්‍රී ලංකාවේ දී හෝ වෙනත් යම් රටක දී වරදකරු කරනු ලැබ, බන්ධනාගාරගත කිරීමේ දණ්ඩනය නියමයක් ප්‍රකාශයට පත් කරන ලද වරදක් සම්බන්ධයෙන් නිදහස් සමාවක් නොලැබී ඇත්තා වූ සහ එවැ සම්බන්ධ අවස්ථානුගත කරුණුවල හේතුවෙන් ශ්‍රී ලංකාවෙහි නැවතී සිටීමට ඉඩදීම සඳහා නොහැකි තැනැත්තකු බවට අමාත්‍යවරයා විසින් සලකනු ලබන අවස්ථාවක;

(ඇ) ඒ තැනැත්තා, පලායන තැනැත්තෙක්ව සහ ඔවුන් උදෙසා ඉල්ලීම කිරීමට අදාළව ශ්‍රී ලංකාවෙහි බලාත්මක වූ හෝ බලාත්මක විය යුතු යම් නීතියක අදාළ කුලවේ ශ්‍රී ලංකාවෙන් පිටත දී දණ්ඩනය නියමයක් කරනු ලැබ ඇති අවස්ථාවක;

(ඈ) ඒ තැනැත්තාට විරුද්ධව රටින් පිටකිරීමේ නියෝගයක් කිරීම මහජන යහපත සඳහා කිහෙකර යයි අමාත්‍යවරයා විසින් සලකනු ලබන අවස්ථාවක.

(2) මෙම වගන්තිය යටතේ සාදනු ලබන නියමයක් සුදුසු යයි අමාත්‍යවරයා විසින් සිතන නියමයන්ට සහ කොන්දේසිවලට යටත්ව සාදනු ලැබිය හැකි ය.

(3) රටින් පිට කිරීමේ නියෝගයක් කරනු ලැබුවේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තා විසින් ඒ නියෝගයට අනුකූලව ශ්‍රී ලංකාවෙන් පිටත නැවතී සිටිය යුතු ය.

(4) රටින් පිටකිරීමේ නියෝගයක් කර ඇත්තේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තා අමාත්‍යවරයා විසින් විධාන කරනු ලබන යම් ආකාරයකින් රඳවා ගනු ලැබිය හැකි අතර ශ්‍රී ලංකාවෙන් පිටවීයෙමට ආසන්න නැවක ඔහු නැවැත් විය හැකි ය.

(5) අමාත්‍යවරයා විසින් හෝ බලයලත් නිලධරයකු විසින් මෙහි නියම කරනු ලැබුවහොත් ශ්‍රී ලංකාවෙන් පිටත යම් වරායකට ගමට ආසන්න නැවක නෞකාධිපතිවරයා විසින්, රටින් පිට කිරීමේ නියෝගයක් කර ඇත්තේ යම් තැනැත්තකුට විරුද්ධව ද ඒ තැනැත්තා සහ ඔහුගේ යැපෙන්නන් කිසිවකු වෙනුවෙන්

ඔවුන් ද නැවට බාරගත යුතු ය. තවද ඒ තැනැත්තාට සහ ඔහුගේ යැපෙන්නන්ට ඒ වරායට යන මාර්ගය සහ ඒ යන මාර්ගයේ දී නිසි ඉඩකඩ සහ නඩත්තුව සැලසිය යුතු ය.

[1955 අංක 16 සිට 17] (6) යම් තැනැත්තකු, මේ පනත යටතේ හෝ වෙන යම් නීති යක් යටතේ අධිකරණයක් විසින් නියම කරන ලද බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයක් විඳිමින් සිටින්නේ වුවද මේ වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදන ලද නියමයක් මඟින් පවරන ලද බලතල කිසිවක් ඒ තැනැත්තා සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

රටින් ඉවත් කරනු ලැබූ තැනැත්තන් ඉඟි මුදල් සහ දේපළ විසඳීම සහ හාස්තු ගෙවීම සඳහා අදළ කළ හැකි බව.

32. යම් තැනැත්තකු සම්බන්ධයෙන් රටින් පිට කිරීමේ නියෝගයක් කරනු ලැබ ඇති අවස්ථාවක, සුදුසු යයි අමාත්‍යවරයා විසින් අදහස් කරනු ලැබුවහොත් ඒ තැනැත්තා සම්බන්ධයෙන් ආණ්ඩුව විසින් දරන ලද විසඳීම සහ හාස්තු සම්පූර්ණයෙන් හෝ ඉන් කොටසක් ගෙවීමෙහි ලා ඒ තැනැත්තාගේ මුදල් හෝ දේපළ කිසිවක් අදාළ කරනු ලැබිය හැකි ය.

## VII වන කොටස

### නැනැත්තන් ශ්‍රී ලංකාවෙන් පිටකිරීම

VII වන කොටස අදළ කිරීම

33. තත්කාලයෙහි බලපවත්නා I වන කොටස යටතේ වූ යම් නියමයක් ප්‍රකාර, යම් තැනැත්තකු මේ කොටසේ විධිවිධානවලින් නිදහස් කරනු ලැබ ඇත්නම් මිස, මේ කොටස සෑම තැනැත්තකුට ම අදාළ විය යුතු ය.

අනුමත කළ පිටවීමේ වරායවලින් තැනැත්තන් ශ්‍රී ලංකාවෙන් පිටවිය යුතු බව.

34. මේ කොටස අදාළ වන කිසිම තැනැත්තකු, අනුමත කළ පිටවීමේ වරායක් නොවන යම් ස්ථානයකින් ශ්‍රී ලංකාවෙන් පිටවීම නොකළ යුතු ය.

ශ්‍රී ලංකාවෙන් පිටවීම සඳහා ගමන් බලපත්‍ර අවශ්‍ය බව.

* 35. මේ කොටස අදාළ වන කිසිම තැනැත්තකු—

(අ) ඔහු ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් නම්, ශ්‍රී ලංකාවේ විදේශ ගමන් බලපත්‍රයක් ඔහුගේ සන්තකයෙහි ඇත්නම් මිස, ශ්‍රී ලංකාවෙන් පිටවීම නොකළ යුතු ය: හැත

(ආ) ඔහු ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නේ නම්, වලංගු විදේශ ගමන් බලපත්‍රයක් ඔහුගේ සන්තකයෙහි ඇත්නම් මිස ශ්‍රී ලංකාවෙන් පිටවීම නොකළ යුතු ය:

එසේ වුවද මේ කොටස අදාළ වන්නා වූ සහ යම් නියමිත පංති යකට හෝ විස්තරයකට අයත් වන්නා වූ තැනැත්තකු, නියමිත ආකෘතිය අනුව නියමිත නිලධරයකු විසින් නිකුත් කරනු ලැබූ සහතිකයක අධිකාරිය යටතේ ශ්‍රී ලංකාවෙන් පිටවන්නේ නම්, ඔහු මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන කඩ කරන්නේ යයි සලකනු නොලැබිය යුතු ය.

නියෝග.

36. (1) මේ කොටස අදාළ වන තැනැත්තන්ට ශ්‍රී ලංකාවෙන් පිටවීම පාලනය කිරීමේ කාර්යය සඳහා පහත දැක්වෙන සියලු කාරණා හෝ ඉන් කිසිවක් සඳහා හෝ ඒ සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය:—

(අ) නියම කිරීමට මේ කොටසින් නියමිත සියලු කාරණා;

(ආ) ශ්‍රී ලංකාවේ විදේශ ගමන් බලපත්‍ර නිකුත් කරනු ලැබිය යුතු තැන් හා අලුත් කරනු ලැබිය යුතු අධිකාරිය හෝ අධිකාරියන්;

(ඇ) ශ්‍රී ලංකාවේ විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීම හෝ අලුත් කිරීම සඳහා ඉල්ලීම් ඉදිරිපත් කිරීම හෝ ඒ ඉල්ලීම්වල ආකෘතිය සහ ඒවායෙහි ඇතුළත් කළ යුතු විස්තර;

(ඈ) නියමිත අධිකාරියේ පරම අභිමතය අනුව වුව ද නැත හොත් නියමිත අවශ්‍යතා සපුරන ලද අය අනුව වුව ද ඒ ගමන් බලපත්‍ර නිකුත් කිරීම, ප්‍රතික්ෂේප කිරීම, අවලංගු කිරීම සහ අත්හිටුවීම; [1955 අංක 16 සි 18]

(ඉ) [මහජන යහපත සඳහා අවශ්‍ය යයි අමාත්‍යවරයා විසින් සලකනු ලබන යම් නියමයන් සහ කොන්දේසි (යටත්) ඒ විදේශ ගමන් බලපත්‍රයෙහි සම්බන්ධ නියමයන් සහ කොන්දේසි;

(ඊ) ඒ විදේශ ගමන් බලපත්‍රවල ආකෘති සහ ඒවායෙහි ඇතුළත් කළ යුතු විස්තර;

(උ) මේ කොටස අදාළ වන්නා වූ සහ ශ්‍රී ලංකාවේ පුරවැසි යන් වන්නා වූ තැනැත්තන්ට ඒ විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීමට හෝ අලුත් කිරීමට පූර්ව කොන්දේසියක් වශයෙන්, ඒ තැනැත්තන් පෙරළා ස්ථිරව ගෙන්වීම සම්බන්ධයෙන් ආණ්ඩුව විසින් දරනු ලබන යම් වියදම් ආණ්ඩුවට ආපසු ගෙවීම සඳහා ඇප තැබීම, ඒ ඇප තැබිය යුතු ආකාරය, මුදල් තැන්පත් කිරීමෙන් ද තැනෙකුගේ හිමිවල දේපළ උකස් කොට බැඳ තැබීමෙන් ද නැතහොත් අන්‍යාකාරයකින් ද යන වග, ඒ ඇපය තැබිය යුතු තැනැත්තන් සහ එසේ තබන ලද ඇපය සම්බන්ධයෙන් සුදුසුකම් කිරීම;

(ඌ) ඒ විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීම හෝ අලුත් කිරීම සම්බන්ධයෙන් ගාස්තු කියම කිරීම, අය කිරීම සහ ඒ සම්බන්ධයෙන් සුදුසුකම් කිරීම;

(එ) මේ කොටස අදාළ වන්නා වූ සහ ශ්‍රී ලංකාවේ පුරවැසි යන් වන්නා වූ තැනැත්තන් සේවා වූ හෝ වූවිය කිසි යම් විදේශ රාජ්‍යයක සේවය සඳහා ශ්‍රී ලංකාවෙන් පිටවීම තහනම් කිරීම, විධිමත් කිරීම සහ පාලනය කිරීම; (මහජන යහපත සඳහා අවශ්‍ය යයි අමාත්‍යවරයා විසින් සලකනු ලබන යම්

නියමයන් සඳ කොන්දේසි ඇතුළුව) ඉහත කී කාර්යය සඳහා ශ්‍රී ලංකාවෙන් පිටතිමට ඉඩ දෙනු ලබන යම් තැනැත්තන් යටත් විය යුතු නියම යන් සහ කොන්දේසි;

(ඒ) නියෝගවල දක්වා ඇති නියමයන් සහ කොන්දේසි වලට අනුකූලව ඒ තැනැත්තන් බදවා ගැනීම ක්‍රියාත්මක කරනු ලැබ ඇත්නම් මිස, ශ්‍රී ලංකාවෙන් පිටත සේවකයන්ව වශයෙන් සේවා නියුක්තිය සඳහා ඒ තැනැත්තන් බදවා ගනු ලැබූ විට, ඔවුන් ලංකාවෙන් පිටවීම තහනම් කිරීම;

(ඓ) නියම කරනු ලබන තැනැත්තන් යම් පාතියකට හෝ විස්තරයක අයත් යම් තැනැත්තෑ කොන්දේසි රහිතව හෝ නියම කරනු ලබන යම් නියමයන්ට සහ කොන්දේසිවලට යටත්ව ඒ නියෝගවල සියලු විධිවිධානවලින් හෝ ඉන් කිසිඳුකින් නිදහස් කිරීම;

(ඔ) මේ උපවගන්තියේ සඳහන් කාරණාවලට සහ විෂය යන්ට ආනුෂංගික හෝ සම්බන්ධ සියලු කාරණා.

(2) මේ වගන්තියේ කාර්ය සඳහා "විදේශ රාජ්‍යය" යන්නෙහි ශ්‍රී ලංකාවේ සීමාවන්ගෙන් ඔබ්බෙහි ඇති යම් රටක, විජිතයක, පළාතක හෝ ජනතාවක නැතහොත් රටක්, විජිතයක්, පළාතක් හෝ ජනතාවක් කෙරෙහි ආණ්ඩුවේ බලතල ක්‍රියාත්මක කරන හෝ ක්‍රියාත්මක කිරීමට භාරගෙන ඇති යම් තැනැත්තෙක් හෝ තැනැත්තන් ඇතුළත් වේ.

## VIII වන කොටස

### සාමාන්‍ය විධිවිධාන

ලංකාවට ඇතුල් වන හෝ ඉන් පිටවන තැනැත්තන් සලකා බැලීම.

37. (1) ශ්‍රී ලංකාවට ඇතුල්වන හෝ ඉන් පිටවන යම් තැනැත්තකු විසින් ම, ඒ තැනැත්තා ශ්‍රී ලංකාවේ පුරවැසියෙක ද නැතහොත් පුරවැසියකු නොවේ ද යන වග නිශ්චය කර ගැනීමේ කාර්යය සඳහා යම් බලයලත් නිලධරයකු විසින් නියම කරනු ලබන යම් තොරතුරු ඒ නිලධරයාට සැපයිය යුතු ය.

(2) ශ්‍රී ලංකාවේ යම් ස්ථානයකට පැමිණෙන යම් නැවක නෞකාධිපතිවරයා විසින්, ඒ නැවෙයි සිටින යම් මගියෙක් හෝ නාවික පිරිසේ යම් සාමාජිකයෙක් ශ්‍රී ලංකාවේ පුරවැසියකු ද නැතහොත් ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවේ ද යන වග නිශ්චය කර ගැනීමේ කාර්යය සඳහා බලය ලත් නිලධරයකු විසින් පරීක්ෂා කරනු ලබන තෙක්, ඒ මගියා හෝ නාවික පිරිසේ සාමාජිකයා නැවෙහි රඳවා ගනු ලැබිය යුතු ය.

38. පොලිස්කවරයා විසින් බලය දෙන ලද යම් නිලධාරියකු විසින් හෝ සාර්ජන්ට්වරයකුගේ නිලයට පහළ නොවන නිලයක් දරන පොලිස් නිලධාරියකු විසින් හෝ කොන්ස්ටේබල්වරයකුගේ හෝ නායක තැවියකුගේ නිලයට පහළ නොවන නිලයක් දරන හමුදාවල බලය ලත් සාමාජිකයකු විසින්,— නැනැත්තන් පලුනා ගැනීම. [1961 අංක 69 §3]

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන යම් තැනැත්තකුගේ හෝ

(ආ) මේ පනතු යටතේ වරදක් සිදු කරන ලදැයි සැක කරන හෝ චෝදනා කරන යම් තැනැත්තකුගේ

ඡායාරූප ගැනීම, මිනුම් ගැනීම, ඇඟිලි සටහන් ගැනීම් සහ ඔහු අනන්‍යතාවය කියා හඳුනා ගැනීම සඳහා යුක්තියුක්තවූත්ත වෙස අවශ්‍ය කරනු ලබන සියලු පියවර ගැනීම් මේ පනතේ කාර්ය සඳහා නීත්‍යානුකූල වන්නේ ය.

39. යම් තැවිකට ඇතුල් වීමට හෝ තැගෙනට ද ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය බලයෙහි හෝ ඉන් පිටවන යම් තැනැත්තකු සිරිකුම් කිරීමට ද ඒ තැනැත්තා විසින් යම් ලේඛන අදිරිපත් කිරීම්ට නියම කිරීමට ද තැම බලයෙන්ම නිලධරයකුට මෙයින් බලය පවරනු ලැබේ. නැවිවලට ඇතුල් වීමට සහ තැගීමට බලයලත් නිලධරයන්ට ඇති බලය.

40. අපරාධ නඩු විධාන සංග්‍රහයෙන් හෝ නිලධරයකු වෙත පවරන ලද යම් බලයක් ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා ඒ පනතේ අර්ථානුකූලව පොලිස්කවරයා, නියෝජ්‍ය පොලිස්කවරයා, තැම යහකාර පොලිස්කවරයකු සහ තැම බලය ලත් නිලධරයකු හෝ නිලධරයකු බවට සැලකිය යුතු ය. පොලිස්කවරයා ආදීන් හෝ නිලධරයන් බවට සැලකිය යුතු බව.

41. මේ පනතින් හෝ මේ යටතේ පවරන ලද යම් බලතල ක්‍රියාත්මක කිරීමේ දී රඳවා ගනු ලැබූ යම් තැනැත්තකු එසේ රඳවා ගෙන සිටින අතරතුර නීත්‍යානුකූල භාරයෙහි ඇති බවට සැලකිය යුතු ය. රඳවා ගනු ලැබූ තැනැත්තන් නීත්‍යානුකූල භාරයෙහි ඇති බවට සැලකිය යුතු බව.

42. (1) යම් බලය ලත් නිලධරයකු විසින් කරන ලද ඉල්ලීමක් මත ශ්‍රී ලංකාවේ යම් වරායකට ඇතුල් වන හෝ ඉන් පිටවන තැම තැවක් නොකාඩිපතිවරයා විසින්,— තැවිවල සිටින මඟින් සහ නාවික පිරිසේ සාමාජිකයන් පිළිබඳ විත්තා.

(අ) ඒ වරායේ දී ඒ තැවට නගින හෝ ඉන් බසින සියලු මඟින්; හෝ

(ආ) ඒ තැවේ නාවික පිරිසෙස් සාමාජිකයන් සම්බන්ධයෙන් ඕනෑතර ඇතුළත් විත්තාවක් ඒ නිලධරයාට සැප කිරීය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ විත්තාවක් සැපයීමේ කාර්යය සඳහා තැවික එක් එක් මඟියා සහ නාවික පිරිසේ එක් එක් සාමාජිකයා ඒ තැවේ නොකාඩිපතිවරයා විසින් ඔහුට නියම කරනු ලබන ඔහුගේ සන්තකයෙහි ඇති යම් තොරතුරු නොකාඩිපතිවරයාට සැපයිය යුතු ය.

23

[1955 අංක 16 §19] (3) පාලකවරයා මිඹින් නියම කරනු ලැබුවහොත් ශ්‍රී ලංකාවේ යම් වරායකින් පිටව යන සෑම නැවක අයිතිකරු විසින් හෝ අයිතිකරුගේ අනුයෝජිතයා විසින් හෝ තත් කාර්යය සඳහා නියම කරනු ලබන ආකෘතියක් අනුව, ඒ නැවෙන් ලංකාවෙන් පිටවීම ගිය නාවික පිරිසේ සියලු නාවිකයන් සහ සියලු මිනින් පිළිබඳ ලැයිස්තුවක් පාලකවරයාට ඇපයිය යුතු ය.

සංගත ක්‍රියාත්මක කිරීමේ විසඳීම 43. මේ පනත ක්‍රියාත්මක කිරීමෙහි ලා දරනු ලබන සියලු විසඳීම්, මේ පනතින් හෝ ඒ යටතේ විධිවිධාන සලසන ලද පරිදි හෙවනු ලබන තාක් දුරට හැර, තත් කාර්යය සඳහා පාර්ලිමේන්තුව විසින් ප්‍රතිපාදන සලසනු ලැබූ මුදල්වලින් හෙවීම යුතු ය.

අමාත්‍යවරයා විසින් සාදන ලද හෝ නිකුත් කරන ලද සාධන පනු නිශ්චිත කිරීමේ. 44. (1) මේ පනතෙහි ඇතුළත් කිසි දෙයකින් බලය ඇති යම් විනිවිදභාවයෙන් අනුව කටයුතු කරමින් අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ හෝ නිකුත් කරනු ලැබූ, ඔහු විසින් හෝ වෙනුවෙන් අත්සන් කරන ලද කියවන්නන්, ධාරණයන්, උපදෙස්වල්, අවසර පත්‍රයක් හෝ අවසානත් යම්කිසි ප්‍රලේඛයක් පළමු උපලේඛනයේ [illegible] සඳහා විශේෂයෙන් නාවි වන ලෙස නියම කරනු ලබන අවස්ථාවක දී, එසේ නොවන පක්ෂයෙහි මෙන්ම කරනු ලබන ඕනෑම අවස්ථාවක දී ඔහු විසින් සාදන ලද එහෙ නිකුත් කරන ලද යම්කිසි ප්‍රලේඛයක් පළමු උපලේඛනයේ [illegible] යුතු ය.

(2) නඩු කටයුත්තක දී අමාත්‍යවරයා විසින් හෝ ඔහු වෙනුවෙන්, ඩාබිත පත්‍රයේ සත්‍ය පිටපතක් බවට සහතික කළ බවට අදහස් කෙරෙන ලේඛනයක් ඉදිරිපත් කිරීමෙන් ඉවත හි පරිදි එවැනි යම් සාධන පත්‍රයක් යම්කිසි [illegible] සාක්ෂි ලබා ගැනීම සිදු කළ හැකි ය.

වැරදි 45. (1) (අ) මේ පනතේ හෝ ඒ යටතේ පැනවූ ලද යම් නියමයක හෝ නියෝගයක යම් විධිවිධානයක් කඩ කරමින් ශ්‍රී ලංකාවේ ඇතුල් වීම හෝ එහි නැවතී සිටීම;

[1961 අංක 08 §4] (ආ) මේ පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියමයක හෝ නියෝගයක යම් විධිවිධානයක් කඩ කරමින් ශ්‍රී ලංකාවෙන් පිටව යෑම;

[1961 අංක 08 §4] (ඇ) අමාත්‍යවරයාට හෝ යම් බලය ලත් නිලධරයකුට හෝ මේ පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියමයක හෝ නියෝගයක විධිවිධාන ක්‍රියාවේ යෙදවීමෙහි ලා නීත්‍යනුකූල වූ ක්‍රියා කරන අවස්ථාවක නොනැත්තකුට පිළිතුරු වශයෙන් හෝ ඔහුට අදාළව යම් අසත්‍ය වාර්තාවක්, අසත්‍ය ප්‍රකාශයක් හෝ අසත්‍ය කරුණු සැලකිරීමක් කරන හෝ කිරීමට සලස්වන;

(ඇ) ශ්‍රී ලංකාවේ දී හෝ වෙනත් දේශයක දී නීතිකූල් කරනු ලැබුව ද යම් විදේශ ගමන් බලපත්‍රයක් හෝ යම් වීසා පත්‍රයක් යෝ ඒ මෙන බූ පිරිස නාම් ව්‍යාජ මලය සාදනා, වෙනස් කරන හෝ අයුතු ලෙස වෙනස් කරන; [1961 අංක 68§ 4]

(ඈ) යම් සහතිකයක් ව්‍යාජ ලෙස සාදන, වෙනස් කරන හෝ අයුතු ලෙස වෙනස් කරන; 1961 අංක 68 § 4]

(ඉ) ව්‍යාජ ලෙස සාදන ලද, වෙනස් කරන ලද හෝ අවසිමින් යම් විදේශ ගමන් බලපත්‍රයක් හෝ ව්‍යාජ ලෙස සාදන ලද, වෙනස් කරන ලද හෝ අවසිමින් වීසා පත්‍රයක් හෝ පිටසනක් සහිත යම් විදේශ ගමන් බලපත්‍රයක්, නීත්‍යානුකූල අධිකාරය නොමැතිව පාවිච්චි කරන හෝ තම සන් නසගෙහී තිබෙන; [1961 අංක 68 § 4]

(උ) යම් ව්‍යාජ ලේඛ සාදන ලද, වෙනස් කරන ලද හෝ අවසිමින් යම්කිසියක් නීත්‍යානුකූල බලය නොමැතිව පාවිච්චි කරන හෝ තම සන්තකයේ තබා ගන්නේ; [1955 අංක 10§ 20] [1961 අංක 68 § 4]

(ඌ) යම් ලේඛනය සැදෙන හෝ ඒ යටතේ සාදන ලද, නියෝගයක් හෝ නියමයක් යටතේ කළ බලපෑම යන කාර්ය ක්‍රියාත්මක කරන යම් තැනැත්තෙකුට බාධා කරන හෝ අවහිර කරන; [1961 අංක 68 § 4]

(එ) යම් ලේඛනය සැදෙන හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක හෝ නියමයක යම් විධිවිධානයක් අනුව නිපදවූ කිරීම් අනාකාරයකින් කළ කරන හෝ පැහැර හරින [1961 අංක 68 § 4]

යන් තැනැත්තාකු, එම ලේඛය යටතේ වරදකට වරදකරු කිරීම ලබනු අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් දෙසියයකට නොඅඩු වූ සහ රුපියල් පන්සීයකට නොවැඩි වූ දඩයකට හෝ මාස තුනක් නොඅඩු වූ සහ දෙවසරකට නොවැඩි වූ කාලයක් සඳහා බන්ධනාගාරයෙන් එක් ආකාරයක සිරදඬුවමකට හෝ ඒ දඩය සහ සිරදඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය. [1955 අංක 10§ 20]

9. (1) මෙහි උපවගන්තිය යටතේ වරදක් කිරීමට තැත් කරන [1961 අංක 68§4] තැත්, වරද කිරීමට ඉදිරියට යම් ක්‍රියාවක් කරන හෝ වරදක් කිරීමේ අරමුණ කරන හෝ අනුබල දෙන යම් තැනැත්තාකු මේ පනත යටතේ වරදකට වරදකරු කිරීම ලබනු ලැබූ විට, (1) වන උපවගන්තිය යටතේ වූ වරදකට වරදකරු වී වරදකරු කරනු ලැබූ ලෙස එම දඩුවමට ම යටත් විය යුතු ය.

[1961 අංක 68 § 4] (3) පොලිසකවරයා විසින් හෝ සහකාර පොලිස් අධිකාරිවරයකුගේ නිලයට පහළ නොවන නිලයක් දරන පොලිස් නිලධරයකු විසින් හෝ පොලිසකවරයාගේ හෝ ඒ පොලිස් නිලධරයාගේ ලිඛිත අනුමතය ඇතිව මිස, මේ පනත යටතේ වරදක් සඳහා කිසිම නඩුවක් පවරනු නො ලැබිය යුතු ය.

[1955 අංක 16 § 20] [1961 අංක 68 § 4] (4) මේ පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියමයක හෝ නියෝගයක යම් විධිවිධානයක් කඩ කරමින් ශ්‍රී ලංකාවට ඇතුල් වීමේ හෝ එයි නැවතී සිටීමේ වරදට යම් තැනැත්තකු වරදකරු නරණින් යම් අධිකරණයක් විසින් දෙන ලද (ඊට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කර නොමැත්තා වූ සහ අභියාචනයේ දී ස්ථිර කර ඇත්තා වූ) නඩු තීන්දුවක්, එසේ වරදකරු කරනු ලැබූ තැනැත්තාට හෝ වෙනත් යම් තැනැත්තකුට විරුද්ධව මේ පනත යටතේ වෙනත් යම් වරදක් සඳහා පවරනු ලබන යම් නඩුවක දී සාක්ෂි ආඥා පනතෙහි පටහැනිව කුමක් සඳහන්ව ඇත ද ඒ වරදකරු කරනු ලැබීම ඔප්පු කිරීමේ සාක්ෂි වශයෙන් ආවේශ්‍ය කළ යුතු ය. එවිට එසේ වරදකරු කරනු ලැබූ තැනැත්තා—

(අ) මේ පනතේ III වන කොටස අදාළ නොවන තැනැත්තකු බව; හෝ

(ආ) ඒ විධිවිධානවලට අනුකූලව අවශ්‍යතාවෝ්ත පරිදි, ශ්‍රී ලංකාවට ඇතුල් වුණ බව හෝ නැවතී සිටි බව; හෝ

(ඇ) නියමිත දිනයට පෙරාතුව ශ්‍රී ලංකාවේ සිටි බව සහ ඉන් පසුව ශ්‍රී ලංකාවෙන් පිට වී නොගිය බව; හෝ

(ඈ) නියමිත දින හෝ ඉන් පසුව ශ්‍රී ලංකාවේ උපන් බවත් සහ ඉන් පසුව ශ්‍රී ලංකාවෙන් පිට වී නොගිය බව

ඒ නඩුවේ චූදිතයා විසින් ඔප්පු කරනු ලැබුවෙහොත් මිස, එසේ වරදකරු කරනු ලැබූ තැනැත්තා ඒ විධිවිධානය කඩ කරමින් ශ්‍රී ලංකාවට ඇතුල් වූ බවට හෝ ශ්‍රී ලංකාවෙහි නැවතී සිටි බවට සූදුවිය නිගමනය කළ යුතු ය.

පනත ආදිය කඩ කරමින් තැනැත්තන් ශ්‍රී ලංකාවට ගෙන ඒම යම්බඳ විධෙයන් වැරදි.
[1961 අංක 68 § 6]

45. (1) (අ) වෙනත් යම් තැනැත්තකු ශ්‍රී ලංකාවට ඇතුල් වීම මේ පනතේ හෝ ඒ යටතේ සාදන යද යම් නියමයක හෝ නියෝගයක යම් විධිවිධානයක් කඩ කරන බව හෝ කඩ කරනු ලබිය හැකි බව හෝ සැවර වූ යම් ආකාරයකින් ශ්‍රී ලංකාවට ඒ වෙනත් තැනැත්තා ගෙන එන;

(ආ) මේ පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියමයක හෝ නියෝගයක යම් විධිවිධානයක් කඩ කරමින් වෙනත් යම් තැනැත්තකු ශ්‍රී ලංකාවට ඇතුල් වී ඇති බව හෝ ශ්‍රී ලංකාවේ නතර වී සිටින බව දනිමින් සැවර වූ යම් ස්ථානයක ඒ

කර්තව්‍යවල ස්වභාවය සහ අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගැනීමෙන් පසුව, අවස්ථෝචිත පරිදි, ඒ පුද්ගල මණ්ඩලයේ කළමනාකාරවරයා, ලේකම්වරයා, අධ්‍යක්ෂවරයා හෝ ගබ්‍රල් සුරු විසින් ඔප්පු කරනු ලැබුවේ හොත් මිස—

(i) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් වන අවස්ථාවක දී අවස්ථාවේ කළමනාකාරවරයා, ලේකම්වරයා සහ සෑම අධ්‍යක්ෂවරයකු විසින් සේවයේ නියුක්ත කරනු ලැබූ තැනැත්තකු වශයෙන් සලකනු ලැබිය යුතු ය; තව ද

(ii) ඒ පුද්ගල මණ්ඩලය ව්‍යාපාරික ආයතනයක් වන අවස්ථාවක දී, ඒ ව්‍යාපාරික ආයතනයේ සෑම හවුල් කරුවකු විසින් සේවයේ නියුක්ත කරනු ලැබූ තැනැත්තකු වශයෙන් සලකනු ලැබිය යුතු ය.

(ආ) ඒ තැනැත්තා ව්‍යාපාර නාම ආඥාපනත යටතේ ලියාපදිංචි කරන ලද ව්‍යාපාරයක සේවයේ නියුක්ත යම් තැනැත්තකු වන කල්හි, ඔහු සේවයේ නියුක්ත කරනු ලැබුවේ තමාගේ අනුදැකීමක් නොමැති බව ඔහුගේ කර්තව්‍යවල ස්වභාවය සහ අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගැනීමෙන් පසුව, අවස්ථෝචිත පරිදි, ඒ පුද්ගලයා, හවුල් සුරු, කළමනාකාරවරයා, ලේකම්වරයා හෝ අධ්‍යක්ෂවරයා විසින් ඔප්පු කරනු ලැබුවහොත් හිස, ඒ ව්‍යාපාරය සම්බන්ධයෙන් ඒ ආඥාපනත යටතේ ලියාපදිංචි කරවා ලද සෑම පුද්ගලයකු, සෑම ව්‍යාපාරික ආයතනයක් සහ සංස්ථාවක් සම්බන්ධයෙන් ඒ පුද්ගලයා, ඒ ව්‍යාපාරික ආයතනයේ සෑම හවුල්කරුවකු ඒ සංස්ථාවේ සෑම කළමනාකාරවරයකු, ලේකම්වරයකු සහ අධ්‍යක්ෂවරයකු විසින් සේවයේ නියුක්ත කරනු ලැබූ තැනැත්තකු වශයෙන් සලකනු ලැබිය යුතු ය.

ඇතැම් සහතික සම්බන්ධයෙන් පූර්ව නිගමනය. [1961 අංක 68 සිට]

45ඇ. මේ පනත යටතේ යම් විරුද්ධ. සම්බන්ධයෙන් යම් නඩුවක දී මේ පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියමයක හෝ ශ්‍රී ලංකාවට ඇතුල් වූ හෝ එයින් නැවතී සිටින තැනැත්තකු බවට සහතික කෙරෙහි නම් කරනු ලැබූ යම් තැනැත්තකු ලෙස තමා විශ්වාස කරන බවට සහකාර පොලිස් අධිකාරිවරයකුගේ නිලයට පහළ නොවන නිලයක් දරන පොලිස් නිලධාරියකු විසින් නිතුත් කරන ලද සහතිකයක් ඉදිරිපත් කරනු ලැබුවහොත්, එසේ නම් කරනු ලැබූ තැනැත්තා චුදිතයා විසින්,—

(අ) මේ පනතේ III වන කොටස අදාළ නොවන තැනැත්තකු බවට, හෝ

(ආ) ඒ විධිවිධානවලට අනුකූලව අවස්ථෝචිත පරිදි ශ්‍රී ලංකාවට ඇතුල් වූ බවට හෝ ශ්‍රී ලංකාවේ නැවතී සිටින බවට; හෝ

(ඇ) නියමිත දිනයට පෙරාතුව ශ්‍රී ලංකාවේ සිටි බවට සහ ඉන් පසුව ශ්‍රී ලංකාවෙන් පිට වී නොගිය බවට; හෝ

(ඈ) නියමිත දින හෝ ඉන් පසුව ශ්‍රී ලංකාවේ උපන් බවට සහ ඉන් පසුව ශ්‍රී ලංකාවෙන් පිට වී නොගිය බවට

78

ඔප්පු කරනු ලැබුවහොත් මිය, එසේ නම් කරන ලද තැනැත්තා ඒ විධිවිධාන සඳ කරමින් ශ්‍රී ලංකාවේ ඇතුල් වූ බවට හෝ ශ්‍රී ලංකාවේ නැවතී සිටින බවට පූර්ව නිගමනය කළ යුතු ය.

46. අපරාධ නඩු විධාන සංග්‍රහයේ පළමුවන උපලේඛනයෙහි කුමක් ඇතුළත්ව ඇත ද මේ පනත යටතේ වූ සියලු වැරදි ඒ සංග්‍රහයේ විධිවිධාන අදාළ කිරීමේ කාර්යය සඳහා සංඥේය වැරදි විය යුතු අතර, මහේස්ත්‍රාත්වරයකු විසින් උක්ත ලෙස විභාග කරනු ලැබිය යුතු ය.

වැරදි සංඥෙය විය යුතු අතර, ඒ මහේස්ත්‍රාත්වරයකු විසින් විභාග කළ යුතු බව.

[1955 අංක 16 §21]

මේ පනතින් නියමිත යම් දඩුවමක් මහේස්ත්‍රාත්වරයකුගේ සාමාන්‍ය බලතල ඉක්මවන්නේ වුවද ඒ මහේස්ත්‍රාත්වරයා විසින් ඒ දඩුවම නියම කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

47. (1) වෙනත් යම් නීතියක කුමක් සඳහන්ව ඇත ද—

ඇතැම් වැරදිවලට ඇප දෙනු නොලැබිය යුතු බව.

[1961 අංක 68 §6]

(අ) 45 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ වූ සෑම වරදකට;

(ආ) 45 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයට අදාළ වන තාක් දුරට ඒ වගන්තියේ (2) වන උප වගන්තිය යටතේ වූ සෑම වරදකට;

(ඇ) 45අ වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය හෝ (ආ) ඡේදය යටතේ වූ සෑම වරදකට;

(ඈ) 45අ වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයට හෝ (ආ) ඡේදයට අදාළ වන තාක් දුරට ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ වූ සෑම වරදකට;

(ඉ) 45අ වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ වූ සෑම වරදකට

ඇප දෙනු නොලැබිය යුතු අතර. එවැනි වරදක් සම්බන්ධයෙන් චෝදනා කරනු ලැබූ කිසිම තැනැත්තකුට කිසිම අවස්ථාවක දී ඇප දෙනු නොලැබිය යුතු ය.

(2) වෙනත් යම් නීතියක කුමක් සඳහන්ව ඇත ද—

(අ) 45අ වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ වූ සෑම වරදකට; සහ

(ආ) 45අ වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයට අදාළ වන තාක් දුරට, ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ වූ සෑම වරදකට

ඇප දෙනු නොලැබිය යුතු ය.

45 (1) (අ) වගන්තිය යටතේ වැරදි කිරීම සම්බන්ධයෙන් සැක කරනු ලැබූ හෝ චෝදනා කරනු ලැබූ තැනැත්තන් රඳවා තැබීම.

[1961 පාක 68§7]

48. 45 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ මරදක් කිරීම සම්බන්ධයෙන් යම් තැනැත්තකු සැක කරනු ලබ ඇති අවස්ථාවක, චෙනත් යම් නීතියක කුමක් සඳහන්ව ඇත ද පොලිස්පතිවරයා විසින් හෝ සහකාර පොලිස් අධිකාරිවරයකුගේ නිලයට පහළ නොවන නිලයක් දරන යම් පොලිස් නිලධරයකු විසින් හෝ මේ වගන්තියේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද යම් රඳවා තැබීමේ ස්ථානයක, ඒ තැනැත්තා විසින් තම නිර්දෝෂී භාවය තහවුරු කරනු ලබන තුරු හෝ 28(2) වන වගන්තිය ප්‍රකාර අමාත්‍යවරයා විසින් ඒ තැනැත්තා පිළිබඳව නියමයක් කරනු ලබන තුරු, ඒ තැනැත්තා රඳවා තබීමට ලියවිල්ලකින් බලය දීම නීත්‍යනුකූල වන්නේ ය:

එසේ වුවද යම් තැනැත්තකු අත්අඩංගුවට ගනු ලැබුවේ යම් දිනයක ද ඒ දිනයේ සිට සති දෙකක කාලයක් අවසානයේ දී ඒ තැනැත්තා, අත් අඩංගුවට්හි සිටින්නේ නම්, මහාම් ඔහු මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, උචිත යයි ඒ මහේස්ත්‍රාත්වරයා විසින් නියම කරනු ලබන යම් ආඥාවක් පරිදි රැඳීයට යුතු ය.

ඔප්පු කිරීමේ භාරය.

49. මේ පනත යටතේ හෝ ඒ ඡේදයේ සාදන ලද හෝ නිකුත් කරන ලද යම් නියෝගයක්, නියමයක්, විධානයක්, උපදෙසක් හෝ වෙනත් සාධන පත්‍රයක් යටතේ වූ යම් කටයුතු සම්බන්ධයෙන් හෝ මේ පනත යටතේ හෝ යම් නියෝගයක්, නියමයක්, විධානයක්, උපදෙසක් හෝ වෙනත් සාධන පත්‍රයක් ඡේදයේ කරන ලද වහ් කිරීමට යෝජනා කරන ලද යම් දෙයක් සම්බන්ධයෙන් යම් තැනැත්තකු විසින්—

(අ) ඔහු ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන බව; හෝ

(ආ) ඔහු ශ්‍රී ලංකාවේ පුරවැසියකු බව; හෝ

(ඇ) ඔහු ශ්‍රී ලංකාවේ පුරවැසියන් වන්නා වූ තැනැත්තන්ගේ යම් විශේෂ පංතියකට හෝ විස්තරයකට අයත් තැනැත්තකු බව; හෝ

(ඈ) ඔහු ශ්‍රීතාන්‍ය යටත් වැසියකු බව හෝ යම් විශේෂ රටක ජාතිකයකු බව

කියනු ලබන අවස්ථාවක, හාක්ෂි ආඥාපනතේ කුමක් සඳහන්ව ඇතද ඒ සිද්ධිය ඔප්පු කිරීමේ භාරය ඒ තැනැත්තා වෙත පැවරෙන්නේ ය.

50. කඩිර වූ නිලයක් දරන පොලිස් නිලධරයකු විසින් හෝ කොන්පරල්වරයකුගේ හෝ ප්‍රධාන කැමියකුගේ නිලශ්‍රේ පහළ නොවන නිලයක් දරන හමුදාවල බලයලත් සාමාජිකයකු විසින් හෝ ශ්‍රී ලංකාවේ අද්‍යතන ජල කිරයෙහි ඇති (ගුවන් යානාවක් නොවන) යම් නැවක් පෝදිසි කිරීම සහ 40(1) (අ) විගන්තියට හෝ 45අ විගන්තියට අදාළ වන තැන් දුරට 45(1) (අ) විගන්තිය සහ 45(2) විගන්තිය යටතේ යම් විරුද්ධ කිරීමේ සම්බන්ධයෙන් ඇ. කෙ කරනු ලබන ඒ නැවෙහි සිටින යම් කෙනෙක්හු සිර භාරයට ගැනීමේ සහ අත් අඩංගුවට ගැනීමේ නීත්‍යානුකූල වන්නේ ය.

සිර භාරයට ගැනීමේ කාර්යය සඳහා යම් නැවක් පෝදිසි කිරීමේ බලය. [1961 අංක 68 §6]

51. (1) 45අ විගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයෙහි හෝ (ආ) ඡේදයෙහි සඳහන් යම් විරුද්ධ කිරීමකින් ලා හෝ ඒ සම්බන්ධයෙන් යම් වාහනයක්, යාත්‍රාවක් හෝ වෙනත් ප්‍රවාහන ක්‍රමයක් ප්‍රයෝජනයට ගෙන ඇති බව විශ්වාස කිරීමට කවර වූ නිලයක් දරන පොලිස් නිලධරයකුට හෝ කොන්පරල්වරයකුගේ හෝ ප්‍රධාන කැමියකුගේ නිලයට පහළ නොවන නිලයක් දරන හමුදාවල සාමාජිකයෙකුට හෝ මේ විගන්තියෙන් ප්‍රවර්ධන ලද බල තල ක්‍රියාත්මක කිරීමට නියෝග මගින් බලය දෙනු ලැබූ කවුහුත් යම් නිලධරයකුට හේතු ඇති අවස්ථාවක. ඔහු විසින් ඒ වාහනය, යාත්‍රාව හෝ ප්‍රවාහණ උපක්‍රමය, එහි ඇති යම් උපකරණ සහ උපකාරක සමඟ තහනම්ව ගෙන රඳවා, තබන්නට ලැබිය හැකි ය.

45අ (1) (අ) විගන්තිය හෝ 45අ (1) (ආ) විගන්තිය යටතේ වැරදි කිරීම සම්බන්ධයෙන් ප්‍රයෝජනයට ගනු ලැබිය හැකි යැක කරනුලබන වාහන ආදිය පොලිසිය, හමුදාවල බලයලත් සාමාජිකයන් හෝ ඉල්ලා ලත් නිලධරයන් විසින් බොහෝවිට ගැනීම් සහ රඳවා තැබීම. [1961 අංක 68 §9]

[1918 අංක 58 §9]

(2) (1) වන උපවගන්තිය යටතේ තහනම්ව ගනු ලැබූ යම් වාහනයක්, යාත්‍රාවක් හෝ වෙනත් ප්‍රවාහණ උපක්‍රමයක් හෝ උපකරණ හෝ උපකාරක, ඒ තහනම්ව ගැනීම කරන නිලධරයා විසින් හෝ ඒ නිලධරයා හමුදාවල බලය ලත් යම් සාමාජිකයකු වන අවස්ථාවක, පොලිස් නිලධරයකු විසින් හෝ ඇති ඉක්මණින් නිති අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත් අධිකරණයක් වෙත ඉදිරි පත් කළ යුතු ය. නැතහොත් ඒ අධිකරණය විසින් පරීක්ෂා කිරීම සඳහා සලස්වා දෙනු ලැබිය යුතු අතර, එවිට එසේ තහනම්ව ගනු ලැබූ දේවල් සම්බන්ධයෙන් (1) වන උපවගන්තිය යටතේ පුදුස්සක් කරනු ලබන තෙක්, අධිකරණය විසින් ඒ දේවල භාරකාරත්වය සම්බන්ධයෙන් සුදුසු යයි සලකනු ලබන යම් ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(3) යම් කෙනෙත්තකුගේ සන්තකයේන් (1) වන උපවගන්තිය යටතේ තහනම්ව ගනු ලැබූ යම් වාහනයක්, යාත්‍රාවක් හෝ වෙනත් ප්‍රවාහන උපක්‍රමයක් හෝ උපකරණ හෝ උපකාරක නිසිවෙත්—

[1961 අංක 68 §9]

(අ) තහනම්ව ගැනීමෙන් පසුව සති හයක කාලයක් අවසන් වීමට පෙර කරනු ලැබුවේ යයි කියන ලද වරද සම්බන්ධයෙන් නඩු පැවරීමක් කරනු ලබා ඇත් නම්, ඒ නඩුය අතුත් වූ විට, නොපමාව ඒ කෙනෙත් හාට ආපසු භාර දෙනු ලැබිය යුතු ය;

[1961 අංක 68 § 9]

(ආ) රාජසන්තක කළ බවට සථා පරිදි ප්‍රකාශයක් කොට ඇත්නම් හෝ (4) වන උපවගන්තිය යටතේ විනාශ කප් යුතු බවට ආඥාවක් කරනු ලැබ ඇත්නම් මිස, නඩුව අවසාන වශයෙන් තීරණය කරනු ලැබීමෙන් පසුව නොපමාව ඒ තැනැත්තාට ආපසු භාර දෙනු ලැබිය යුතු ය.

[1961 අංක 68 § 9]

(4) (2) වන උපවගන්තිය යටතේ මහේෂ්ඛ්‍යාත් අධිකරණයක් වෙත ඉදිරිපත් කරන ලද තැතෙහෙත් ඒ අධිකරණය විසින් පරීක්ෂා කිරීම සඳහා සලස්වා දෙනු ලැබූ යම් වාහනයක්, යානාවක් හෝ වෙනත් ප්‍රවාහණ උපක්‍රමයක් හෝ උපකරණ හෝ උපකාරක කිසිවක්, 45අ වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය හෝ (ආ) ඡේදය යටතේ වරදක් කිරීමෙහි ලා හෝ ඒ සම්බන්ධයෙන් පංචවිධ කරනු ලැබූ බවට ඔප්පු කරනු ලැබූ අවස්ථාවක, ඒ වාහනය, යානාව හෝ උපකාරක රාජසන්තක කිරීම සඳහා හෝ විනාශ කිරීම සඳහා හෝ ඒ අධිකරණයේ විසින් ආඥාවක් කළ යුතු ය.

පනත යටතේ නඩු කටයුතුවලට අධිකරණයේ පුනුබන්ධය ලැබිය යුතු බව.
[1961 අංක 68§10]

51අ. (1) මේ පනත යටතේ යම් තැනැත්තකු විසින් කරනු ලැබුවේ යයි කියන ලද යම් වරදක් සම්බන්ධයෙන් යම් අධිකරණ යක ඇති නඩු කටයුතුවලට, වෙනත් කටයුතු සම්බන්ධයෙන් කලින් සුදුස්සක් කිරීම අවශ්‍යතාවය කරුණු අනුව අවශ්‍ය වන විට හැර ඒ අධිකරණයේ ඒ වරදත් කටයුතු අතිබලා පුම්ඛත්වය ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ වරදක් සම්බන්ධයෙන් චෝදනා කරනු ලැබූ තැනැත්තකුගේ නඩු විභාගය ආරම්භ කළ දින අවසන් කරනු ලබිය නොහැකි අවස්ථාවක, ඉන් ඉක්බිතිව ම එළඹෙන වැඩ කරන දින ඒ නඩුව නොකඩවා පවත්වා ගෙන යාම අවස්ථානුගත කරුණු අනුව කළ නොහැකි වන් හෝ අවශ්‍යතාවය කටයුතු සම්බන්ධයෙන් සුදුස්සක් කිරීම අවශ්‍ය වන අවස්ථාවක් හැර, ඉන් ඉක්බිතිව ම එළඹෙන වැඩ කරන දින ඒ නඩු විභාගය නොකඩවා පවත්වා ගෙන යා යුතු ය.

ඇතැම් වැරදි සම්බන්ධයෙන් දිවයිනෙන් පිටව යාමට ආඥාන්න තැනැත්තකුගේ යාක්මි.
[1961 අංක 68§10]

51ආ. (1) 45 (1) (අ) වගන්තිය යටතේ හෝ 45අ වගන්තියට අදාළ වන තාක් දුරට 45 (1) (අ) වගන්තිය හෝ 45 (2) වගන්තිය යටතේ වූ වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකුට විරුද්ධව චෝදනා කරනු ලබන අවස්ථාවක, දිවයිනෙන් පිටව යාමට ආඥාන්න වෙනත් යම් තැනැත්තකු විසින්, ඔහු කැමැත්තෙකි නම්, සමාදාන විනිශ්චයකාරවරයකු හෝ සහකාර පොලිස් අධිකාරිවරයකුගේ නිල යට පහළ නොවන නිලයක් දරන පොලිස් නිලධරයකු ඉදිරිපිට, වරද සම්බන්ධයෙන් චෝදනා කරනු ලැබූ තැනැත්තා පැමිණ සිටිය දී එම වරද සම්බන්ධයෙන් දිවරා හෝ ප්‍රතිඥා කොට ප්‍රකාශයක් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ ඒ ප්‍රකාශය කරනු ලබන්නේ යම් සමාදාන විනිශ්චයකාරවරයකු ඉදිරිපිට ද නැතහොත් යම් පොලිස් නිලධරයකු ඉදිරිපිට ද ඒ සමාදාන විනිශ්චයකාරවරයා හෝ පොලිස් නිලධරයා විසින්—

(අ) ඒ ප්‍රකාශය වාර්තාගත කළ යුතු ය;

(ආ) චුදිතයා ඉදිරියේ දී ප්‍රකාශය කරන තැනැත්තාට ඒ ප්‍රකාශය කියවා දිය යුතු ය;

(ඇ) චුදිතයාට ඒ ප්‍රකාශය තේරුම් කර දිය යුතු ය;

(ඈ) ප්‍රකාශය කරන තැනැත්තාගෙන් ප්‍රකාශයට අදාළ යම් ප්‍රශ්නයක් ඇසීමට සම්පූර්ණ අවස්ථාවක් චුදිතයාට සැලසිය යුතු ය;

(ඉ) ප්‍රකාශ කරන තැනැත්තා විසින් දෙනු ලබන උත්තර සමඟ ඒ ප්‍රශ්න වාර්තාගත කළ යුතු ය;

(ඊ) ප්‍රකාශය පිළිබඳ වාර්තාවට ප්‍රකාශය කරන තැනැත්තාගේ අත්සන ලබාගත යුතු ය; නමුදු

(උ) අවස්ථාවෝචිත වුවහොත්, මේ වගන්තියේ පිහිටුවන් අනුව කටයුතු කළ බවට සහතික කළ යුතු ය.

(3) යම් සමාදාන විනිශ්චයකාරවරයකුට හෝ සහකාර පොලිස් නිලධරයකුගේ නිලයට පහළ නොවන නිලයක් දරන පොලිස් නිලධරයකුට—

(අ) අම් වගන්තියට අනුකූලව ප්‍රකාශයක් කිරීමට කැමැති යම් තැනැත්තකුට දිවුරුම් ආඥාපනත යටතේ සාක්ෂිකරුවන් සඳහා බලය දෙනු ලැබූ ආකාරයකින් දිවුරුමක් හෝ ප්‍රතිඥාවක් කරවීමට; සහ

(ආ) ඉන් පසුව (2) වන උපවගන්තියේ විධිවිධාන යටතේ කටයුතු කිරීමට

ඔහුගෙන් බලය දෙවරනු ලැබේ.

(4) මේ වගන්තිය යටතේ සහතික කරනු ලැබූ ඕනෑ ලියා අදහස් කරෙරෙහි ප්‍රකාශයක්, වෙනත් යම් නීතියක විධිවිධානවල කුමක් සඳහන්ව ඇතද; අධිකරණය වෙත ඉදිරිපත් කළ හැකි අතර, 45(1) (අ) වගන්තියට හෝ 45අ වගන්තියට අදාළ වන තැන්දී 45(1) (අ) වගන්තිය හෝ 45(2) වගන්තිය යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් චෝදනා කරනු ලැබූ යම් තැනැත්තකුට විරුද්ධව සාක්ෂි වශයෙන් දෙනු ලැබිය හැකි ය. තව ද එය එසේ සඳහන් ඔද්ධිත් සම්බන්ධයෙන් බැලූ බැල්මේ සාක්ෂි වන්නේ ය.

නියෝග

52. (1) මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හෝ එහි ප්‍රතිපත්ති බලාත්මක කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය සියලු නියෝග අමාත්‍යවරයා විසින් සාදනු ලැබිය හැකි ය.

(2) විශේෂයෙන් ම සහ (1) වන උපවගන්තියෙන් පවරන ලද බලතලවලට හානියක් නොමැතිව, පහත ඇත්වෙන සියලු කරුණු හෝ ඉන් කිසිවක් සම්බන්ධයෙන් වූ නියෝග අමාත්‍යවරයා විසින් සාදනු ලැබිය හැකි ය:—

(අ) නියම කළ යුතු බවට මේ පනතෙහි සඳහන් සියලු කරුණු;

(ආ) මේ පනත යටතේ නියෝග සාදනු ලැබීමට නියමිත හෝ බලය දෙනු ලැබූ සියලු කරුණු;

(ඇ) 2(1) වන උපවගන්තියෙහි සඳහන් පංතිවලට හෝ විස්තරයකට අයත් නැතැත්තන් නොවන, මේ පනතේ විධිවිධාන කිසිවකින් නිදහස් කිරීමක් ප්‍රදානය කරනු ලැබිය හැකි පංතිවලට හෝ විස්තරයකට අයත් නැතැත්තන්;

(ඈ) යම් විශේෂ අවස්ථානුගත කරුණු අනුව මහජන යහපත සඳහා අවශ්‍ය යයි අමාත්‍යවරයා විසින් සලකනු ලබන යම් නියමයන්; කොන්දේසි හෝ පරිසීමාවන් අනුව, යම් නිදහස් කිරීම් ප්‍රදානය කරනු ලබන්නේ නියමයන්ට, කොන්දේසිවලට හෝ පරිසීමාවන්ට යටත්ව ද ඒ වාගේ ප්‍රමාණය සහ ඒ නියමයන්, කොන්දේසි සහ පරිසීමාවන්;

[1965 අංක 16 සි 24] (ඉ) මේ පනතේ කාර්ය සඳහා යම් තැනැත්තකු විභාග කිරීම සහ යම් ලේඛනයක් ඉදිරිපත් කිරීම, පරීක්ෂා කිරීම සහ මුද්දර මුද්‍රා තැබීම; සහ

[1965 අංක 16 සි 24] (ඊ) මේ පනතේ කාර්ය සඳහා නියෝගවල සඳහන් යම් පංතිය කට හෝ විස්තරයකට අයත් නැතැත්තාගෙන් හෝ නැතැත්තන්ගෙන් ඇතිලි සලකුණු ගැනීම.

(3) පාර්ලිමේන්තුව විසින් යම් නියෝගයක් අනුමත කරනු ලබනු හොත් ඒ නියෝගය බල සහිත නොවන්නේ ය, ඒ අනුමතය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබිය යුතු ය.

(4) යම් නියෝගයක අනුමත කිරීම පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබූ විට, ඒ නියෝගය මෙහි පහවනු ලැබූ බලය වලංගු සහ බල සහිත වන්නේ ය.

53. ශ්‍රී ලංකාවේ යම් ස්ථානයක සිට තවත් ස්ථානයකට නැවකින් ගමන් කරන යම් තැනැත්තකු, අවස්ථාවෝචිත පරිදි ශ්‍රී ලංකාවේ යම් ස්ථානයකින් නැව නැගීමේ දී හෝ යම් ස්ථානයකට ප්‍රවේශ වීමේ දී ඔහු ඒ නැවෙන් ගමන් කරන කාලය තුළ දී ඒ නැව ශ්‍රී ලංකාවෙන් පිටත යම් ස්ථානයක නොනවත්වූයේ නම් හෝ නොනවත්වන්නේ නම්, ඒ තැනැත්තා ශ්‍රී ලංකාවේ යම් ස්ථානයකින් නැව නැගීම හෝ යම් ස්ථානයකට ප්‍රවේශ වීම මේ පනතේ අඛංගු කිසිවකින් හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක, නියමයක, විධානයක, උපදේශයක හෝ වෙනත් සැඟෙන පත්‍රයක අඛංගු කිසිවකින් තහනම් කෙරෙන හෝ කවර වුවද ආකාරයකින් සීමා කෙරෙන බවක් නොසැලකිය යුතු අතර එසේ තේරුම් කොගත යුතු ය. ශ්‍රී ලංකාවේ ස්ථාන අතර ගමන්වලට පනත අදළ කොවිය යුතු බව.

54. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි— අර්ථ නිරූපණය,

"නියමිත දිනය" යන්නෙන් 1949 නොවැම්බර් මස 1 වන දිනය අදහස් වේ;

"සහකාර පාලකවරයා" යන්නෙන් සහකාර ආගමන හා විගමන පාලකවරයකු ලෙස හෝ එලෙස වැඩ බැලීමට 4 වන වගන්තිය යටතේ පත් කරනු ලැබූ යම් තැනැත්තෙක් අදහස් වේ;

"බලයලත් නිලධරයා" යන්නෙන් බලයලත් නිලධරයකු ලෙස හෝ එලෙස වැඩ බැලීමට පත් කරනු ලැබූ යම් තැනැත්තෙක් අදහස් වේ;

"ශ්‍රී ලංකාව" යන්නෙහි ශ්‍රී ලංකාවේ දේශීය ජල තීරය ඇතුළත් වේ; [1961 අ. 66 මු 11]

"ශ්‍රී ලංකාවේ පුරවැසියා" යන්නෙන් තත් කාලයෙහි බල පවත්නා යම් නීතියක් යටතේ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් අදහස් වේ;

"පාලකවරයා" යන්නෙන් ආගමන හා විගමන පාලකවරයා ලෙස හෝ එලෙස වැඩබැලීමට 4 වන වගන්තිය යටතේ පත් කරනු ලැබූ තැනැත්තා අදහස් වේ;

"විසඳම් සහ ගෙවිතු" යන්නෙන් ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන යම් තැනැත්තකු සම්බන්ධයෙන් වන විට, ඒ තැනැත්තාට ශ්‍රී ලංකාවෙන් පිටත්ව යාම සැලසීම හෝ එය පහසු කරවීම සඳහා රාජ්‍ය අරමුදල්වලින් විසඳම් කරනු ලැබූ යම් මුදලක් අදහස් වන අතර—

(i) ඔහුගේ සහනය, නඩත්තුව, ආරක්ෂාව හෝ ප්‍රතිකාර කිරීම සඳහා රාජ්‍ය අරමුදල්වලින් විසඳම් කරනු ලැබූ යම් මුදලක්; සහ

(ii) පොදු අරමුදල්වලින් හෝ ඇණවුම් මඟින් ආයතන කරනු ලබන යම් ප්‍රණාමසනාගයක් මඟින් හෝ පවත්වා ගෙන යනු ලබන යම් ඇරෝග්‍යශාලාවක දී, රෝගී වූ හෝ අනාථ වූ තැනැත්තන්ගේ සහනය

සඳහා වූ දාන ශාලාවක දී හෝ වෙනත් ආගන්තු ශාලාවක දී කරන ලද යම් සහනයක්, සඔත්තුවක්, ආරක්ෂාවක් හෝ ප්‍රතිකාරයක් සම්බන්ධයෙන් වූ විෂයම්

ඊට ඇතුළත් වේ.

[1955 අංක 16 සිට] "සැපෙන්නා" යන්නෙන් නඩත්තුව සහ ආධාරය සඳහා සම් පූර්ණයෙන් සහ කෙලින් ම වෙනත් යම් තැනැත්තකු කෙරෙහි සැපෙන—

(අ) ඔහුගේ භාර්යාව; හෝ

(ආ) ඔහුගේ හෝ ඔහුගේ භාර්යාවගේ මව/පියා හෝ සියා/ආච්චි; හෝ

(ඇ) ඔහුගේ හෝ ඔහුගේ භාර්යාවගේ අවිවාහක වූ හෝ වැන්දඹුවක් වූ හෝ දික්කසාද වූ දියණිය, මිණිබිරිය, සහෝදරිය හෝ ලේලිය; හෝ

(ඈ) ඔහුගේ හෝ ඔහුගේ භාර්යාවගේ වයස අවුරුදු විසි එකට අඩු වූ නැතහොත් ඒ වයස ඉක්ම වුවද ස්ථිර වශයෙන් ම අඛලතාවට පත්ව, තමා විසින් ම තම සැපීම සඳහා ගැනීමට නොහැකි පුත්‍රයා, මුණුබුරා, සහෝදරයා හෝ බෑණා

අදහස් වේ;

"නියෝජ්‍ය පාලකවරයා" යන්නෙන්, නියෝජ්‍ය ආඥාමන හා විඥාමන පාලකවරයා ලෙස හෝ එලෙස වැඩ බැලීමට 4 වන වගන්තිය යටතේ පත් කරනු ලැබූ තැනැත්තෙක් අදහස් වේ;

"පිළිතුරු" යන්නෙන් මේ කොටසේ III වන කොටස යටතේ ප්‍රදානය කරන ලද යම් පිළිතුරක් අදහස් වේ;

[1955 අංක 16 සිට] "දරන්නා" යන්න යම් ඕනෑ පත්‍රයක් සම්බන්ධයෙන් වන විට ඒ විසා පත්‍රය ප්‍රදානය කරනු ලැබුවේ හෝ නිකුත් කරනු ලැබුවේ යම් තැනැත්තකුට ද, ඒ තැනැත්තා අදහස් වේ;

"නෞකාධිපතිවරයා" යන්න නැවක් සම්බන්ධයෙන් වන විට, ඒ නැව භාරව සිටින, ඊට අණ දෙන හෝ එය පාලනය කරන තැනැත්තා අදහස් වේ;

"නාවික පිරිසේ සාමාජිකයා" යන්න නැවක් සම්බන්ධයෙන් වන විට, ඒ නැවේ ක්‍රියාකාරිත්වය හෝ සේවය සම්බන්ධයෙන් සේවයෙහි නියුක්ත කරනු ලැබූ යම් තැනැත්තෙක් අදහස් වේ;

"මගීයා" යන්නෙන් නැවේ නාවික පිරිසේ සාමාජිකයකු නොවන, ඒ නැවේහි ගමන් කරන හෝ ගමන් කිරීමට අපේක්ෂා කරන යම් තැනැත්තෙක් අදහස් වේ;

"සාම නිලධරයා" යන්නෙහි අපරාධ නඩු විධාන සංග්‍රහයෙහි දී ඇති අර්ථය ම ඇත්තේ ය;

"නැව" යන්නෙන් මනුෂ්‍යයන් හෝ දේපළ ප්‍රවාහනය කිරීමෙහි යාම සඳහා සාදන ලද යම් දෙයක් අදහස් වේ;

"ශ්‍රී ලංකාවේ දේශීය ජල තීරය" යන්නෙන් ජාතික රාජ්‍ය සහභාවේ සමුද්‍රීය කලාප පිළිබඳ පනත මගින් නිශ්චය කොට ඇති දේශීය ජල තීරය අදහස් වේ; [1981 අංක 59 (11)]

"විදේශ ගමන් බලපත්‍රය" යන්න ශ්‍රී ලංකාවේ පුරවැසි ශකු නොවන යම් තැනැත්තකු සම්බන්ධයෙන් වන විට—

(අ) ශ්‍රී ලංකාණ්ඩුව විසින් පිළිගන්නා ලද යම් ආණ්ඩුවක් විසින් හෝ ඒ වෙනුවෙන් ඔහුට නිකුත් කර ඇත්නා වූ ද;

(ආ) ඔහු හඳුනා ගැනීමට ප්‍රමාණවත් පෞද්ගලික විස්තර යක් ඇතුළත් වූ සහ ඔහුගේ ඡායාරූපය අඩංගු ඇත්නා වූ ද;

(ඇ) තත් කාලයෙහි බලපවත්නා වූ ද

විදේශ ගමන් බලපත්‍රයක ලක්ෂණ ඇති විදේශ ගමන් බලපත්‍රයක් හෝ හඳුනා ගැනීමේ වෙනත් යම් ලේඛනයක් අදහස් වේ;

"විසා පත්‍රය" යන්නෙන් මේ පනත යටතේ සාදන ලද නීතියෝග යටතේ ප්‍රදානය කරන ලද විසා පත්‍රයක් අදහස් වේ.

(2) මේ පනතේ හෝ ඒ යටතේ සාදන ලද හෝ නිකුත් කරන ලද යම් නීතියෝගයක, නීතිමයක, විධානයක, උපදෙසක හෝ වෙනත් සාධන පත්‍රයක නැවක් හෝ වරායක් සම්බන්ධයෙන් කරන ලද යම් සඳහනක හුවන් යානාවක් හෝ ගගන සංක්‍රාමණය වක් සම්බන්ධයෙන් කරන ලද සඳහනක් ඇතුළත් වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) (අ) යම් හුවන් යානාවකින් ශ්‍රී ලංකාවේ යම් ගගන සංක්‍රාමණ [1981 අංක 59 (11)]
ස්ථානයකට පැමිණෙන තැනැත්තකු, ඒ හුවන් යානාවෙන් නොවන අන්‍යාකාරයකින් ගගන සංක්‍රාමණයෙන් පිටවන තුරු, මේ පනතේ කාර්ය සඳහා ඒ තැනැත්තා ශ්‍රී ලංකාවට ඇතුල් වූ ලෙස හෝ ශ්‍රී ලංකාවට ගොන් එහු ලැබූ ලෙස සලකනු නොලැබිය යුතු ය.

(ආ) (i) (හුවන් යානාවක් නොවන) යම් නැවක මාර්ගස්ථ [1981 අංක 59 (11)]
මගියකු වශයෙන් ශ්‍රී ලංකාවේ දේශීය ජල තීරයට ඇතුල් වන තැනැත්තකු ඒ නැවෙන් පිටවන තුරු, මේ පනතේ කාර්ය සඳහා ඒ තැනැත්තා ශ්‍රී ලංකාවට ඇතුල් වූ ලෙස හෝ ශ්‍රී ලංකාවට ගොන් එහු ලැබූ ලෙස සලකනු නොලැබිය යුතු ය.

(ii) "මාර්ගස්ථ" මගියා යන්නෙන් ශ්‍රී ලංකාව හැර යම් රටක සිට ශ්‍රී ලංකාව හැර වෙනත් රටකට ඒ නැවෙන් ම ගමන් කරන මගියෙක් අදහස් වේ.

(iii) මේ පනත යටතේ වරදක් සඳහා වූ යම් නඩු පැවරීමක දී තැනැත්තකු මාර්ගස්ථ මගියකු බව ඔප්පු කිරීමේ භාරය එලෙස ප්‍රකාශ කරන තැනැත්තා වෙත ඇත්තේ ය.

(4) තත් කාලයෙහි බලපවත්නා I වන කොටස යටතේ වූ යම් නියමයක් ප්‍රකාර I වන කොටසේ සිව VII වන කොටස දක්වා වූ යම් කොටසක සමහරක් විධිවිධානවලින් එම්ණක් යම් තැනැත්තකු නිදහස් කරනු ලැබ ඇති අවස්ථාවක, ඔහු නිදහස් කර නොමැති ඒ කොටසේ එක් එක් විධානය "මේ කොටස අදාළ වන තැනැත්තා" යන සෙයුම් වෙනුවට "මේ වගන්තිය අදාළ වන තැනැත්තා" යන සෙයුම් ආදේශ කරනු ලැබූ ලෙස ඒ තැනැත්තා සම්බන්ධයෙන් බල පැවැත්විය යුතු ය.

පනතේ අර්ථ නිරූපණය.

55. මේ පනතේ විධිවිධාන, ජර්ගු ආඥාපනත, නිරෝධායන රෝග වැළැක්වීමේ ආඥාපනත හෝ තැනැත්තන් ශ්‍රී ලංකාවට ඇතුල් වීමට සහ ශ්‍රී ලංකාවෙන් පිටවීමට අදාළ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අතිරේක විය යුතු අතර, ඒ විධිවිධානවල බලය ඉන් කරවන්නක් නොවිය යුතු ය:

එසේ වුවද මේ පනතේ සහ එවැනි යම් ආඥාපනතක හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන අතර යම් ගැටුමක් හෝ අනනුකූලතාවයක් ඇති වුවහොත්, මේ පනතේ විධිවිධාන බල පැවැත්විය යුතු ය.

අන්තර්කාලීන විධිවිධාන.

56. (1) 1935 අංක 30 දරන මිදේශිකයන් ලියාපදිංචි කිරීමේ ආඥාපනත* ඉවත් කරනු ලැබුව ද, ඒ ආඥාපනතේ 5 වන වගන්තිය යටතේ සාදනු ලැබ, නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයෙහි බලාත්මකව පවත්නා රටින් නෙරපීමේ යම් ආඥාවක් මේ පනත් යටතේ කරන ලද රටින් නෙරපීමේ ආඥාවක් ලෙස සලකනු ලැබිය යුතු ය. තව ද, ඒ අනුව ඒ ආඥාව මේ පනත යටතේ වෙනස් කළ හැකි ය. නැතහොත් ප්‍රත්‍යාදිෂ්ට කළ හැකි ය. තව ද එසේ ප්‍රත්‍යාදිෂ්ට කරනු ලබන තුරු කොකඩවා වලංගුව බලපැවැත්විය යුතු ය.

(2) 1923 අංක 20 දරන මිදේශිය ගමන් බලපත්‍ර ආඥාපනත* ඉවත් කරනු ලැබුව ද,—

(අ) ඒ ආඥාපනතේ 5 වන වගන්තිය යටතේ සාදනු ලැබ නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයෙහි බලාත්මකව පවත්නා යම් නෙරපීමේ ආඥාවක් මේ පනත යටතේ කරන ලද නෙරපීමේ ආඥාවක් ලෙස සලකනු ලැබිය යුතු ය. තව ද ඒ අනුව ඒ ආඥාව මේ පනත යටතේ වෙනස් කළ හැකි ය. නැතහොත් ප්‍රත්‍යාදිෂ්ට කළ හැකි ය. තව ද, එසේ ප්‍රත්‍යාදිෂ්ට කරනු ලබන තුරු කොකඩවා වලංගුව බලපැවැත්විය යුතු ය.

* 1948 අංක 20 දරන පනතින් ඉවත් කරන ලදී.

(ආ) ඒ ආඥාපනත යටතේ සාදනු ලැබූ, නියමිත දිනයට පෙරාතුවම වූ දිනයෙහි බලාත්මකව පවත්නා නියෝග මේ පනතට අනනුකූල නොවන තාක් දුරට ඒවා මේ පනත යටතේ සාදනු ලැබූ ලෙස ඒ සමාන ආකාරයෙන් නොකඩවා බල පැවැත්විය යුතු ය. තවද ඒ නියෝග සංශෝධනය කිරීම්, වෙනස් කිරීම හෝ පරිච්ඡින්න කිරීම මේ පනත යටතේ වූ නියෝග මඟින් කරනු ලැබිය හැකි ය.

අත්සැලීම් අදාළ. [1955 අංක 16 සහ 39]

57. (1) ස්ථිර වාස අවසර පත්‍රවලට සහ තාවකාලික වාස අවසර පත්‍රවලට අදාළ ලිඛිත නීතියක විධිවිධාන කිහිවක් ඉවත් කරනු ලබුව ද පරිච්ඡින්න කරනු ලබුව ද නැතහොත් සංශෝධනය කරනු ලබුව ද, 1955 ජූනි මස 6 වන දිනට පෙර නිකුත් කරනු ලැබ, ඒ දිනයට පෙරාතුව ම වූ දිනයෙහි බලාත්මකව පවත්නා එවැනි යම් අවසර පත්‍රයක්, ඒ දිනයෙන් පසුව ඒ අවසර පත්‍රයේ කාලය කාල සීමාව සඳහා නොකඩවා බල පැවැත්විය යුතු අතර, ඉන් පසුව එහි බල පැවැත්ම අවසන් විය යුතු ය. තව ද, ඒ දිනයට පෙර ඒ අවසර පත්‍රවලට අදාළ වූ ලිඛිත නීතියේ විධිවිධාන ඒ දිනයට පෙර ඒවා අදාළ වූ ආකාරයෙන් ම ඒ දිනයෙන් පසුව ද, ඒ අවසර පත්‍රවල විලංගු කාල සීමාව තුළ ඒ අවසර පත්‍රවලට අදාළ විය යුතු ය.

(2) ස්ථිර වාස අවසර පත්‍රවලට සහ තාවකාලික වාස අවසර පත්‍රවලට අදාළ ලිඛිත නීතියෙහි විධිවිධාන කිහිවක් අත්හරිනු ලැබීම ප්‍රතිඵලය වන යම් සංශෝධනයක් සම්බන්ධයෙන්, අර්ථ නිරූපණ ආඥාපනතේ 6 වන වගන්තියේ (3) වන උපවගන්තිය යම් ඉවත් කිරීමක් සම්බන්ධයෙන් අදාළ වන ආකාරයෙන් ම ඒ සංශෝධනය ලට ද අදාළ විය යුතු ය.

191

පාඨලිඛිත්තුවේ පනාත් කෙවුම්පත්වල සහ කිකිවල වාර්ෂික දශක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත හැම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දශක මුද්‍රණ කෙරෙහි පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.



# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2015 අංක 7 දරන ආගාමික හා විගාමික (සංශෝධන) පනත

---

[සභතිකය සටහන් කළේ 2015 ජූනි මස 03 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2015 ජූනි මස 05 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

මිළ : රු. 4.00 සි. තැපැල් ගාස්තුව : රු. 10.00 සි.

(179)

# 2015 අංක 7 දරන ආගාමික හා විගාමික (සංශෝධන) පනත

[සභාගිකය සටහන් කළේ 2015 ජූනි මස 03 වැනි දින]

එල්.ඩී.—ඕ. 25/2013

(351 වන අධිකාරය වූ) ආගාමික හා විගාමික පනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

සුහුඩු නාමය.

1. මේ පනත 2015 අංක 7 දරන ආගාමික හා විගාමික (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

351 වන අධිකාරයට 35අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

2. (351 වන අධිකාරය වූ) ආගාමික හා විගාමික පනතේ 35 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කිරීම මගින් එකී පනත මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

*ගමන් බලපතු කාර්ය සඳහා ඇඟිලි සලකුණු ලබා ගැනීම.

35අ. ගමන් බලපත්‍ර නිකුත් කිරීම හෝ අලුත් කිරීම පවරන ලද අධිකාරිය විසින් ගමන් බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා හෝ ගමන් බලපත්‍රයක් අලුත් කිරීම සඳහා ඉල්ලීමක් කරන යම් පැනැත්තකුගෙන් ගමන් බලපත්‍රයට ඇතුළත් කිරීම සඳහා, ඇඟිලි සලකුණු ලබාගත හැකි ය.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

3. මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

2—PL 009027 -2850 (2015/04)

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් තෙවෑ පසුව එළඹෙන එක් එක් වර්ෂයේ සඳහා ඒවා ලබාගත හැකිය.

178

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2021 අංක 27 දරන ආගාමික හා විගාමික (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2021 නොවැම්බර් මස 12 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2021 නොවැම්බර් මස 12 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකි ය.

මිල : රු. 5.00

කැපැල් ගාස්තුව : රු. 15.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# 2021 අංක 27 දරන ආඥාමික හා විඥාමික (සංශෝධන) පනත

[සභාභිකය සටහන් කළේ 2021 නොවැම්බර් මස 12 වන දින]

එල්. ඩී.—ඕ. 24/2018

(351 වන අධිකාරය වූ) ආඥාමික හා විඥාමික පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:–

සුළුපිඩ නාමය

1. මේ පනත 2021 අංක 27 දරන ආඥාමික හා විඥාමික (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

351 වන අධිකාරයේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම

2. (351 වන අධිකාරය වූ ) ආඥාමික හා විඥාමික පනතේ 14 වන වගන්තිය පහත දක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :–

(1) එහි (1) වන උපවගන්තියේ "අවුරුදු දෙකක්" යන වචන වෙනුවට "අවුරුදු පහක්" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (2) වන උපවගන්තියේ "අවුරුදු දෙකක් ඉක්මවන එහෙත් අවුරුදු පහක් නොඉක්මවන" යන වචන වෙනුවට "අවුරුදු පහක් ඉක්මවන එහෙත් අවුරුදු දහයක් නොඉක්මවන" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(3) එහි (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :–


"(3අ) (අ) (1) වන සහ (2) වන උපවගන්තිවල නිශ්චිතව දක්වා ඇති කාලසීමා කවරක් වුව ද, ස්ථිර වාස වීසා පත්‍රයක කාලය අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි ය.

(ආ) (අ) ඡේදයේ කාර්යය සඳහා "ස්ථිර වාස වීසා පත්‍රයක්" යන්නෙන්, මේ පනත යටතේ සාදන ලද නියෝග යටතේ ප්‍රදානය කරන වීසා පත්‍රයක් අදහස් වේ.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

3. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

ඇමුණුම 02




# 1948 අංක 20 දරන ආගාමික හා විගාමික පනත

## 1956 ආගාමික හා විගාමික නියෝග

ඇ.ප.ඒ—ඒ. 69/49

1948 අංක 20 දරන ආගාමික හා විවාහික පනත

1948 අංක 20 දරන ආගාමික හා විවාහික පනතේ 48 වෙනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය අරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යවරයා විසින් පනවනු ලබා එම වගන්තිය යටතේ උත්තර ඇත්ති ලේඛනය සහ නියෝජිත ආරක්ෂිත නිලධාරීන විසින් අත්සන් කරන ලද නියෝග.

ජී. ද සොයිසා,
රාජ්‍ය අරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්.

1958 පෙබරවාරි මස 18 වෙනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 1958 ආගාමික හා විවාහික නියෝග ගනුවෙන් හැඳින්විය යුතු ය.

විසා පත්‍ර

2. පනතේ 10 වෙනි වගන්තිය අදාළ වන සහ ලංකාවට ඇතුළු වීමට අදහස් කරන සෑම සෑහැන්තකු එම වගන්තියේ (අ) ඡේදය අනුව දිනා පත්‍රයක් ලබා ගත යුතු ය යි මෙයින් නියම කරනු ලැබේ.

3. (1) පහත සඳහන් සෑහැන්තන්, එනම්—

(අ) ලංකාවට ඇතුළුවීමට බලය පවරන පිවිසුමක් සඳහා ඇතිමේ අභිප්‍රායෙන් ඇත්තේ නම්, 37 වෙනි නියෝගය යටතේ නිසුන් කරන ලද සඳහා සෑහීමේ සහතිකයක් දරන්න නම් සෑහැන්තකු හෝ;

(ආ) තම, උපන් දිනය සහ ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ නිවැරදි ඔහු සමග පැමිණෙන පියාගේ/මවගේ විලංගු විදේශ ගමන් බලපත්‍රයකට ඇතුළත් කොට තිබේ නම් සහ ඒ පියා/මව විසා පත්‍රයක් ලබා ගැනීම සඳහා ඉල්ලූ විගස ඒ සෙන් නිදහස් කර ඇති බව හැර ඒ පියා/මව ළඟ විසා පත්‍රයක් ඇත්තේ නම් වයස අවුරුදු දහසයට අඩු යම් සෑහැන්තකු;

පනතේ 10 වෙනි වගන්තියේ විධිවිධානවලින් නිදහස් කළ හැකි ය.

(2) පහත සඳහන් සෑහැන්තන්, එනම්—

(අ) වලංගු විදේශ ගමන් බලපත්‍රයක් සහ ඔහු අවසාන වශයෙන් සෑහැන්ත වූ රටවල නියෝජිත ආරක්ෂිත නිලධාරීන්ගේ

ඇති විට ඒ රටට ඇතුළුවීමට ඔහුට බලය පවරන වීසා පත්‍රයක් ලබා ඇත්තේ නම්, තීර්ව්‍යාජ සංචාරකයකු වන යම් තැනැත්තකු ;

(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රයක් සහ ඔහු අවිඥාන වශයෙන් යන්නා වූ රටෙහි වීසීමයක් ඒසේ නියමිත ව ඇති විට ඒ රටට ඇතුළුවීමට ඔහුට බලය පවරන වීසා පත්‍රයක් ලබා ඇත්තේ නම්, යම් කෙනෙක් මෙයකු වූ සහ ඒ නැව අනුමත කළ පොරොත්තු නොවූ හේතුවක් නිසා ලංකාවට ඇතුළු වී ලංකාවේ නැවතී සිටීමට අදහස් කරන යම් තැනැත්තකු ; හෝ

(ඇ) තමා පුරවැසියකු ව සිටින රටෙහි රජය විසින් නීතිගත් කරන ලද වලංගු විදේශ ගමන් බලපත්‍රයක් හෝ සමාන තැනීමේ ලියවිල්ලක් ලබා ඇත්තේ නම්, වෙන යම් රටක පුරවැසි භාවය අත්හැර දැමීමට හෝ හැකි වීමේ හේතුවෙන් පරමාධිපත්‍යයෙන් ලංකාවේ පුරවැසියකු වීම කෙළවර වී ඇති යම් තැනැත්තකු ; හෝ

(ඈ) ඉන්දීය රජය විසින් නීතිගත් කරන ලද වලංගු විදේශ ගමන් බලපත්‍රයක් හෝ සමාන තැනීමේ ලියවිල්ලක් සහ වලංගු සංක්‍රමණ ආඥාවක් ලබා ඇත්තේ නම්, ඉන්දීය සමූහාණ්ඩුවේ ජාතික, ශුද්ධ සහ ගුවන් ගමුදා ආඥාපනයක හිමිලියක් කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු වන යම් තැනැත්තකු ;

(ඉ) වලංගු විදේශ ගමන් බලපත්‍රයක් ලබා ඇත්තේ නම්, මහා රාජිණියගේ ලංකාවේ පිහිටි ජාතික, ශුද්ධ සහ ගුවන් ගමුදා ආඥාපනයක හිමිලියක් කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු වන යම් තැනැත්තකු ;

(ඊ) ඒ ගුවන්විව හෝ දරුවා ලබා වලංගු විදේශ ගමන් බල පත්‍රයක් තිබිය යුතු වීමේ නියමයෙන් මිදුනේ කර ඇති විට හැර ගුවන්විව හෝ දරුවා ලබා වලංගු විදේශ ගමන් බලපත්‍රයක් ඇත්තේ නම්, (ඉ) අනුවේදයේ සඳහන් යම් තැනැත්තකුගේ ගුවන්විව හෝ යැපෙන දරුවකු වන යම් තැනැත්තකු.

ලංකාවට ඇතුළුවීම සඳහා වීසා පත්‍රයක් තිබිය යුතු වීමේ නියමයෙන් නිදහස් කළ හැකි ය.

4. මේ නියෝග යටතේ නීතිගත් කරනු ලබන වීසා පත්‍ර පහත සඳහන් පන්තිවල වීය යුතු ය :—

(අ) සෘජ වීසා පත්‍ර.

(ආ) පැමිණීමේ වීසා පත්‍ර.

(ඇ) මාර්ගයේ වීසා පත්‍ර.

5. වීසා පත්‍ර දීමෙහි, නීතිගත් කිරීමේ හෝ දිර්ඝ කිරීමේ සාධාරණයන් සඳහා පහත සඳහන් තැනැත්තන්ගෙන් යම් කෙනෙකු නියමිත බලධාරියකු වීය යුතු ය :—

(අ) ආගමන හා විගමන පාලක.

(ආ) නියෝජ්‍ය ආගමන හා විගමන පාලකයෙක්.

(ඇ) සහකාර ආගමන හා විගමන පාලකයෙක්.

(ඈ) ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා ලේඛන සහකාර.

(ඉ) ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ලිපිකරු.

(ඊ) ලංකා රජය විසින්, වෙන යම් රටක රජයක් වෙත යවන සත් [illegible]

(උ) තුන්වන ලේකමාගේ තාත්ත්වයෙන් හෝ අදූ ලංකා විදේශ සේවයේ සාමාජිකයෙක්.

(ඌ) විදේශගත යම් ලංකා සංස්ථාපනි ඌන මණ්ඩලයක ප්‍රධාන ලිපිකරු.

(එ) එක්සත් රාජධානියේ, ඕස්ට්‍රේලියාවේ, කැනඩාවේ, පකිස්තානයේ, නවසීලන්තයේ හෝ දකුණු අප්‍රිකාවේ රජයේ විදේශ ගමන් බලපත්‍ර හෝ විසා පත්‍ර නිලධරයෙක්.

(ඒ) මාලදිවයින් රජයේ විදේශ ගමන් බලපත්‍ර නිලධරයා.

(ඔ) යාපනයේ පාලන දිස්ත්‍රික්කයේ රජයේ දිසාපති.

(ඕ) යාපනයේ පාලන දිස්ත්‍රික්කයෙහි ක්‍රියා කරන සහකාර රජයේ දිසාපති වරයෙක්.

(ක) යාපනයේ පාලන දිස්ත්‍රික්කයේ රජයේ දිසාපතිගේ කාර්යාල සහකරුවෙක්,

(ඛ) ඉන්දියානු සහ පකිස්තානු වැසියන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්.

(ග) ඉන්දියානු සහ පකිස්තානු වැසියන් ලියාපදිංචි කිරීමේ නියෝජ්‍ය කොමසාරිස්වරයෙක්.

(ඝ) තිරුවිරුපල්ලිහි ලංකා විගමන කොමසාරිස්.

(ඞ) තිරුවිරුපල්ලිහි ලංකා විගමන කොමසාරිස් කාර්යාලයේ ප්‍රධාන ලිපිකරු.

(ච) බොම්බායේ ලංකා වෙළෙඳ කොමසාරිස්.

6. විසා පත්‍රයක් සඳහා මූ නැමි ඉල්ලුම් පත්‍රයක් මෙහට ශ කොට ඇති පළමුවන උපලේඛනයෙහි දැක්වෙන "අ" සිට "ඇ" දක්වා වූ ආකෘති අතුරෙන් අවශ්‍යාවට උචිත ආකෘතියෙහි පිළියෙළ කොට නියමිත බලධරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, එයට අනුගත් කිරීමට නියමිත ගියයු තෝරතුරු එහි අඩංගු විය යුතු ය.

7. විශේෂ අවශ්‍යතා දැනගෙන් අඩු දරුවකු හෝ යැපෙන්නකු වෙනුවෙන් දෙමව්පියන්ගෙන් කෙනකු විසින් හෝ හෝ පරිදි පත් කරනු ලැබ නිවන හාරකරු විසින් විසා පත්‍රයක් සඳහා ඉල්ලුම් කළ හැකිය.

8. (1) යම් තැනැත්තකු සම්බන්ධයෙන් වීසා පත්‍රයක් සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කර ඇති විට ඉල්ලීම කර ඇත්තේ යම් තැනැත්තකු සඳහා ද ඒ තැනැත්තාගේ ඡායාරූපයෙන් හෝ ඇඟිලි සටහන්වලින් හෝ ඒ දෙකෙන්ම ද තමා විසින් නියම කරනු ලබන පිටපත් ගණනක් සපයන මෙන් නියෝජිත බලධරයා විසින් එම ඉල්ලීම කරන තැනැත්තාට නියම කළ හැකි ය.

(2) මේ නීතිගරුකයේ (1) වෙනි ඡේදය යටතේ සපයනු ලබන ඡායාරූපයක හෝ ඇඟිලි සටහන්වල සෑම පිටපතක් නියමිත බලධරයා විසින් නියම කරනු ලැබිය හැකි අන්දමින් සහතික කළ යුතු ය.

9. වීසා පත්‍රය දෙනු ලැබීමට, නිකුත් කිරීමට හෝ දීර්ඝ කිරීමට අදාළ වන්නේ ය යි නියමිත බලධරයා විසින් සලකනු ලැබිය හැකි තොරතුරු සපයන මෙන් හෝ ලියවිලි ඉදිරිපත් කරන මෙන්, වීසා පත්‍රයක් නිකුත් කර ඇති හෝ වීසා පත්‍රයක් දෙනු ලැබීම, නිකුත් කිරීම හෝ දීර්ඝ කිරීම සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කර ඇති යම් තැනැත්තකුට නියමිත බලධරයා විසින් නියම කළ හැකි ය.

10. (1) (අ) යම් තැනැත්තකු ශාසපත් චරිතයක් ඇත්තකු බවට නියමිත බලධරයා සෑහීමට පත් වී සිටී නම්;

(ආ) යම් තැනැත්තකු ලංකාවට ඇතුළු වන කාර්යය නියමිත බලධරයා විසින් අනුමත කරනු ලැබේ නම්;

(ඇ) යම් තැනැත්තෙක් තමාට ලංකාවට ඇතුළුවීමට ඉඩ සලසන වලංගු විදේශ ගමන් බලපත්‍රයක් දරන්නෙක් නම්; සහ

(ඈ) තමාට ලංකාවේ දී ගැනීමට සහ තමාට විදේශ ගමන් බලපත්‍රය නිකුත් කළ රටට ආපසු යෑම් සඳහා ගමන් ගාස්තු ගෙවීමට ප්‍රමාණවත් මුදල් යම් තැනැත්තකුට තිබෙන බවට නියමිත බලධරයා සෑහීමට පත් වී සිටී නම්,

එවැනි තැනැත්තකුට නියමිත බලධරයා විසින් වීසා පත්‍රයක් දිය හැකි ය, නොහොත් නිකුත් කළ හැකි ය.

(2) වීසා පත්‍රයක් දීම හෝ නිකුත් කිරීම සඳහා (1) වෙනි ඡේදයේ නිශ්චිත ව සඳහන් කොන්දේසිවලට අතිරේක ව, එය දීමේ හෝ නිකුත් කිරීමේ සූරව්‍ය කොන්දේසියක් වශයෙන්—

(අ) නියමිත බලධරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි මුදලක් නියමිත බලධරයා වෙත හෝ රජයේ විදෙස්ගතිවරයකු වෙත තැන්පත් කිරීමෙන්; හෝ

(ආ) නියමිත බලධරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි මුදලක් ගෙවීමට බැඳුම්කරගතක් ලියා අත්සන් කර දීමෙන්; හෝ

(ඇ) නියමිත බලධරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි [illegible] තැබීමෙන්

ඇප තබන ලෙස, වීසා පත්‍රය ඉල්ලුම්කරුට හෝ ඔහු වෙනුවෙන් නියමිත බලධරයා විසින් අනුමත කරනු ලබන තැනැත්තකුට නියම කළ හැකි ය.

(3) (2)වෙනි ඡේදයේ විධිවිධාන යටතේ බූ ඇප තැබීම කර ඇති යම් තැනැත්තකුට දෙන ලද හෝ නිකුත් කරන ලද යම් වීසා පත්‍රයක යම් නියමයක් හෝ කොන්දේසියක් කඩ කළ හෝ ඉටු නො කළ අවස්ථාවක් ඇති බූ බව, එවැනි යම් ඇපයක සම්බන්ධයෙන් ඉන් යම් කොටසක් රාජ්‍ය සන්තක කළ යුතු ය.

11. 1955 අංක 18 දරන ආගමික හා සීමාමික (සංශෝධන) පනත වලංගු වූ දිනයට පෙර නිකුත් කරන ලද සහ ඒ දිනයෙන් පසු ව වලංගු ව පවතින යම් වීසා පත්‍රයක් හෝ තාවකාලික වීසා අවසර පත්‍රයක් දීම සම්බන්ධයෙන් යම් තැනැත්තකු විසින් තබන ලද යම් ඇපයක සම්බන්ධයෙන් ම හෝ ඉන් යම් කොටසක්,—

(අ) ඒ වීසා පත්‍රයෙහි හෝ අවසර පත්‍රයෙහි, හෝ

(ආ) ඒ ඇපය තැබීමට ලියා අත්සන් කර දෙන ලද බැඳුම්කර යෙහි

යම් නියමයක් හෝ කොන්දේසියක් පිළිබඳ යම් කඩ කිරීමක් හෝ ඉටු නො කිරීමක් ඇති බි නීතිඥ නාම, නියමිත බලධරයා විසින් රාජ්‍ය සන්තක කිරීම සම්බන්ධයෙන් විය යුතු ය.

12. පනතේ 11 (2) වෙනි විගාන්තියේ සඳහන් යම් තැනැත්තකුට—

(අ) ඒ තැනැත්තා අනාතුරුදාගත ළදෙස රෝගී ව අප්‍රමාද ව වෛද්‍ය ප්‍රතිකාර අවශ්‍ය බි බිවීන අවස්ථාවක දී ; හෝ

(ආ) ඒ තැනැත්තාට වීසා පත්‍රයක් දෙන ලෙස හෝ නිකුත් කරන ලෙස ඇමතිවරයා විසින් විධාන කරනු ලබන අවස්ථාවක දී හැර,

ලංකාවට ඇතුළුවීම සඳහා කිසි ම වීසා පත්‍රයක් නො දිය යුතු ය, නොහොත් නිකුත් නො කළ යුතු ය.

13. (1) වීසා පත්‍ර පිළිබඳ ව යෙදිය යුතු ගාස්තු පහත සඳහන් පරිදි විය යුතු ය:—

| | රු. ශ. |
|---|---|
| (අ) වෘත්ත වීසා පත්‍රයක් දීම හෝ නිකුත් කිරීම පිණිස (එක් එක් දොළොස් මස් කල ඕමංවිකට හෝ ඉන් කොටසකට) ... ... | 2. 00 |
| (ආ) සැමියන්ගේ වීසා පත්‍රයක් දීම හෝ නිකුත් කිරීම පිණිස ... ... ... | 2. 00 |
| (ඇ) මාථමස්ථ වීසා පත්‍රයක් දීම හෝ නිකුත් කිරීම පිණිස ... ... ... | 1. 00 |

එසේ වුව ද—

(අ) තානාපති හෝ කිල විදේශ ගමන් බලපත්‍රයක් දරන්නා වූ ; හෝ

(ආ) තමාගේ විදේශ ගමන් බලපත්‍රයෙහි වලංගු තානාපති හෝ කිල පිවහනක් දරන්නා වූ

යම් තැනැත්තකුට වීසා පත්‍රයක් දීම හෝ නිකුත් කිරීම සඳහා කාන්තුවක් හෝ කෙවිය යුතු ය.

(2) (1) වෙනි ඡේදයෙහි පටහැනි වී කුමක් සඳහන් ව ඇත ද එය සෙ සලකා—

(අ) (ලංකාව නොවන) යම් රටක රටවැසියකු විසින් පැමිණිලි මේ විසා පත්‍රයක් හෝ මැරිහෝඩ් විසා පත්‍රයක් සඳහා, ලංකාවේ ධුරාවැසියකු ඒ රටේ විසා පත්‍රයක් සඳහා හෙවී මට මැදී සිටින ඉඩදලට නොවැඩි ඉඩදලක් ගෙවිය යුතු යයි නියම කළ හැකි ය; තවද

(ආ) ලංකා රජය වෙනුවෙන් හවහන් රජයක නියෝජිතයකු විසින් පැමිණිලිමේ විසා පත්‍රයක් හෝ මැරිහෝඩ් විසා පත්‍රයක් යම් පැහැන්තකුට දෙනු ලබන හෝ නිකුත් කරනු ලබන අවස්ථාවක දී, දෙරජය අතර නියම කර ගනු ලබන යම් ඉඳලක් ඒ විසා පත්‍රය සඳහා ගෙවීමට ඒ පැහැන්තාට නියම කළ හැකි ය.

14. යම් පැහැන්තකුට එක් ගමනක් හෝ ගමන් ගණනක් සඳහා වාහ විසා පත්‍රයක් දිය හැකි ය, නොහොත් නිකුත් කළ හැකිය.

15. යම් පැහැන්තකුට විසා පත්‍රයෙහි සිඟ්වීම ව සඳහන් කරනු ලැබිය හැකි පරිදි වූ හය මසකට නොවැඩි කාල සීමාවක් සඳහා පැමිණිමේ විසා පත්‍රයක් දිය හැකි ය, නොහොත් නිකුත් කළ හැකි ය.

16. ලංකාව හරහා ගමන් කරන පැහැන්තකුට, විසා පත්‍රයෙහි සිඟ්වීම ව සඳහන් කරනු ලැබිය හැකි පරිදි වූ එක් මසකට අඩාල වැනි කාල සීමාවක් සඳහා මැරිහෝඩ් විසා පත්‍රයක් දිය හැකි ය, නොහොත් නිකුත් කළ හැකි ය.

17. මෙම නීතියේ ඉහ යටතේ යම් පැහැන්තකුට දෙනු ලබන හෝ නිකුත් කරනු ලබන සෑම විසා පත්‍රයක්ම ඒ පැහැන්තා සතු ව ඇති, වලංගු ගමන් බලපත්‍රය අවලංගු වන දිනයෙහ වන පසිද්දෙන් දිය යුතු ය, නොහොත් නිකුත් කළ යුතුය.

18. යම් පැහැන්තකු අවශ්‍යතා වශයෙන් යන්නා වූ යම් රටක නීතියෙන්, ඒ රටට ඇතුළුවීමට බලය පවරන විසා පත්‍රයක් ඒ පැහැන්තා ළඟ තිබිය යුතු ය යි නියමිත ව ඇති විට ඒ රටේ නීතියෙන් නියමිත පරිදි ඔනු ලබ විසා පත්‍රයක් ඇතහොත් මිස, ඒ පැහැන්තාට මැරිහෝඩ් විසා පත්‍රයක් සහ දිග යුතු ය නොහොත් නිකුත් කළ යුතු ය.

19. (1) සෑම විසා පත්‍රයක් ම, අවසානවිට උච්ච පරිදි, මෙයට සහ කොට ඇති පළමුවන උපලේඛනයෙහි ඇතුළත් "අ" ආකෘතියට හෝ "අ1" ආකෘතියට සාරාංශකල විය යුතු ය.

(3) කැම යැමිණීමේ විසා පත්‍රයක් ම, අවසථාවට උචිත පරිදි, මෙයට සා සකොට ඇති පළමුවන උපලේඛනයෙහි දක්වෙන " ඉ " ආකෘතියට හෝ " ඉ 1 " ආකෘතියට හැරුනුකල විය යුතු ය.

(3) කැම ඉර්ගෙඩ විසා පත්‍රයක් ම, අවසථාවට උචිත පරිදි, මෙයට සා සකොට ඇති පළමුවන උපලේඛනයෙහි දක්වෙන " ඊ " ආකෘතියට හෝ " ඊ 1 " ආකෘතියට හැරුනුකල විය යුතු ය.

20. (1) නියමිත බලධරයා විසින් තමාගේ පරම අභිමතය අනුව විසා පත්‍රය හෝ එහි නිශ්චිත ම සඳහන් යම් නියමයක් හෝ කොන්දේසියක් අවලංගු කිරීම, වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම කළ හැකි බව සෑම විසා පත්‍රයක ම කොන්දේසියක් විය යුතු ය.

(2) නියමිත බලධරයා විසින් යම් විසා පත්‍රයක් අවලංගු කරන, වෙනස් කරන හෝ සංශෝධනය කරන අවසථාවක දී, අවසථානුගෝචිත පරිදි ඒ අවලංගු කිරීම, වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම පිළිබඳ දැන්වීමක් ඒ විසා පත්‍රය දරන්නා වෙත බාර දීමට හිතු විසින් සැලැස්විය යුතු ය.

21. නියමිත බලධරයා හෝ ඔලය ලත් නිලධරයකු විසින් එහේ කිරීමට නියම කරනු ලැබූ කවර අවසථාවක දී වුවත් විසා පත්‍රය දරන්නා විසින් තමාගේ විදේශ ගමන් බලපත්‍රය සහ විසා පත්‍රය ඉදිරිපත් කළ යුතු බව හෝ ඉදිරිපත් කිරීමට සැලැස්විය යුතු බව කැම විසා පත්‍රයක ම කොන්දේසියක් විය යුතු ය.

22. (අ) විසා පත්‍රය දරන්නා, ඔහු ලංකාවේ තැවති සිටින කාලය තුළ දී වැටුප් ලබන හෝ සොලබන යම් රැකියාවක හෝ වෙළෙඳාමක හෝ ව්‍යාපාරයක නො යෙදිය යුතු බවට, හෝ

(ආ) විසා පත්‍රය දරන්නා, නියමිත බලධරයාගෙන් ප්‍රකාශිත ව ම ලබන ලද ලිඛිත අවසරය නොමැති ව විසා පත්‍රයෙහි නිශ්චිතව සඳහන් වන්නක් නොවන යම් රැකියාවක, වෙළෙඳාමක හෝ ව්‍යාපාරයක නො යෙදිය යුතු බවට,

නියමිත බලධරයා විසින් නිසිමිනින සැලැස්විය හැකි බව සෑම විසා පත්‍රයක ම කොන්දේසියක් විය යුතු ය.

23. විසා පත්‍රය දරන්නා, ඔහු ලංකාවේ තැවති සිටින කාලය තුළ දී වැටුප් ලබන හෝ නො ලබන යම් රැකියාවක හෝ යම් වෙළෙඳාමක හෝ ව්‍යාපාරයක නො යෙදිය යුතු බව සෑම සැම්ඡීමේ විසා පත්‍රයක ම සහ සෑම ඉර්ගෙඩ් විසා පත්‍රයකම කොන්දේසියක් විය යුතු ය.

24. සෑම විසා පත්‍රයක ම විලංගු තැවය—

(අ) ඒ සඳහා ගෙවය යුතු ලද හෝ නිකුත් කරන ලද කාල සීමාව අවසානය වූ විට හෝ

(ආ) ඒ විසා පත්‍රය දෙන ලද හෝ නිකුත් කරන ලද කාර්යය අවසානය වූ විට; හෝ

(අ) ඒ විසා පත්‍රය දීම හෝ නිකුත් කිරීම යටත් කරනු ලැබූ යම් නියමයක් හෝ කොන්දේසියක් අවශ්‍ය වූ විට ; හෝ

(ආ) ඒ විසා පත්‍රය දීම හෝ නිකුත් කිරීම යටත් කරනු ලැබූ යම් නියමයක් හෝ කොන්දේසියක් ඉටු නොකරනු ලැබූ හෝ කඩ කරනු ලැබූ විට,

කෙළවර විය යුතු ය.

25. දරුවකුට ඉපදෙන විට හෝ නිකුත් කරන ලද විසා විසා පත්‍රයක වලංගු භාවය ඒ දරුවා වයසින් අවුරුදු දහසයට එළඹි පසු කෙළවර විය යුතු ය :

එසේ වුව ද ඒ සඳහා කරනු ලබන ඉල්ලීමක් පිට නියමිත බලධාරියා විසින් ඒ විසා පත්‍රයෙහි කාල සීමාව දිගු කරනු ලැබුව හොත් ඒ දිගු කරන ලද කාලය සඳහා ඒ විසා පත්‍රය වලංගු වී පවතිය යුතු ය.

26. යම් තැනැත්තකුට නිකුත් කරන ලද බහු විසා පත්‍රයක වලංගු භාවය කෙළවර වූ විට, ඒ තැනැත්තා විසා පත්‍රයක් දරන්නකු වීම නිසා ම ඒ තැනැත්තාගේ භාණ්ඩවල/ශ්‍රවම් සුරුඹයාට හෝ යැපෙන්නකුට දී ඇති හෝ නිකුත් කර ඇති යම් විසා පත්‍රයක් වෙ නම් එහි ද වලංගු භාවය කෙළවර විය යුතු ය.

## පනතේ III වෙනි කොටස යටතේ පිටසන්

27. පනතේ III වෙනි කොටස යටතේ වූ සෑම පිටසනක්, අවස්ථාවට උචිත පරිදි, මේයට යා කොට ඇති පළමුවන උපලේඛනයෙහි දක්වෙන "ඒ" සිට "ඒ 2" දක්වා වූ ආකෘතියකට සාරාංශගත විය යුතු ය.

28. විදේශ ගමන් බලපත්‍රයක් දරන්නකුට පිටසනක් දීම සඳහා පූර්ව කොන්දේසියක් වශයෙන් ඇපයක් තැබිය යුතු යයි මුලය පත් නිලධරයකු විසින් 13 (3) වෙනි වගන්තිය යටතේ නියම කරනු ලැබූ අවස්ථාවක, නිලධරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි රුපියල් පත් සියයකට අනාවැකි මුදලක් තැන්පත් කිරීමෙන් හෝ ඒ මුදල ගෙවීමට බැඳීමකරයක් ලියා අත්සන් කර දීමෙන් හෝ ඒ මුදල් සඳහා නිශ්චල දේපළ යටවත් කොට බැඳ තැබීමෙන් ඒ ඇපය තැබිය යුතු ය.

29. පිටසනෙහි නිශ්චිත ව සඳහන් කාලසීමාව අතුලත දී පාලක වෙත හෝ පෙනී සිටීමේ කොන්දේසිය පිට, බලයලත් නිලධරයකු විසින් විදෙස ගමන් බලපත්‍රයක් දරන්නාට පිටසනක් නිකුත්කළ හැකිය.

30. පනතේ 11 (2) වෙනි වගන්තියෙහි සඳහන් යම් තැනැත්තකුට—

(අ) ඒ තැනැත්තා අනාතුරුදායක ලෙස රෝහි ව අලුතෙන් ප්‍රතිසාධන අවශ්‍ය වී සිටියහ අවස්ථාවක දී ; හෝ

(ආ) ඒ තැනැත්තාට පිටසනක් දෙනා ලෙස ඇමතිවරයා විසින් විධාන කරන අවස්ථාවක දී හැර,

කිසි පිටසනක් නො දිය යුතු ය.

31. පනත යටතේ දෙන ලද යම් පිටසනක් සම්බන්ධයෙන් ආඥාඥා පාලක විසින්—

(අ) ඒ පිටසනා දෙන ලද කාල සීමාව දිර්ඝ කිරීම සැහෙන්නේ සීමා කිරීම ; හෝ

(ආ) ඒ පිටසනා දීම යටතේ කරනු ලැබූ යම් නියමයක් හෝ කොන්දේසියක් අවලංගු කිරීම, වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම,

කළ හැකි ය.

32. පිටසනා දෙනු ලැබූ තැනැත්තා ඔහු උංකුවේ නැවතී සිටින කාලය තුළ දී, නියමිත බලධරයා විසින් ඔහුට දෙන ලද හෝ නිකුත් කරන ලද විසා පත්‍රයෙන් එහේ කිරීමට බලය පවරා ඇතහොත් මිස, වැටුප් ලබන හෝ තොලබන යම් රැකියාවක, හෝ යම් ව්‍යාපාරයක හෝ වෙළෙඳාමක නො යෙදිය යුතු බව සැම පිටසනක ම කොන්දේසියක් විය යුතු ය.

33. යම් තැනැත්තකුට දී ඇති හෝ නිකුත් කර ඇති මිනා පත්‍රය වඩා දිර්ඝ කාලයක් ලංකාවේ නැවතී සිටීමට ඔහුට බලය පවරතොත් මිස, නිකුත් කළ දින සිට හය මසකට වැඩි වූ යම් කාල සීමාවක් සඳහා ඒ තැනැත්තාට කිසි ම පිටසනක් නිකුත් නො කළ යුතු ය.

34. මේ නියෝග යටතේ යම් තැනැත්තකුට නිකුත් කරනු ලබන සැම පිටසනක් ඒ තැනැත්තා සතු නිදේශ ගමන් බලපත්‍රය අවසාන වීමට යටත් පිරිසෙයින් සදමසකටවත් කලින් වූ දිනයක අවසාන වන පරිද්දෙන් දිය යුතු ය.:

එහෙත් මුව ද පිටසනා නිකුත් කරන බලධාරීන් නිලබරයා විසින් අභාමාන්‍ය හැටි සලකනු ලබන තත්ත්වයන් යටතේ දී, පිටසනා දෙනු ලබන තැනැත්තා සතු නිදේශ ගමන් බලපත්‍රය අවසාන වන දිනයට පසු නොවන දිනයක දී අවසාන වන පරිදි පිටසනක් දිය හැකි ය.

35. පිටසනාක් සම්බන්ධ සැම දිර්ඝ කිරීමක් මෙයට යා කොට ඇති පළමුවන උපලේඛනයෙහි දක්වෙන "උ" ආකෘතියට සකසනු ලැබිය යුතු ය.

නිදේශ ගමන් බලපත්‍ර, හදිසි සහතික සහ ගමනා ගැනීමේ සහතික

36. නිදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීමේ හෝ අලුත් කිරීමේ කාර්යය සඳහා පහත සඳහන් තැනැත්තන්ගෙන් යම් කෙනකු නියම බලධරයකු විය යුතු ය :—

(අ) ආගමන හා විගමන පාලක.

(ආ) නියෝජ්‍ය ආගමන හා විගමන පාලකයෙක්.

(ඇ) සහකාර ආගමන හා විගමන පාලකයෙක්.

(ඈ) ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා ඉල්ලන සහකාර.

(ඉ) ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ලිපිකරු.

(ඊ) ලංකා රජය මඟින් වෙනත් යම් රජයක් වෙත පත් කර යවනු ලැබූ තානාපතිතෙක්.

(උ) තුන්වන ලේකඩගේ තත්ත්වයට නොඅඩු ලංකා විදේශ සේවයේ සාමාජිකයෙක්.

(ඌ) විදේශගත යම් ලංකා තානාපති දූත මණ්ඩලයක ප්‍රධාන ලිපිකරු.

(එ) කොමන්වෙල්ත් ලංකා වෙළෙඳ කොමසාරිස්.

(ඒ) එක්සත් රාජධානි රජයේ විදේශ ගමන් බලපත්‍ර හෝ විසා පත්‍ර නිලධරයෙක්.

37. (1) පනතේ VII වෙනි කොටස අදාළ වන්නා වූ හෝ ඉන්දියා දේවි, පකිස්තානයට, මලයාසු ඒකාබද්ධ රාජ්‍යයට, සිංගප්පූරුවට, බ්‍රූනියට හෝ බෝර්නියෝ වට යනට අදහස් කරන්නා වූ ලංකා පුර වැසියකු වෙත පනතේ 36 වෙනි වගන්තියේ අනුරූ විධානයේ කාර්යයන් සඳහා නිකුත් කරනු ලබන සහතිකය (ඒ සහතිකය මින් මතු මෙහි "හදිසි සහතිකය" යනුවෙන් හඳහන් කරනු ලැබේ) "එ" ආකෘතියෙහි විය යුතු ය.

හදිසි සහතිකයක් පහත සඳහන් නිලධරයන්ගෙන් යම් කෙනකු විසින් නිකුත් කළ යුතු ය :—

(අ) ආගමන හා විගමන පාලක.

(ආ) නියෝජ්‍ය ආගමන හා විගමන පාලකයෙක්.

(ඇ) තහකාර ආගමන හා විගමන පාලකයෙක්.

(ඈ) ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා ලේඛන නිලධාරි.

(ඉ) ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ලිපිකරු.

(ඊ) යාපනයේ පාලන දිස්ත්‍රික්කයේ රජයේ දිසාපති.

(උ) යාපනයේ පාලන දිස්ත්‍රික්කයෙහි ක්‍රියා කරන සහකාර රජයේ දිසාපතිවරයෙක්.

(ඌ) යාපනයේ පාලන දිස්ත්‍රික්කයේ රජයේ දිසාපතිගේ කාර්යාල සහකරුවෙක්.

(එ) ලංකා රජය විසින් වෙන යම් රටක රජයක් වෙත පත් කර යවනු ලැබූ තානාපතිතෙක්.

(ඒ) තුන්වන ලේකඩගේ තත්ත්වයට නොඅඩු ලංකා විදේශ සේවයේ සාමාජිකයෙක්.

(ඔ) විදේශගත යම් ලංකා තානාපති දූත මණ්ඩලයක ප්‍රධාන ලිපිකරු.

(ඕ) කොමන්වෙල්ත් ලංකා වෙළෙඳ කොමසාරිස්.

(2) පනතේ VII වෙනි කොටස අදාළ වන්නා වූ හෝ, සහතිකය නිකුත් කිරීමට බලය පවරා ඇති නිලධරයා ප්‍රමාණවත් යයි සලකන යම් හේතුවක් නිසා සෑහෙන කාල සීමාවක් ඇතුළත ජාතික විදේශ ගමන් බලපත්‍රයක් ලබා ගැනීමට අපොහොසත් වී සිටින යම් තැනැත්තකුට පනතේ 36 වන වගන්තියේ අනුරූ විධානයේ කාර්යයන් සඳහා නිකුත් කරනු ලබන සහතිකය (ඒ සහතිකය මින් මතු මෙහි "හදිසි සහතිකය" යනුවෙන් හඳහන් කරනු ලැබේ.) "ඒ" ආකෘතියෙහි විය යුතු ය.

භාෂාය හැකිමේ සහතිකයක් පහත සඳහන් නිලධරයන්ගෙන් යම් කෙනෙකු විසින් නිකුත් කළ යුතු ය :—

(අ) ආගමන හා විගමන පාලක.

(ආ) නියෝජ්‍ය ආගමන හා විගමන පාලකයෙක්.

(ඇ) සහකාර ආගමන හා විගමන පාලකයෙක්.

(ඈ) ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා ලේඛන සහකාරි.

(ඉ) ඉන්දියානු සහ පකිස්තානු වැසියන් ලියාපදිංචි කිරීමේ කොමිසාරිස්.

(ඊ) ඉන්දියානු සහ පකිස්තානු වැසියන් ලියාපදිංචි කිරීමේ නියෝජ්‍ය කොමිසාරිස්වරයෙක්.

(උ) ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන පිළිකරු.

38. විදේශ ගමන් බලපත්‍රයක්, හදිසි සහතිකයක් හෝ භාෂාව හැකිමේ සහතිකයක් සඳහා වූ සෑම ඉල්ලුම් පත්‍රයක් පිළිවෙළින් මෙහට යා කොට ඇති පළමුවන උපලේඛනයෙහි දැක්වෙන "අ", "ආ" සහ "ඇ" යන ආකෘති වලට සාරාංශකුල විය යුතු අතර, අවශ්‍යතාවට උචිත පරිදි නියම බලධරයා වෙත හෝ නියමිත නිලධරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

39. වයස අවුරුදු දහසයට අඩු දරුවකු හෝ ශ්‍රීපෙන්නාකු වෙනුවෙන් මවුපියන්ගෙන් හෝ යම් පරිදි පත් කරනු ලැබූ භාරකරුවකු විසින් විදේශ ගමන් බලපත්‍රයක්, හදිසි සහතිකයක් හෝ භාෂාව හැකිමේ සහතිකයක් සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ හැකි ය.

40. නියම බලධරයා හෝ සුදුසු නියමිත නිලධරයා විසින්, විදේශ ගමන් බලපත්‍රයක්, හදිසි සහතිකයක් හෝ භාෂාව හැකිමේ සහතිකයක් නිකුත් කිරීමේ හෝ අලුත් කිරීමේ පූර්ව කොන්දේසියක් වශයෙන්, ඉල්ලුම්කරු පිළිබඳ ව දරනු ලැබිය හැකි ශ්‍රේයසු විෂයෙහි රජයට ආරක්ෂා ගෙවීම සඳහා ඒ බලධරයා හෝ නිලධරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි මුදල් ගණන ඒ බලධරයා හෝ නිලධරයා සහ රජයේ දිනපතිවරයකු වෙත තැන්පත් කිරීමෙන් හෝ ඒ මුදල් ගෙවීමට ඇපකරුවෙක් ලියා අත්සන් කර දීමෙන් හෝ එසේම නිශ්චය කරනු ලැබිය හැකි වචනානුකූලව යුත් නිශ්චල දේපළ යටවත් කොට බැඳ තැබීමෙන් ඇප තබන ලෙස ඉල්ලුම්කරුවකුට හෝ ඔහු වෙනුවෙන් ඒ බලධරයා හෝ නිලධරයා විසින් අනුමත කරනු ලබන තැනැත්තකුට නියම කළ හැකි ය.

41. සෑම විදේශ ගමන් බලපත්‍රයක් ම මෙයට යා කොට ඇති පළමුවන උපලේඛනයෙහි දැක්වෙන "ඉ" ආකෘතියට සාරාංශකුල විය යුතුය.

42. ඇමතිවරයා විසින් පනතේ 2 (2) වෙනි වගන්තිය යටතේ පනවනු ලබන ආඥාවකින්, වයස අවුරුදු දහසයට අඩු යම් තැනැත්තකු ඒ තැනැත්තාගේ නම, උපන් දිනය සහ ස්ත්‍රී පුරුෂ

භාවය ඔහු සමඟ සැමියෙකු පියාගේ/මවුගේ වලංගු විදේශ ගමන් බලපත්‍රයකට ඇතුළත් කොට හැකි නම් ලංකාවෙන් පිටව යාම සඳහා විදේශ ගමන් බලපත්‍රයක් නිකුත කිරීම සුදුසු වේ යන නියමයෙන් නිදහස් කළ හැකි ය.

43. යම් තැනැත්තකුට විදේශ ගමන් බලපත්‍රයක්, හදිසි සහතිකයක් හෝ හදුනා ගැනීමේ සහතිකයක් නිකුත් නො කරන ලෙස ඇමතිවරයා විසින් විශේෂ විධානයක් නිකුත් කර ඇති අවස්ථාවක දී, අවස්ථාවෙචිත පරිදි නියම බලධරයා හෝ සුදුසු නියමිත නිලධරයා විසින් ඒ තැනැත්තා හඳුනාගත් විදේශ ගමන් බලපත්‍රයක් හෝ හදිසි සහතිකයක් හෝ හදුනා ගැනීමේ සහතිකයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කළ හැකි ය.

44. නියම බලධරයා හෝ සුදුසු නියමිත නිලධරයා විසින්—

(අ) අවස්ථාවෙචිත පරිදි, යම් විදේශ ගමන් බලපත්‍රයක් හෝ හදිසි සහතිකයක් හෝ හදුනා ගැනීමේ සහතිකයක් එහි එවකට සඳහන් කර නොමැති රටකට හෝ රටවලට යාමට එය වලංගු වන පරිදි පිටසන් කළ හැකි ය; නොහොත්

(ආ) අවස්ථාවෝචිත පරිදි, යම් විදේශ ගමන් බලපත්‍රයක හෝ හදිසි සහතිකයක හෝ හදුනා ගැනීමේ සහතිකයක ඇති යම් පිටසනක් එහි එවකට සඳහන් කර ඇති යම් රටකට හෝ රටවලට යාම සම්බන්ධයෙන් වලංගු වන පරිදි, අවලංගු කළ හැකි ය.

45. (1) විදේශ ගමන් බලපත්‍රයක්, හදිසි සහතිකයක් හෝ හදුනා ගැනීමේ සහතිකයක් එහි පිටසන් කර තිබෙන රටවලට පමණක් යාමට වලංගු විය යුතු ය.

(2) ලංකා විදේශ ගමන් බලපත්‍රයක්, හදිසි සහතිකයක් හෝ හදුනා ගැනීමේ සහතිකයක් දරන කිසිවකු ඒ විදේශ ගමන් බලපත්‍රය, හදිසි සහතිකය හෝ හදුනා ගැනීමේ සහතිකය පිටසන් කර තිබෙන රටක් නොවන යම් රටකට යන හෝ එන්න යුතු ය.

46. සෑම විදේශ ගමන් බලපත්‍රයක් ම නියම බලධරයා විසින් ඒ විදේශ ගමන් බලපත්‍රයෙහි නිශ්චිත ව සඳහන්/කරනු ලැබිය හැකි පරිදි වූ එය නිකුත් කළ දින සිට අවුරුදු පහකට නො වැඩි කාල සීමාවක් සඳහා වලංගු විය යුතු ය:

එසේ වුව ද ඒ බලධරයා විසින් ඒ විදේශ ගමන් බලපත්‍රය එය අවසන වන දින සිට තවත් අවුරුදු පහකට නො වැඩි කාලයකට අලුත් කළ හැකි ය.

47. සෑම හදිසි සහතිකයක හෝ හදුනා ගැනීමේ සහතිකයක් සුදුසු නියමිත නිලධරයා විසින් ඒ සහතිකයෙහි නිශ්චිත ව සඳහන් කරනු ලැබිය හැකි පරිදි වූ එය නිකුත් කළ දින සිට අවුරුදු දෙකකට නො වැඩි කාල සීමාවක් සඳහා වලංගු විය යුතු ය:

එසේ වුව ද සුදුසු නියමිත නිලධරයා මිනින් ඒ සහතිකය එහ අවියෙන එන දින සිට තවත් අවුරුදු දෙකකට නොවැඩි කාලයකට අලුත් කළ හැකි ය.

48. විදේශ ගමන් බලපත්‍රයක්, හදිසි සහතිකයක් හෝ හදුනා ගැනීමේ සහතිකයක් අලුත් කිරීම හෝ වෙනස් කිරීම සඳහා වූ සෑම ඉල්ලුම් පත්‍රයක් සමගට ම කොට ඇති පළමුවන උපලේඛනයෙහි දැක්වෙන "බී" ආකෘතියට අනුකූල වීය යුතු අතර, අවශ්‍යතාවට උචිත පරිදි නියම බලධරයා වෙත හෝ සුදුසු නියමිත බලධාරියා වෙත ඉදිරිපත් කළ යුතු ය.

49. 48 වෙනි නියෝගය යටතේ ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක දී, ඒ හා සම්බන්ධයෙන් අවශ්‍ය වෙතැයි පරිදි නියම බලධරයා වෙත හෝ සුදුසු නියමිත නිලධරයා වෙත සපයන මෙන් ඔහු විසින් නියම කරනු ලබන ගියලු විස්තර හෝ ලියවිලි ඉල්ලුම්කරු විසින් ඇපයිය යුතු ය.

50. විදේශ ගමන් බලපත්‍රයක්, හදිසි ගහතිකයක් හෝ හදුනා ගැනීමේ සහතිකයක් එක් සමයක් සඳහා හෝ නිශ්චිත වූ සඳහන් ගමන් තණතාක් සඳහා නිකුත් කළ හැකි ය. ගම් විදේශ ගමන් බලපත්‍රයක, හදිසි සහතිකයක් හෝ හදුනා ගැනීමේ සහතිකයක් ගමන් තණන නිශ්චිත ව සඳහන් කර නොමැති විට ඒ විදේශ ගමන් බලපත්‍රය හෝ සහතිකය එය වලංගුව පවතින කාල සීමාව තුළ දී ඕනෑ ම ගමන් ගණනක් සඳහා වලංගු විය යුතු ය.

51. (1) අවශ්‍යතාවෙහිදී නියම බලධරයා විසින් හෝ සුදුසු නියමිත නිලධරයා විසින් පහත දැක්වෙන අවම අවශ්‍යතා අනුවය

(අ) විශේෂ ගමන් බලපත්‍රය, හදිසි සහතිකය හෝ හදුනා ගැනීමේ සහතිකය අවලංගු කළ හැකි බවත් නොහොත් අත්හිටවිය හැකි බවත්, සහ

(ආ) එකී වලංගු කාලය සීමා කළ හැකි බවත්

සෑම විදේශ ගමන් බලපත්‍රයක, හදිසි සහතිකයක හෝ හදුනා ගැනීමේ සහතිකයක සෙයාස්ද්ගියෙන් විය යුතු ය.

(2) නියම බලධරයා හෝ සුදුසු නියමිත නිලධරයා විසින් ගම් විදේශ ගමන් බලපත්‍රයක්, හදිසි සහතිකයක් හෝ හදුනා ගැනීමේ සහතිකයක් අවලංගු කරනු ලබන හෝ අත්හිටවනු ලබන අවස්ථාවේ දී අවශ්‍යතාවෙහිදී ඒ බලධරයා හෝ නිලධරයා විසින් ඒ අවලංගු කිරීම හෝ අත්හිටවීම පිළිබඳ දැන්වීමක් ඒ විදේශ ගමන් බලපත්‍රය, හදිසි සහතිකය හෝ හදුනා ගැනීමේ සහතිකය දරන්නා වෙත කර දීමට සැලැස්විය යුතු ය.

(3) (2) වෙනි ඡේදය යටතේ දැන්වීමක් කර දෙනු ලැබූ විට, දැන්වීම කර දෙන ලද්දේ ගම් විදේශ ගමන් බලපත්‍රයක්, හදිසි සහතිකයක් හෝ හදුනා ගැනීමේ සහතිකයක් සම්බන්ධයෙන් ද ඒ බලපත්‍රය හෝ සහතිකය දරන්නා විසින්, ඒ විදේශ ගමන් බලපත්‍රය, හදිසි සහතිකය හෝ හදුනා ගැනීමේ සහතිකය අවලංගුවීමෙහි පරිදි, දැන්වීම කර දීමට සලස්වන ලද නියම බලධරයාට හෝ සුදුසු නියමිත නිලධරයාට ආපසු දිය යුතු ය.

52. (අ) කලින් නිබුණු විදේශ ගමන් බලපත්‍රයේ වලංගු කාලය අවසන් වීමෙන් කෙළවර වී තිබෙන නම් හෝ කලින් නිබුණු හදිසි සහතිකයේ හෝ හදුනා ගැනීමේ සහතිකයේ වලංගු කාලය අවසන් වීමෙන් කෙළවර වී තිබෙන නම්; නැතහොත්

(ආ) කලින් නිබුණු විදේශ ගමන් බලපත්‍රය, හදිසි සහතිකය හෝ හදුනා ගැනීමේ සහතිකය නැති වී හිමිකම් හෝ පාවිච්චි කළ නොහැකි වන පරිදි එයට හානි පැමිණ තිබෙන නම්; නැතහොත්

(ඇ) කලින් නිබුණු විදේශ ගමන් බලපත්‍රයේ, හදිසි සහතිකයේ හෝ හදුනා ගැනීමේ සහතිකයේ නියපු ම පිටු අවසන් වී තිබෙන නම්,

ඒ සඳහා ඉල්ලීමක් කරනු ලැබූ විට, අවශ්‍ය වෙවෙච්චා පරිදි නියමිත බල ධරයා හෝ ලියාපු නියමිත නිලධරයා විසින් යම් කෙනෙක්ගෙන් අලුත් විදේශ ගමන් බලපත්‍රයක්, හදිසි සහතිකයක් හෝ හදුනා ගැනීමේ සහතිකයක් නිකුත් කළ හැකි ය.

53. මෙයට යාබඳව ඇති දෙවන උපලේඛනයේ II වන කිරයෙහි නිශ්චිත ම නියමිත ගාස්තු, පිළිවෙළින් විදේශ ගමන් බලපත්‍ර, හදිසි සහතික හෝ හදුනා ගැනීමේ සහතික පිළිබඳ ව එම උපලේඛනයේ I වන කිරයෙහි අනුරූප සටහන්වල නිශ්චිත ව සඳහන් කරුණු සඳහා අය කළ යුතු ය.

54. 38, 40, 43, 44, 47, 48, 49, 51 සහ 52 යන නියෝගවල කාර්යයන් සඳහා "නියමිත නිලධරයා" යන්නෙන් නියමිත නිලධරයකු ලෙස 37 වෙනි නියෝගයෙන් නියමිත යම් කෙනෙක් අදහස් වේ.

## පුද්ගලයන් ලංකාවෙන් නික්ම යාම

55. ලංකාවෙන් පිට ව යන කාල සීමාවක් තුකුම තම විදේශ ගමන් බලපත්‍රය, හදිසි සහතිකය හෝ හදුනා ගැනීමේ සහතිකය ඒ නිලධරයා විසින් මුද්‍රා තබනු ලැබීමේ කාර්යය සඳහා බලයලත් නිල ධරයකු වෙත ඉදිරිපත් කළ යුතු ය.

## සාමාන්‍ය කරුණු

56. මේ පනතේ කාර්යයන් සඳහා විචාරවීම් කරවීමට ආගමන හා විගමන පාලකට, නියෝජ්‍ය පාලකට සහ සෑම සහකාර පාලකයකුට ම බලය තිබිය යුතු ය.

57. ලංකාවෙහි ස්ථිරවැසිකරු නොමැති යම් කෙනෙක්ගෙන් ලංකාවෙන් ඇතුළත්වීමේ දී හෝ ලංකාවෙන් නික්ම යාමේ දී, තම නියෝග යටතේ වීසා පත්‍ර දීමට හෝ නිකුත් කිරීමට බලය පවරා ඇති කෙනෙක්ගෙන් යම් කෙනකු විසින් ඒ කෙනෙක්ගේ ඇතිල් සටහන් ගැනීමට කැඳවීම නීත්‍යනුකූල විය යුතු ය.

58. (1) ලංකාවට ඇතුළු වන හැම විදේශ ප්‍රධානයෙ විසින්—

(අ) එම භූමියේ සිටින මහින්ගේ, භූත හී යක්ෂයන්ගේ සහ රජවරු කෙරෙහිම්ගේ නාමාවලියක්;

(ආ) එම භූමියේ සේවයේ නියුක්ත නිලධරයන්ගේ, භූත හී යක්ෂයන්ගේ සහ දෙවියන් භූතයන්ගේ නාමාවලියක්;

(ඇ) ලංකාවේ දී භූතවෙන් පිට වූ ගහ සිංහල ම මහින්ගේ නාමාවලියක්;

(ඈ) එම භූතවෙන් ලංකාවෙන් පිට වූ ගහ සිංහල ම මහින්ගේ නාමාවලියක්; සහ

(ඉ) භූතවෙහි සිටින මහින් සහ භූත හී යක්ෂයන් විසින් තම තමන් ශරීරයන්ගයෙන් භූතවූ ප්‍රධානයාගේ ඉල්ලීම පරිදි සූදානම් දිය යුතු භූත භූතිමේ සේ ගොඩ බැසීමේ පත්‍රිකා,

ආගමන හා විගමන පාලක නමින සේ බලයලත් නිලධරයකු වෙත අවම්‍යෙන් වූ භූතියේ යුතු ය.

(2) (1) වෙනි ඡේදයෙහි සඳහන් නාමාවලි සහ පත්‍රිකා පිළි ගුවලින් මෙයට ගැ කොට ඇති උපලේඛනයෙහි දැක්වෙන "ඡ", "ට" "ඣ", "ණ", "ත" සහ "ද" යන අක්ෂරවලට සරිලනකුලු විය යුතු ය.

59. භූත හී යක්ෂයකු සම්බන්ධයෙ අවිනිශ්චය තොමැති ව ලංකාවේ දී මොඩ බැස ඇති බව භූවන ප්‍රධානයාට පෙනී යියහොත් ඔහු විසින් ආගමන හා විගමන පාලක වෙත හෝ ආගමන හා විගමන නිලධාරියෙ පාලක වෙත භූතකාර තාලයකු වෙත එය දන්වා සිටිය යුතු ය.

60. පූර්වයේ 42 (3) වෙනි වගන්තියෙහි සඳහන් නාමාවලිය මෙයට ගැ කොට ඇති පළමුවන උපලේඛනයෙහි දැක්වෙන "න" අක්ෂරයට සරිලනකුල විය යුතු ය.

61. පූර්වයේ 28 වෙනි වගන්තියේ කාර්යයන් සඳහා නිලධරයා පූර්ව සඳහන් භූතවන්තයන්ගෙන් යම් කෙනෙකු විය යුතුය:—

(අ) බලයලත් නිලධරයෙක්.

(ආ) උප පරීක්ෂකයකුගේ තත්ත්වයට නො අඩු පොලිස් නිලධරයෙක්.

62. යම් භූතවන්තයකුට බර දිය යුතු ය යි මේ නියෝගවලින් නියම ව ඇති යම් දන්වීමක් ඒ භූතවන්තයා විසින් සපයන ලද ලිපිනය වෙ ලියාපදිංචි කළ ලිපිනයෙන් භූතපලෙන් හවතු ලැබුවහොත් එය යථා පරිදි බාර දෙනු ලබ ඇතැ යි සැලකිය යුතු ය.

63. 1940 ඔක්තෝබර් මස 28 වෙනි දින අංක 10,030 දරන භූතවි පත්‍රයෙහි පළ කරන ලද 1949 ආගමන හා විගමන නියෝග මෙයින් අවලංගු කරනු ලැබේ.

64. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ නියෝගවල—

"පනත" යන්නෙන් පසු ව පනවනු ලැබූ වෙන යම් පනතක් ව නම් ඉන් සංශෝධිත 1948 අංක 20 දරන ආගමික හා ව්‍යාමික පනත අදහස් වේ;

"අනුමතකළ තැට" යන්නෙන් පනතේ කාර්යයන් සඳහා පනතෙහි 3 වෙනි වගන්තිය යටතේ වූ නියෝගයකින්, අනුමත කළ ඇතුළු වීමේ තැටක් හෝ අනුමත කළ නික්ම යෑමේ තැටක් වශයෙන් ප්‍රකාශ කරන ලද ලංකාවේ යම් ස්ථානයක් අදහස් වේ;

"ලෙහෙසි නිලධරයා" යන්නෙන් නිලධරයකු මිශයෙන් හෝ එසේ ක්‍රියා කිරීමට පනතේ 4 වෙනි වගන්තිය යටතේ පත් කරන ලද යම් තැනැත්තෙක් අදහස් වේ;

"නියම බලධරයා" යන්නෙන් විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීමේ හෝ අලුත් කිරීමේ කාර්යයන් සඳහා නියම බල ධරයකු වශයෙන් 38 වෙනි නියෝගයෙහි නාම්වීතව සඳහන් යම් තැනැත්තකු අදහස් වන අතර,

"නියමිත බලධරයා" යන්නෙන් විසා පත්‍ර දීමේ, නිකුත් කිරීමේ හෝ දීර්ඝ කිරීමේ කාර්යය සඳහා 5 වෙනි නියෝගයෙහි නම්වීත ව සඳහන් තැනැත්තන්ගෙන් යම් කෙනෙක් අදහස් වේ.

ඇමුණුම 03

සැ. යු. අංක අති විශෙෂ ගැසට් පත්‍රය දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් වෙන වෙනම පළවේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1933/13 - 2015 සැප්තැම්බර් මස 21 වැනි සඳුදා - 2015.09.21

(රජයේ මුද්‍රණය ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43 වැනි ව්‍යවස්ථාවේ (1) වැනි අනුව්‍යවස්ථාව යටතේ මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, මා විසින් අමාත්‍ය මණ්ඩලයෙහි අමාත්‍යවරුන් හා අමාත්‍යාංශ සංඛ්‍යාව ද එහි අමාත්‍යවරයන්ට විෂයයන් හා කාර්යයන් සහ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාවිත ආයතන පැවරීම ද නියමය කර ඇති ආකාරයේ ;

විවිධ අමාත්‍යවරයන් භාරයේ පවත්නා විෂයයන්, කාර්යයන්, දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාවිත ආයතන මෙම නිවේදනයේ දිනයේ සිට මෙහි පහත දක්වෙන උපලේඛනයෙහි සඳහන් පරිදි පවත්නා බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

යම් අමාත්‍යවරයකුට නියම්කර පවරනු නොලැබූ කිසියම් විෂයයන් හා කාර්යයන් සහ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාවිත ආයතන ජනාධිපති විෂයෙහි නවදුරටත් මා භාරයේ පවතිනු ඇත.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති.

2015 සැප්තැම්බර් මස 21 වැනි දින,
ජනාධිපති කාර්යාලය,
කොළඹ 01.

IA - PG 2499 — 565 (2015/09)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

(19) ස්වදේශ කටයුතු අමාත්‍යාංශය (සම්බන්ධීකරණ)

| I වැනි කීරුව | II වැනි කීරුව | III වැනි කීරුව |
|---|---|---|
| කාර්යයන් හා කර්තව්‍යයන් | දෙපාර්තමේන්තු, විවෘත්තායතන ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළ යුතු නීති |
| 4. ග්‍රාම රාජ්‍ය සේවක මණ්ඩලය පිහිටුවීම | | ▪ කොන්සියර් ආඥාපනත (1907 අංක 1) |
| 5. දිවයිනේ සංවර්ධන සම්බන්ධීකරණ මණ්ඩලය පිහිටුවීම | | ▪ ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත (1927 අංක 23) |
| 6. උපත්, විවාහ හා මරණ ලියාපදිංචියට අදාළ කටයුතු | | ▪ සාමාන්‍ය විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනත (1907 අංක 19) |
| | | ▪ නිවාඩු පනත (1971 අංක 29) |
| 7. II වැනි කීරුවෙහි දැක්වෙන ආයතනයන්ට බැඳී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු | | ▪ වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිර්දේශ පවරා නොමැති, මෙහි I හා II වැනි කීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු වගවීම්වලින් |
| 8. II වැනි කීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

(20) අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

| I වැනි කීරුව | II වැනි කීරුව | III වැනි කීරුව |
|---|---|---|
| කාර්යයන් හා කර්තව්‍යයන් | දෙපාර්තමේන්තු, විවෘත්තායතන ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළ යුතු නීති |
| 1. අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු විෂයයන්ට සහ II වැනි කීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තුවල විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්බන්ධීකරණය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම | 1. ආගමික හා විගමික දෙපාර්තමේන්තුව | ▪ ආගමික හා විගමික පනත(1948 අංක 20) |
| 2. ආගමික හා විගමික කටයුතු | 2. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව | ▪ ප්‍රජාවැටි පනත (1948 අංක 18) |
| 3. ශ්‍රී ලාංකික ප්‍රජාවැසිභාවයට හා උද්වරණයට අදාළ කටයුතු | 3. සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | ▪ ඉන්දීය සම්භවයක් ඇති නැනැත්තන්ට ප්‍රජාවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත (2003 අංක 35) |
| 4. පුද්ගලයින් ලියාපදිංචි කිරීම | 4. ජාතික කොඩිතනාගර දෙපාර්තමේන්තුව | ▪ අදේශික නැනැත්තන්ට ප්‍රජාවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත (1986 අංක 5) |
| 5. වයඹ පළාත තුළ ආර්ථික සහ යටිතල පහසුකම් සංවර්ධන විෂයානි සම්බන්ධීකරණය, ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම | | ▪ අදේශිකයින්ට ප්‍රජාවැසිභාවය ප්‍රදානය කිරීමේ (විශේෂ විධිවිධාන) පනත (1988 අංක 39) |
| | | ▪ උද්වරණ නීතිය (1977 අංක 8) |
| 6. වයඹ සංවර්ධන වැඩසටහන් සම්බන්ධීකරණය සඳහා ප්‍රේරණී කාර්යාලයන් පිහිටුවීම | | ▪ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ පනත (1968 අංක 32) |
| | | ▪ සංස්කෘතික අරමුදල් පනත (1988 අංක 73) |
| | | ▪ වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිර්දේශ පවරා නොමැති, මෙහි I හා II වැනි කීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු වගවීම්වලින් |

(04)

ඇමුණුම 04



# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

# இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு வர்த்தமானப் பத்திரிகை

அதி விசேஷமானது

# The Gazette of the Democratic Socialist Republic of Sri Lanka

EXTRAORDINARY


අංක 2187/27 - 2020 අගෝස්තු මස 09 වැනි ඉරිදා - 2020.08.09

2187/27 ஆம் இலக்கம் - 2020 ஆம் ஆண்டு ஒகத்து மாதம் 09 ஆந் திகதி ஞாயிற்றுக்கிழமை

No. 2187/ 27 – SUNDAY, AUGUST 09, 2020


(ජනාධිපති විධානය පිට ප්‍රසිද්ධ කරන ලදී / சனாதிபதியின் அதிகாரத்துடன் பிரசுரிக்கப்பட்டது / By order of the President)

## රජයේ නිවේදන / அரசாங்க அறிவித்தல்கள் / Government Notifications

2020 අගෝස්තු මස 09 වැනි දින, කොළඹ 1, ජනාධිපති කාර්යාලයේ දී ය

2020, ஒகத்து 09 ஆந் திகதி, சனாதிபதி அலுவலகம், கொழும்பு 1

09th of August, 2020, Colombo 01, Presidential Secretariat


(IA- G 32327 - 517 (08/2020)

මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක

1.0 ආරක්ෂක අමාත්‍ය

01. විෂයපථය

ජාතික ආරක්ෂාව තහවුරු කිරීම ප්‍රමුඛව ශ්‍රී ලංකාවේ සියලුම ජනතාව ගේ සුරක්ෂිත බව සහතික කරමින් අපරාධ හා සමාජ විරෝධී සහ ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් වලින් තොර වූ නීතිය හා සාමය ස්ථාපිත රටක් ඇති කිරීම.

02. කාර්යයන් හා කර්තව්‍යයන්

(1) සෞභාග්‍යයේ දැක්ම" ප්‍රකිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "සුරක්ෂිත රටක්" ඇති කිරීම සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශ සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම සිදු කිරීම සහ නියමිත නීති සහ අණපනත් වලට අනුකූලව ආරක්ෂක විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්ගේ විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

(2) ජාතික ආරක්ෂාව තහවුරු කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

(3) සියලුම පුරවැසියන්ට නියෙන් සැකෙන් තොරව නිදහසේ ජීවත් වීමට සුදුසු පරිසරයක් නිර්මාණය කිරීම මගින් මහජන ආරක්ෂාව තහවුරු කිරීම.

(4) රාජ්‍ය හා පෞද්ගලික ආර්ථික ක්‍රියාවලීන් මෙන්ම දෙස් විදෙස් ආයෝජන අවස්ථා ප්‍රළුල් කරන ආරක්ෂිත පරිසරයක් රට තුළ ඇති කිරීම.

03. සුවිශේෂී ප්‍රමුඛතා

1. මත්ද්‍රව්‍ය උවදුරෙන් නිදහස් රටක් ඇති කිරීම සඳහා මත්ද්‍රව්‍ය මෙරටට ඇතුළු වීම වැළැක්වීම, මත්ද්‍රව්‍ය උවදුර පාලනය කිරීම, මත්ද්‍රව්‍ය උවදුරට ගොදුරු වීම වැළැක්වීම හා මත්ද්‍රව්‍ය උවදුරට ගොදුරුවූවන් පුනරුත්ථාපනය සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකාය සමග ඒකාබද්ධව කටයුතු කිරීම.
2. ත්‍රිවිධ හමුදා, පොලිස්, සිවිල් ආරක්ෂක බලකායන්ගේ සේවයේ නියුතු, විශ්‍රාමික, මියගිය හා ආබාධිත අයවලුන්ගේ පවුල් සම්බන්ධයෙන් වන පරිපාලන, සැපයුම් හා සුබසාධන කටයුතු කිරීම

04. අදාළ ආයතනික හා නෛතික රාමුව

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| 1. ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලය<br>2. ශ්‍රී ලංකා යුද හමුදාව<br>3. ශ්‍රී ලංකා නාවික හමුදාව<br>4. ශ්‍රී ලංකා ගුවන් හමුදාව<br>5. රක්නා ආරක්ෂණ ලංකා ලිමිටඩ්<br>6. රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරිය<br>7. සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව<br>8. රාජ්‍ය රහස් නොරකුරු සේවය<br>9. ශ්‍රී ලංකා වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුව<br>10. ජාතික අන්තරායකාර ඖෂධ පාලක මණ්ඩලය<br>11. සර්ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය<br>12. ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය<br>13. ආරක්ෂක සේවා පාසල<br>14. ජාතික ගිෂ්‍යභට බලකාය<br>15. ජාතික ආරක්ෂක අරමුදල<br>16. ආරක්ෂක පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය | ■ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී පනත (2009 අංක 35)<br>■ යුධ හමුදා පනත (1949 අංක 17)<br>■ නාවික හමුදා පනත (1950 අංක 34)<br>■ ගුවන් හමුදා පනත (1949 අංක 41)<br>■ උදර්පණ නීතිය (1977 අංක 8)<br>■ රසායනික අවි සම්මුතිය පිළිබඳ පනත (2007 අංක 58)<br>■ ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය පනත (2008 අංක 5)<br>■ වෙරළාරක්ෂක දෙපාර්තමේන්තු පනත (2009 අංක 41)<br>■ පෞද්ගලික ආරක්ෂක නියෝජිතායතන පනත (1998 අංක 45)<br>■ පුපුරණ ද්‍රව්‍ය පනත (1956 අංක 21)<br>■ ගිනි අවි ආඥා පනත (1916 අංක 33)<br>■ වෙඩිපිටි සහ යුධ හමුදා පුහුණුවීමේ පනත (1951 අංක 24)<br>■ උපයෝගිතා හා පරිපූරක පනත (1985 අංක 40)<br>■ පීඩාකාරී අවි පනත (1966 අංක 18)<br>■ මුහුදු කොල්ලකෑම් පනත (2001 අංක 9) |

| දෙපාර්තමේන්තු,ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| 17. ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක අධ්‍යයනය ආයතනය<br>18. ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක විද්‍යායතනය<br>19. රණවිරු සේවා අධිකාරිය<br>20. අපි වෙනුවෙන් අපි අරමුදල<br>21. බහුකාර්ය සංවර්ධන කාර්යසාධක බලකා දෙපාර්තමේන්තුව<br>22. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව<br>23. මිලෝදා ආයතනය (Academy of Financial Studies) | ▪ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (1979 අංක අංක 48)<br>▪ මහජන ආරක්ෂක ආඥා පනත (1947 අංක 25)<br>▪ මාධක ඖෂධ සහ මනෝවර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනත (2008 අංක 1)<br>▪ ඖෂධවලට ඇබ්බැහිවූ තැනැත්තන් (ප්‍රතිකාර කිරීම හා පුනරුත්ථාපනය) පිළිබඳ පනත (2007 අංක 54)<br>▪ ජාතික අන්තරායකර ඖෂධ පාලක මණ්ඩල පනත (1984 අංක 11)<br>▪ ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක අභ්‍යාස ආයතනය පනත (1981 අංක 68)<br>▪ රණවිරු සේවා අධිකාරිය පනත (1955 අංක 54)<br>▪ අපි වෙනුවෙන් අපි අරමුදල පනත (2008 අංක 6)<br>▪ ත්‍රස්තවාදී බෝම්බ ප්‍රහාර මැඩපැවැත්වීමේ පනත (1999 අංක 11)<br>▪ සමුද්‍රීය සංතරණයේ ආරක්ෂාවට එරෙහිව සිදුකරනු ලබන නීති විරෝධී ක්‍රියා මැඩපැවැත්වීමේ පනත (2000 අංක 42)<br>▪ පුරාවස්තු ආඥාපනත (1940 අංක 9) |

1.1 අභ්‍යන්තර ආරක්ෂණ, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍ය

01. කාර්යයන් හා කර්තව්‍යයන්

(1) ආරක්ෂක අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "සුරක්ෂිත රටක්" ඇති කිරීම සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව අභ්‍යන්තර ආරක්ෂාව, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

02. සුවිශේෂී ප්‍රමුඛතා

(1) දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් ඉටු කරනු ලබන ජනතා කේන්ද්‍රීය සේවාවන් ශක්තිමත් කිරීම.
(2) මහජන ආරක්ෂාව තහවුරු කිරීම, ශ්‍රී ලංකා පොලිස් සේවයේ සේවා මට්ටම ඉහළ නැංවීම, රාජ්‍ය නොවන සංවිධාන නියාමනය, ආගමන හා විගමන පරිපාලන කටයුතු නවීකරණය හා කාර්යක්ෂම සේවාවක් ලෙස පවත්වා ගැනීම.
(3) ස්වාභාවික ආපදා අවදානම් කල්තබා හඳුනා ගැනීම, ආපදා වළක්වා ගැනීම, හානි අවම කිරීම හා හානි වූවන් නගා සිටුවීම කාර්යක්ෂම කිරීම සඳහා ආපදා අවදානම් කළමනාකරණ මධ්‍යස්ථාන හා සහන සේවා මධ්‍යස්ථාන සම්බන්ධීකරණය කරමින් ආයතනික වයුහයන් ශක්තිමත් කිරීම.
(4) ආපදා තත්ත්වයන් පිළිබඳව නිවැරදිව පුරෝකථනය කළ හැකි වන පරිදි නවීන තාක්ෂණය සහ දැනුමින් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සවිමත් කිරීම.
(5) ආපදාවන්ට ලක්වූ ප්‍රදේශ, නිතර ආපදාවන්ට ලක් වීමේ අවදානමක් සහිත ප්‍රදේශ, ආපදාවන්ට ලක් වූ පුද්ගලයන්, දේපල, ව්‍යාපාර සහ කෘෂිකාර්මික ඉඩම් ආදී සියළු තොරතුරු ඇතුළත් "ජාතික ආපදා දත්ත ගබඩාවක්" ස්ථාපනය කිරීම.

03. අදාළ ආයතනික හා නෛතික රාමුව

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| 1. සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල<br>2. ශ්‍රී ලංකා පොලිසිය<br>3. ජාතික පොලිස් අභ්‍යාස ආයතනය<br>4. රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව<br>5. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව<br>6. ආගමන හා විගමන දෙපාර්තමේන්තුව<br>7. රාජ්‍ය නොවන සංවිධාන සඳහා වන ලේකම් කාර්යාලය<br>8. ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාව<br>9. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය<br>10. ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය<br>11. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව<br>12. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය | ▪ බලතල පැවරීමේ (ප්‍රාදේශීය ලේකම්වරයන්) පනත (1992 අංක 58)<br>▪ නිවාඩු පනත (1971 අංක 29)<br>▪ පොලිස් ආඥාපනත (1865 අංක 16)<br>▪ ජාතික පොලිස් අභ්‍යාස ආයතනය පනත (2011 අංක 44)<br>▪ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ පනත (1951 අංක 17)<br>▪ උඩරට විවාහ හා දික්කසාද පනත (1952 අංක 44)<br>▪ මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (1951 අංක 13)<br>▪ නොතාරිස් ආඥාපනත (1907 අංක 1)<br>▪ ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත (1927 අංක 23)<br>▪ සාමාන්‍ය විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනත (1907 අංක 19)<br>▪ භාර ආඥා පනත (1917 අංක 09)<br>▪ ඉඩම් (සන්තකය පැවරීමේ සීමා කිරීමේ) පනත (2014 අංක 38)<br>▪ මුද්දර පනත (2006 අංක 12)<br>▪ දඩ මුදල් වැඩි කිරීමේ පනත (2005 අංක 12)<br>▪ අවලංගු කළ නොහැකි තෑගි ඔප්පු බලවත් අකෘතඥතාවය පදනම් කොටගෙන අවලංගු කිරීමේ පනත (2017 අංක 05)<br>▪ බද්ධ නිවාස අයිතිවාසිකම් පනත (1973 අංක 11)<br>▪ ඇටර්නි බලපත්‍ර ලියාපදිංචි කිරීමේ ආඥාපනත (122 වන අධිකාරය) (1902 අංක 4)<br>▪ ඉඩම් සංවර්ධන ආඥාපනත (464 වන අධිකාරය) (1969 අංක 16)<br>▪ ළමයින් දරුකමට හදාගැනීමේ ආඥාපනත (1941 අංක 24)<br>▪ කොන්සල් කර්තව්‍ය පනත (1981 අංක 04)<br>▪ මරණ ලියාපදිංචි කිරීමේ තාවකාලික පනත (2016 අංක 16)<br>▪ මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) පනත (2010 අංක 19)<br>▪ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත (1998 අංක 21)<br>▪ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ පනත (1968 අංක 32)<br>▪ ආගාමික හා විගාමික පනත (1948 අංක 20)<br>▪ පුරවැසි පනත (1948 අංක 18)<br>▪ ඉන්දීය සම්භවයක් ඇති තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත (2003 අංක 35)<br>▪ අදේශික තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත (1986 අංක 5)<br>▪ අදේශිකයින්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (විශේෂ විධිවිධාන) පනත (1988 අංක 39)<br>▪ ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම් හා අධීක්ෂණය) පනත (1980 අංක 31)<br>▪ ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත (2005 අංක 13) |

2.0 මුදල් අමාත්‍ය

01. විෂයපථය

සාර්ව ආර්ථික ප්‍රතිපත්ති, වාර්ෂික අයවැය හා විසර්ජන පනත් සම්බන්ධ වගකීම්, රාජ්‍ය මූල්‍ය කළමනාකරණය, දේශීය හා විදේශීය ඉතුරු කිරීම් හා ආයෝජන, රාජ්‍ය ණය, බැංකු, මූල්‍ය හා රක්ෂණ කටයුතු ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා, සමාජ ආරක්ෂණ සහ ආර්ථික සංවර්ධන කටයුතු මෙහෙයවීම.

02. කාර්යයන් හා කර්තව්‍යයන්

1. "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක්" ඇති කිරීම සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශ සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම් සිදු කිරීම සහ නියමිත නීති සහ අණපනත් වලට අනුකූලව මුදල් විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය යාන්ත්‍රණය හා පෞද්ගලික අංශ යොමු කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම"

2. දිළිඳුකම පිටුදැකීම හා ආර්ථික පුනර්ජීවනය සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකාය මගින් සියළු අමාත්‍යාංශ සම්බන්ධීකරණය කරමින් සංවර්ධන කටයුතු මෙහෙයවීම සඳහා පහසුකම් සැලසීම

01. සුවිශේෂී ප්‍රමුඛතා

(1) සැමට ප්‍රතිලාභ විහිදෙන සියළු පළාත් ආවරණය වන ආදායම් විෂමතා අවම වන තිරසර ඉහළ ආර්ථික වර්ධන වේගයක් ඇති කර ගැනීම.

(2) අඩු ආදායම්ලාභීන්ට ප්‍රමුඛත්වය දෙමින් සේවා වියුක්තිය අඩුකර ගැනීම හා ඒක පුද්ගල ආදායම් ඉහළ නංවා ගැනීම.

(3) වාර්ෂික සාමාන්‍ය උද්ධමන අනුපාතය අඩු අගයක පවත්වා ගැනීම තුළ මිල ස්ථාවරත්වය ඇති කිරීම.

(4) අයවැය හිඟය හා රාජ්‍ය ණය අඩු කර ගැනීම මගින් රාජ්‍ය ආදායම් ප්‍රතිපත්තිවල අවිනිශ්චිතභාවයන් අවම කිරීම.

(5) ණය පොලී අනුපාතය අඩු අගයක පවත්වා ගැනීම තුලින් මූල්‍ය සම්පත් ආර්ථික අවශ්‍යතාවන් පුළුල් කිරීම.

(6) රුපියලේ අගය ස්ථාවරත්වය නහවුරු වන පරිදි මූල්‍ය හා ගෙවුම් ශේෂ ප්‍රතිපත්ති හා පොලී අනුපාත ස්ථාවර කර ගැනීම.

(7) දේශීය නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම, අඩු ආදායම්ලාභීන් සවිබල ගැන්වීම සහ ආයෝජන දිරිගැන්වීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග හඳුන්වා දීම.

(8) පොදු ජනතාවට ප්‍රතිලාභ ලැබෙන පරිදි දේශීය ව්‍යාපාරික ප්‍රජාවට අවශ්‍ය ව්‍යාපාරික පරිසරය පුළුල් කිරීම

(9) රාජ්‍ය ව්‍යවසායන් ශක්තිමත් කර ගැනීම.

(10) රජයේ ආදායම් හා වියදම් කළමනාකරණය කාර්යක්ෂම කිරීම සඳහා අවශ්‍ය ආයතනික ව්‍යුහය ශක්තිමත් කිරීම.

ඇමුණුම 05


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2289/43 - 2022 ජූලි මස 22 වැනි සිකුරාදා - 2022.07.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (1) (අ) අනු ව්‍යවස්ථාව යටතේ මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, මා විසින් අමාත්‍ය මණ්ඩලයෙහි අමාත්‍යවරුන් හා අමාත්‍යාංශ සංඛ්‍යාව ද එසේ අමාත්‍යවරුයන්ට විෂයයන් හා කාර්යයන් සහ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතන පැවරීම ද නිශ්චය කර ඇති හෙයින් ;

විවිධ අමාත්‍යවරයන් භාරයේ පවත්නා විෂයයන්, කාර්යයන්, දෙපාර්තමේන්තු, සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතන මෙම නිවේදනයේ දිනයේ සිට මෙහි පහත දැක්වෙන ලේඛාවයෙහි සඳහන් පරිදි පවත්නා බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

යම් අමාත්‍යවරයෙකුට නිශ්චිතව පවරනු නොලැබූ සියලු විෂයයන් හා කාර්යයන් දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතන ජනාධිපති වශයෙන් තවදුරටත් මා භාරයේ පවතිනු ඇත.

රනිල් වික්‍රමසිංහ,
ජනාධිපති.

2022 ජූලි මස 22 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.


[illegible] - G 17120 — 381 (2022/07)


මෙම පනත් පිටපත් තැපැල් සඳහා www.documents.gov.lk වෙබ් අඩවියෙන් මිලදී ගත හැක.

## උපලේඛනය

06. ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය

| I වැනි තීරුව | II වැනි තීරුව | III වැනි තීරුව |
|---|---|---|
| කාර්යයන් හා කර්තව්‍යයන් | දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත් |
| 1. රජය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා ආයෝජන ප්‍රවර්ධන විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම<br>2. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන ඉතිකාමී අයුරින් ලබා දීම<br>3. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා නාස්තිය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම<br>4. ශ්‍රී ලංකාව කලාපීය වෙළඳ හා ආයෝජන සහයෝගිතාවය ඉහළ නැංවීම අරමුණු කර ගත් ප්‍රතිපත්ති, උපායමාර්ග, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය<br>5. ශ්‍රී ලංකාව තුළ ආර්ථික විභවතාව ප්‍රවර්ධනය කරමින් විදේශීය සෘජු ආයෝජන සහ පුද්ගලික අංශයේ ආයෝජන ප්‍රවර්ධනය කිරීම<br>6. ආර්ථික සංවර්ධන කළාප ප්‍රවර්ධනය, නියාමනය සහ අධීක්ෂණය<br>7. ආගමන හා විගමන කටයුතු<br>8. කොළඹ තෙවැනි තුරණ ව්‍යාපාර මොඩලයක් බවට පත්කර සංවාරක වටපිටාවක් වියයෙන් ප්‍රවර්ධනය කිරීම<br>9. නාස්තිය උදාහරණ ඇති කිරීම. | 1. ආගමන හා විගමන දෙපාර්තමේන්තුව<br>2. කලම්බු ලෝවස් වවර් මැනේජ්මන්ට් කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ්<br>3. වෙක්නො පාක් ඩිවලොප්මන්ට් කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ්<br>4. තොරතුරු තාක්ෂණ උදාහන | • ආගාමික හා විගාමික පනත (1948 අංක 20)<br>• පුරවැසි පනත (1948 අංක 18)<br>• ඉන්දීය සම්භවයක් ඇති නැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත (2003 අංක 35)<br>• අදේශික නැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත (1986අංක 5)<br>• අදේශිකයින්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (විශේෂ විධිවිධාන) පනත (1988 අංක 39)<br>• වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2300/24 - 2022 ඔක්තෝබර් මස 05 වැනි බදාදා - 2022.10.05

(රජයේ බලයෙන් ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (1) (අ) අනු ව්‍යවස්ථාව යටතේ මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, *ම විසින් 2022 සැප්තැම්බර් මස 16 දිනැති අංක 2297/78 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නිවේදනය මගින් සංශෝධිත, 2022 ජූලි මස 22 දිනැති අංක 2289/43 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනය, 2022 ඔක්තෝබර් මස 06 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත උපලේඛනයේ සඳහන් වන පරිදි තවදුරටත් සංශෝධනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

රනිල් වික්‍රමසිංහ,
ජනාධිපති.

2022 ඔක්තෝබර් මස 05 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.


1A - G 37695 — 366 (2022/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## උපලේඛනය

(1) එම නිවේදනයෙහි "අංක 01. ආරක්ෂක අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි I වැනි තීරුවෙහි අංක 16 අයිතමය ඉවත් කිරීමෙන්;

(ආ) එහි I වැනි තීරුවෙහි අංක 17 සිට 28 දක්වා අයිතමයන් පිළිවෙලින් අංක 16 සිට 27 දක්වා වශයෙන් නැවත අංක ගත කිරීමෙන් ;

(ඇ) එහි II වැනි තීරුවෙහි අංක 19 අයිතමය ඉවත් කිරීමෙන්;

(ඈ) එහි II වැනි තීරුවෙහි අංක 20 සිට 28 දක්වා අයිතමයන් පිළිවෙලින් අංක 19 සිට 27 දක්වා වශයෙන් නැවත අංක ගත කිරීමෙන්;

(ඉ) එහි III වැනි තීරුවෙහි දැක්වෙන පහත සඳහන් අයිතමයන් ඉවත් කිරීමෙන්;

- මාධක ඖෂධ සහ මනෝවර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනත (2008 අංක 1)
- ඖෂධවලට අබිබෑහිටු තැනැත්තන් (ප්‍රතිකාර කිරීම හා පුනරුත්ථාපනය) පිළිබඳ පනත (2007 අංක 54)
- ජාතික අන්තරායකර ඖෂධ පාලක මණ්ඩල පනත (1984 අංක 11)

(2) එම නිවේදනයෙහි "අංක 03. තාක්ෂණ අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි I වැනි තීරුවෙහි අංක 11 අයිතමය ඉවත් කිරීමෙන්;

(ආ) එහි I වැනි තීරුවෙහි අංක 12 සහ 13 අයිතමයන් පිළිවෙලින් අංක 11 සහ 12 වශයෙන් නැවත අංක ගත කිරීමෙන්;

(ඇ) එහි II වැනි තීරුවෙහි අංක 1 සහ 5 අයිතමයන් ඉවත් කිරීමෙන්;

(ඈ) එහි II වැනි තීරුවෙහි අංක 2 සිට 4 දක්වා සහ අංක 6 අයිතමයන් පිළිවෙලින් අංක 1 සිට 4 දක්වා වශයෙන් නැවත අංක ගත කිරීමෙන්;

(ඉ) එහි III වැනි තීරුවෙහි දැක්වෙන පහත සඳහන් අයිතමයන් ඉවත් කිරීමෙන්;

- පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ පනත (1968 අංක 32)
- විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනත (1994 අංක 11)

(3) එම නිවේදනයෙහි " අංක 06. ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත පරිදි:-

(අ) එහි I වැනි තීරුවෙහි අංක 7 අයිතමය ඉවත් කිරීමෙන්;

(ආ) එහි I වැනි තීරුවෙහි අංක 8 සිට 13 අයිතමයන් පිළිවෙලින් අංක 7 සිට 12 දක්වා වශයෙන් නැවත අංක ගත කිරීමෙන් ;

(ඇ) එහි II වැනි තීරුවෙහි අංක 1 අයිතමය ඉවත් කිරීමෙන්;

(ඈ) එහි II වැනි තීරුවෙහි අංක 2 සිට 7 දක්වා අයිතමයන් පිළිවෙලින් අංක 1 සිට 6 දක්වා වශයෙන් නැවත අංක ගත කිරීමෙන්;

(ඉ) එහි III වැනි තීරුවෙහි දැක්වෙන පහත සඳහන් අයිතමයන් ඉවත් කිරීමෙන්;

- ආගාමික හා විගාමික පනත (1948 අංක 20)
- පුරවැසි පනත (1948 අංක 18)
- ඉන්දීය සම්භවයක් ඇති තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත (2003 අංක 35)
- අදේශීන තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත (1986 අංක 5)
- අදේශිකයින්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (විශේෂ විධිවිධාන) පනත (1988 අංක 39)

(4) එම නිවේදනයෙහි "අංක 19. කර්මාන්ත අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත පරිදි :-

(අ) එහි II වැනි තීරුවෙහි අංක 27 අයිතමයට පසු පහත සඳහන් අයිතමය ඇතුළත් කිරීමෙන්;

28. කාර්මික නාක්ෂණ ආයතනය

(ආ) එහි III වැනි තීරුවෙහි "ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පනත (1993 අංක 50)" අයිතමයට පසුව පහත අයිතමය එකතු කිරීමෙන් ;

- විද්‍යාව හා තාක්ෂණය වැඩිදියුණු කිරීමේ පනත (1994 අංක 11)

(5) එම නිවේදනයෙහි "අංක 28. මහජන ආරක්ෂක අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත පරිදි :-

(අ) එහි I වැනි තීරුවෙහි අංක 9 අයිතමයට පසු පහත සඳහන් අයිතමයන් ඇතුළත් කිරීමෙන්;

vi. IVSGBS though its technical partner VFS shall procure and deliver the Department of Immigration and Emigration of Sri Lanka with a maximum fifty (50) facial recognition cameras that shall capture 72 points of an arriving passenger at all international entry points of Sri Lanka which includes Airports and Seaports. It is also agreed that CG-DIE will be responsible for integration of the biometrics equipment to the border management system or any other immigration system as required. It is further agreed that CG-DIE make biometric capture compulsory for all visitors arriving in Sri Lanka and for post launch of biometric enrolment.

b. *Guarantees and payments*: IVSGBS shall agreed to open a United State Dollar Account in a bank in Sri Lanka recommended by CG-DIE to fulfill the visa payment requirement as per the government of Sri Lanka. The IVSGBS shall make a deposit in a prior agreed amount with the CG-DIE in order to remit on time all visa fees respectively. The IVSGBS shall be responsible for maintaining the minimum dollar amount agreed by the CG-DIE for all the time through out the period. It is specifically understood that remittances of funds for eVisas to CG-DIE shall be made by prime contractor IVSGBS. Any delay in payment shall attract a penalty of interest as per Sri Lankan laws.

c. IVSGBS shall also provide a bank guarantee if required, the value of the bank guarantee should be mutually agreed.

2. *Expat Visa Services in Sri Lanka*: It is hereby agreed that the scope shall also include the following;

a. Issuance of Visas through Visa on Arrival counters at all airports and seaports for arrivals of tourists into Sri Lanka.

b. Extensions of Tourist or Residence Visa of Expatriate community living in Sri Lanka.

c. *The scope of Services includes*:

i. Managing the existing or setting up of Visa of Arrival counters at the Airports and Seaports in Sri Lanka

ii. Dissemination of information provided and approved by the CG-DIE

iii. Pre-scrutiny and acceptance of Visa applications with accuracy

iv. Seamless integrated submission of applications to CG-DIE

v. Collection in USD and remittance in USD the Visa fee with submission of each application as per the approved process and the guidelines of Department.

vi. Maintain all data security standards as prescribed by CG-DIE and international standards

NS

KSD

d. *Competent Authority:* The CG-DIE maintains full and exclusive competence for overseeing all visa applications and its approval and/or rejection. The CG-DIE will be responsible for applications and documents attached therewith only on receipt of the application at the relevant Mission/ Department.

e. The CG-DIE reserves the right to process on exclusive basis the applications received. The IVSGBS shall follow all regulations as prescribed by the CG-DIE.

f. *Dissemination of Information:* On behalf of CG-DIE, IVSGBS will create and manage a website; operate a telephone/ e-mail for handling enquiries on application process, Visa application status and complaints, and distribute literature as provided by the CG-DIE related to its Visa rules. The Mission warrants and agrees that any information, literature provided to IVSGBS by them to be provided to the applicants and or to be uploaded on the website does not infringe the intellectual property rights of any third Party.

g. *Receipt and Pre-scrutiny of applications:* IVSGBS will receive Visa applications in its designated offices at the airports, seaports and inland within Sri Lanka and also across selected counters and by mail and courier as mutually agreed. IVSGBS will scrutinise the applications to ensure that they are complete, authentic and contain all supporting documentation as specified and provided by the authority. Where an application is incomplete, IVSGBS shall contact the applicant to offer guidance in providing the required assistance as duly informed by the Department. IVSGBS will not have any discretion to refuse an application if the applicant insists on submitting an incomplete application. Besides, acceptance of any application does not necessarily mean approval of application.

h. *Submission of applications:* IVSGBS will arrange to forward applications to the designated Department/ Visa office of the CG-DIE. This will be carried out within timelines agreed and as per prescribed process duly agreed by all parties.

i. *Data-entry:* IVSGBS will perform the data-entry required by the competent Authority of CG-DIE. The authorized personnel/ officer of the CG-DIE will be allowed to access at any moment the computer network of the IVSGBS in order to obtain information on applications submitted or under process through a separate login credentials.

j. *Inspections:* The CG-DIE reserves the right to conduct inspections without prior notice by their personnel.

k. *Collection of Fees and remittance:* Visa fee collected from the applicant in USD will be deposited in the designated bank account **71963786** Bank of Ceylon - Battaramulla of CG-DIE. The amount of fee will be deposited in the designated account after receiving the confirmation on the applications from the Department concerned. Thereafter, IVSGBS will submit the Bank Transaction Slip along with the application summary to the Department of Immigration & Emigration or their nominee on the agreed schedule for remittance of funds.

l. *Retrieval and return of passports:* For visa applications in designated locations IVSGBS application centre will collect processed passports from the designated visa office as per the timelines agreed with the Department and arrange for their return to applicants at submission counter of the IVSGBS application centre or return via courier.

m. *Application Centre*: Moreover, managing the existing or setting up the counters for on Arrival visa at the airports or seaports and the proposed visa application centres will be based on the number of applications received. The counter dedicated for accepting applications for Sri Lankan visa will be provided based on the volume. The head of this unit will be a one-point contact for the CG-DIE.

මුල් පිටපතෙන් ලබා ගන්නා ලදී
නියෝජ්‍ය පිටපතකි.

කේ. එම්. සුහාසි එම්. විතුරංගි
නියෝජ්‍ය පාලක (නිති)
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
"සුසුරුපාය" ශ්‍රී සුදුසිපුර පාර,
බත්තරමුල්ල.

657

n. *Working offices and working hours:* IVSGBS along with its technical partner shall leverage its network for providing such services under guidelines provided by CG-DIE.

o. *Fees (Fees should be charged according to existing Regulations)*

i. Issuance of Visa (Tourist/ Business) / Transit through Visa on Arrival counters at the Airports and Seaports –

ii. Extension or Renewal of Residence Visa Application –

iii. New Residence Visa Application –

Service fees for above i, ii, iii should be mutually agreed by the parties.
In case of a change of visa fee, the CG-DIE will inform IVSGBS 48 working hours in advance.

p. *Commencement of Operations*: IVSGBS team will interact with the CG-DIE officials to have a complete understanding of the process and discuss in details for customisation. Once the process flows and document is approved and signed off, IVSGBS and VFS will develop and implement the system within 8-10 weeks and 12-14 weeks for eVisa/ eTA platform and Expat Visa Services respectively from the date of signing the Agreement. The commencement of operations and launch will be planned on mutual agreement after deployment of the above system.

q. *Territory of operation*: IVSGBS and VFS will provide the services for the CG-DIE across Sri Lanka including Airports and Seaports.

r. *Courier submissions*: For applications submitted at application centres two-way courier service fees will be levied.

s. *Allied services to applicants at an extra charge: IVSGBS application centres can provide additional allied and optional services to visa applicants at an extra charge. Such services may include but not be limited to photography, photocopy, SMS, courier for home delivery and similar services.*

KSB

N.S

556 මුල් පිටපතෙන් ලබා ගන්නා ලද
ඡායා පිටපතකි.

157

කේ. එම්. සුහානි එම්. වතුරංගි
නියෝජ්‍ය පාලක (නීති)
ආගමික හා විහාරික දෙපාර්තමේන්තුව
"සුසුරුසාය" ශ්‍රී සුගතපුර පාර,
බත්තරමුල්ල.

**ANNEXURE 02**

1. **STATUTORY FEES TO BE COLLECTED FROM eTA/ eVISA APPLICANTS**

1.1 The service fee for an individual tourist for all normal visa categories is 18.50 USD per applicant.

1.2 The total service fees shall be structured as:

1.2.1 Service fee of 18.50 USD per application

1.2.2 Fees will be exclusive of any payment gateway, local taxes as applicable and other transaction fees.

In case of a change in visa fee, the CG-DIE will inform IVSGBS 48 working hours in advance.

*1.3* *Working hours:* IVSGBS and VFS shall leverage its network for providing such services under guidelines provided by CG-DIE.

1.4 *Visa Fee – Rules & Regulations*:

i. One visa application form filled out on the website eVisa
ii. One passport sized photograph to the application form.
iii. Photocopy of Passport (front and last page of passport with personal data)
iv. Health certificates if required
v. Flight Information
vi. Country residing in and location details
vii. Accommodation details in Sri Lanka
viii. Contact number
ix. Visa fee

2. **STATUTORY FEES TO BE COLLECTED FROM EXPAT VISA SERVICE APPLICANTS**

Service Fees and additional service fees for Expat Visa Service shall be determined and agreed upon between all parties after taking in to due consideration of local economic conditions, the number of applications in each location concerned and local market conditions.

3. It is agreed with CG-DIE and after receiving written consent from DIE SL that IVSGBS can increase its service fees for eVisa/ eTA and Expat Visa Services in Sri Lanka as referred to in above in the Agreement every 2 years for the tenure of its agreement including subsequent extensions, and it shall be 10% from its prevailing prices.

4. Settlement centrally and regionally of all CG-DIE fees collected from the applicants will be the sole responsibility of IVS as per the agreed timelines with CG-DIE.

KSD

N.S

මුල් පිටපතෙන් ලියා ගන්නා ලදි
නියා පිටපත කි.

655

ANNEXURE 03

කේ. එම්. සුගතපාල එම්. විතුරංගි
නියෝජ්‍ය පාලක (නීති)
අගමන හා විගමන දෙපාර්තමේන්තුව
"සුතුරුපාය" ශ්‍රී සුභූතිපුර පාර,
බත්තරමුල්ල.

## SCOPE OF THE eTA PRODUCT

### 1. Modules to be provided

#### 1.1 Front End Interface

I. The front end website will be provided in 10 different languages (English, Sinhala, Spanish, German, Russian, Hindi, Arabic, Mandarin, French and Japanese)
II. Platform for online submission of eTA application form as per the approved data fields (to be provided) and as per the list of mandatory/ optional documents upload.
III. Integration with online Payment Getaway for collection of fees (MID-Merchant Identification Number. to be provided by IVSGBS)
IV. Receipt of acknowledgement of payment to the customer via email
V. Email notifications to the customers on the status of the visa application.
VI. Application status and live tracking on the website
VII. Information required for the applicant to complete an application form.

#### 1.2 Back Office System

I. Platform for the Quality check of application form and documents submitted by applicant to be made by VFS team.
II. As per the current process the VFS back-office team will only check the quality and completeness of the documents.
III. Please note that quality does not mean verification or the authentication check of the document.
IV. VFS QC team will check that all the mandatory documents have been uploaded and all form fields are filled.
V. VFS will setup a central QC office for all applications.

#### 1.3 Adjudication System

I. Visa Decision making platform for the Client Government
II. Sharing of the eTA decision by the Adjudication system with the Border Management System

Sharing of the eTA decision by the Adjudication system with any other system as may be required.

### 2. Infrastructure and hosting environment configuration

I. Hosting and infrastructure for the solution will be provided by VFS.
II. Hosting to be done on cloud (AWS service UK)
III. The core applicant's data will also rest on the cloud server and shall be purged at agreed intervals (Time to be decided)
IV. Applicant data to be pushed immediately after QC is completed to the government system (API to be provided of the immigrations back-office system)
V. Hosting parameters as per the local laws (The laws are required to be provided).

මුල් පිටපතෙන් ලබා ගන්න
ලද කොපි පිටපතකි.

### 3. Integrations

VFS will integrate into the Department of Immigration and Emigration back-office system and will push all the collected data immediately after completion of the application form and collection of payments. The decision of the application will be sent back to the VFS system after the final adjudication.

The VFS adjudication system will also be integrated into the system for applications which would require manual intervention.

### 4. Business Logic and SLAs (Service Level Agreements)

a. **Visa Processing**: Visas (Normal or Express as agreed with CG-DIE) to be processed within stipulated working days as agreed with CG-DIE from the time of successful payment by applicant. If the application is fully completed / correct, VFS will send the application to the adjudication module within 1 working day for a fully completed / correct application. For incomplete applications, VFS will send up to 3 reminders to applicant to complete / correct the application as mutually agreed with CG-DIE.

b. **Data Purging:** Propose data purging at VFS end in every 6 months; VFS will share the data every 6 calendar months with the government as a data dump to be stored within their systems.

c. **Collection of payment** – The fees are to be collected in USD by IVSGBS through a payment gateway/MID provided to VFS.

d. **Payment of visa fees** – The visa fees will be transferred on agreed intervals of 7 days to the Department by IVSGBS.

**Others**: Any other required logic for business rules that is shared by Client CG-DIE prior to the commencement of development.

53

ඇමුණුම 54

ආකෘති 2ඇ
படிவம் 2A
FORM 2A

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
இலங்கை ஜனநாயக சோசலிச குடியரசு
Democratic Socialist Republic of Sri Lanka

සමාගමේ අංකය
கம்பனி இலக்கம்
Company Number

| P | V | 00293873 |
|---|---|---|

2007 අංක 7 දරණ සමාගම් පනත
2007 ஆம் ஆண்டின் 7ஆம் இலக்கக் கம்பனிகள் சட்டம்
The Companies Act No 7 of 2007

පෞද්ගලික සමාගම සංස්ථාගත කිරීමේ සහතිකය
தனியார் கம்பனி கூட்டிணைப்புச் சான்றிதழ்
Certificate of Incorporation of a Private Company
5 වන වගන්තිය අනුව பிரிவு 5 இன் படி Pursuant to Section 5

**ජීබීඑස් ටෙක්නොලොජි සර්විස් ලංකා (පිවිටි) එල්ටීඩී**

2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ අවශ්‍යතා සපුරා ඇති බැවින් පෞද්ගලික සමාගමක් වශයෙන් අද දින සංස්ථාගත කළ බවත්, එහි සමාගම සීමාසහිත බවත් මෙයින් සහතික කරමි.
දෙදහස් විසි හතර වන් වූ පෙබරවාරි මස අට වන දින මොළඹදී අත්සන්කොට දුනිමි.

**ஜிபிஎஸ் டெக்நொலொஜி சோவிஸ் லங்கா (பீவிடீ) எல்டீடி**

2007 ஆம் ஆண்டின் 7 ஆம் இலக்க கம்பனிகள் சட்டத்தின் கீழான எல்லாத் தேவைப்பாடுகளும் இணங்கியொழுக்கப்பட்டு இத் திகதியன்று தனியார் கம்பனியாக கூட்டிணைக்கப்பட்டுள்ளது என்றும் அக்கம்பனி வரையறுக்கப்பட்டதென்றும் நான் இதனால் சான்றளிக்கிறேன்.
இரண்டாயிரத்து இருபத்துநான்கு ஆம் ஆண்டு பெப்ரவரி மாதம் எட்டாம் திகதியன்று கொழும்பில் எனது கைச்சாத்திட்டுக் கொடுக்கப்பட்டது.

I hereby certify that

**GBS TECHNOLOGY SERVICE LANKA (PVT) LTD**

On this day has been incorporated as a Private Company With Limited Liability having complied with the requirements of the Companies Act No. 7 of 2007.
Given under my hand at Colombo, on this **Eighth** day of **February Two Thousand Twenty Four**

සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් වෙනුවට
கம்பனிகள் பதிவாளர் நாயகம் உள்ளது
For Registrar General of Companies
L.K. Sunethra Dharmakeerthi
අතිරේක සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්
மேலதிக கம்பனிகள் பதிவாளர் நாயகம்
Additional Registrar General of Companies

සභාය ලිපිකාරි

.....
ප්‍රතිපත්ති, සංවර්ධන සහ ප්‍රතිපාදන අංශය

සටහන 1. මෙම සහතිකය පෞද්ගලික සමාගම් පනත 3 වන වගන්තිය සමඟ කියවන 5 වන වගන්තිය
2. II වගන්තියේ ප්‍රතිපාදන අදාළ වේ - 3(2) වගන්තිය
குறிப்பு 1. இந்த சான்றிதழ் தனியார் கம்பனிகள் சட்டம் பிரிவு 3 ஐ பிரிவு 5 உடன் சேர்த்து வாசிக்கவும்
2. பகுதி II இன்கீழான ஏற்பாடுகள் பொருந்தக்கூடியவை - பிரிவு 3(2)
NOTE: 1. This Certificate is for a Private Company - Section 3 read with Section 5
2. The Provisions of Part II apply - Section 3(2)

ඇමුණුම 55


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2213/35 - 2021 පෙබරවාරි මස 03 වැනි බදාදා - 2021.02.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්.ඩි.බී. 10/2017 (III).

**2017 අංක 12 දරන විදේශ විනිමය පනත**

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වන වගන්තිය සමඟ කියවිය යුතු 29 වන වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

මහින්ද රාජපක්ෂ,
මුදල් අමාත්‍ය.

2021 පෙබරවාරි මස 03 වැනි දින,
කොළඹ දී ය.

**නියෝග**

1. මේ නියෝග 2021 අංක 2 දරන විදේශ විනිමය (ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික නැනැත්තකු විසින් ශ්‍රී ලංකාව තුළ දී සිදු කරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු වර්ග) නියෝග යනුවෙන් හඳුන්වනු ලබන අතර 2021 මාර්තු මස 22 වන දින සිට ක්‍රියාත්මක විය යුතුය.

2. ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික නැනැත්තකු විසින් ශ්‍රී ලංකාවේ දී සිදු කරනු ලබන මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ප්‍රාග්ධන ගනුදෙනු, මේ නියෝගවල සහ මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති යම් සීමාවන්, නියම සහ කොන්දේසිවලට යටත්ව, පනතේ 4 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ප්‍රමාණයට යම් බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු විසින් සිදු කරනු ලැබීමට අවසර දෙනු ලැබූ විදේශ විනිමයෙන් වූ බලයලත් ප්‍රාග්ධන ගනුදෙනු වර්ග විය යුතු ය.

3. මේ නියෝග යටතේ විදේශ විනිමයෙන් වූ ප්‍රාග්ධන ගනුදෙනු සිදු කිරීමේ දී සෑම බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු විසින්ම පනතේ 9 වන වගන්තිය යටතේ, කලින් කලට, මහ බැංකුව විසින්, ඒ සම්බන්ධයෙන් නිකුත් කරනු ලබන විධානවලට අනුකූල විය යුතු ය.


1A - PG 5299 — 450 (2021/02)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

4. (1) මේ නියෝග යටතේ විදේශ විනිමයෙන් වූ ප්‍රාග්ධන ගනුදෙනු සිදු කිරීමේ නිරත වන සෑම බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු විසින්ම -

(අ) ගනුදෙනුව සිදු කරනු ලබන නැනැත්තාගේ සද්භාවය; සහ

(ආ) එම ගනුදෙනුව මේ නියෝගවලට අනුකූල වන බව,

ඒ සම්බන්ධයෙන් වූ ලේඛනගත සාක්ෂි ලබා ගැනීම මගින් නිශ්චය කරගනු ලැබිය යුතු ය.

(2) මේ නියෝග යටතේ ප්‍රාග්ධන ගනුදෙනුවල නිරත වන සෑම නැනැත්තකු විසින්ම, (1) වන ඡේදයේ කාර්යය සඳහා, යම් බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු වෙත අවශ්‍ය සියලු ලේඛනගත සාක්ෂි සපයනු ලැබිය යුතු ය.

(3) මේ නියෝග යටතේ විදේශ විනිමයෙන් වූ ප්‍රාග්ධන ගනුදෙනු සිදු කිරීමේ දී සෑම බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු විසින්ම පූර්ණ නිසි උද්‍යෝගයෙන් කටයුතු කළ යුතු ය.

5. මේ නියෝග සමඟ අනුකූල වීමට අපොහොසත් වන යම් බලයලත් වෙළෙන්දකු, පරිසීමිත වෙළෙන්දකු හෝ බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු නොවන යම් නැනැත්තකු සම්බන්ධයෙන් පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් අවශ්‍ය වන බවට සලකනු ලැබිය හැකි යම් ක්‍රියාමාර්ගයක් ගනු ලැබිය හැකි ය.

6. මේ නියෝගවල නිශ්චිතව දක්වා ඇති ප්‍රාග්ධන ගනුදෙනුවලට සම්බන්ධ (සියලු අතරමැදියන්, ව්‍යාපාර වස්තු තැරැව්කරුවන්, ජනක භාර, අනෙකානෙක අරමුදල් සහ මූලෝ ආයතන ඇතුළුව) ශ්‍රී ලංකාව තුළ හේවායික යම් නැනැත්තකු විසින්, එම ප්‍රාග්ධන ගනුදෙනු සිදු කිරීමේ දී මේ නියෝග සමඟ අනුකූල වී ඇති බවට සහතික වීමට වගබලා ගත යුතු ය.

7. මෙහි උපලේඛනයේ I වන කොටසේ "ආ" ශීර්ෂය යටතේ I වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති සෑම විදේශීය සමාගමක් විසින්ම එම සමාගම, මෙහි උපලේඛනයේ I වන කොටසේ "ආ" ශීර්ෂය යටතේ නිශ්චිතව දක්වා ඇති නියමයන් සහ කොන්දේසි සමඟ අනුකූල වන බවට සහතික වීමට වග බලා ගත යුතු ය.

8.(1) මේ නියෝගවල කාර්යය සඳහා "නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල්" යන්නෙන් -

(අ) එක්සත් ජනපද ඩොලර් (එ.ජ.ඩො.);

(ආ) යුරෝ;

(ඇ) ස්ටර්ලිං පවුම්;

(ඈ) ඔස්ට්‍රේලියානු ඩොලර්;

(ඉ) සිංගප්පූරු ඩොලර්;

(ඊ) ස්විඩන ක්‍රෝනර්;

(උ) ස්විස් ෆ්‍රෑන්ක්;

(ඌ) කැනේඩියානු ඩොලර්;

(එ) හොංකොං ඩොලර්;

(ඒ) ජපන් යෙන්;

(ඔ) ඩෙන්මාර්ක ක්‍රෝනර්;

(ඕ) නෝර්වීජියානු ක්‍රෝනර්;

(ක) චීන රෙන්මින්බී; සහ

(ඛ) නවසීලන්ත ඩොලර්.

අදහස් වේ.

(2) මහ බැංකුව විසින්, පනතේ 9 වන වගන්තිය යටතේ ඒ සම්බන්ධයෙන් නිකුත් කරනු ලබන විධාන මගින්, තලින් කලට (1) වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල් සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ එකතු කිරීම සිදු කරනු ලැබිය හැකි ය.

9. 2019 පෙබරවාරි මස 28 වන දින අංක 2112/25 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වන වගන්තිය සමඟ කියවිය යුතු 29 වන වගන්තිය යටතේ සාදන ලද නියෝග, ඒ යටතේ කරන ලද කිසිවකට අගතියක් නොවන පරිදි මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

10. මෙම නියෝගවල කාර්යය සඳහා -

"පනත" යන්නෙන් 2017 අංක 12 දරන විදේශ විනිමය පනත අදහස් වේ;

"බලයලත් වෙළෙන්දා" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම හිමිය යුතු ය;

"ප්‍රාග්ධන ගනුදෙනුව" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම හිමිය යුතු ය;

"මහ බැංකුව" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම හිමිය යුතු ය;

"ඇපයෙන් සීමිත සමාගම" යන්නට 2007 අංක 7 දරන සමාගම් පනතේ දී ඇති අර්ථයම හිමිය යුතු ය;

"කොටස් වලට පරිවර්තනය කිරීම" යන්නෙන් -

(අ) 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාව තුළ සංස්ථාගත කරන ලද සමාගමක් විසින් නිකුත් කරනු ලබන වරණීය කොටස් මේ නියෝග යටතේ හෝ ඉවත් කරන ලද විනිමය පාලන පනත යටතේ සාමාන්‍ය කොටස් බවට පරිවර්තනය කිරීමක්;

(ආ) 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාව තුළ සංස්ථාගත කරන ලද සමාගමක් විසින් ලබා ගනු ලබන හෝ නිකුත් කරනු ලබන ණය හෝ ණය සුරැකුම්පත්, මේ නියෝග යටතේ හෝ ඉවත් කරන ලද විනිමය පාලන පනත යටතේ සාමාන්‍ය කොටස් බවට පරිවර්තනය කිරීමක්; හෝ

(ඇ) නිෂ්පාදකවරයා හෝ නිෂ්පාදකවරයාගේ බලයලත් නියෝජිතයා විසින් තක්සේරු කරන ලද, ආනයනික යන්ත්‍රෝපකරණවල වටිනාකම්, එම යන්ත්‍රෝපකරණවල පිරිවැය දරනු ලැබූ ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද සමාගමක නාමයෙන් සාමාන්‍ය කොටස් බවට පරිවර්තනය කිරීමක්;

අදහස් වේ;

"විගාමිකයා" යන්නට, තලින් කලට සංශෝධනය විය හැකි පරිදි වන 2021 පෙබරවාරි මස 03 දිනැති අංක 2213/36 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද 2021 අංක 3 දරන විදේශ විනිමය (විගාමිකයන් විසින් අරමුදල් ප්‍රේෂණය කිරීම) නියෝගවල දී ඇති අර්ථයම හිමිය යුතු ය;

"කොටස් සඳහා හිමිකම්" යන්නෙන්, නිකුත් කරන්නා විසින් කරන ලද සංස්ථායි ක්‍රියාවන් ප්‍රකාරව හෝ ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සමාගම්වල ඒකාබද්ධවීම් හෝ සම්බන්ධවීම් ප්‍රකාරව හෝ උරුමය සහ අනුප්‍රාප්තියට අදාළ නීතිය ප්‍රකාරව (විගාමිකයකු ඇතුළුව) නේවාසික නොවන පුද්ගලයකු වෙත උරුම වීම ප්‍රකාරව හෝ සමීපතම පවුල් සාමාජිකයකු විසින් (විගාමිකයකු ඇතුළුව) නේවාසික නොවන පුද්ගලයකු වෙත ත්‍යාග වශයෙන් හෝ අධිකරණ නියෝගයක් යටතේ බේරුම් කිරීමක් වශයෙන් හෝ නිකුත් කරන ලද හෝ පවරන ලද යම් කොටස් අදහස් වේ;

"සමීපතම පවුල් සාමාජිකයන්" යන්නෙන්, දෙමව්පියන්, සීයා, ආච්චි, කලත්‍රයා සහ දරුවන් අදහස් වේ;

"බලපත්‍රලාභී වාණිජ බැංකුව" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම හිමිය යුතු ය;

"බලපත්‍රලාභී මුදල් සමාගම" යන්නෙන් 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ බලපත්‍රලාභී මුදල් සමාගමක් අදහස් වේ;

"බලපත්‍රලාභී මූල්‍ය ආයතනය" යන්නෙන් -

(අ) බලපත්‍රලාභී වාණිජ බැංකුවක්;

(ආ) බලපත්‍රලාභී විශේෂිත බැංකුවක්;

(ඇ) 2016 අංක 6 දරන ක්ෂුද්‍රමූල්‍ය පනත යටතේ බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගමක්; හෝ

(ඈ) බලපත්‍රලාභී මූල්‍ය සමාගමක්,

අදහස් වේ;

"බලපත්‍රලාභී විශේෂිත බැංකුව" යන්නට, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම හිමිය යුතු ය;

"අමාත්‍යවරයා" යන්නට, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම හිමිය යුතු ය;

"මුදල් මණ්ඩලය" යන්නට, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම හිමිය යුතු ය;

"විදේශ සමාගම" යන්නට, 2007 අංක 7 දරන සමාගම් පනතේ දී ඇති අර්ථයම හිමිය යුතු ය;

"අවත් කරන ලද විනිමය පාලන පනත" යන්නෙන් (423 වන අධිකාරය වූ) විනිමය පාලන පනත අදහස් වේ;

"පරිසීමිත වෙළෙන්දා" යන්නට, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථය ම හිමිය යුතු ය;

"සිල්ලර වෙළඳාම්" යන්නෙන්, පොද්ගලික හෝ ගෘහස්ථ පරිභෝජනය හෝ පාරිභෝගිය සඳහා අලුත් සහ භාවිත කළ භාණ්ඩ පොදු මහජනතාව වෙත නැවත විකිණීම (වෙනස්කම් සිදු කිරීමකින් තොරව විකිණීම) අදහස් වේ;

"විශේෂිත කල්බදු සමාගම" යන්නෙන් කල්බදු මූල්‍යකරණ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම සඳහා 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත යටතේ ලියාපදිංචි කරන ලද සමාගමක් අදහස් වේ;

"රාජ්‍ය හිමිකම සහිත ව්‍යවසාය" යන්නෙන්, කොටස් ප්‍රාග්ධනයෙන් සියයට පනහකට වැඩි ප්‍රමාණයක හිමිකම ශ්‍රී ලංකා රජය විසින් දරනු ලබන, ශ්‍රී ලංකා රජයේ රාජ්‍ය හිමිකම සහිත ව්‍යවසායයක් අදහස් වේ;

"ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර" යන්නෙන්, ශ්‍රී ලංකා රජය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් නාමනය කරන ලද ණය සාධන පත්‍රයක් අදහස් වේ.

(2 වන සහ 7 වන නියෝග).

## උපලේඛනය

I වන කොටස

**ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව තුළ සිදු කරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු**

අ. අවසරලත් ආයෝජන

1. ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකු, ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටුවන ලද දේශීය අරමුදල්, ප්‍රාදේශීය අරමුදල්, ආයෝජන අරමුදල් සහ අනෙකානෙක අරමුදල් (නේවාසික නොවන ආයෝජකයින්) විසින්, ශ්‍රී ලංකාවේ දී පහත දැක්වෙන වර්ගවල ප්‍රාග්ධන ගනුදෙනුවල නිරත වනු ලැබිය හැකි ය:-

(I) උපලේඛනයේ මේ කොටසේ "අ" ශීර්ෂය යටතේ 7 සහ 8 වන ඡේදවල දක්වා ඇති බැහැර කිරීම් සහ සීමා කිරීම්වලට යටත්ව, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාව තුළ සංස්ථාගත කරන ලද සමාගම් විසින් නිකුත් කරනු ලැබූ, කොටස් සඳහා වූ හිමිකමක් හෝ කොටස්වලට පරිවර්තනය කිරීමක් යටතේ වන සියලු වර්ගවල කොටස් අත්පත් කර ගැනීම, දැරීම හෝ අන්හැර දැමීම;

(2) (බලපතලාභී වාණිජ බැංකු, බලපතලාභී විශේෂිත බැංකු, බලපතලාභී මූලය සමාගම්, විශේෂිත කල්බදු සමාගම් සහ ඇපයෙන් සීමිත සමාගම් සහ ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි කරන ලද විදේශීය සමාගම් හැර) 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාව තුළ සංස්ථාගත කරන ලද සමාගම් විසින් නිකුත් කරන ලද වසර 3 ක් හෝ ඊට වැඩි කාලයක් සඳහා වන (ලැයිස්තුගත ණය සුරකුම්පත් හැර) ණය සුරකුම්පත්වල නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලින් හෝ ශ්‍රී ලංකා රුපියල්වලින් ආයෝජනය කිරීම;

(3) බලපතලාභී වාණිජ බැංකු, බලපතලාභී විශේෂිත බැංකු, බලපතලාභී මූලය සමාගම් හෝ විශේෂිත කල්බදු සමාගම් විසින් අදාළ නියාමන අධිකාරිත්ව අනුමැතිය සහිතව නිකුත් කරන ලද ණය සුරකුම්පත්වල නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලින් හෝ ශ්‍රී ලංකා රුපියල්වලින් ආයෝජනය කිරීම;

(4) (බලපතලාභී වාණිජ බැංකු, බලපතලාභී විශේෂිත බැංකු, බලපතලාභී මූලය සමාගම්, විශේෂිත කල්බදු සමාගම් සහ ඇපයෙන් සීමිත සමාගම් සහ විදේශීය සමාගම් හැර) 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාව තුළ සංස්ථාගත කරන ලද සමාගම් වෙත වසර 3 ක් හෝ ඊට වැඩි කාලයක් සඳහා නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලින් හෝ ශ්‍රී ලංකා රුපියල්වලින් ණය ප්‍රදානය කිරීම;

(5) ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරනු ලැබූ මව් සමාගම් විසින් 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ විදේශීය සමාගමක් ලෙස ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි කරන ලද එම විදේශීය සමාගමේ ශාඛා කාර්යාලයක් වෙත හෝ වාහපෘති කාර්යාලයක් වෙත නම්කරන ලද විදේශ ව්‍යවහාර මුදලින් හෝ ශ්‍රී ලංකා රුපියල්වලින් ණය ප්‍රදානය කිරීම;

(6) අදාළ රේඛීය අමාත්‍යාංශයෙන් සහ වෙනත් යම් අදාළ අධිකාරියකින් අනුමැතිය ලබා ගැනීමට යටත්ව ශ්‍රී ලංකා රජය වෙත හෝ රාජ්‍ය හිමිකම සහිත ව්‍යවසායයන් වෙත ණය ප්‍රදානය කිරීම;

(7) අදාළ නියාමන අධිකාරිවල අනුමැතියට යටත්ව, බලපතලාභී වාණිජ බැංකු, බලපතලාභී විශේෂිත බැංකු, බලපතලාභී මූලය සමාගම් සහ විශේෂිත කල්බදු සමාගම් වෙත විදේශ ව්‍යවහාර මුදලින් හෝ ශ්‍රී ලංකා රුපියල්වලින් ණය ප්‍රදානය කිරීම;

(8) වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට හෝ සීමාකිරීම්වලට යටත්ව -

(අ) ඒකක භාරවල හෝ අනෙකානන්‍ය අරමුදල්වල ඒකකයන්හි;

(ආ) රජයේ සුරකුම්පත්වල (භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර සහ ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරනු ලබන වෙනත් යම් සුරකුම්පත්);

(ඇ) ශ්‍රී ලංකා මහ බැංකුව හෝ යම් රාජ්‍ය හිමිකම සහිත ව්‍යවසායයක් හෝ වෙනත් යම් ව්‍යවස්ථාපිත මණ්ඩලයක් විසින් නිකුත් කරනු ලබන සුරකුම්පත්වල;

(ඈ) ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරුවල (ශ්‍රී.ල.ස.බැ.);

(ඉ) පනතේ 4 වන වගන්තියට යටත්ව, ශ්‍රී ලංකා රුපියල්වලින් හෝ යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් බලපතලාභී මූලය ආයතනවල කාලීන තැන්පතුවල;

(ඊ) නිශ්චල දේපළවල; හෝ

(උ) ලැයිස්තුගත ණය සුරකුම්පත්වල;

ආයෝජනය කිරීම.

(9) ණය ලබා ගන්නාගේ විදේශ විනිමය ඉපැයුම්වලින් එම ණයවල සියලු ආපසු ගෙවීම් සිදු කරන්නේ නම්, ණය ලබා ගන්නාගේ ක්‍රියාකාරී ප්‍රාග්ධන අවශ්‍යතා වෙනුවෙන් ණය මුදල් භාවිත කිරීමේ කාර්යය සඳහා වාහපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හිමි, ශ්‍රී ලංකාව තුළ පිහිටි 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ අර්ථ නිරූපණය කර ඇති පරිදි වන සමාගම් වෙත අවුරුදු තුනකට අඩු කාලයක් සඳහා වන ණය ප්‍රදානය කිරීම.

(10) අමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලැබිය හැකි යම් විධානවලට අනුකූලව මුදල් මණ්ඩලය විසින් අනුමත කරනු ලබන වෙනත් යම් ආයෝජන වර්ගයක ආයෝජනය කිරීම.

2. නේවාසික නොවන පුද්ගලයකු විසින්, සමීපතම පවුල් සාමාජිකයකුගෙන් තෘතියක් වශයෙන් හෝ උරුමය සහ අනුප්‍රාප්තියට අදාළ නීතිය ප්‍රකාරව උරුමයක් වශයෙන්, හෝ අධිකරණ නියෝගයක් යටතේ වූ බෙදාරුම්කිරීමක් වශයෙන් උපලේඛනයේ මේ කොටසේ "අ" ශීර්ෂය යටතේ 1 වන ඡේදයේ (1) වන, (2) වන, (3) වන සහ (8) වන අනුඡේදවල දක්වා ඇති වන්කම් අත්පත්කර ගනු ලැබිය හැකි ය.

3. විගාමිකයකු විසින්, නේවාසික නැනැත්තකු හෝ විගාමිකයකු වන්නා වූ දෙමව්පියන්ගෙන්, සියා හෝ ආච්චිගෙන්, සහෝදර සහෝදරියන්ගෙන් හෝ කලත්‍රයාගෙන් තෘතියක් වශයෙන්, ශ්‍රී ලංකාවේ යම් වත්කමක් අත්පත්කර ගනු ලැබිය හැකි ය. විගාමිකයකු විසින්, උරුමය සහ අනුප්‍රාප්තියට අදාළ නීතිය ප්‍රකාරව උරුමයක් වශයෙන් ශ්‍රී ලංකාවේ යම් වත්කමක් අත්පත්කර ගනු ලැබිය හැකි ය.

4. උපලේඛනයේ මේ කොටසේ 'අ' ශීර්ෂය යටතේ 1 වන, 2 වන සහ 3 වන ඡේදවල නිශ්චිතව දක්වා ඇති සියලු ප්‍රාග්ධන ගනුදෙනු, පහත දැක්වෙන කොන්දේසිවලට යටත් විය යුතු ය:-

(1) අවසරලත් ආයෝජනවලට අදාළව අරමුදල් ශ්‍රී ලංකාව තුළට රැගෙන ඒමට හෝ ශ්‍රී ලංකාවෙන් පිටතට යැවීමට පැලැස්වීමේ යාන්ත්‍රණය,

(අ) ඉහත සඳහන් කරන ලද අවසරලත් ආයෝජන සඳහා ගෙවනු ලැබිය යුතු ප්‍රතිඵල මුදල්, යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් හෝ ශ්‍රී ලංකා රුපියල්වලින් විවෘතකර පවත්වාගෙන යන්නා වූ ආමුඛ ආයෝජන ගිණුමක් හරහා ගෙවනු ලැබිය යුතු ය:

(ආ) එම ආයෝජනවලින් උපයා ගනු ලබන සියලු ආදායම් සහ යම් ප්‍රාග්ධන ලැබීම්, එම ආයෝජනය සිදු කරන ලද ආමුඛ ආයෝජන ගිණුම වෙත බැර කරනු ලැබිය යුතු ය:

(ඇ) උපලේඛනයේ මේ කොටසේ "අ" ශීර්ෂය යටතේ 1 වන ඡේදයේ (මුදල් මණ්ඩලය විසින් එසේ අවසර ලබා දී ඇත්නම්) (4) වන, (5) වන, (6) වන, (7) වන, (8) (අ) වන සහ (9) වන අනුඡේද යටතේ අවසර ලබා දී ඇති ආයෝජන සඳහා සහ (8) වන අනුඡේදය යටතේ අවසර ලබා දී ඇති වෙනත් යම් ආයෝජන සඳහා, ඉහත (අ) සහ (ආ) අයිතමයන්හි නිශ්චිතව දක්වා ඇති, නේවාසික නොවන ආයෝජකයකුගේ ආමුඛ ආයෝජන ගිණුමක් හරහා අරමුදල් ගෙවීමේ අවශ්‍යතාවය අනිවාර්ය නොවේ.

(ඈ) උපලේඛනයේ මේ කොටසේ 'අ' ශීර්ෂය යටතේ 1 වන ඡේදයේ (8) වන අනුඡේදයේ (අ) අයිතමය යටතේ අවසර ලබා දී ඇති ආයෝජන සඳහා සෘජුවම ප්‍රේෂණ සිදු කරනු ලබන අවස්ථාවක දී සහ බලපත්‍රලාභී වාණිජ බැංකුවලට, බලපත්‍රලාභී විශේෂිත බැංකුවලට, ශ්‍රී ලංකා රජයට සහ රාජ්‍ය නිමිතම සහිත ව්‍යවසායයන් වෙත ණය ප්‍රදානය කර ඇති අවස්ථාවක දී එම ආයෝජනවලින් ලැබෙන සියලු ආදායම් සහ ප්‍රාග්ධන ලැබීම්, ආයෝජකයා විසින් නේවාසික නොවන ආයෝජකයා වෙත සෘජුවම සියරට යවනු ලැබිය හැකි ය:

(ඉ) උපලේඛනයේ මේ කොටසේ "අ" ශීර්ෂය යටතේ 1 වන ඡේදයේ (9) වන අනුඡේදයේ සඳහන් කර ඇති ණය මුදල්, ණය ලබා ගන්නා විසින් විවෘත කර පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරික විදේශ ව්‍යවහාර ණය මුදල් ගිණුමකට බැර කළ යුතු අතර පහතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධානවලට යටත්ව එම ව්‍යාපාරික විදේශ ව්‍යවහාර ණය මුදල් ගිණුම් හරහා ම එම ණය මුදලේ සියලු ආපසු ගෙවීම් සිදු කළ යුතු ය. කිසිදු අවස්ථානුගත කරුණු යටතේ වුව ද රුපියල් පරිවර්තනය කිරීමක් ආකාරයෙන් එම ණය මුදල් සියවීමට අවසර ලබා නොදිය යුතු ය.

(2) ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික නැනැත්තකුගෙන් ණය වශයෙන් මුදල් ලබා ගන්නා වූ, බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු, ශ්‍රී ලංකා රජය සහ රාජ්‍ය නිමිතම සහිත ව්‍යවසායයන් හැර ශ්‍රී ලංකාවේ නේවාසික යම් නැනැත්තකු විසින්, එම ණය මුදල් ලබා ගැනීම සඳහා සහ ණය සේවා කිරීම සහ ණය ආපසු ගෙවීම් සඳහා පහත යටතේ මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධානවලට යටත් ව විදේශීය වාණිජ ණය ගැනීමේ ගිණුමක් විවෘත කර පවත්වා ගෙන යා යුතු ය.

(3) උපලේඛනයේ මේ කොටසේ 'අ' ශීර්ෂය යටතේ 1 වන ඡේදයේ (6) වන සහ (7) වන අනුඡේද යටතේ සිදු කරන ලද ණය ලබා ගැනීම් පිළිබඳ වාර්තා කිරීම් -

(අ) බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින් ණය ලබා ගැනීම් සිදු කරනු ලබන අවස්ථාවක දී, එම ණය ලබාගැනීම් පිළිබඳ විස්තර (දිනය, ණය මුදලේ ප්‍රමාණය සහ ව්‍යවහාර මුදල් වර්ගය, ණය කාල සීමාව

සහ ණය ලබා දෙන්නා පිළිබඳ විස්තරය ඇතුළුව) ඊළඟ මාසයේ පහළොස් වන දින හෝ ඊට පෙර විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වෙත වාර්තා කරනු ලැබිය යුතු ය:

(අ) ශ්‍රී ලංකා රජය සහ රාජ්‍ය ගිම්හම සහිත ව්‍යවසායයන් විසින් ණය ලබා ගැනීම සිදු කරනු ලබන අවස්ථාවක දී, (දිනය, ණය මුදලේ ප්‍රමාණය සහ ව්‍යවහාර මුදල් වර්ගය, ණය කාල සීමාව සහ ණය ලබා දෙන්නා පිළිබඳ විස්තරය ඇතුළුව) එම ණයමුදල් ලබා ගැනීම පිළිබඳ විස්තර, ණය මුදල් ලැබීමෙන් එක් මසක් ඇතුළත, (අදාළ වන පරිදි) මුදල් අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව සහ ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වෙත වාර්තා කරනු ලැබිය යුතු ය;

(4) උපලේඛනයේ මේ කොටසේ 'අ' ශීර්ෂය යටතේ 1 වන ඡේදයේ (4) වන සහ (5) වන අනුඡේද යටතේ ලබාගෙන ඇති ණය, ණය ලබාගත්තා විසින්, ණය කාල සීමාව අවසානයේදී සම්පූර්ණයෙන් ම ගෙවනු ලැබිය නැකි හෝ ණය ගිවිසුමේ නියමයන්ට අනුකූලව ණය කාල සීමාව තුළ කුමක්ෂය කරනු ලැබිය යුතු ය.

(5) උරුමයෙන් ලද හෝ තෑගි වශයෙන් ලැබුණු හෝ අධිකරණ නියෝගයක් යටතේ ලැබුණු ආයෝජනවලින් හෝ වත්කම්වලින් ලද ලැබීම් ආපසු සියරට බලා යැවීම.

(අ) (අදාළ වන පරිදි) උරුමය සහ අනුප්‍රාප්තියට අදාළ නීතිය ප්‍රකාරව හෝ සම්පතම පවුල් සාමාජිකයකුගෙන් තෑගියක් වශයෙන් හෝ යම් අධිකරණ නියෝගයක් යටතේ බෙරුම් තීරීමක් වශයෙන් නේවාසික නොවන පුද්ගලයකු වෙත ලැබුණු අවසරලත් ආයෝජනවල යම් ආදායම් සහ යම් ප්‍රාග්ධන ලැබීම්, එකී ආයෝජනය මේ නියෝගවලට අනුකූලව මුල් ආයෝජකයා විසින් සිදු කරනු ලැබ ඇත්තේ නම්, ප්‍රතිලාභියා විසින් විවෘත කරන ලද ආමුඛ ආයෝජන ගිණුමක් හරහා පමණක් ආපසු සියරට යවනු ලැබිය නැකි ය.

(ආ) (අදාළ වන පරිදි) උරුමය සහ අනුප්‍රාප්තිය පිළිබඳ නීතිය ප්‍රකාරව හෝ සම්පතම පවුල් සාමාජිකයකුගෙන් තෑගියක් වශයෙන් හෝ යම් අධිකරණ නියෝගයක් යටතේ බෙරුම් තීරීමක් වශයෙන් නේවාසික නොවන පුද්ගලයකු වෙත ලැබුණු අවසරලත් ආයෝජනවල යම් ආදායම් සහ යම් ප්‍රාග්ධන ලැබීම්, එකී ආයෝජනය, 2017 නොවැම්බර් මස 20 වන දිනට පෙර මුල් ආයෝජකයාගේ (ආමුඛ ආයෝජන ගිණුමක් ලෙස නැවත නම් කරන ලද) සුරැකුම්පත් ආයෝජන ගිණුමක් හෝ වෙනත් යම් ගිණුමක් හරහා සිදු කරන ලද ආමුඛ ප්‍රේෂණ මඟින් සිදු කරනු ලැබ ඇත්තේ නම්, ප්‍රතිලාභියා විසින් විවෘත කරන ලද ආමුඛ ආයෝජන ගිණුමක් හරහා පමණක් ආපසු සියරට යවනු ලැබිය නැකි ය.

(ඇ) (විගාමිකයකු හැර) නේවාසිකයකු නොවන පුද්ගලයකු වෙත, මියගිය නේවාසික නැනැත්තකුගෙන්, උරුමය සහ අනුප්‍රාප්තිය පිළිබඳ නීතිය ප්‍රකාරව උරුම වී ඇති හෝ නේවාසිකයකු වන සම්පතම පවුල් සාමාජිකයකුගෙන් තෑග වශයෙන් ලැබී ඇති හෝ නේවාසිකයකු විසින් දරනු ලබන වත්කම් සම්බන්ධයෙන් අධිකරණ නියෝගයක් යටතේ බෙරුම් තීරීමක් වශයෙන් ලැබී ඇති යම් අවසරලත් ආයෝජනයක යම් ආදායමක් සහ යම් ප්‍රාග්ධන ලැබීම් පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධානවලට අනුව, ඇ.ජ.ඩො. 30,000ක වාර්ෂික දීමනාවට යටත්ව, ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුමකට බැර කර එය හරහා ආපසු සියරට යවනු ලැබිය යුතු ය.

(ඈ) වෙනත් විගාමිකයකු හෝ විගාමිකයකු වන සම්පතම පවුල් සාමාජිකයකු විසින් යම් ආයෝජනයක් එම විගාමිකයා විසින් ශ්‍රී ලංකාවේ නේවාසිකයකුව සිටින අතරතුර දී, සිදු කරනු ලැබූ හෝ ඔහුගේ හෝ ඇයගේ ශ්‍රී ලංකා රුපියල් ගිණුම් හරහා මෙම නියෝග ක්‍රියාත්මක වීමට පෙර සිදු කරනු ලැබූ හෝ උපලේඛනයේ මේ කොටසේ 'අ' ශීර්ෂය යටතේ 6 වන ඡේදය යටතේ අවසර ලබා දී ඇති පරිදි සිදු කරනු ලැබ ඇති අවස්ථාවක දී, වෙනත් විගාමිකයාගෙන් හෝ විගාමිකයකු වන සම්පතම පවුලේ සාමාජිකයාගෙන්, (විගාමිකයකු හැර) නේවාසික නොවන තනි පුද්ගලයකු වෙත, උරුමය සහ අනුප්‍රාප්තිය පිළිබඳ නීතිය ප්‍රකාරව උරුම වී ඇති හෝ තෑග වශයෙන් ලැබී ඇති යම් අවසරලත් ආයෝජනයක යම් ආදායමක් සහ යම් ප්‍රාග්ධන ලැබීම් පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධානවලට අනුව, ඇ.ජ.ඩො. 30,000ක වාර්ෂික දීමනාවකට යටත්ව, ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුමකට බැර කර එය හරහා ආපසු සියරට යවනු ලැබිය යුතු ය.

(ඉ) උපලේඛනයේ මේ කොටසේ 'අ' ශීර්ෂය යටතේ 3 වන ඡේදය යටතේ අවසර ලබා දී ඇති පරිදි යම් විගාමිකයකු වෙත උරුම වන හෝ තෑග වශයෙන් ලැබුණු යම් ආදායමක් සහ යම් වත්කමක යම් ප්‍රාග්ධන ලැබීම්, කලින් කලට සංශෝධනය විය හැකි පරිදි වන 2021 පෙබරවාරි මස 03 දිනැති අංක 2213/36 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද 2021 අංක 3 දරන විදේශ විනිමය (විගාමිකයන් විසින් අරමුදල් ප්‍රේෂණය කිරීම) නියෝගවලට යටත්ව ආපසු සියරට යවනු ලැබිය යුතු ය.

(6) 2017 නොවැම්බර් මස 20 වැනි දිනට පෙර සිදු කරන ලද ආයෝජනවල ලැබීම් ආපසු සියරට යැවීම-

(අ) 2017 නොවැම්බර් මස 20 වන දිනට පෙර සිදු කරන ලද ඉහත ආයෝජනවල යම් ආදායම් සහ යම් ප්‍රාග්ධන ලැබීම්, ආයෝජනය සඳහා වන ආමුඛ ප්‍රේෂණවල සාක්ෂි ඉදිරිපත් කිරීමට යටත්ව, ආයෝජකයා විසින් විවෘත කරනු ලැබ ඇති ආමුඛ ආයෝජන ගිණුමක් හරහා හෝ ඒකක භාරවල ඒකකවල ආයෝජන සිදු කරන ලද අවස්ථාවක දී, පාදුවම, ආයෝජකයාගේ ශ්‍රී ලංකාවෙන් පිටත ගිණුමක් වෙතට පමණක් ආපසු සියරට යවනු ලැබිය හැකි ය.

(ආ) 2010 ජනවාරි මස 1 වන දිනට පෙර සිදු කරන ලද ආයෝජන සඳහා ආමුඛ ප්‍රේෂණ පිළිබඳ සාක්ෂි නොපවතින අවස්ථාවක දී, එකී ආයෝජනයේ යම් ආදායම් සහ යම් ප්‍රාග්ධන ලැබීම්, බලයලත් වෙළෙන්දා හෝ පරිපිළිත වෙළෙන්දා විසින් සිදුකරන ලද ගනුදෙනුවේ සද්භාවය පිළිබඳ සැකීමකට පත් වීමෙන් පසුව, නේවාසික නොවන ආයෝජකයා විසින් විවෘත කරන ලද ආමුඛ ආයෝජන ගිණුමක් හරහා හෝ ඒකක භාරවල ඒකකවල ආයෝජන සිදු කරන ලද අවස්ථාවක දී ආයෝජකයාගේ ශ්‍රී ලංකාවෙන් පිටත ගිණුමක් වෙත පාදුවම ප්‍රේෂණය කිරීමෙන් පමණක් ආපසු සියරට යවනු ලැබිය හැකි ය.

(7) උපලේඛනයේ මේ කොටසේ 'අ' ශීර්ෂය යටතේ 4 වැනි ඡේදයේ (5) වැනි අනුඡේදයේ (ආ) අයිතමය යටතේ සඳහන් කරන ලද ආයෝජන සඳහා හෝ 2010 ජනවාරි මස 1 වන දින සිට 2017 නොවැම්බර් මස 20 වන දින දක්වා කාලසීමාව තුළදී සිදු කරන ලද ආයෝජන සඳහා ආමුඛ ප්‍රේෂණ පිළිබඳ සාක්ෂි නොපවතින අවස්ථාවක දී, එම ආයෝජනවල යම් ආදායම් හෝ ප්‍රාග්ධන ලැබීම්, අවස්ථාවෝචිත පරිදි, ආයෝජකයා විසින් හෝ ප්‍රතිලාභියා විසින් විවෘත කරන ලද, අවස්ථාවෝචිත පරිදි, ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුමක් වෙත හෝ නේවාසික නොවන රුපියල් ගිණුමක් වෙත බැර කරනු ලැබිය යුතු අතර පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධානවලට අනුව එ.ජ.ඩො. 30,000ක වාර්ෂික දීමනාවකට යටත්ව ආපසු සියරට යවනු ලැබිය යුතු ය.

(8) බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු, බලපත්‍රලාභී මූල්‍ය සමාගම් හෝ විශේෂිත කල්බදු සමාගම් විසින්, මෙම නියෝග යටතේ නිකුත් කරන ලද හෝ ලබා ගන්නා ලද ණය සුරකුම්පත් හෝ ණය, අදාළ නියාමන අධිකාරියේ අනුමැතියට යටත්ව, සාමාන්‍ය කොටස් බවට පරිවර්තනය කරනු ලැබිය හැකි ය. 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කරන ලද සමාගම් විසින් නිකුත් කරන ලද හෝ ලබා ගන්නා ලද ලැයිස්තුගත නොකළ ණය සුරකුම්පත් හෝ ණය, අවස්ථාවෝචිත පරිදි, නිකුත් කිරීමේ හෝ ලබා ගැනීමේ දින සිට මාස 18ක් ඉකුත් වීමෙන් පසුව සාමාන්‍ය කොටස් බවට පමණක් පරිවර්තනය කරනු ලැබිය හැකි ය. 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාව තුළ සංස්ථාගත කරන ලද සමාගම් විසින් නිකුත් කරන ලද ලැයිස්තුගත ණය සුරකුම්පත්, කොළඹ කොටස් හුවමාරුවේ නියෝගවලට අනුකූලව සාමාන්‍ය කොටස් බවට පමණක් පරිවර්තනය කරනු ලැබිය හැකි ය.

5. නේවාසික නොවන ආයෝජකයින් විසින්, ශ්‍රී ලංකාවේ යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක අක්වෙරළ බැංකු ඒකකවල පවත්වාගෙන යන ගිණුම් හරහා අරමුදල් සැපයීම මගින්, කිසිදු සීමා කිරීම්වලින් තොරව, ශ්‍රී ලංකාව තුළ සංස්ථාගත නොකළ සහ ශ්‍රී ලංකාවේ කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත නළ පමාගම්වල කොටස්වල හෝ ණය සුරකුම්පත්වල ආයෝජනය තළ හැකි ය.

6. නේවාසික නොවන රුපියල් ගිණුම්වල පවත්වාගෙන යනු ලබන අරමුදල්වලින් විදාමිකයන් විසින් සිදු කරනු ලබන ආයෝජන.

(1) යම් විදාමිකයකුට, එම විදාමිකයාගේ නේවාසික නොවන රුපියල් ගිණුමක පවත්වාගෙන යනු ලබන අරමුදල්වලින්, උපලේඛනයේ මේ කොටසේ 'අ' ශීර්ෂය යටතේ 1 වන ඡේදයේ (8) වන අනුඡේදයේ (ඇ) අයිතමය හැර, උපලේඛනයේ මේ කොටසේ 'අ' ශීර්ෂය යටතේ 1 වන ඡේදයේ (1) වන, (2) වන, (3) වන සහ (8) වන අනුඡේද යටතේ අවසර ලබා දී ඇති ආයෝජන සිදු කිරීම සඳහා අවසර ඇත.

(2) එම ආයෝජනවල සියලු ආදායම් සහ ප්‍රාග්ධන ලැබීම් එම ආයෝජන සිදු කරන ලද්දේ කවර නේවාසික නොවන රුපියල් ගිණුම හරහා ද එම අදාළ නේවාසික නොවන රුපියල් ගිණුම් වෙත බැර කරනු ලැබිය යුතු ය.

(3) එම ආයෝජනවලින් උපයා ගනු ලබන සියලු ආදායම්, පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධානවලට අනුව, සුදුසුකම්ලත් පංකුමණ දීමනාවට යටත් නොවෙමින්, (අදාළ වන පරිදි) අදාළ ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් හෝ විදාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුම් හරහා පමණක් ආපසු සියරට යවනු ලැබිය හැකි ය.

(4) එම ආයෝජනවල යම් ප්‍රාග්ධන ඉපැයුම්, පනතේ විධිවිධාන යටතේ මෙහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධානවලට අනුව, සුදුසුකම්ලත් සංක්‍රමණ දීමනාවට යටත්ව, අදාළ ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම හරහා පමණක් ආපසු සියරට යවනු ලැබිය හැකි ය.

7. බැහැර කිරීම- මේ කොටසේ 'අ' ශීර්ෂයේ යටතේ 1 වන ඡේදයේ (1) වන අනුඡේදය යටතේ වන අවසරය පහත දැක්වෙන ව්‍යාපාරවලින් යම් ව්‍යාපාරයක් සිදු කිරීමට යෝජනා කරන හෝ සිදු කරගෙන යන සමාගමක ඡන්දය දීමේ අයිතිය ගිමි කොටස් සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය -

(1) භාණ්ඩ උකසට ගැනීම;

(2) (ධීවර විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විසින් අර්ථ දක්වනු ලබන පරිදි) වෙරළබඩ මසුන් ඇල්ලීම;

(3) ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික නැනැත්තන් විසින් දායකත්වය දරනලද ප්‍රාග්ධනය, ඇ.ජ.ඩො. මිලියන 5 ට අඩුවන අවස්ථාවක දී, සිල්ලර වෙළඳාම;

8. සීමා කිරීම -

(1) උපලේඛනයේ මේ කොටසේ 'අ' ශීර්ෂය යටතේ 1 වන ඡේදයේ (1) වන අනුඡේදය යටතේ වන අවසරය, පහත සඳහන් ව්‍යාපාරවලින් යම් ව්‍යාපාරයක් කරගෙන යන හෝ කරගෙන යාමට යෝජනා කරන සමාගමක ඡන්දය දීමේ අයිතිය ගිමි කොටස් සම්බන්ධයෙන් එකි සමාගමේ සම්පූර්ණයෙන් නෙවන ලද ඡන්දය දීමේ අයිතිය ගිමි කොටස් සංඛ්‍යාවෙන් 40% ක ප්‍රතිශතයක් දක්වා පමණක් හෝ යම් සමාගමක විදේශ ආයෝජනයන්හි වඩා ඉහළ ප්‍රතිශතයක් සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් විශේෂ අනුමැතියක් ප්‍රදානය කර ඇත්නම්, එකී ඉහළ ප්‍රතිශතය දක්වා පමණක් අදාළ විය යුතු ය.

(අ) ශ්‍රී ලංකාවේ අපනයන ජාත්‍යන්තර වශයෙන් නිශ්චය කරන ලද සලාක සීමා කිරීම්වලට යටත් වන අවස්ථාවක දී, භාණ්ඩ නිෂ්පාදනය;

(ආ) තේ, රබර්, පොල්, කොකෝවා, සහල්, සීනි සහ කුළුබඩු වගා කිරීම සහ මූලික වශයෙන් සකස් කිරීම;

(ඇ) පුනර්ජනනීය නොවන ජාතික සම්පත් කැණීම සහ මූලික වශයෙන් සකස් කිරීම;

(ඈ) දේශීය දැව භාවිතයෙන් සිදු කරනු ලබන දැව පදනම් කරගත් කර්මාන්ත;

(ඉ) (ධීවර විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විසින් අර්ථ දක්වනු ලබන පරිදි) ගැඹුරු මුහුදෙහි මසුන් ඇල්ලීම;

(ඊ) ජන සන්නිවේදනය;

(උ) අධ්‍යාපනය;

(ඌ) භාණ්ඩ ප්‍රවාහනය;

(එ) සංචාරක නියෝජ්‍යායතන;

(ඒ) නැව් ප්‍රවාහන නියෝජ්‍යායතන;

(2) උපලේඛනයේ මේ කොටසේ 'අ' ශීර්ෂය යටතේ 1 වන ඡේදයේ (1) වන අනුඡේදය යටතේ වන අවසරය, මෙහි පහත නිශ්චිතව දක්වා ඇති ව්‍යාපාරවලින් යම් ව්‍යාපාරයක් කරගෙන යන හෝ කරගෙන යාමට යෝජනා කරන සමාගමක ඡන්දය දීමේ අයිතිය ගිමි කොටස් සම්බන්ධයෙන්, ශ්‍රී ලංකා රජය විසින් එකී ව්‍යාපාරයන්හි විදේශ ආයෝජන සඳහා අනුමැතිය ලබා දීම පිණිස පිහිටුවා ඇති අදාළ නීතිමය හෝ පරිපාලන අධිකාරියක් මඟින් ප්‍රදානය කරනු ලබන

සාමාන්‍ය හෝ විශේෂ අනුමැතියක් ලබා දී ඇත්තේ කවර කොටස් ප්‍රතිශතයක් සඳහා ද, එම සමාගමේ සම්පූර්ණයෙන් හෙවත ලද ප්‍රාන්දය දීමේ අයිතිය කිසි කොටස් සංඛ්‍යාවේ ප්‍රතිශතය දක්වා පමණක් අදාළ විය යුතු ය.

(අ) ගුවනින් ප්‍රවාහනය කිරීම;

(ආ) (නාවික විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විසින් අවිට දක්වනු ලබන පරිදි) වෙරළබඩ නැව් ප්‍රවාහනය;

(ඇ) 1990 අංක 46 දරන කර්මාන්ත ප්‍රවර්ධන පනතේ දෙවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කර්මාන්තමය ව්‍යවසායයන්: එනම්,

(i) ආයුධ, පතරොම්, පුපුරන ද්‍රව්‍ය, යුධ වාහන සහ උපකරණ, ගුවන් යානා සහ අනෙකුත් යුධමය දෘඩාංග නිෂ්පාදනය කරනු ලබන යම් කර්මාන්තයක්;

(ii) විෂ, මාදක, මදඋසාර, අන්තරායකර ඖෂධ සහ විෂ සහිත, උපද්‍රවකාරී හෝ පිළිකාකාරක ද්‍රව්‍ය නිෂ්පාදනය කරනු ලබන යම් කර්මාන්තයක්;

(iii) ව්‍යවහාර මුදල්, කාසි හෝ සුරැකුම්පත් ලේඛන, නිපදවනු ලබන යම් කර්මාන්තයක්;

(ඇ) මහා පරිමාණ යාන්ත්‍රික මැණික් කැණීම;

(ඉ) ලොතරැයි.

**ආ. ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර ස්ථානයක් ආරම්භ කිරීම සහ පවත්වාගෙන යාම.**

1. (1) 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති විදේශීය සමාගමකට ශ්‍රී ලංකාව තුළ,

(අ) උපලේඛනයේ මේ කොටසේ "ආ" ශීර්ෂය යටතේ 3 වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති ක්‍රියාකාරකම් හැර, යම් වාණිජමය, වෙළඳ හෝ කර්මාන්ත ක්‍රියාකාරකමක් කරගෙන යා නැකි ය. එසේ වුව ද උපලේඛනයේ මේ කොටසේ "ආ" ශීර්ෂය යටතේ 4 වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් විදේශ ආයෝජන සඳහා අනුමැතිය ප්‍රදානය කිරීමට ශ්‍රී ලංකා රජය විසින් පිහිටුවා ඇති අදාළ නෛතික හෝ පරිපාලන අධිකාරියක පූර්ව අවසරය ලබා ගෙන සිටිය යුතු ය: හෝ

(ආ) සම්බන්ධීකරණ කාර්යාලයක්, නියෝජිත කාර්යාලයක්, ප්‍රාදේශීය කාර්යාලයක් හෝ වෙනත් ඒ හා සමාන කාර්යාලයක් විසින් සිදු කිරීමට භාරගෙන ඇති හෝ සිදු කරනු ලබන්නා වූ, එසේ වුව ද එම ක්‍රියාකාරකම් සිදු කිරීමෙන් ශ්‍රී ලංකාව තුළ වූ විදේශ සමාගමට සෘජුව හෝ වකුව යම් ආදායමක් ජනනය කරනු නොලබන්නා වූ, යම් වාණිජ, වෙළඳ හෝ කර්මාන්ත නොවන යම් ක්‍රියාකාරකමක් සිදු කරනු ලැබිය නැකි ය.

(2) ඉහත සඳහන් යම් ක්‍රියාකාරකමක් සිදු කරගෙන යාමට භාරගෙන ඇති හෝ සිදු කරනු ලබන 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති යම් විදේශීය සමාගමක,

(අ) ව්‍යාපාර ස්ථානය, ශාඛා කාර්යාලයක්, ව්‍යාපෘති කාර්යාලයක් හෝ වෙනත් ඒ හා සමාන කාර්යාලයක් වන අවස්ථාවක දී, ශ්‍රී ලංකාවේ බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු සමඟ විදේශයේ පිහිටි මව් සමාගම විසින් විවාහ කර ඇති ආමුඛ ආයෝජන ගිණුමක් හරහා යොමු කරන ලද අවම වශයෙන් එ.ජ.ඩොං. 200,000ක හෝ ඊට සමාන නම් කරන ලද වෙනත් යම් විදේශ ව්‍යවහාර මුදලකින් වන ආයෝජනයක් එසේ විදේශ සමාගමේ ගිණුමක බැරට ලැබිය යුතු අතර, එසේ ආයෝජනය සනාථ කිරීම සඳහා වන සාක්ෂි ලියාපදිංචි කිරීමේ දින සිට දින අනූවක් (90) ඇතුළත සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව වෙත සැපයිය යුතු ය. එසේ අරමුදල් ආයෝජනයක් වශයෙන් සමාගමේ පොත්වල සටහන් නළ යුතු අතර ශ්‍රී ලංකාව තුළ සමාගම එසේ ව්‍යාපාර කටයුතු අවසන් කරන තුරු සමාගමේ පොත්වල ඇති එම සටහන් පවත්වාගෙන යා යුතු ය.

(ආ) ව්‍යාපාර ස්ථානය, සම්බන්ධීකරණ කාර්යාලයක්, නියෝජිත කාර්යාලයක් හෝ වෙනත් ඒ හා සමාන කාර්යාලයක් වන අවස්ථාවක දී, එසේ ව්‍යාපාරික ස්ථානය පිහිටුවීම සහ පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය අරමුදල්, විදේශයේ පිහිටි මව් සමාගම විසින් ශ්‍රී ලංකාවේ බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු සමඟ විවාහ කරන ලද ආමුඛ ආයෝජන ගිණුමක් හරහා විදේශ සමාගමේ ගිණුමක බැරට ලැබිය යුතු ය.

2. උපලේඛනයේ මේ කොටසේ 'ආ' ශීර්ෂය යටතේ 1 වන ඡේදයේ (1) වන අනුඡේදයේ සඳහන් විදේශ සමාගමක් විසින්, ආයෝජනය සිදු කරනු ලැබූ එහි මව් සමාගමේ ආමුඛ ආයෝජන ගිණුම් හරහා මවුන්ගේ ලාභය, රාජ්‍ය භාගය, වරලත් ව්‍යාපාරික ගාස්තු හෝ ඊට සමාන වෙනත් ගෙවීම් හෝ ගිණුම් අවසන් කරනු ලබන අවස්ථාවේ දී පවතින අතිරික්ත අරමුදල්, බදු අඩු කළ පසු, ශ්‍රී ලංකාවෙන් පිටතට ප්‍රේෂණය කරනු ලැබිය හැකි ය. 2017 නොවැම්බර් මස 20 වන දිනට පෙරාතුව ලියාපදිංචි කරන ලද විදේශීය සමාගමක් විසින්, බලයලත් වෙළෙන්දා හෝ පරිසීමිත වෙළෙන්දා විසින් ගනුදෙනුවේ සද්භාවය පිළිබඳව සැඟීමට පත් වීමෙන් පසු, එකී ගෙවීම්, මව් සමාගමේ ආමුඛ ආයෝජන ගිණුමක් හරහා ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය.

3. උපලේඛනයේ මේ කොටසේ 'ආ' ශීර්ෂය යටතේ 1 වන ඡේදයේ (1) වන අනුඡේදයේ (අ) අයිතමයේ කාර්යය සඳහා, පහත දැක්වෙන වාණිජමය, වෙළඳ සහ කර්මාන්ත ක්‍රියාකාරකම්, විදේශ සමාගමක් විසින් සිදු කිරීම සඳහා අවසර දෙනු නොලැබේ -

(1) (1988 අංක 30 දරන බැංකු පනත යටතේ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලද විදේශ බැංකු ශාඛා හැර) මුදල් ණයට දීම;

(2) භාණ්ඩ උකසට ගැනීම;

(3) ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තන් විසින් දායකත්වය දරන ලද ප්‍රාග්ධනය, ආයෝජනයෙන් පසු, ඇ.ඩො. මිලියන 5 කට අඩු වන අවස්ථාවක දී, සිල්ලර වෙළඳාම;

(4) (ධීවර විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විසින් අර්ථ දක්වනු ලබන පරිදි) වෙරළබඩ මසුන් ඇල්ලීම;

(5) තේ, රබර්, පොල් සහ පහල් වගාකිරීම සහ මූලික වශයෙන් සකස් කිරීම;

(6) පුනර්ජනනීය නොවන ජානික සම්පත් කැණීම සහ මූලික වශයෙන් සකස් කිරීම;

(7) භාණ්ඩ ප්‍රවාහනය;

(8) නැව් ප්‍රවාහන නියෝජිත ව්‍යාපාරය;

(9) යාන්ත්‍රික මැණික් කැණීම; සහ

(10) ලොතරැයි.

4. උපලේඛනයේ මේ කොටසේ 'ආ' ශීර්ෂයේ 1 වන ඡේදයේ (1) වන අනුඡේදයේ (අ) අයිතමයේ කාර්යය සඳහා, විදේශ ආයෝජන සඳහා අනුමැතිය ප්‍රදානය කිරීමට ශ්‍රී ලංකා රජය විසින් පිහිටුවන ලද අදාළ නීතිමය හෝ පරිපාලන අධිකාරියේ පූර්ව අවසරය සහිතව පහත දැක්වෙන කටයුතු සිදු කිරීම සඳහා අවසර ලබා දෙනු ලැබේ -

(1) ශ්‍රී ලංකාවේ අපනයන ජාත්‍යන්තර වශයෙන් නිශ්චය කරන ලද සලාක සීමාකිරීම්වලට යටත් වන අවස්ථාවක දී, භාණ්ඩ නිෂ්පාදනය;

(2) සීනි, කොකෝවා සහ කුළුබඩු වගාකිරීම සහ මූලික වශයෙන් සකස් කිරීම;

(3) දේශීය දැව භාවිතයෙන් සිදු කරනු ලබන දැව පදනම් කරගත් කර්මාන්ත;

(4) (ධීවර විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විසින් අර්ථ දක්වනු ලබන පරිදි) ගැඹුරු මුහුදෙහි මසුන් ඇල්ලීම;

(5) ජන සන්නිවේදනය;

(6) අධ්‍යාපනය;

(7) ශ්‍රී ලංකාවෙන් පිටත සංචාරක නියෝජිත ව්‍යාපාරය;

(8) දේශීය ගුවන් ප්‍රවාහනය;

(9) (අ) ආයුධ, පතරොම්, පුපුරන ද්‍රව්‍ය, යුධ වාහන සහ නුවන් යානා උපකරණ සහ වෙනත් යුධමය දෘඩාංග;

(ආ) විෂ, මාදක, මදඋසාර, අන්තරායකර ඖෂධ සහ විෂ සහිත උපද්‍රවකාරී හෝ පිළිකාකාරක ද්‍රව්‍ය; සහ

(ඇ) ව්‍යවහාර මුද්‍රල්, කාසි සහ සුරැකුම්පත් ලේඛන,

නිෂ්පාදනය කරනු ලබන හෝ නිපදවනු ලබන යම් කර්මාන්තයක්.

II වන කොටස

ශ්‍රී ලංකා රජය විසින් ස්වෙච්ඡාවෙන් බැඳුම්කර නිකුත් කරනු ලැබීම සඳහා වන අවසරය

ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික යම් තැනැත්තකු වෙත යම් විදේශ විවෙහාර මුදලකින් ජාතාන්තර ස්වෙච්ඡාවෙන්ව බැඳුම්කර හෝ වෙනත් වර්ගවල ණය සුරැකුම්පත් නිකුත් කිරීම සහ නිකුත් කිරීමට අදාළව එකී තැනැත්තන් වෙත යම් ගෙවීමක් සිදුකිරීම සඳහා, ඒ සම්බන්ධයෙන් වන අදාළ අධිකාරීන් හි අවසරයන්ට යටත්ව ශ්‍රී ලංකා රජයට අවසර ලබා දෙනු ලැබේ.

III වන කොටස

නේවාසික නැනැත්තන් සඳහා වන අවසර

